
# දහම්ගුරු අවසාන විභාගය

## අත්පොත

### පළමුවන කොටස



ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි

# දහම්ගුරු අවසාන විභාගය අත්පොත
# 1 කොටස

ශ්‍රී ලංකාවේ කතෝලික දහම්ගුරු පිරිස සඳහා වූ විභාග තුනක් ඇත. ඒවා හඳුන්වනුයේ දහම්ගුරු ප්‍රථම, දහම්ගුරු මධ්‍යම හා අවසාන විභාගය වශයෙනි. එම දහම්ගුරු විභාග තුනෙන් දහම්ගුරු අවසාන විභාගය තුන්වන හා අවසාන විභාගය වේ. අවසාන විභාගයට පෙනී සිටීමට දහම්ගුරු ප්‍රථම සහ දහම්ගුරු මධ්‍යම විභාගය සමත් වී තිබිය යුතු ය. අ.පො.ස. උසස් පෙළ ක්‍රිස්තියානි ධර්මය හදාරා ඇති සිසුනට දහම්ගුරු ප්‍රථම විභාගයට පෙනී නොසිට ඍජුව ම දහම්ගුරු මධ්‍යම විභාගයට පෙනී සිටිය හැක. ඊට පසු දහම්ගුරු අවසාන විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

දහම්ගුරු අවසාන විභාගය, දහම්ගුරු විභාග අතර අති සුවිශේෂ ගණයේ විභාගය බව පැවසිය යුතුම ය. එය සුවිශේෂ විභාගයක් වනුයේ විෂය කරුණු රාශියක් අඩංගු පුළුල් විෂය නිර්දේශයක් හදාරා විභාගය සමත් ව ඉන්පසු ශාස්ත්‍රීය රචනයක් ලියා ඊටත් පසු ඉගැන්වීමේ ප්‍රායෝගික පරීක්ෂණයකට ද, මුහුණ දීමට සිදුවන විභාගයක් බැවිනි.

මෙම දහම්ගුරු විභාගයේ විෂය නිර්දේශය විභාග අපේක්ෂිකයින්ට පහසුවෙන් හැදෑරීම පිණිස කොටස් දෙකකින් සමන්විත, සංශෝධිත විභාග අත්වැලක් සුදානම් කිරීමට අදහස් කළේ විභාග අපේක්ෂකයින්ගේ ම පහසුව සඳහා ය. ඒ අනුව පළමුවන ප්‍රශ්න පත්‍රයට එක් පොතකුත්, දෙවන ප්‍රශ්න පත්‍රයට තවත් පොතකුත් ලෙස පොත් දෙකක් නිකුත්වී ඇත. මෙම පළමු පොතට ශුද්ධ වූ බයිබල් අධ්‍යයනය ඇතුළත් කර ඇත. පැරණි ගිවිසුමේ දිවැසිවර කැඳවීම හා දිවැසිවර ඉගැන්වීම්, යුගාන්ත ධර්මය හා ප්‍රඥා සාහිත්‍යය ආදි කරුණු අවබෝධ කරගැනීමට උපකාරක සටහන් ගොනුකර ඇත. තවද නව ගිවිසුමේ ශුද්ධවර ජොහන් සුවිශේෂය පාවුලු තුමාගේ සංදේශ ඇතුළු ව, එළිදරව් පොත පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට උපකාර ව සටහන් ගොනුකර ඇත.

එපමණකුදු නොව දෙවන වතිකාන මන්ත්‍රණ සභා ප්‍රකාශන ගැන සාමාන්‍ය අවබෝධයක් දැන ගැනීමට උපකාර කරන අතර දේව ප්‍රසාද නිධාන ගැන අවබෝධයක් යොමු කිරීමට මෙම පළමු පොත පිටුවහලක් වනු ඇත.


දහම්ගුරු අවසාන විභාගය සමත්වීම තුළ දහම් ගුරුවරයා ශුද්ධ වූ බයිබලය ගැන, සභා ඉගැන්වීම් ගැන හා දේව ප්‍රසාද නිධාන ගැන හසළ දැනුමක් නොතිබුණහොත් දහම්ගුරු භූමිකාවට මහත් මදිපුංචිකමක් වනු නියත ය. විභාගයට පෙර ඒ දැනුම ලැබීමට කියවිය යුතු පොත් පත් රාශියක් ඇත. විටෙක දී ඒ පොත් සොයා ගැනීමට අපහසුකම් හා දුෂ්කරතා මතුවිය හැක. එවැනි දුෂ්කරතාවයනට මද අස්වැසිල්ලක් වනු පිණිස මෙම පොත දහම්ගුරු අවසාන විභාගයේ පළමු ප්‍රශ්න පත්‍රයට උපකාරකයක් ලෙස ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය සුදානම් කර ඇත.

අධ්‍යක්ෂ පියතුමා,
ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය,
19, බැල්කම් පෙදෙස,
කොටා පාර,
කොළඹ 08.

# දහම්ගුරු අවසාන විභාගය

# අත්පොත

# 1-කොටස



ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය

# පටුන

පිටු අංකය

| | |
|---|---|
| ශුද්ධ වූ බයිබලය ගැන අධ්‍යනය | 4 |
| දෙවන වතිකාන මන්ත්‍රණ සභා ප්‍රකාශන | 104 |
| රෝගීන්ගේ ආලේපය පූජාත්වරය හා ආශිර්වාදකාර බන්ධනය යන දේව ප්‍රසාද නිධාන පිළිබඳ අවබෝධය | 128 |

# පළමු වන පාඩම


## 1. ශුද්ධවූ බයිබලය ගැන අධ්‍යයනය

## 1.1 පැරණි ගිවිසුම

**පොදු හැඳින්වීම**

**දිවැසිවරයා යනු කවරෙක් ද?**

බයිබලීය දිවැසිවරයා ගැන සලකා බැලීමේ දී ප්‍රධාන කොට අවධානය යොමු කළ යුතු අංග තුනක් ඇත.




## 1.1.1.1. ඊශ්‍රායෙලීය දිවැසිවරයේ ස්වභාවය

### (අ) දිවැසිවර නාමය

පුරාණ ගිවිසුමෙහි සඳහන් දිවැසිවරයා යන වචනයට හිබෲ බසින් නබී යන්න භාවිතා කෙරිණ. බයිබල් විශේෂඥයන් පවසන අන්දමට විශේෂිතවූ අදහස් හෙවත් අර්ථ තුනක් ගෙන දේ.

- ප්‍රකාශ කරන්නා - To Proclaim
- යමකට කැඳවනු ලැබූ තැනැත්තා - To be called
- යමක් උතුරුවා/ පසාරණය කරනු ලබන්නා - To boil over

මෙම අර්ථ තුනක් ගෙන දෙන ''නබී'' යන්නෙහි මූලික අර්ථය වටහා ගන්නට, සෙප්තුවාජින්ත බයිබලයෙන් කෙරෙන දායකත්වය කෙරෙහි අවධානය යොමු කල යුතු වේ.

සෙප්තුවාජින්ත බයිබලයේ දිවැසිවරයා හඳුන්වන්නේ ''ප්‍රොෆෙටේස්'' යනුවෙනි. එය 'ප්‍රෝ'' හා ''ෆේමී''යන වචන දෙකක එකතුවෙනි.

''ප්‍රෝ '' - යමෙකු වෙනුවෙන් - On behalf of

''ෆේමී''- කථා කරන්නා - To speak

මෙමගින් ප්‍රොෆේටේස් යනු, යමෙකු වෙනුවෙන් කථා කරන්නා හෝ අර්ථ නිරූපණය කරන්නා යන අරුත ඉදිරිපත් කෙරේ. ක්‍රි. පූ. 5 වන සියවසේ සිට භාවිතා කරනු ලැබුවේ ප්‍රසිද්ධ හෝ ප්‍රකට ආගම් සඳහා ය. මේ නිසාම ප්‍රොෆෙටේස් යන වචනය තුළ දිවැසිවරයා යනු දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කරන්නා, දෙවියන් වහන්සේ වෙනුවෙන් යමක් දන්වා සිටින්නා ය. ''රෝහේ'' සහ ''හොසේ'' යන හීබෲ වචන වලින් ද, 'මන්ටිස්' යන ග්‍රීක් වචනයෙන් ද ප්‍රකාශ කරනුයේ දිවැසිවරයා අනාගතය ගැන කියන තැනැත්තෙකු ලෙස යි.

හීබෲ බයිබලය අනුව තවත් අර්ථ නිරූපනයක් ඉදිරිපත් කෙරේ. එනම් ඔහු ඊශ්‍රායෙල් දෙවියන් වහන්සේ විසින් විශේෂ වු කාර්යයක් සඳහා යවනු ලැබූ තැනැත්තෙකි, පණිවුඩයක් ප්‍රකාශ කරන්නෙකි.

මේ අනුව ඉදිරිපත් කෙරෙන බයිබලීය දිවැසිවරයා, හඳුනාගත හැකි ව්‍යවහාරීක පද මාලාවන් තුනක් බයිබලය තුළින් දැකිය හැකි ය.

- ''ස්වාමීන් වහන්සේ මෙසේ වදාරණ සේක'' (යෙසායා 1/2ඃ ජෙරමියා 1/4,එසකියෙල් 5/1, ආමොස් 1/3)
  Thus says the Lord- Koh Amar Yaweh

- ''මෙසේ වදාරන්නේ ස්වාමීන් වන මම ය.'' (ජෙරමියා 31/33ඃ 34/2)
  The Oracle of Yaweh- Ne um Yahweh

- සමිඳාණන් වහන්සේගේ පණිවුඩය.. පැමිණියේ ය. (එසකියෙල් 1/3ඃ ජෙරමියා 1/3ඃ ජොවෙල් 1/3
  The word of the Lord came to.......... Devar Yaweh

## දිවැසිවර වර්ගීකරණය

ඊශ්‍රායෙලීය දිවැසිවරය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකි ය.

1. පැරණි හෙවත් ලිඛිත නො වන දිවැසිවරු
2. ලිඛිත, සම්භාව්‍ය හෙවත් ශාස්ත්‍රීය දිවැසිවරු

### පැරණි හෙවත් ලිඛිත නො වන දිවැසිවරු

පැරණි හෙවත් ලිඛිත නො වන දිවැසිවරුන්ව පූරාණ ගිවිසුම තුළ අපට හමුවන්නේ ආදී පිතෘ යුගයේ දී ආබ්‍රහම්, ඊසාක්, ජාකොබ් හා මෝසෙස් යන පුද්ගලයන් තුළිනි. පැරණි දිවැසිවරුන්ගේ ලියකියවිලි පූරාණ ගිවිසුමේ නො මැති වුවද, ඔවුන්ගේ වචන හා ක්‍රියා ප්‍රධාන වශයෙන් බයිබලය තුළ අපට දැකිය හැක. මොව්හු දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කළ ද, තමන් කියමන් ලිඛිතව සටහන් නො කළහ. එසේ කථා කළ කිහිප දෙනෙකි නාතාන් (2 සාමුවෙල් 7-2 පරිච්ඡේද), එළියා (1 රාජාවලිය 17-19 පරිච්ඡේද), එළිෂා (2 රාජාවලිය 2-13 පරිච්ඡේද), හුල්දා (2 රාජාවලිය 22 පරිච්ඡේදය), අහිජා (1 රාජාවලිය 11/29, 12/15, 14/2) මිකායා (1 රාජාවලිය 22).
මෙම දිවැසිවරුන්ට ආවේණිකවූ විශේෂ ලක්ෂණ හා ක්‍රියාකාරකම් පූරාණ ගිවිසුමෙන් අපට අනාවරණය වේ.

I. ධ්‍යානයට සමවැදීම - සමහර අවස්ථාවලදී ඔව්හු ධ්‍යානයට සමවැදී පරවස වූ විට දිවැසි වදන් දෙසූහ. උදා 1 සාමුවෙල් 19/23-24

II. කණ්ඩායම් වශයෙන් දිවස් කීම - දෙවියන් වහන්සේ වෙනුවෙන් කණ්ඩායමක් ලෙස ගොස් දිවැසි වදන් කීම උදා 1 සාමුවෙල් 19/18-24, 1 රාජාවලිය 20/35

III. රාජ්‍ය සභා දිවැසිවරු - සමහර අවස්ථාවලදී මෙම දිවැසිවරුන් රාජ්‍ය සභාව හා සම්බන්ධව ක්‍රියා කරන ලදි. උදාඃ නාතාන්, එළියා (2 සාමුවෙල් 12/1-11, 2 රාජාවලිය 1, 2 පරිච්ඡේද

ලිඛිත දිවැසිවරු හෙවත් ශාස්ත්‍රීය දිවැසිවරු
ලිඛිත දිවැසිවරු ප්‍රධාන කොටස් දෙකකට බෙදා ඇත.

**ලිඛිත දිවැසිවරු**

→ **ප්‍රධාන දිවැසිවරු 3**
යෙසායා, ජෙරමියා එසකියෙල්

→ **සුළු දිවැසිවරු (12)**
ආමොස්, හොසියා, සෙකරියා, ජෝනා,
මීකා, ඔබදියා, හබකුක් , ශෙපනියා,
ජොඑල්, හග්ගයි, මලාකි, නාහුම්

## 1.1.1.2. දිවැසිවර කැඳවීම

බයිබලයේ එන විවිධ නායකයන්ගේ ජීවිත කථා බොහෝ විට ඇරඹෙනුයේ,ඔවුන් සිය දූත මෙහෙවරට ලද කැඳවීම්, කෙටියෙන් හෝ දීර්ඝ ලෙස සඳහන් කිරීමෙනි. මෙලෙස මෙම කැඳවීම් පිළිබඳ සිද්ධිය ඔවුන් සඳහන් කිරීමේ පරමාර්ථ දෙකක් ඇත.

I. ජනතාව ඉදිරියේ තමාව කැඳවනු ලැබූ දූත මෙහෙවරට එනම් දිව්‍යමය වූ, සම්භවයට ප්‍රසිද්ධ සාක්ෂියක් දීම සඳහාත්, එනම් දිවස්වැකී කීම, තමාගේ පෞද්ගලික ආශාවක් හෝ චින්තන මාත්‍රයක් නොව, එය දෙවියන් වහන්සේගෙන් ම ලද ආරාධනයක් නිසා සිදුවන්නක් බව ඒත්තු ගැන්වීම.

II. සිය දූත මෙහෙවරේ දි හමුවන බාධක ඉදිරියේ දී, සිය කැඳවීම ගැන සිතීමටත්, එම අභියෝගවලට මුහුණදීමටත් මහත් ශක්තියක් හා ධෛර්යය ලබා ගැනීමටත් ය.

## දිවැසිවර කැඳවීමේ පොදු ව්‍යූහ ලක්ෂණ

දිවසිවරුන්ගේ කැඳවීම් පුවත්හි දක්නට ලැබෙන පොදු ලක්ෂණ කිහිපයකි.

## I. දර්ශනය හා විශේෂ අත්දැකීම

දිවැසිවරයා එක්තරා දර්ශනයක් මගින් ස්වාමීන් වහන්සේ හා සම්මුඛ වේ. මෙම දර්ශනය චමත්කාරය, සවිස්තර ලෙස පෙන්නුම් කර ඇත. එහි සමහර අංගයන් දිවැසිරයාගේ කැඳවීම හා කෙලින්ම සම්බන්ධ නො වූවත් ඒවා දිවැසිවරය පිහිටා ඇති පසුබිම හ පදනම තිරසාර කිරීමට උපයෝගි වේ. වෙනත් වචන වලින් කිවහොත් මෙවැනි දර්ශන, දිවැසිවරය දෙන ස්වාමීන් වහන්සේගේ අති උත්කෘෂ්ඨභාවයත්, දිවැසිවරය ලබන පුද්ගලයාගේ අසරණ බව හෝ නො වටිනා බවත්, පෙන්නුම් කරයි. මෙවන් දර්ශනවල දි දෙවියන් වහන්සේගේ අති උත්කෘෂ්ඨභාවයත් මහිමවත් වැඩසිටීමත්, මේඝ ගර්ජනා, වළාකුළු, ඝන මීදුම, දුම් වළලු, පොළවේ කම්පනය, සුළඟ මේ ආදී දේ මගින් සංකේතවත් කරන ලදී. (යෙසායා 6:4, එසකියෙල් 1:4) ස්වාමීන් වහන්සේගේ අති උත්කෘෂ්ඨභාවය සඳහන් කෙරෙන්නේ ''කදෝෂ්'' නැමැති හිබෲ වචනය මගිනි. එහි මුල් අරුත නම් අන් සැම දෙයකට වඩා වෙනස්වීම ය. නැතහොත් අන් සැම දෙයින් වෙන් කිරීම ය.

## II. දූත මෙහෙවර භාරදීම

දර්ශනය, කැඳවීම හෙවත් දූත මෙහෙවර භාරදීමට උචිත රාමුවක් ලෙස යොදා ගැනේ. දිවැසිවරයාව තෝරාගැනීම වෙනුවෙන් දේව කැමැත්ත වන්නේ කුමක්දැයි පැහැදිලි කිරීම, දූත මෙහෙවර භාර දීමේහි දී

සංකේතවත් කරයි. එමගින් ඔහු යොමු විය යුතු කාර්යභාරය, කළයුතු ක්‍රියාදාමය දෙවියන් වහන්සේ ඔහු ඉදිරියේ දිග හරිනු ලබයි.

## III. දිවැසිවරයාගේ අකමැත්ත ප්‍රකාශ කිරීම

දිවැසිවරයා තමාට පිළිගැනෙන භාරදූර කාර්යය භාරගැනීමට මැලි වෙයි. එය මග හැරවීමට උත්සහා කරයි. ඔහු මෙය කරන්නේ දේව පණිවුඩය ප්‍රකාශ කිරිමේ දී තමන්ට මුහුණ පාන්නට වන හිරිහැර හා අනෙකුත් දුෂ්කරතාවයන දන්නා නිසා ය. ජෙරමියා හා එසකියෙල් තමන්ට භාර කරන ලද දූත කාර්යය එකහෙළා පිළිගැනිමට උනන්දුවක් දැක්වූ බවක් නො පෙනේ. විශාල උද්යෝගයකින් එය පිළිගත් යෙසායා ''සමිඳුන් මෙසේ වන්නේ කොපමණ කලකට ද '' යන ප්‍රශ්නය නගන්නේ තමන් භාරගත් කාර්යය ඉදිරියේ, පැකිලෙන බව ඉගි කරවමිනි. ආමොස් දිවැසිවරයා මේ සම්බන්දයෙන් තම මැලිබව පවසන්නේ ''මම රැකියාව වශයෙන් දිවැස්වැකි කියන දිවැසිවරයෙක් නො වෙමි. මම ගොපල්ලෙක්මි, අත්තික්කා වගා කරන්නෙක්මි'' දෙවියන් වහන්සේ යම් පුද්ගලයෙකුට කැඳවීම භාර දෙන විට දිවැසිවරයාගේ කැමැත්ත, අකමැත්ත නො විමසන සේක. තෝරාගැනීම තුළ සේවකයාට සංවාදයක් හෝ වාද විවාද කිරීමට අවස්ථාවක් නො මැත. දිවැසිවරයාට සිදුවන්නේ තම අසරණභාවය තුළ කැඳවීම පිළිගැනීම හා කීකරුවීම පමණකි. මෙසේ විවිධාකාරව කැඳවීම ලැබූ පුද්ගලයන්ගේ ප්‍රතිචාර අනුව සිව් ආකාර වර්ගීකරණයකට යොමු කළ හැකි ය.

- කීකරු දරුවෙකු මෙන් කැඳවීම පිළිගැනීම - උදාඃ සාමුවෙල් (1 සාමුවෙල් 3/4-5)
- යුධ භටයෙකු මෙන් නිර්භිතව කැඳවීම පිළිගැනීම උදාඃ ආමොස්, එළියා (ආමොස් 3/8,1 රාජාවලිය 19/ 11)
  බියෙන් හා අකමැත්තෙන් එය පිළිගැනීම උදාඃ මෝසෙස් (නික්මයාම 3/11, 13-17), ජෙරමියා (ජෙරමියා 1/6)
- ත්‍යාගිශිලීව කැඳවීම පිළිගැනීම උදාඃ යොසායා 6/8

## IV. දිවැසිවරයාව ධෛර්යමත් කිරීම

තම ඉරණමවූ දුක් කම්කටොළු, තර්ජන, අපවාද හා අවිනිශ්චිත හැඟිම් වලින් පීඩනයට පත්වූ දිවැසිවරයාගේ සරණයට අවසානයේ දි එන්නේ ස්වාමීන් වහන්සේ ය. ඔවුන් වහන්සේ ඔවුන් සමග සිටින බවටත්, දුෂ්කර අවස්ථාවලට මුහුණ දීමට ඔහු ධෛර්‍යය හා ශක්තිය දෙන බවටත් ප්‍රතිඥා දෙන සේක

**උදාඃ ජෙරමියා 1/8 ''ඔවුන්ට බිය නො වන්න. මන්ද නුඹ ගලවන්නට මම නුඹ සමඟ සිටිමි''**

මෙසේ ස්වාමීන් වහන්සේ දිවැසිවරයාව මෙහෙයවන අතර ධෛර්යයවත් කරන සහතිකය දිවැසිවර කැඳවීම තුළ දැකිය හැක. තවද අභ්‍යන්තර බලවේගයක් ලෙසින් ඔවුන්ව පසු කාලයේ දි ක්‍රියාකාරි කරවන හා මෙහෙයවන බව කතුවරයා පැහැදිළි කරයි.
උදාඃ ජෙරමියා 20/9 ''ඔබ තුමන්ගේ වචනය මගේ සිතේ ගින්නක් මෙන් ඇවිලේ. එය මගේ ඇටකටු තුළ සැඟවී ඇත.
කෙසේ වෙතත් දිවැසිවරයාගේ කාර්යයේ බැරෑරුම්කමට, උන්වහන්සේගේ සබැඳියාව ද, සහයෝගිතාවය ද, දැක්වීමේ අදහසක් ලෙස උන්වහන්සේ දෙන ප්‍රතිඥාවන් සැලකිය හැකි ය.
උදා (ජෙරමියා 1/ 18-19) - ''අද නුඹ සුරක්ෂිත නගරයක් ද, යකඩ කුළුණක් ද, ලෝකඩ පවුරක් ද මෙන් ශක්තිමත් කළෙමි. මන්ද මම නුඹ සමග සිටිමි''
මෙසේ කැඳවා ගන්නා දිවැසිවරයා මූලික වශයෙන් අබල දුබල මිනිසෙකි. ලේ, මස්, ඇට වලින් සැදුණ දිළින්දෙකි. මේ සියලු සීමාවන්ට අභිබවා යමින් දෙවියන් වහන්සේගේ කැඳවීම ඔහු භාර ගන්නේ ය.

## V. ගදිවැසි කාර්යය සඳහා යවනු ලැබීම

කිසිදු කොන්දේසියක් නො මැතිව, තම ප්‍රතිඥාව මතම, තම පණිවුඩය ප්‍රකාශ කරන්නට, දෙවියන් වහන්සේ දිවැසිවරයාව යවනු ලැබේ.
උදා ජෙරමියා 1/9-10 ''ජාතින් හා රාජ්‍යයන් කෙරෙහි නුඹට බලය දී අද මම නුඹ පත් කළෙමි.

මේ සෑම යවනු ලැබීමක් සඳහා දිවැසිවරය සංකේතාත්මකව ප්‍රදානය කෙරේ. යෙසායාගේ තොල් පවිත්‍ර කරමින් ගිනි අඟුරක් මුඛයෙහි තැවරීමත්, උන්වහන්සේගේ අත දිගු කොට ජෙරමියාගේ මුඛය ස්පර්ශ කිරීමත්, අත දිග හැර ඇතුළත හා පිටත ලියන ලද අකුලන ලද පොතක් අනුභව කරන්නට එසකියෙල්ට දීමත්, මගින් දිවැසිවරයට උන්වහන්සේගේ අනුග්‍රහය හා පිටුබලයක් ලබාදෙන බව පෙන්වයි.

- මෙසේ යවන ලද සෑම දිවැසිවරයෙකුවම එසේ යවනු ලැබුවේ කුමක් සඳහා ද යන්න, දීර්ඝ ලෙස විස්තර කෙරේ.

**යෙසායා යවනු ලබන්නේ** - කොතෙක් සවන් දුන්නත් තේරුම් නො ගන්නා තද සිත් ඇති අයගේ සිත් තවත් දැඩි කරන්නට ය. ඇස් අඳුරු කරන්නට ය. කන් බිහිරි කරන්නට ය.

**ජෙරමියා යවනු ලබන්නේ** - උදුරන්නට හා කඩා දමන්නටත්, නැති කරන්නට හා හෙළාදමන්නටත්, ගොඩ නගන්නට හා සිටුවන්නටත් ය.

**එසකියෙල් යවනු ලබන්නේ** - ඉතා මුරණ්ඩු තද සිත් ඇති කැරළිකාර වංශයක් වන විප්‍රවාසීගත ජනතාවක්ගේ මුරණ්ඩු සිත වෙනුවට මාංශමය හදවතක් ඇති කිරීමට ය.

මේනයින් බලන විට මේ දූත මෙහෙවරේ ධනාත්මක හා ඍණාත්මක පැති දෙකක් ඇත. දිවැසිවරයා දරණ දේව වචනයේ ද්වීත්ව ස්වභාවය මෙයින් පැහැදිළි වන අතර, එය දෙපැත්ත කැපෙන කඩුවක් මෙන් ක්‍රියාකාරී වන්නේ ය. එය නපුර බිඳ දමා යටපත් කරන අතර, යහපත ගොඩ නගන්නේ ය. දිවැසිවරයාගේ කාර්යය භාරය වන්නේ ද මෙයම ය.

# දිවැසිවර කැඳවීම

## යෙසායාගේ කැඳවීම :- ක්‍රි.පූ. 740-687 - (යෙසාය 6/1-13)

යෙසායා පළමු කාණ්ඩයේ දිවැසිවරයෙකි. ඔහු පාලක පන්තියට අයත්, රජතුමා සම්මුඛ වී කථා කිරීමට තරම් කිට්ටු සම්බන්ධතාවයක් ගොඩනගාගත්, පූජක පැලැන්තියට අයත් කෙනෙකි. දිවැසිවරය සඳහා මොහු කැඳවනු ලැබුයේ ක්‍රි. පු. 742- 736 ටත් අතර කාලයේ දී එනම් උශ්ශියා රජු අපවත් වූ අවුරුද්දේ දී ය. ඊශ්‍රායෙලීය රාජතාන්ත්‍රය පිරිහීමකට ලක්ව තිබුණ යුගයක බලාපොරොත්තු හීන වූ ජනතාවකට, බලාපොරොත්තුවක් ඇති කිරීමට යෙසායාව තෝරා ගන්නා ලදී. යෙසායාගේ දූත මෙහෙය විශේෂයෙන් දකුණු රාජ්‍යය වන ජුදෙයාව හා ජෙරුසලමේ වැසියන් සඳහා වූ අතර, උශ්ශියාට පසු පැමිණි ජෝතම් (ක්‍රි. පු. 742- 735) ආහස් (ක්‍රි. පු. 735-715) සහ හෙසකියා (ක්‍රි.පු. 715-687) යන රජවරුන්ගේ පාලනය කරන කාලය තුළ දීම අවුරුදු 50 කට වැඩි කාලයක් ඉටු කෙරිණි.
යෙසායාට දිවැසිවරය සඳහා කැඳවීම ලැබෙනුයේ ජෙරුසලෙම් දේව මන්දිරයේ දී ය. කැඳවීම පිලිබඳ පුවතේ ස්වාමීන් වහන්සේගේ තේජස්ශ්‍රීය හා උත්තරීතරභාවය සංකේතාත්මකව විස්තර කෙරෙන්නේ, දිවැසිවරයාගේ කැඳවීමට ස්ථාවර පසුබිමක් සැපැයීමට ය. (යෙසායා 6/1).

❖ ස්වාමීන් වහන්සේ පිරිවරා සිටින සෙරාප්වරු ඔවුන්වහන්සේගේ මහිමාලංකාරයට මුහුණ දීමට නො හැකිව තම වත පියාපත් වලින් වසා ගනිති. තම ඇස් පියාපත් දෙකකින් වසා ගනිති. තවත් පියාපත් දෙකකින් ඔව්හු පියාසර කරති. සෑම දෙයක් අභ්‍යන්තරයේ ඇති රහස් එළිදරව් කරන සමිඳුන් ඉදිරියේ ඔව්හු තම දුබල බව හා නිරුවත් බව වටහාගෙන සියොලඟ තම පියාපත් වලින් ආවරණය කරගනිති. සෙරාප්වරුන්ගේ ගීයේ පිළිවෙලින් තෙවරක් ''සුවිශුද්ධය'' යන වචනය සඳහන් වීම ස්වාමීන් වහන්සේගේ අති උත්කෘෂ්ඨභාවය හඟවනු ලබයි. (යෙසායා 6/3)

❖ මෙහි දී ඇති වන්නේ අත්තිවාරම් සෙලවෙන තරමට ඇතිවූ භූමිකම්පාවකි. දේව මාලිගය ද දුමින් පිරුණේ, සීනායි කන්ද පාමුල මෝසෙස්ට ගිවිසුම දෙන විට ස්වාමීන් වහන්සේ අනාවරණ වූ විට ඇති වූ පරිසරයකි. (නික්මයාම 19/ 16-20). මෙම අත්දැකීම දිවැසිවරයාගේ කැඳවීමට විශේෂත්වයක් ලබා දෙන අතර භූමිකම්පාව හා දුම්පටලය දෙවියන් වහන්සේගේ ජීවමාන වැඩ සිටීම සංකේතවත් කෙරුණි. (යෙසායා 6/4)

❖ ස්වාමීන් වහන්සේගේ පරම උත්කෘෂ්ඨභාවය ඉදිරියේ දිවැසිවරයාට තමාගේ සහ තම සෙනඟගේ පවිටු බව මනාව ප්‍රත්‍යක්ෂ වේ. එසේ ම තමන් ලබන්නට යන්නාවූ විශේෂ කැඳවීම අනුව, දේව වචනය ප්‍රකාශ කරන ප්‍රචාරකවරයෙක් ලෙස තම දෙතොලින් එම කාර්යය කරන්නට තරම් තමා සුදුසු නො වන බවත්, ජීවමාන දෙවිඳුන් ඉදිරියේ අසරණයකු වන තමා කාලකණ්ණියෙක් ලෙස හඳුන්වා ගනිමින්, මහත් දොම්නසකින් ප්‍රකාශ කරන්නේ ''අපවිත්‍ර තොල් ඇති මිනිසෙකු වන, අපවිත්‍ර තොල් ඇති මිනිසුන් අතර ජීවත් වන, තමාට කිසිදු බලාපොරොත්තුවක් නැති බව ය. (යෙසායා 6/5)

❖ තම නුසුදුසු බව යෙසායා පැවසුවත්, තමන් කාර්යය සඳහා දුබලයන් ප්‍රබලයන් කරන්නට ක්‍රියා කරන සමිඳාණන් වහන්සේ, යෙසායා දිවැසිවරයාව කාර්යයට සූදානම් කිරීම සංකේතවත් කරමින් ඔහුගේ දෙතොල් පූජාසනයෙන් ගත් ගිනි අඟුරකින් පිරිසිදු කරනු ලබයි. (යෙසායා 6/6-7) එසේ කරන්නේ ඔහුගේ අපරාධය පහ කරන්ටත්, පාපය කමා කරන්නටත් ය.

❖ ස්වාමීන් වහන්සේ යෙසායාට දිවැසිවරය ප්‍රදානය කරමින් ''මෙන්න මා මෙහි ය, මා යැව්ව මැනවයි.' මහත් උද්යෝගයෙන් භාරගත් කාර්යයේ බරපතල කම ඔහුට වටහා දෙන්නේ ජනතාවගේ ප්‍රතිචාරය පිළිබඳව අනතුරු අඟවීමක් කරමින් ය. ''මේ සෙනඟගේ සිත් අඳුරු වනු ඇත. කන් බිහිරි වනු ඇත. ඇස් අන්ධ වනු ඇත...... ' (යෙසායා 6/9-10) යයි දඩබ්බර වූ පාපිෂ්ඨ වූ ජනතාවගේ සිත් යහමගට නො හැරෙන තරමට තද සිත්වුවත් දිවැසිවරයාට දේව වචනය ප්‍රකාශ කිරීමට කාල වකවානුවක් දක්වයි. ස්වාමීන් වහන්සේ එසේ කරන්නේ දිවැසිවරයා තම කාර්යයේ භාරදූර බව වටහාගෙන මෙය කොපමණ කලකට දැයි සංවේගාත්මකව උන්වහන්සේගෙන් කන්නලව් ස්වරූපයෙන් විමසූ විට දි ය.

❖ වැසියෙකු නැතිව නගර ද, මිනිසෙකු නැතිව ගෙවල් ද දේශය සහමුලින් ජන ශූන්‍ය වන තුරුත්, දිවැසි කාර්යය ඉටු කරන්නට දෙවි සමිඳාණන් තමන් විසින් දෙනු ලබන දඬුවම් සහිත විනිශ්චය ගැන ඉඟි කරමින් ඔහුට කාර්යය භාර කරන්නේ ය. (යෙසායා 6/ 11-13)

## ජෙරමියාගේ කැඳවීම :- ක්‍රි.පූ. 626-588 - (ජෙරමියා 1/4-10, 17-19)

ජෙරමියා වනාහි සමිඳාණන්ගේ නව ගිවිසුමේ දිවැසිවරයා වේ. ජෙරමියා තම දූත මෙහෙය සඳහා යොමු වූයේ බබිලෝනියානු විප්‍රවාසයට පෙර හා විප්‍රවාසය හා සම්බන්ධ යුගයේ දී ය. (ජෙරමියා 1/2-3) අනුව දිවැසිවරයාගේ දූත මෙහෙවර ජොෂියා (ක්‍රි. පූ. 640-609), ජෙහොයාකිම් (ක්‍රි. පූ. 609-598), ශෙදකියා (ක්‍රි. පූ. 597- 587) - යන අයගේ කාල වකවානුව තුළදී ය.

ජොෂියාගේ පාලන සමයේ 13 වන වසරේ එනම් ක්‍රි. පූ. 626 දි ජෙරමියාගේ දූත කාර්යය ඇරඹිණි.

### දූත මෙහෙවරේ ඓතිහාසික පසුබිම

බබිලෝනියේ අධිරාජ්‍යයා වු නබුකද්නසාර් ක්‍රි. පූ. 605 - 598 ත් අතර කාලයේ දී, පලස්තීනයේ තම බලය තහවුරු කරමින් ක්‍රි.පූ. 598 දී ජෙරුසලෙම වටලෑවේ ය. මිසර අධිරාජ්‍යයා වු ජෙහොයාකිම් නම් ලත් ''නේකෝ'' (ක්‍රි. පූ. 610-595) විසින් පත්කරනු ලැබූ ජෙරුසලෙමේ රජු මේ අවදියේ දී මරණයට පත් විය. ඔහුගේ පුත් ජෙහොයාකින් රජකමට පත්වූවත්, ක්‍රි. පූ. 597 දී පළමුවන බැබිලෝනියානු විප්‍රවාසය සිදුවිය. එවිට රජ ඇතුළු පාලක පංතිය ද, පුහුණු ශ්‍රමිකයන් බොහෝ දෙනෙක් ද බබිලෝනියාවට ගෙන යන ලදි. එවිට නෙබුකඩ්නසාර් විසින් ජොසියා රජුගේ පුතෙකු වු ද ජෙහොයොකිම්ගේ සහෝදරයෙකු වු ද ශෙදකියාව රජකමට පත් කරවීය.

එහෙත් ශෙදකියා බබිලෝනියට බදු මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කිරීම හේතුකොට ගෙන ක්‍රි. පූ. 588 ජනවාරි පස්වන දින සිට 587 ජුලි 01 වන දින දක්වා බබිලෝනි හමුදා විසින් ජෙරුසලෙම වටකර සිටියේ ය. පුරා වසර 1 1/2 ක් පමණ වටකර සිටීමෙන් පසු වැටුණු නගරයට පිවිසි බැබිලෝනියානු හමුදා, එය කඩා බිඳ සුණු විසුනු කර නගරය ගිනි බත් කළ අතර, ශෙදකියා රජුන්ව, නෙබුකද්නසාර් රජ ඉදිරියට පමුණුවා ඔහුගේ ඇස් අන්ධ කලෝ ය. ඒ සමගම අන්ත දිළිඳු අසරණ ජනතාව හැර අන් සෑම කෙනෙකුම බැබිලෝනියාවේ විප්‍රවාසයට ගෙන ගිය හ. ඉන් අනතුරුව, නෙබුකද්නසාර් විසින් පත් කරන ලද ගෙදලියා නැමැති තම මිතුරා සමග ජෙරුසලෙමෙහි නැවතුන ජෙරමියාට ගෙදලියාගේ මරණයෙන් පසු හමුදා නිළධාරින්ගේ රැකවරණය යටතේ මිසරයට පලා යාමට සිදු විය.

## දූත මෙහෙවර

ජෙරමියා දිවැසිවරයට කැඳවීමේ කථා පුවත, ඔහු හා ස්වාමීන් වහන්සේ අතර ඇති වූ දෙබසකින් ආරම්භ වේ. යෙසායාගේ කථා පුවතේ දී මෙන් චමත්කාර දර්ශනයක් තුළ කැඳවීම නො දුන්නත්, මෙහිදි ද ස්වාමීන් වහන්සේගේ දර්ශනයක් නැතහොත් ස්වාමීන් වහන්සේ සම්මුඛ වීමක් පසුබිම් වී ඇත. 1/4 වගන්තියෙන් දිවැසිවර ව්‍යවහාරික පද මාලාවක් ඉදිරිපත් කරමින් දිවැසිවරය සඳහා කැඳවීමේ ලක්ෂණය සපුරාලන්නේ ය.

1/5 වගන්තියෙන් දිවැසිවරයට කැඳවනු ලැබීම ජෙරමියාගේ ඉරණම සේ පෙන්නුම් කෙරේ. ''නුඹ මව් කුසෙහි පිළිසිඳ ගැනීම ඇති කරන්නට ....

පෙර පටන් - මම නුඹ හඳුනාගතිමි.
උපතට පෙර - මම නුඹ කැප කළෙමි.
ජාතීන් හට - මම නුඹ පත්කළෙමි.

## හඳුනාගතිමි

යන්නට පුරාණ ගිවිසුම තුළ දැනගැනීම, සංවාසයේ යෙදිම, කැපකිරීම හා ස්ථාපිත කිරීම යන අරුත් ඉදිරිපත්වූවත් ජෙරමියාගේ කැඳවීම වඩාත් පැහැදිලි කරන්නේ කැප කිරීම හා ස්ථාපිත කිරීම මගිනි. එවැනි තත්ත්වයකට ජෙරමියාව පත් කරන්නේ මවු කුස පිළිසිඳ ගැන්මට පෙර පටන් ය. මෙය එක්තරා අන්දමකින්, නව ගිවිසුමේ පෙරමග සූදානම් කරන්නාවූ ස්නාවක ජුවාම් තුමාව, තෝරාගත්තාක් මෙන් සිදුව ඇත.

## මම නුඹ කැප කළෙමි.

මෙමගින් දැක්වෙන පුළුල් අර්ථය වන්නේ දෙවියන් වහන්සේ තමන්වහන්සේගේ කාර්යයන් වෙනුවෙන් එම සේවය සඳහා දිවැසිවරයාව තෝරා වෙන්කර, තමාට නතුකරගැනීම ය. එම කාර්යය දිව්‍යමයවූ මතයක් මත සිදුවූවක් බව පෙනේ.

## මම නුඹ පත් කළෙමි

ජෙරමියාගේ දිවැසිකාර්යය කොයි ආකාරයෙන් ද? කා හට ද? යන්න මෙමගින් අවධාරණය කෙරේ. විශේෂයෙන් මුළු ලෝකයාටම ආදිපත්‍යය, එනම් සකල ජනතාවට ම විය යුතු බව හැඟවිණ.

❖ එකල සමකාලීන ආගම්වල එක් එක් මිථ්‍යා දෙවි දේවතාවුන්ට ඒ ඒ බල ප්‍රදේශ වෙන් වී තිබුණි. එසේ ම ඒ ඒ ප්‍රදේශයේ ජාතීන් හට, එම දෙවියාගේ බලය අයත් ව තිබුණි. නමුත් දෙවියන් වහන්සේ මෙහි දි ජෙරමියාව ජාතින්ගේ දිවැසිවරයා ලෙස පත් කරමින් පෙන්නුම් කරන්නේ තමන් සතු විශ්වීය බලය, ජෙරමියාට දෙන බව ය. මෙම බලය ජෙරමියාට දුන් බව කියමින් බයිබල් කතුවරයා අවධාරණය කරනු ලැබුවේ අන් සියළු දෙවිවරුන්ගේ හා දෙවිදේවතාවන්ගේ බලය අභිබවා

දෙවියන් වහන්සේගේ ආධිපත්‍යය ක්‍රියා කරන බවත්, ඒක දේව වාදය තුළ බහු දේව වාදයට ඉඩක් නො මැති බවත් ය.

- ❖ එසේ ම සෑම දිවැසිවරයෙකුගේ ම දිවැසිකාර්යය තත්කාලීන සමාජයට ප්‍රකාශ කෙරුණි. නමුත් ජෙරමියාගේ දිවැසි වාක්‍යය මුළු විශ්වීය ජනතාවටත් එම කාලයට පමණක් නොව මතු අනාගතයටත් විය යුතු බව එමගින් පෙන්නුම් කරයි. ස්වාමීන් වහන්සේගේ තේරීමේ, කැමැත්ත කුමක් දැයි (ප්‍රකාශවුණ) වචන අසා ක්ෂණිකවම පැකිළෙමින්, මැලවෙමින්, ජෙරමියා පවසන්නේ, තමා එවැනි භාරදූර කාර්යයකට නුසුදුසු බවයි. ''අහෝ ස්වාමීන් වන දෙවියන් වහන්ස. මා ළාබාලයෙකු වන බැවින් මම කථාකරන්නට නො දනිමි. (ජෙරමියා 1/6) තමා තවමත් අන්‍යන්ට උපදෙස් දීමට තරම්, නුවණ මුහුකුරා ගිය, පෙරදිග සම්ප්‍රදායය අනුව වැඩිවියට නො පැමිණි, තරුණයෙක් බවයි ඔහු පවසන්නේ.

- ❖ මෙයට ස්වාමීන් වහන්සේගේ පිළිතුර වන්නේ ඔහුට පැවරී ඇති කාර්යය පිළිගැනීමට ජෙරමියාට දෙන ආඥාවයි. දිවැසිවරය භාරගන්නට යම් ආකාරයක බලපෑමක් කළත්, ඒ සමගම, ඔහුට ඔවුන්වහන්සේගේ (නො මසුරු) සහය සහතික කෙරේ. ''ඔවුන්ට භය නො වන්න. මන්ද නුඹ ගලවන්න. මමනුඹ සමග සිටිමි. (ජෙරමියා 1/8)

- ❖ ඒ සමගම සිය අත දිගුකොට ජෙරමියාගේ මුඛය ස්පර්ශ කළේ ය.
  දිවැසිවරය ප්‍රදානය කිරීම මෙහිදී සංකේතාත්මකව ඉදිරිපත් කරයි. අත දිගු කිරීමෙන් තම බලය ප්‍රදානය කිරීමත්, මුඛය ස්පර්ශ කිරීමෙන් තමුන් සමග ඇති සම්බන්ධතාවය ද ප්‍රකාශ කරන්නටත් ය. ඒ නිසාම තමන් තුළ ඇති ජීවය ඔහුගේ දෙතොලට පෙවීමත් පෙන්නුම් කරයි.
  එවැනි සහයක් දෙමින් දිවැසි කාර්යය කෙසේ විය යුතු ද යන්න රූපක දෙකක් (එනම් ගස හා ගෙය ) මගින් පෙන්නුම් කරයි.
  ගස - සිටුවන්නට : උදුරාදමන්නටත් (වර්ධනය කිරීම/ නැති කිරීම)
  ගෙය - ගොඩනගන්නට : හෙලා දැමීමට (සංවර්ධනය කිරීම/ නැති කර දැමීම)
  මෙමගින් දෙවියන් වහන්සේ ජෙරමියාට ද්විප්‍රකාර කාර්යය භාරයක් පවරනු ලබයි. එනම් යහපත ගොඩ නැගීමටත් අයහපත නැති කිරීමටත් ය.

- ❖ මුළු දේශයටම විරුද්ධව ඉහත දක්වූ කාර්යභාර්ය කරන්ට .... අද නුඹ සූරක්ෂිත නගරයක් ද යකඩ කුළුණක් ද පිත්තල පවුරක් ද මෙන් ශක්තිමත් කළෙමි. මන්ද මම නුඹ සමග සිටිමි යනුවෙන් පැවැසිය (ජෙරමියා 1/18-19)

- ❖ සිත් දැඩි පව්ටුන්ට, දඬුවම් සහිත විනිශ්චයත් ඒ සමගම, සිත් හැරෙන්නාට සමාව සාමය හා සෞභාග්‍යයත් ළඟා කරවීමටත්, දිවැසිවරයා, දෙවියන් වහන්සේගේ ප්‍රබල මාධ්‍යයක් වීමට ක්‍රියා කළ යුතු බවත් පෙන්වයි.

- ❖ ඒ සඳහා දිවැසිවරයාට එක්තරා අන්දමක ස්ථාවරත්වයකට පත්විය යුතුව තිබිණි. විශ්වාසයේ ස්ථිරව, කැඳවීම තහවුරු කරගන්නටත් ස්වාමීන් වහන්සේගේ වචනය තුළ උන්වහන්සේව අත්දකින්ටත්, දිවැසිවරයාට ආරාධනා කරයි. එසේ ම ජනතාව ඉදිරියේ සන්සුන්ව සිටීමේ අභියෝගය ඉදිරිපත් කරමින්, ස්වාමීන් වහන්සේ ඔහුට අනතුරු ඇඟවීමක් ද කරයි.

- ❖ දිවැසිවරයාගේ කාර්යය සමාජයේ සෑම මට්ටමක් වෙතම එල්ල කළ යුතු විය. එනම් රජවරුන්, අධිපතීන්, පූජකයන් පොදු ජනතාව හා දේශයට දිවැසි වචනය ප්‍රකාශය කිරීම ය.

  මේ නිසාම සතුරන් ඔහුට විරුද්ධව කොපමණ සටන් කළත්, ඔහුව පරාජය කරන්නට, ඔවුන්ට නො හැකි බව සමිඳාණන් වහන්සේ ඔහුව ධෛර්යමත් කරමින් සහතික කරන්නේ ය.

## එසකියෙල් දිවැසිවරයාගේ කැඳවීම

එසකියෙල් ගැන දන්නා සියළුම කරුණු එම ග්‍රන්ථය තුළින් ම මතුකර දක්වේ. ක්‍රි. පු. 597 දී බබිලෝනිය විසින් විප්‍රවාසයට ගෙන යන ලදුව එසකියෙල් එහි සිටිය දි දිවැසිවරය සඳහා, 5 වන අවුරුද්දේ එනම් ක්‍රි. පු.. 593 දී දිවැසිවරය සඳහා කැඳවනු ලැබිය. (එසකියෙල් 1/1-3) සඩොක් නැමැති ප්‍රසිද්ධ පූජක පවුලක උපත ලද එසකියෙල්, බුසිගේ පුත්‍රයා ය. බැබිලෝනියාවේ කෙබාර් ගංගාවේ මහ ගංතෙර අසල තෙල් අබිබ් හි ඔහුගේ නිවසය පිහිටියේ ය. එසකියෙල් යන්නෙහි අර්ථය වන්නේ ''දෙවියන් වහන්සේ ගලවන සේක'' හා ''දෙවියන් වහන්සේ මාගේ ගැළවීම ය.'' එසකියල් විප්‍රවාසිය දිවැසිවරයා වශයෙන් ද හඳුන්වනු ලැබේ.

## එසකියෙල් දිවැසිවරයාගේ ඓතිහාසික පසුබිම.

ක්‍රි.පු. 605 දි නෙබුකද්නසාර් රජ බැබිලෝනියේ රජකමට පත් වු පසු ජෙරුසලමේ රජ වු ජෙහොයාකිම්, අධිරාජයා වූ නෙබුකද්නසාර්ට විරුද්ධව කැරලි ගැසුවේ ය. මෙම විරුද්ධත්වයට ප්‍රතිචාරයක් වශයෙන් නෙබුකද්නසාර් විසින් ක්‍රි.පු. 598 දී ජෙරුසලමට එවන ලද හමුදා බල ඇණිය ජෙහොයොකිම්ගේ කැරැල්ල මර්ධනය කරන ලදී. එම කැරැල්ල මර්ධනයේ දි ජෙහොයාකිම් රජ මිය ගිය අතර, ඔහුගේ පුත් ජෙහොයාකින් ව ද, එසකියෙල් ඇතුළු 10,000 ක් වූ ජූදා ජනතාව ද, විප්‍රවාසය සඳහා බැබිලෝනියාවට ගෙන යන ලදි. (2 රාජාවලිය 24,25 පරිච්ඡේද) අධිරාජයා විසින් ජෙරුසලෙමේ රජකමට ජොෂියා රජුගේ තවත් පුතෙකු වු ද, ජෙහොයාකිම්ගේ සොහොයුරෙකු වු ද ශෙදකියාව පත් කරන ලදි. ශෙදකියා ද නෙබුක්ද්නසාර් අධිරාජ්‍යයාට බදු ගෙවීම පැහැර හැරිය හෙයින් ද, රජුට විරුද්ධව කැරළි ගැසු හෙයින් ද නැවතත් බබිලෝනියානු හමුදා ජෙරුසලම වටලා ක්‍රි. පු. 587 දී එය යටත් කර ගත් හ. ඒ සමඟම දේව මාලිගයත්, නගරයත් විනාශ කළේ ය.

## කර්තෘත්වය

එසකියෙල් ගැන දන්නා සියලුම කරුණු එම ග්‍රන්ථය තුළින් ම මතුකර දක්වේ. ක්‍රි.පු. 597 දී බබිලෝනියේ රජු විසින් විප්‍රවාසයට ගෙන යන ලද එසකියෙල්, බැබිලෝනියේ කෙබාර් නදී තිරයේ සිටිද්දි දිවැසිවරය සඳහා කැඳවීම ලැබුවේ ය. (එසකියෙල් 1/1-3) පූජක පවුලකට අයත් ඔහු (එසකියෙල් 1/3) විවාහකයෙකි. (එසකියෙල් 24/15-18) දේව මාලිගයෙන් ද, එහි පුද පූජා වලින් ද දේව නමස්කාරයෙන් හා එහි වත්පිළිවෙත් වලින් ද බැහැර වු බැබිලෝනියාවේ සිටි විප්‍රවාසිගත වූවන්ට සේවය කරන්නට එසකියෙල්ව කැඳවනු ලැබී ය. ඔහුගේ පණිවුඩය බොහෝ දුරට සම්බන්ධ වූයේ දේව මාළිගය හා එහි උත්සව වලට ය. (8-11) (40-18) පූජක ආභාෂය නිසා ව්‍යවස්ථාව හා වත් පිළිවෙත් පිළිබඳ ලත් පුළුල් දැනුම හා අවබෝධය ද, තීක්ෂණ බුද්ධිය ද නිසා එකල ජන සමාජයේ විවාදයට භාජනවූ ප්‍රධාන ප්‍රශ්න සැලකිල්ලට ගෙන, කාලීන හා අවස්ථාවෝචිත විසඳුම් රූපක හා සංකේත (එසකියෙල් 12,15) මගින් ජනතාවට පැහැදිලි කිරීමේ දක්ෂතාවයක් එසකියල්ට සතුවු බව ග්‍රන්ථය තුළින් පැහැදිළි කර දෙන්නේ ය.

## එසකියෙල්ට දූත මෙහෙවර පැවරීම (එසකියෙල් 1/1- 3/5)

❖ 1/1-26 - ජීවමාන සත්ත්වයන් සතර දෙනාගේ දර්ශනය
❖ 2/1-7 - දෙවියන් වහන්සේ දර්ශනය
❖ 2/8-3/15- දිවැසිවරයට කැඳවීම හා දිවැසිවරය භාරදීම

## I. කොටස ජීවමාන සත්ත්වයන් සතර දෙනාගේ දර්ශනය එසකියෙල් 1/1-5

මෙම කොටසින් ජීවමාන සත්ත්වයන් පිළිබඳ දර්ශනය ඉදිරිපත් කරයි. මෙය එළිදරව් සාහිත්‍යයට නෑකම් කියන බව පෙනේ. ජෙහොයාකින්ගේ විප්‍රවාසයට අවුරුදු 5කට පසු (2 රාජාවලිය 24/10-16: 2 වංශාවලිය 36/ 9-10), බැබිලෝනියාවේ කෙබාර් හෙවත් යුප්‍රටීස් නම් ගංගාවේ අතු පතර තෙරක සිටින විට දී එසකියෙල් කැඳවීම ලැබී ය. මෙම කාලයේ දී සමිඳාණන් වහන්සේගේ ආත්මානුභාවය ඔහු තුළ ක්‍රියාකාරි වු බව පෙනේ. (එසකියෙල් 3/22: 33/22: 37'/1: 40/1) මෙය හෙබ්‍රෙව් බසින් යද් - යාවේ හෙවත් සමිඳාණන්ගේ හස්තය ලෙසින් දක්වයි.

එසකියෙල් 1/4 දෙවියන් වහන්සේ ජීවමාන ප්‍රකාශ වීම දක්වන මාධ්‍ය මෙම වගන්තියෙන් පැහැදිළි කෙරේ. ''මා බැලූ විට චණ්ඩමාරුතයක් උතුරෙන් එනු මම දිටිමි. ඒ සමග දීප්තියෙන් වටවූ මහා වළා පටළයක් ..... ගින්නක් ද වූයේ ය.

**චණ්ඩමාරුතය** :- ස්වභාවිකව මෙම ප්‍රදේශයේ වැලි මාරුත දකිය හැක. චණ්ඩ වූ මෙවැනි මාරුතයක් ගැන කියමින්, දෙවියන් වහන්සේගේ අභිරහස්‍යම සහ බියජනක වැඩ සිටීම පෙන්නුම් කරයි.

**ගින්න** :- එය (1/27) වගන්තියේ සඳහන් පරිදි දෙවියන් වහන්සේගේ මහිමාන්විත වැඩ සිටීම ඉඟි කරයි. ගින්න පූරාණ ගිවිසුම තුළ දෙවියන් වහන්සේගේ ආශ්චර්යමත් වැඩ සිටීම සංකේතවත් කරයි. (නික්මයාම 13/12-22, 19/18: දානියෙල් 7/7-10)

**වළාපටලය** :- දෙවියන් වහන්සේගේ අභිරහස්‍යයම වැඩ සිටීම පෙන්නුම් කරයි. සතුන්ගේ පෙනුම ඇත සතර දෙනෙක් ඒ මැද සිටියහ. එසකියෙල් 10 පරිච්ඡේදය අනුව, උන් කෙරුබ්වරුන් ලෙස හඳුන්වා දී ඇත. අසිරියානුවන් අතර කෙරුබ් නම් ලත්, රජ මාළිගා හා දේවාල මුරගල්වල දක්නට ලැබෙන ජීවින්ගේ හැඩහුරුකම් මොවුන්ට ද තිබෙන බව පෙනේ. (එළිදරව්ව 4/7-8) විස්තරය අනුව මෙම සත්ත්වයන් සතර දෙනා, දෙවියන් වහන්සේගේ සිංහාසනය දරා සිටින්නන් හෝ ගෙනයන්නන් බව පෙනේ.

1/7-18 මෙම කොටසින් ජීවමාන සත්ත්වයන් සතර දෙනෙකු ඉදිරිපත් කරමින් මිනිස් ගුණාංග සහ සත්ත්ව විස්තර සංකලනයක් අපට ගෙන හැර පායි. දෙවියන් වහන්සේ තුළ තිබෙන්නාවූ සුලක්ෂණයන් මෙම සත්ත්වයන් සතර දෙනා මගින් පෙන්නුම් කෙරේ.

- ❖ මිනිස් රූපය - දෙවියන් වහන්සේගේ සර්ව ඥානය
- ❖ සිංහ රූපය - දෙවියන් වහන්සේගේ රාජකියත්වය
- ❖ ගව රූපය - දෙවියන් වහන්සේගේ ශක්තිය
- ❖ රාජාලි රූපය - දෙවියන් වහන්සේගේ වේගය

- මෙම සත්ත්වයන්ගේ මුහුණු, සතර අතට පැත්තට ද, එකිනෙකට සම්බන්ධව ද තිබීමෙන් සර්ව බලය පෙන්නුම් කෙරේ.

- පියාපත් යට, අත්තටු තිබීමෙන් අධි ස්වාභාවික බලය හඟවයි.

- ජීවමාන සත්ත්වයන් සතර දෙනා චක්‍ර 4කට සම්බන්ධ කර ඇත. චක්‍ර 4ට සමාන්තර සංකේතයන් ඇතිබව පෙනේ. චක්‍රයේ සංකේතය වනාහි දෙවියන් වහන්සේගේ ක්‍රියාකාරිත්වය යි.

- දෙවනුව මෙම චක්‍ර පුරා ඇස් තිබීමෙන්, දැනුමේ සංකේතය ඉදිරියට ගෙන එයි. එමගින් සර්ව ඥානය අදහස් කෙරේ.
  1/22-25
- මෙම කොටසින් දේව අනාවරණයට සුදානම දක්වයි. ඉහළ අහස දෙවියන් වහන්සේගේ මහිමාන්විත වැඩ සිටීම පෙන්නුම් කරයි.

- ජලධාරා ඝෝෂාව හා යුධ කඳවුරේ ඝෝෂාව දෙවියන් වහන්සේගේ සර්ව බලපරාක්‍රමය පිළිබිඹු කරයි. දේව ප්‍රකාශනයක ආරම්භය ලෙස හඬක් ඇසීම මගින් ස්ව අනාවරණයට පසුබිම සකස් වෙන බව ඉඟි කරයි.

(එසකියෙල් 1/26-28) ස්වාමීන් වහන්සේගේ බලවන්ත, මහිමාන්විත, ප්‍රකාශවීම සඳහා පසුබිම සකස් වීම මෙම කොටසින් පැහැදිළි වේ. එසේම දේව ප්‍රකාශවීම වක්‍රාකාරව ඉඟි කෙරේ.

- දෙවියන් වහන්සේගේ පරම උත්තරීතර බව පෙන්නුම් කෙරෙන්නේ (නික්මයාම 24/9-11) දක්වා කොටසින් දැක්වෙන ආකාරයට නීල මාණික්‍යය පෙනිම ඇති සිංහාසනය මගිනි.

- දෙවනුව දෙවියන් වහන්සේගේ ස්වරූපය ගින්න හා සම්බන්ධ කර ඉදිරිපත් කරයි. මෙය දෙවියන් වහන්සේගේ මහිමාන්විත වැඩ සිටීම ප්‍රබලව දක්වයි.
- මෙම කොටසින් දිවැසිවර කැඳවීමට මහත් දායකත්වයක් දෙන අතර, දේදුන්න මගින් දේව කාරුණාවත්, දේව මහිමයත් පෙන්නුම් කරයි. එම නිසාම දිවැසිවරයා තමාට ලැබෙන කැඳවීමට, මුහුණින් තලා වැටීමෙන් තම ප්‍රතිචාරය දක්වයි.

# II. කොටස - දෙවියන් වහන්සේගේ දර්ශනය එසකියෙල් 2/1-7

## 2.2 දේවාත්මානුභාවය මා තුළට ඇතුල් වී මා නැගිටුවා සිටෙව්වේ ය.

පුරාණ ගිවිසුමේ දී දේවාත්මානුභාවය දිවැසිවරය හා බැඳී පැවැතිණි. මෙය දේව ක්‍රියාකාරිත්වය ඉඟි කරයි. මේ දේව ක්‍රියාකාරිත්වය පූරාණ ගිවිසුමේ දි පැවති බව (ගණන් කථාව 1/ 25-30) (1 සාමුවෙල් 19/20-24) (ජොවෙල් 2/28-29) මගින් පෙන්නුම් කෙරේ.

## 2/3-4 මනුෂ්‍ය පුත්‍රය මට විරුද්ධව කැරලි ගැසූ .... වෙත මම නුඹ යවමි.

මෙමගින් දිවැසිවරයාව යවනු ලබන, දූත කාර්යය භාරදීමේ අදහසක් ඉදිරිපත් කරන අතර එහි බැරෑරුම් ව ද පෙන්නුම් කරයි.

## 2/5-7 ඔවුන් සවන් නො දුන්නත්

මෙම යෙදුම 5,7 වගන්තිවලද දෙවරක්ම සඳහන් වේ. එමගින් දිවැසිවරයාට දේව පණිවුඩය ප්‍රකාශ කිරීමේ දී ලැබෙන අසුබවාදී ප්‍රතිචාරය ගැන පැහැදිළිව ම පෙන්නුම් කෙරේ. මේ නිසා දෙවියන් වහන්සේ එම මුරණ්ඩු ජනතාව මට්ටු කිරීමට ක්‍රියාකාරි වන බව දක්විය.

පළමුව උන්වහන්සේ ඔවුන්ට නීතිය දෙමින්, දේව අභිමතයට එකඟව ජීවත් වීමට මඟ පෙන්වූවත්, ජනතාව අයහපතට ම යොමු වු හෙයින් දෙවනුව දිවැසිවරුන් එවා, පැමිණෙන්නට තිබෙන දැඩි දණ්ඩනය ගැන දැනුම් දුන් සේක. දිවැසිවරයාව ද ජනතාව විසින් ප්‍රතික්ෂේප කරන විට උන්වහන්සේ දණ්ඩනයේ කසය (PUNISH ROD) හෙබ්‍රෙව් බසින් (MUSAR) භාවිතා කරන බවට ඉඟි කරන සේක.

## 2/8-10

මෙම කොටසින් විශේෂයෙන් 9 වන වගන්තියෙන් එසකියෙල්ට දිවැසිවරය දානය කිරීම සංකේතාත්මකව ඉදිරිපත් කෙරේ. ඒ සඳහා දෙවිඳුන් විසින් දෙසු ලබන අකුලන ලද පොතක් අනුභව කිරීමට නියෝග කරයි. මෙම අකුලන ලද පොතෙහි පිටත හා ඇතුළත වචන ලියා තිබුණත් සාමාන්‍ය හැකුළුම් පතක වචන ඇත්තේ ඇතුළත පමණි. මෙසේ අස්වභාවික අන්දමින් වචන තිබීමෙන් එය දේව අනාවරණයෙන් පිරී පැවතී බව පෙන්නුම් කරයි.

**3/1-3** මෙම කොටසින් පෙන්නුම් කරනු ලබන්නේ , සංකේතාත්මකව හකුලන ලද ලියවිල්ල අනුභව කිරීමට දුන් ඇරයුම මත දිවැසිවරය ප්‍රදානය කරනු ලැබීමයි. මේ ආකාරයෙන් ම යෙසායාගේ තොල් ද, ජෙරමියාගේ තොල් ද පවිත්‍ර කර ස්පර්ශ කරන ලදී.

**3/4-7** එසකියෙකල්ව දූත මෙහෙය සඳහා යවනු ලබන්නේ අන් භාෂාවක් කථාකරන සෙනඟක් වෙත නොව, විප්‍රවාසගත වූ ඊශ්‍රායෙල් ජනතාව වෙත ය. ඊශ්‍රායෙල් ජනතාව, විප්‍රවාසය නිසා කෙතරම් මුරණ්ඩු වී දෙවිඳුන් අමතක කර, උන්වහන්සේට සවන් දෙන්නට අකමැත්තක් දැක්වූයේ ද, ඒ ප්‍රතිචාරයම දිවැසිවරයා වෙත දක්වා ඔහුට ද ඇහුම්කන් නො දෙන බව පැහැදිලි කරයි. මෙය ඊශ්‍රායෙලුන්ගේ අවිශ්වාසී ජීවිතය නිසා ඇතිවන තත්ත්වයකි.

මෙසේ ඊශ්‍රායෙල් ජනතාව, තද සිත් ඇති, අවිශ්වාසවන්තවූ,දෙවිඳුන්ට සවන් දීමට නො කැමති පිරිසක් වී ඇත්තේ, ඔවුන් තුළ පැන නගින එක්තරා ප්‍රශ්නයක් නිසා විය හැක. එනම් උත්පත්ති 15-16 දි ආදී පියවරුන්ට පොරොන්දු වූ ලෙස කිරෙන් පැණියෙන් ඉතිරෙන දේශයක් දී තමන් වහන්සේගේ හස්තය ඔවුන් මත බලය පාමින් ඔවුන් සතපා, මගපෙන්න්නට දෙවියන් වහන්සේ දුන් පොරොන්දුවට කුමක් වී ඇත් ද? කිරියෙන් පැම්ණියෙන් ඉතිරෙන අපගේ ම දේශය වෙනුවට, විදේශිය රටක වහලුන්ගේ තත්ත්වයට අප පත් ව සිටින්නේ ඇයි?, මෙවැනි ප්‍රශ්න නිසා ම, එකළ තමන් ජීවත් වූ දේශයෙහි පැවති ඇදහිල්ල තුළ, බැබිලෝනියේ දෙවිවරුන්, යාවේ දෙවියන් වහන්සේගේ බලය නැතිකර ඇත් ද? යන්න ගැන වැටහීමක් සැකයක් ඇති වී තිබුණු නිසා විය හැක.

**3/8-9** මම නුඹේ අධිෂ්ඨානය, ගිනි ගලට වඩා තද වූ, වෛදූර්ය මෙන් ශක්තිමත් කරන්නෙමි. දිවැසිවර කැඳවීමේ ලක්ෂණයක් මෙමගින් පෙන්නුම් කරේ. එනම් දෙවිඳාණන් දිවැසිවරයා ශක්තිමත් කරන බවේ, ඔහුගේ දිවැසිකාර්යයේ දී පිහිට වන බවේ ප්‍රතිඥාවක් මෙමගින් දෙනු ලබයි.

**3/12-14** මෙම කොටසින් දේවාත්මානුභාවයේ ක්‍රියාකාරිත්වය, එසකියෙල්ව ඔහුගේ දූත සේවාව වෙත ඔසවාගෙන යනු ලබන බව කියන්නේ, ඔහු තුළ අන් දිවැසිවර කැඳවීම්වලදී මෙන්ම, බලවත් අකමැත්ත ඇති වූ නිසා ය. මෙය දුකින් හා උදහසින් පිරුණු සිතකින් සිටි බව සඳහන් කරමින් පෙන්වයි. ස්වාමීන් වහන්සේගේ ආත්මානුභාවය කොපමණ බලවත්ව ඔහු මත පැමිණුනාද යන්න සත් දවසක් ඔහු කෙබාර් ගඟේ බටහිර ඉවුරේ පිහිටි ''තෙල් අබිබ්හි'' හිරාන්තව සිටි බව කියැවේ.

# දිවැසිවර හොසියාගේ කැඳවීම

## ඓතිහාසික කැඳවීම

උතුරු රාජ්‍යයක් වූ ඊශ්‍රායෙලයේ වැසියෙකු වූ හොසියා දිවැසිවරයා ආමොස්ගේ සමකාලීනයෙකි. ක්‍රි. පූ. 8 වන සියවසේ දශක කිහිපයක්ම, උතුරු රාජ්‍යය තුළ ඔහු දිවැසි කාර්යයෙහි නියැලී සිටියේ ය. එකල දෙවන ජෙරබෝවම් ඊශ්‍රායෙලය හෙවත් උතුරු රාජ්‍යයේ ද, උශ්ශියා, ජෝතම්, ආහාස්, හෙසකියා යන රජවරුන් දකුණු රාජ්‍යය හෙවත් ජුදා රාජ්‍යය ද පාලනය කළ හ.
ජොබොවම්ගේ රාජ්‍යය සමයේ දී (ක්‍රි. පූ. 782- 745) ඊශ්‍රායෙලයේ ආර්ථිකය හා සමාජීය ප්‍රගතියක් ඇති විය. එහෙත් ඉන් පසුව පැමිණි සෙකරියා, ෂල්ලුම්, මෙනෙහෙම්, පෙකහියා, පෙකා හා හොසියා නැමැති රජුන් සය දෙනාගේ පාලනය ප්‍රචණ්ඩත්වයෙන් හා වියවුලින් පිරුණු රාජ්‍යය ක්‍රම ක්‍රමයෙන් පිරිහීමකට පත් කළෝ ය. මේ නිසාම හොසියාගේ සමාජීය, දේශපාලනික හා ආගමික පසුබිම වඩාත් ප්‍රබලව දිස් වේ.
ඒ සමගම සිරියා ඒප්‍රායිම් යුද්ධයත්, අසිරියානු අධිරාජයාවූ තෙවන තිග්ලත් ප්ලෙසර් රජුට කප්පන් ගෙවීමත් නිසා, ඊශ්‍රායෙල් ඉතිහාසයේ අර්බුදකාරී තත්ත්වය තවත් වැඩි විය. මෙවන් සමාජීය පසුතලයක් තුළ දෙවි සමිඳුන්ට පිටුපා යමින් ඊශ්‍රායෙල් ජනතාව හැසුරුණු ආකාරය හොසියා දිවැසිවරයාගේ මෙහෙයයට ඉඩ ප්‍රස්ථාව සැලසී ය.

## කතෘත්වය

මෙම ග්‍රන්ථය හොසියාගේ පෞද්ගලික ජීවිතය ගැන සුළු වශයෙන් විස්තර කරයි. ඔහු බෙයරිගේ පුත්‍රයෙකු වූ අතර, ඔහුගේ භාර්යාව ගොමෙර් නම් විය. 1-3 පරිච්ඡේද තුළින් ඔහුගේ විවාහය පිළිබඳව විස්තර කෙරෙන අතර, සමහර විශාරදයන් පවසන්නේ මෙය ඇත්ත වශයෙන්ම විවාහය පිළිබඳ කෙරෙන විස්තරයක් ද නැතහොත් පණිවුඩයක් දීමට ගෙතුන උපමාවක් ද යනුවෙනි. බොහෝ

විශාරදයන් පවසන්නේ හොසියා සාමාන්‍ය ස්ත්‍රීයක් වූ ගෝමෙර් විවාහ කරගත් අතර පසුව ඇය ඔහුට අවිශ්වාසවන්ත වෙමින් අන් අයෙකු හා සරණ ගිය බව ය.

ප්‍රධාන දිවැසිවරුන්ගේ කැඳවීම ලෙස දර්ශනයක් තුළින් හොසියා හා ආමොස් කැඳවූ බවක් නො පෙනුණත් දිවැසිවර ව්‍යවහාරික පදයක් වන ''සමිඳාණන් වහන්සේ දුන් පණිවුඩය මෙසේ ය'' යන්න තුළින් ස්වාමීන් වහන්සේගේ මෙහෙය වීම, හොසියාට හා ආමොස්ට ලැබී තිබෙන බව පැහැදිලි කරන්නේ ය.

### හොසියාගේ පොතේ පරිච්ඡේද පෙළ ගැස්ම

I. විවාහය තුළ වූ හොසියාගේ ආදරයට සමාන්තර වූ, දෙවිඳාණන්ගේ අපිරිමිත ආදරයට ඊශ්‍රායෙල් ජනතාව පිටුපා යාම- හොසියා 1/-3/5
II. ඊශ්‍රායෙල් ජනතාවට එරෙහි වූ දේව විනිශ්චය - හොසියා 4/1-13/16
III. පශ්චාත්තාපයේ සහ ගැලවීමේ පණිවුඩය- හොසියා 14/3-9

### හොසියාගේ පණිවුඩය

- යාවේ දෙවියන් වහන්සේ සිය ජනතාවට දක්වන අසිමීත ප්‍රේමය මෙම ග්‍රන්ථයේ මූලික තේමාවයි.
- සමාවෙන් හා අනුකම්පාවෙන් පිරුනු දෙවියන් වහන්සේගේ ප්‍රේමය අර්ථවත් වන්නේ ගිවිසුම සම්බන්ධතාවය මගින් ය. එනම් යාවේ දෙවියන් වහන්සේ හා ජනතාව අතර ඇතිවන ගිවිසුම, ස්ත්‍රියක හා පුරුෂයකු අතර ඇති වන විවාහයක් දක්වෙන රූපකය තුළින් ප්‍රකාශ වේ.
- මෙහි දී මතුකර දක්වන මිණුම් දණ්ඩ වනුයේ, ඉතිහාසය තුළ ජනතාවගේ හැසිරීමට දෙවිඳුන් දක්වන ඉමහත් ප්‍රේමය යි. එනම් දෙවිඳු ප්‍රේමයට පිටුපා යමින් බාල්, අෂ්ටාඩ් වැනි දෙවි දේවතාවුන් පසුපස යෑම ද්‍රෝහිකමක් වන අතර, එම වැරදි දේව දණ්ඩනයට හා උදහසට ලක්වන කරුණක් වන බව හොසියා පෙන්වා දෙයි.
- දෙවි සමිඳාණන්ගේ ප්‍රේමයට දෝහි වීම, නැතහොත් අවිශ්වාසවන්ත වීම, වෛශ්‍යා වෘත්තියට සමාන කර දක්වීමෙන් පමණක් නොසැහී, තමාගේ ජීවිත යථාර්තය තුළින් ද ප්‍රබල ලෙස දිවැසිවරයා එය පෙන්වා දෙයි.
- එහෙත් විනිශ්චය දේව අරමුණ නො වේ. ''නැවත හැරීයාම'' හා ''සුවය ලැබීම'' වැනි හොසියාට ආවේනික වදන් වලින් සිත් හැරීම ඇති වී එමගින් ජනතාවට ලැබෙන හෝ පිරිනැමෙන නව ජීවිතය පිළිබඳව ඉඟියක් ඉදිරිපත් කරයි.
- ප්‍රේමය මුල් ජීවිතයට හැරීයාම, කාන්තාරයේ දී ඊශ්‍රායෙල් ජනතාව අත්දුටු අත්දැකීමට පිවිසීමකි. එමනිසා දෙවිඳාණන් ඔවුන් පිළිගැනීමට නිරන්තරයෙන් ම සූදානම් ව සිටින බව හොසියා පෙන්වා දෙයි.

**හොසියා 1/1-3/5 -**

හොසියා යන්නෙන් පැහැදිලි කෙරෙන්නේ ''සමිඳාණන් වහන්සේ ඔබව මුදා ගන්නා සේක.'' ''සමිඳාණන් වහන්සේ ඔබේ සහයට වඩින සේක., යන අරුතයි.

**1/2** හොසියාගේ කැඳවීමේ දී සමිදාණන් වහන්සේ වෙසඟනක විවාහ කරගන්නට යයි හොසියාට අණ කරන සේක. මෙහි දී වෙසඟනක් යන වචනයට අරුත් දෙකක් දෙනු ලැබේ.

I. සමහර විශාරදයන් පවසන්නේ, ස්ත්‍රීයක් වෛශ්‍යා වෘත්තියෙහි යෙදෙමින් පුරුෂයන් ගණනාවක් සමග සංවාසයේ යෙදීම. එම වචනයේ අරුත වන බවයි.
II. තවත් සමහරුන්ගේ මතය වන්නේ පැරණි කානානීය දේවාලවල පූජකවරුන්ට සේවය කළ ආගමික වෛශ්‍යා සේවාවේ යෙදුන තැනැත්තියක් වන බවයි. කෙසේ වෙතත් කතුවරයා මෙම යෙදුම තුළින් පෙන්වන්නේ, යාවේ දෙවියන් වහන්සේගේ ප්‍රේමයට පිටුපාමින්, බාල් අෂ්ටාඩ් වැනි සශ්‍රිකත්වයේ දෙවිවරුන් ලෙස මිථ්‍යා ඇදහිලි තුළ හඳුන්වාදෙන, දේවතාවන් පසුපස ඊශ්‍රායෙල් ජනතාවගේ අවිශ්වසවන්තකම, වෛශ්‍යාවකගේ ක්‍රියා කලාපය හා සමාන බවයි.

- විවාහය නැමැති සංකල්පය තුළ ආගමික දැක්මක් ඉදිරිපත් කරයි. එනම් යාවේ දෙවි සමිඳුන් හා ජනතාව අතර ඇති ගිවිසුම් සබඳතාවයි.

**1/3-9** වගන්ති වලින් විස්තර වන්නේ ගොමේර් වෛශ්‍යාකම නිසා ලැබූ දරුවන්ගේ නාමයන් ය. දෙවියන් වහන්සේ විසින් හොසියා ලවා මේ දරුවන්ට නම් තැබූයේ ඊශ්‍රායෙල් ජනතාවගේ ජීවිත මගින් දුන් අර්ථයන්ට සමගාමීවය.

❖ පළමු දරුවා ජෙශ්‍රයෙල් විය. - ජෙශ්‍රයෙල් යන්නෙන් ''දෙවියන් වහන්සේ වපුරණ සේක''යන අර්ථය ගෙන දුනි. ජෙශ්‍රයෙල් යනු, ගලීලයේ සමාරියාවත් ජොර්දාන් නදියත් අතර වූ මිටියාවතකි. (2 රාජාවලිය 9-10) අනුව ජෙසබෙල්ගේ ආධිපත්‍යයට විරුද්ධව දණ්ඩණය ක්‍රියාත්මක වූයේ මෙහි දී ය. 1/5 වගන්තියෙන් පැහැදිලි කෙරෙන්නේ දෙවියන් වහන්සේගේ ගිවිසුමට අපක්ෂපාත වන්නාට ලැබෙන ඉරණමයි. එනම් ඔවුන්ගේ බලය බිඳ දැමීමයි. එමගින් හඟවනු ලැබූයේ ඊශ්‍රායෙල් හි පාපයේ බරපතල කමයි.

❖ දෙවැනි දරුවා ''ලෝරුහාමා'' හෙවත් ''ඈට අනුකම්පා නො ලද්දී ය'' යන අරුත ඇතිව නම් කරන ලදී. - එයට හේතුව දක්වමින් සමිඳාණන් ජුදා දේශයට අනුකම්පා කොට ගැලවීම උදා කළත් ඊශ්‍රායෙල් වංශයට කරුණාව දක්වන්නේවත්, කමා කරන්නේවත් නැතිබව කියාපායි. 'ඈ' යනුවෙන් දියණියකට වඩා, ඊශ්‍රායෙල් දේශය හඟවනු ලබයි. එනම් ඊශ්‍රායෙල්හි ඇතිවන දැඩි සාගතය හෝ දීර්ඝ කාලීනව විඳින්නට වන පීඩාවන් ද සම්බන්ධව දෙවියන් වහන්සේ විසින් දෙනු ලබන දඬුවම පිළිබඳ ආකල්පය පැහැදිළි කරයි.

❖ තෙවැනි දරුවා 'ලෝ අම්මිය' එහි අර්ථය වූයේ 'නුඹලා මාගේ සෙනඟ නො වන්නහුය: මමත් නුඹලාගේ දෙවියන් වහන්සේ නො වන්නෙමි'' මෙමගින් පැහැදිලි කෙරෙනුයේ යාවේ දෙවියන් වහන්සේත් ඊශ්‍රායෙල් ජනතාවත් අතර වූ ගිවිසුම (නික්මයාම 6/6-7, ලෙවී 26/12: ද්විතීය නීති සංග්‍රහය 26/18: ජෙරමියා 31/33) නිමාවට පත්වන බව ය. ''මම ද..... දෙවියන් වහන්සේ නො වෙමි. හෙබ්‍රෙව් අරුත අනුව ''මම යාවේ දෙවියන් වහන්සේ නො වෙමි'' මෙය (නික්මයාම 3/14) මෝසෙස්ට අනාවරණය වෙමින් දුන් හඳුන්වා දීම ආපස්සට හැරවීමකි. මෙමගින් පැහැදිලි කරන්නේ ඊශ්‍රායෙල් ජනතාව ගිවිසුම කෙරෙහි දක්වන ඍණාත්මක ප්‍රතිචාරය නිසා දෙවියන් වහන්සේ ද තව දුරටත් ඔවුන්ගේ දෙවියන් වහන්සේ වශයෙන් ඔවුන්ට අනාවරණය නො වන බව යි.

ඊශ්‍රායෙල් ජනතාව ගිවිසුමේ ජීවිතයට පිටුපා යාම නිසා උදාවූ, ඔවුන් හා දෙවියන් වහන්සේ අතර වූ සම්බන්ධතාවයේ පරිහානිය මෙමගින් ප්‍රබලව දැක් වේ.

දරුවන්ගේ නාමයන් තුළ එවැනි අදහසක් ඉදිරියට ගෙන ආවත් 1/10 වගන්තියෙන් ''එහෙත් ඊශ්‍රායෙල් ජනයා මුහුදේ වැලි මෙන් ........දරුවො යයි කියන දවස පැමිණෙන්නේ ය. මෙහිදී ඊශ්‍රායෙල් ජනයා වශයෙන් හඳුන්වන්නේ සීනයි ගිවිසුමට බැඳුන එහෙත් රාජ්‍යයන් දෙකඩ වීම නිසා දකුණු ජුදෙයා ප්‍රදේශයේත් උතුරු ඊශ්‍රායෙල් ප්‍රදේශයේත් විසූ සෙනඟට ය.

- ජනගහණයේ අසම සම වර්ධනය මුහුදේ වැලි මෙන් යන උපමානාත්මක යෙදුමෙන් පෙන්වා දෙමින් ආබ්‍රහම් සමග වූ ගිවිසුම ඉදිරියට ගෙන එයි. (උත්පත්ති 15/5, උත්පත්ති 22/17, උත්පත්ති 32/12)

2/1-3 වගන්ති වලින් දැක්වෙන්නේ හොසියාගේ දරුවන් තිදෙනාගේ නාමයන් මගින් දුන්නා වූ විරුද්ධ අර්ථයන් වෙනුවට ධනාත්මක අර්ථයන් ඉදිරිපත් කිරීමයි. ජෙශ්‍රයෙල්ට සෞභාග්‍යයක් උදා වීම මගින් නැවත දේව සබඳතාවය ගොඩ නැගෙන බවක් ඉඟි කරයි. ආබ්‍රහම් හට පොරොන්දු වූ කිරියෙන් පැණියෙන් සමෘධිමත් පොරොන්දු දේශය ගැන නැවත මතකය අළුත් කරයි.

'රුහාමා'' යනු අනුකම්පාව ලැබීමයි. ''අම්මි'' යනු නුඹලා මාගේ සෙනඟය යන අදහස ගෙන එයි. මෙමගින් නැවත අළුත් වන බවක් පැහැදිලි කරයි.

මෙසේ තමන් වරින් වර හැරී යන ගෝමර්ව භාරගනිමින් ඉවසිලිවන්ත සැමියෙකුගේ ක්‍රියාකාලාපය පෙන්වන හොසියා, තම ජීවිත යථාර්තය තුළින් අන් දෙවිවරුන් පසුපස යන දේව

ජනතාව කෙරෙහි දෙවියන් වහන්සේ ඉවසිලිවන්තව හා කරුණාවන්තව ක්‍රියා කරමින් ගිවිසුම් සම්බන්ධතාවය පවත්වාගෙන යන ස්වාමියෙකු බව පෙන්නුම් කරයි.

## දිවැසිවර ආමොස් කැඳවීම

ආමොස් වනාහි තෙකෝවා ගම්වැසි එඬේරුන්ගෙන් කෙනෙකි. ආමොස් ජීවත් වූයේ ක්‍රි.පූ. 8 වන සියවසේ දී පමණ ය. එනම් විප්‍රවාසයටට පෙර ය. ජෙරුසලෙමේ සිට කිලෝ මීටර් දහ අටක් පමණ දකුණින් පිහිටි ග්‍රාමකයක උපත ලැබීය. හෙතෙම වෘත්තියෙන් එඬේරෙකු මෙන්ම අත්තික්කා වගාවට සම්බන්ධවූ ගොවියෙකු වූ බව ග්‍රන්ථ තුළින් හෙළි වේ. ඔහු ජනවන්දනාව ආශ්‍රිතව දිවැසිවරයා ද විය හැකි බවට අදහස් පළ කරයි.

ආමොස්ගේ පොත ඊශ්‍රායෙල් හි සමකාලීන ඊශ්‍රායෙල් ජන සමාජයේ පැහැදිලි චිත්‍රයක් ඉදිරිපත් කරයි. ගොඩනැගි ඇති පීඩිත පන්තීයේ පිරමීඩය තුළ පංති අරගලය නිසා ඇතිවන තදබල ප්‍රතිඵල එනම් ධනවතුන්ගේ ගොදුරු බවට අසාධාරණත්වයට දුප්පතුන් හසුවන පැගෙන ආකාරය පෙන්වා දෙයි. මෙම සමාජීය වරදට මූලික හේතුව වන්නේ ආගමික ජීවිතයේ විනාශය හා පරිහානිය බව මෙම පොතින් මනාව පැහැදිළි කරයි. දෙවි සමිඳාණන් හා ඊශ්‍රායෙල් අතර වු ගිවිසුමේ මුල් සැලසුම මගින් කිසිදු පංති භේදයකට ඉඩක් නො දෙන ලදී. යාවේ දෙවිඳාණන් සමග ඇති ගිවිසුම තුළ එකම දෙවියන් කෙරෙහි ඇති විශ්වාසය ඊශ්‍රායෙලුන් අතර ඇති සහෝදරත්වයේ සංකල්ප ගොඩනගයි. එම නිසා ගිවිසුම් වගකීම තුළ සමාජ සාධාරණත්වය අත්‍යාවශ්‍ය කරුණක් වන්නේ ය.

මෙවන් පසුබිමක් ඇතිව ආමොස්ගේ මූලික අවධානය යොමුවන්නේ සමාජ පිළිවෙල හෝ සමාජ ක්‍රමය වෙත ය. එකල සමාජයේ පැවැති පාපය ගැන දැඩි පිළිකුළකින් හා විරෝධතාවයකින් ආමොස් කථා කරන්නේ ය. මෙම බලවත් වාග් ප්‍රහාරය නිසා ම එවැනි වැරදි ගැන නිර්දය ලෙස විවේචනය කරමින් පහර ගසන නිසා ම ඔහුව (ආමොස්ව) ''සමාජ සාධාරණත්වයේ දිවැසිවරයා'' ලෙස හඳුන්වනු ලබන්නේ ය.

සමාජ සාධාරණත්වය කෙරෙහි, සදාචාරාත්මක බවින් තොර විම තුළ කෙරෙන වන්දනාවට, දෙවියන් වහන්සේ ඉදිරියේ කිසිදු වටිනාකමක් නො මැති බව පෙන්වා දෙන ආමොස් දිවැසිවරයා නව ගිවිසුමේ ස්නාවක ජුවාම් තුමා මෙන් සැබෑ සිත් හැරීමකට ජනතාවට ආරාධනා කරයි. ඊශ්‍රායෙලුන් දෙවි සමිඳුන්ගේ අණට කීකරු වී එතුමන්ගේ ආඥා පිළිපැදීම මගින් ඔවුන් ගැලවෙන බවත්, එසේත් නැතහොත් ''ස්වාමීන් වහන්සේගේ දවස'' තුළ විනිශ්චයට පත් කරන බවත් අවධාරණය කරයි. මේ අනුව දෙවිඳුන්ගේ විනිශ්චය ක්‍රියා කෙරෙන බලවත් වු අසිරියානු ආක්‍රමණය සඳහා ඊශ්‍රායෙල් ජනතාව, සූදානම් කළේ ය.

### ආමොස්ගේ පොත තුළ ඊශ්‍රායෙල් හි දෙවි සමිඳාණෝ

- සාධාරණත්වයේ දෙවිඳාණෝ ය.
- ජනතාවගේ දෙවිඳාණෝ ය.
- ඉතිහාසයේ දෙවිඳාණෝ ය.

### ඓතිහාසික පසුබිම

ආමොස්ගේ දිවැසිවර සේවාව ක්‍රි. පූ. 760 දී පමණ ආරම්භ විණි යැයි සිතිය හැක. එකල උතුරු රාජ්‍යයවූ ඊශ්‍රායෙලයේ දෙවන ජෙරබොවාම් ද දකුණු රාජ්‍යයවූ ජුදෙයාවේ උශ්ශියා ද රජකම් කළ හ. දෙවන ජෙරබොවාම් රාජ්‍ය පාලන සමය පුළුල් ව බලන කළ එය සාමකාමී වූ, සමෘධිමත් අවධියක් විය. (ක්‍රි.පූ. 767-747) වාණිජමය හා කෘෂී කාර්මික ප්‍රගතියක් කේන්ද්‍රකරගත් සුඛෝපභෝගි ජීවිතයක් ඉස්මතු කෙරුණ ජනතාවක් බිහිවිණි. නාගරීකරණය වූ එම ජනතාව ධනවත් වූවා පමණක් නොව, පරිපාලනයේ උසස් තනතුරු ද දැරූ හ. සමාරිය අගනුවර කරගත් මොවුන් ද, නගරයෙන් පිට කෘෂිකාර්මික එඬේර හා අනෙක් කම්කරු කාර්යයන්හි නියැලුන වෘත්තිකයන් ද අතර, සමාජ පරතරයක් පැහැදිලිව දිස් විණි. වස්තුවට

ලෝභීව සශ්‍රීකත්වය පැතීමට කානානීය වැඳුම් පිදුම් හා වත් පිළිවෙත් ඔස්සේ යමින්, යාවේ දෙවි සමිඳුන්ගෙන් ඈත් වූ මෙම ජනතාවගේ ආගමීක ජීවිතයේ විශාල පරිහානියක් ද ඇති විය. (ආමොස් 2/6-8) ඇති නැති භේදය හා බොරු දේව ඇදහිල්ල පිළිබඳව ආමොස්ගේ වාග් ප්‍රහාරයන් ඇරඹෙන්නේ මෙවන් පරිසරයක් තුළ ය.

**ආමොස්ගේ පණිවුඩයන්**

- ❖ දෙවි සමිඳුන්ගේ අභිමතය සැම මිනිස් ක්‍රියාකාරිත්වයකම මිනුම් දණ්ඩ වේ.
- ❖ දෙවි සමිඳාණෝ ගිවිසුම් ජීවිතයකට ජනතාව කැඳවන සේක. එයට විරුද්ධව යෑම විනිශ්චය දූඩි විපාක ලබා ගන්නට ඇරයුම් කිරීමකි.
- ❖ සමාජ සාධාරණත්වය ගිවිසුම් ජීවිතය මත පදනම් වු ඊශ්‍රායෙල් ආගමික ප්‍රතිපත්තිවල කැපී පෙනෙන ලක්ෂණයකි. ගිවිසුම් ජීවිතයට පටහැනි වූ සොයුරු ජනතාව පීඩනයට පත් කරන අසාධාරණය දේව උදහසට ලක්වන ආකාරය ආමොස් විසින් පෙන්නුම් කර දෙන විශේෂ වූ පණිවුඩයකි. (ආමොස් 2/6-8) (ආමොස් 5/7-13) (ආමොස් 8/4-6)
- ❖ සමාජීය වගකීම් පිළිබඳ සම්පූර්ණ වගකීම පැවැරෙන්නේ ආගම ධර්මයට ය. එනම් ඇදහිලිවන්ත ජීවිතයට ය. එම නිසා කෙනෙකුගේ ශ්‍රද්ධාව තිබිය යුත්තේ දේව මාලිගයේ හෝ වත් පිළිවෙත් තුළ නොව, සමාජීය වගකීම් ඇති ස්ථානයේ ය.

## 1.1.1.3 දිවැසිවර ඉගැන්වීම්

### 1.1.1.3.1 ගිවිසුම

ගිවිසුම යන වචනය දිවැසිවර සාහිත්‍යයේ දක්නට ලැබුණත්, නාහුම්, හබකුක්, සෙකරියා යන දිවැසිවර ග්‍රන්ථවල මෙම තේමාව කොහෙත්ම දක්නට නො ලැබේ. එනමුත්, ඔව්හු එම තේමාව කිසි විටෙකත් නො සලකා හැරිය බවක් නො හඟවන අතර, ගිවිසුමේ අදහස, එනම් දෙවියන් වහන්සේ හා ඊශ්‍රායෙල් ජනතාව අතර, සම්බන්ධතාවය වෙනත් වචන වලින් ප්‍රකාශ කළ හ.

එය ඔව්හු තේරුම් ගත්තේ සීනයි ගිවිසුම තුළ ය. ඊශ්‍රායෙල්වරුන්ව හඳුන්වනු ලැබුයේ ගිවිසුම් ජනතාව ලෙසින් ය.

මෙනයින් බලන කළ දිවැසිවර සාහිත්‍යය තුළ ගිවිසුම ව්‍යවහාරයන් කිහිපයක් තුළ ඉදිරිපත් කෙරිණි.

| | | | |
|---|---|---|---|
| (I) | ස්ත්‍රී පුරුෂ සබඳතාවය | - | යෙසායා 50/1, යෙසායා 54/3-10, ජෙරමියා 31/32, එසකියෙල් 16 |
| (II) | පිය පුතු සබඳතාවය | - | යෙසායා 1/2, හොසියා 11/1 ජෙරමියා |
| (III) | එඬේරා හා රැළ සබඳතාවය | - | යෙසායා 40/11, එසකියෙල් 34 |
| (IV) | මිදි වත්ත හා අයිතිකරු සබඳතාවය | - | යෙසායා 1-2 |

ගිවිසුම යන තේමාව තුළ බොහෝ දිවැසිවරු ජනතාව අවදි කළේ ගිවිසුමට කීකරුව, පක්ෂපාතිව, සිත් මාරුවක් ඇති කරගෙන ජීවත් වන්නටයි. ජනතාව නිතර නිතර ගිවිසුම උල්ලංඝ කළ නිසා, ඔවුන් තුළ සැබෑ සිත් මාරුවකට ජීවිත අවදි කරනු සඳහා දෙවියන් වහන්සේ දිවැසිවරුන්ව එවීමට පියවර ගත් සේක.

**ගිවිසුම් වගන්තිවල සංක්ෂිප්ත ය මූලික වශයෙන් දෙයාකාරය.**

**එනම්**

- දේව ප්‍රේමයත්
- ගිවිසුම් සාංඝිකත්වයත් ය.

මේවා ප්‍රධාන වශයෙන් දස පණත තුළ ක්‍රියාවට නැංවිණි. පළමු පණත් තුනෙන් දේව ප්‍රේමයත්, සිව්වන සිට දහවන පණත දක්වාවු පණත් හතෙන් ගිවිසුම් සාංඝිකත්වයත් අවධාරණය කෙරිණ.

කල්යාමේ දී දිවැසිවරුන් වෙතින් මෙම ගිවිසුමේ ආකල්ප නවතාවයකට පත්කරනු සඳහා යම් යම් සංශෝධන ඉදිරිපත් කෙරිණි. එසේ වුයේ එතෙක් ඊශ්‍රායෙලයේ ඉතිහාසය නැවත නැවත ඉදිරියට ගෙන

ආ ගල් පුවරු මත කොටනු ලැබූ සීනයි ගිවිසුම එනම්, සෑම වර්ෂයක් පාසාම මහත් උත්කර්ෂවත් පිළිවෙතකින් නැවත නැවත අලුත් කරනු ලැබූ ගිවිසුම කිහිප විටක් ම ඔව්හු උල්ලංඝ කළ නිසා ය.

**පුරාණයේ දී ඔවුනට ගිවිසුම**
- බාහිර එකක් විය.
- හුදෙක් නීතිරීතිවලට හා බාහිරවත් පිළිවෙත්වලට සීමා විය.
- අභ්‍යන්තර හරය ලෙස තිබිය යුතු ආගමික බව නොසලකා හරිනු ලැබීය.

මෙසේ බාහිර වූ දේවලට මුල් තැන දුන් ගිවිසුමක අර්ථ ශූන්‍යතාවය වටහාගත් දිවැසිවරු නව ගිවිසුමක අවශ්‍යතාවය අවධාරණය කළ හ.

### නව ගිවිසුම ජෙරමියා 31/31-34


මෙම වාක්‍ය ඛණ්ඩය තුළ ජෙරමියා නව ගිවිසුමක් ගැන සඳහන් කරයි. එය පැරණි සීනයි ගිවිසුමට නැවත පුනරුජ්ජීවනයක් දෙන්නට හෝ අළුත්වැඩියා කිරීමක් හෝ කරන්නාවූ උත්සාහයක් නොව 31/33 වගන්තියේ සදහන් පරිදි, සීනයි ගිවිසුමට වඩා වෙනස් වූ ජීවමාන එකක් බව පැරණි දේ සසඳමින් විස්තර කරනු ලබයි.

### ඊශ්‍රායෙල් සමඟ ගිවිසුමක් කරන කාලය පැමිණෙන්නේ ය. (31/31)

මෙය දිවැසිවර සාහිත්‍යය තුළ බොහෝ විට භාවිතා කරනු, දක්නට ලැබෙන යෙදුමකි. එනම් කාලයක් පැමිණෙන බව දක්වමින්, යුගාන්තය සම්බන්ධව දෙවියන් වහන්සේගේ ක්‍රියාවලිය ඉඟී කරනු ලබන්නේ ය. එම නිසා මෙමගින් අනාගතය පිළිබඳව බලාපොරොත්තුව ඇති කරගත යුතු ආකල්පයක් ද, අනියමාර්ථයෙන් පවසන අවිනිශ්චත බවක් ද පෙන්නුම් කරන්නේ ය.

31/32 වගන්තියෙන් ඒ වනාහි ඔවුන්ගේ පියවරුන් යන්නෙන් සඳහන් කරමින් දිවැසිවර ජෙරමියා නික්මයාමේ සිද්ධිය ආවර්ජනය කරයි. එදා ඔවුනගේ මැවුම්කරුවන් හා ගැලවුම්කරුවන් වෙමින් කාන්තාර ගමනේ දී දෙවියන් වහන්සේ ඊශ්‍රායෙලුන් වෙත දැක්වූ පිය පුතු සබඳතාවය, සීනයි හි දී කරන ලද ගිවිසුම තුළ උච්ච අවස්ථාවකට ගෙන එමින්, සදාතනික අඹුසැමි සබඳතාවයක් ගොඩ නගන්නට ක්‍රියාකළ බව පැහැදිලි කර දක්වයි.

- දෙවියන් වහන්සේ ''මම ඔබේ දෙවියෝ ය. ඔබ මාගේ ජනතාවය යන්නෙන්'' තමන්වහන්සේගේ පැත්තෙන් ගිවිසුමට පක්ෂපාතීව සිටිය ද, ඊශ්‍රායෙල් ජනතාව, කාන්තාර ගමනේ දී මෙන්ම ජෙරමියාගේ කාලයේ දී ද එම ගිවිසුම කඩ කළ නිසා ඔවුන්ගේ එම අපක්ෂපාතීත්වය හෙළා දකිමින් නව ගිවිසුමක අවශ්‍යතාවය ජෙරමියා අවධාරණය කළේ ය.
- එසේ නව ගිවිසුමක් කිරීමේ ක්‍රියා මාර්ගය ජෙරමියා 31/33 වගන්තියෙන් මෙසේ පැහැදිලි කරයි. ''මාගේ අණපණත් ඔවුන් තුල පිහිටුවා ඔවුන්ගේ සිත්වල ලියන්නෙමි.''
ජෙරමියා මෙහි දි ස්වාමීන් වහන්සේ විසින් ඇති කරන්නට යන අළුත් ගිවිසුමත් කාන්තාර ගමනේ දී ඇති කරගත් සීනයි ගිවිසුමත් අතර වෙනස සසඳමින් ඉදිරිපත් කරයි.




ගල්පුවරුවල සිත්වල

ගල් පුවරුවල ලියැවුණු සීනයි ගිවිසුම ඔවුනට බාහිර දෙයක් විය.

- එම නිසා එවන් බාහිර දෙයක් නොවන, සැමදා තම ජීවිතය තුළ ක්‍රියාවට නංවන සිත්වල ලියැවුනු අළුත් ගිවිසුම, අභ්‍යන්තරිකවූත්, ආධ්‍යාත්මිකවූත් වටිනාකමකින් යුත් දෙයක් සැටියට, එනම් දෙවියන් වහන්සේගේ අභිමතය අවධාරණය කළ නීතිය ඔවුන්ගේ එදිනෙද ජීවිතය තුළ යහපත සොයා යන නිරවද්‍ය හෘදය සාක්ෂිය බව ජෙරමියා පෙන්විය.
- නීතිය හෙවත් අණ පණත්, කෙනෙකුගේ හොඳ නරක මණින මිණුම් දණ්ඩක් නොවේ. එය දේව අභිමතය අනුව, යහපත් දිවියකට මඟ පෙන්වන මාර්ගෝපදේශයකි.
- දෙවියන් වහන්සේත් දේව ජනතාවත් අතර ඇති ගිවිසුම් සබඳතාවය 31/33 වගන්තියෙන් ප්‍රකාශ වන ''මම ඔවුන්ගේ දෙවියන් වහන්සේ වන්නෙමි.'' යන්නෙහි පැහැදිළි කෙරේ.
- දේව අභිමතය ජනතාව තුළ ඇති වීමෙන්, මෙම ගිවිසුම් සබඳතාවය ඇති වන්නේ ය. එවිට සැමදෙනාම උන්වහන්සේව හඳුනාගන්නා නිසා, ''ස්වාමීන් වහන්සේ කවුද කියා අසල්වැසියාටවත්, සහෝදරයාටවත් උගන්වන්නට අවශ්‍යවන්නේ නැත යනුවෙන් ජෙරමියා දිවැසිවරයා සඳහන් කරයි.
- ගිවිසුම ඉදිරියටම ගෙන යාම සඳහා, සැබෑ සිත්මාරුවකින් පසුව ඇතිවන ''පව්සමාව'' අත්‍යවශ්‍යය. දෙවියන් වහන්සේ ජනතාව සමග ඇතිකරගන්නා අළුත් ගිවිසුම තුළ සැම විටම සමාව දෙන්නට සූදානමින් සිටින බවේ ප්‍රතිඥාවක්, මෙමගින් ලබා දෙන බව, ජෙරමියා අවධාරණය කරයි.
- කල්මත්තෙන් ජෙරමියා සඳහන් කරන මෙම නව ගිවිසුම වනාහි, ලූක් 22/ 20 වගන්තිය මගින් විස්තර කරන ''ජේසුස් වහන්සේ කුසලාන රැගෙන තුති පුදා...... මාගේ රුධිරයෙන් කල නව ගිවිසුම'' ම ය.
- එයින් පෙනී යන්නේ පූරාණ ගිවිසුමේ දී දිවැසිවරුන් ප්‍රකාශ කළ නව ගිවිසුම නැමැති සංකල්පය ක්‍රිස්තුන් වහන්සේ තුළ සම්පූර්ණත්වයට පත් වූ බව යි.

මෙසේ ලූක් 22/20 මගින් පෙන්වා දෙන, රුධීරයෙන් කරන නව ගිවිසුම පිළිබඳව හෙබ්‍රෙව් 09 පරිච්ඡේදයෙන් ද විස්තර කෙරේ.



### යෙසායා 1/1-19

1/1-3 වගන්ති මගින් ගිවිසුමට අපක්ෂපාතීව දෙවිඳාණන් හැරදමා ඇති ඊශ්‍රායෙල් ජනතාවට, පැමිණෙන්නට තිබෙන විපත එනම්, දේශපාලනමය තර්ජන ගැන පවසන යෙසායා, ගවයන්ට හා කොටළුවන්ට වඩා පහත් තත්ත්වයකට වැටෙන තරමට ඔව්හු තමන්ගේ එකම දෙවි සමිඳාණන්ව ප්‍රතික්ෂේප කර ඇති බව පවසයි.

1/4-9 වඩ වඩා කැරළි ගසමින්, වැඩියෙන් දඬුවම් ලබන පිණිස, සමිඳුන් අතහැර, එතුමන්ට පිටුපා ඇති ඉශ්‍රායෙල් ජනතාව පිළිකුල් වන තරමට වණ වී ඇති බව පෙන්නුම් කෙරේ.

1/10-19 මෙසේ දෙවිඳුන් අමතක කරදමා ආධ්‍යාත්මික පිළිකුල් භාවයක් අත්දකින ඔවුන්ගේ වන්දනා ගමන් පුද පූජා අමාවක් උත්සව තමාට පිළිකුල් බව පවසන දෙවිඳාණෝ,

- ඔවුන් විසින් සිත් හරවාගෙන පවිත්‍ර වී පව් දුරු කරන්නටත්,
- යහපත කරන්නට ඉගෙනගන්නටත්
- පීඩා විඳින්නන් වෙතට පිහිට වන්නටත්
- අනාථයන්ගේ හිමිකම් රැක දෙන්නටත්
- වැන්දඹුවන් වෙනුවෙන් යුක්තිය ඉටුකරදෙන්නටත් යොමුවිය යුතුබව මතක් කර දෙයි.

### හොසියා 1/1-11

සීනයි ගිවිසුම, විවාහයකට සමාන කර දක්වන හොසියා දිවැසිවරයා තමාගේ විවාහය තුළින් එහි අර්ථය විග්‍රහ කර දක්වන්නේ ය.

ලෝක ආරම්භයේ සිටම විවාහය පරිශුද්ධ සංස්ථාවක්, පරිශුද්ධ සංකල්පයක් ලෙස ඉදිරිපත් කෙරුණි. (උත්පත්ති 2/24) මෝසෙස්ගේ නීතිය අනුව මෙම බන්ධනය කඩන්නට ගිවිසුමට සම්බන්ධ වූ කෙනෙකු පියවර ගතහොත්, එම විවාහ බන්ධනයට එක්වූ අනෙක් තැනැත්තාට, ඔහුව හෝ ඇයව දික්කසාද කළ හැකිය යන මතය තුළ, නැවත එම විවාහය ගොඩ නැගීමක් සිදු නො වීය.

ඉහතකී ධර්මතාවය, ගිවිසුම් ජීවිතයට පාදක කරමින්, සදාතනික ස්වාමියාණන්වූ දෙවියන් වහන්සේ භාර්යාව වූ දේව ජනතාවට, පුරාණ ගිවිසුමේ දී විවාහය සම්බන්ධව තිබූ ආකල්ප ලෙස නො සලකන බවත්, එනමුත් ඇය තමාව හැර දමා යන සෑම අවස්ථාවක දී ම, ඇය පසුපස ඇයව සොයා ගොස්, තම කුළුඳුල් ප්‍රේමයෙන් ඇයට ආදරය කරන බවත්, හොසියා දිවැසිවරයා තමාගේ සහ ගොමෙර්ගේ විවාහක ජීවිතය තුළින් පෙන්වා දෙයි.

එකල සශ්‍රීකත්වය පිළිබඳ ඇදහිලිවලට, දෙවි දේවතාවන්ගේ ප්‍රේම කථා යොදා ගැනිණ. කානාහි දෙවියෙක් වූ බාල්ගේ දේවාලවල පූජකවරුන් හා ගණිකාවන් අතර තිබූ ශුද්ධවූ ගණිකා වෘත්තිය නිසා, විවාහයේ පරිශුද්ධභාවය විකෘති විය. ජනතාව දෙවියන් වහන්සේ අතහැර, ලෞකික වූ භවභෝග, දරුඵල, මේ ආදී සශ්‍රීකත්වය පතා මිථ්‍යා දෙවිවරුන් තම ස්වාමියන් ලෙස සැළකුයේ, පරපුරුෂ සේවනයේ යෙදෙන ගණිකාවන් ලෙස ගිවිසුමේ පාරිශුද්ධ සම්බන්ධතාවය කෙළෙසමින් ය. නමුත් දෙවියන් වහන්සේ දේව ජනතාව වන තම භාර්යාව ව, කැඳවාගෙන නැවත පැමිණෙන්නේ තම කුළුඳුල් ප්‍රේමය පාමිනුයි.

## 1.1.1.3.2 මෙසියානික අපේක්ෂාව

තවත් දිවැසි වර ඉගැන්වීමක් වන මෙම සංකල්පය, දාවිත් හට නාතාන් දිවැසිවරයා විසින් පවසන ලද දිවැසි වැකියක් ( 2 සාමුවෙල් 7/10-17) පදනම් කරගෙන ගොඩ නැගේ. මෙහි අන්තර්ගතය මූලික කරුණු තුනක් යටතේ ඉදිරිපත් කළ හැක.

- ❖ මෙසියස් තුමා දාවිත්ගේ රාජ පරපුරෙන් පැමිණෙන බව
- ❖ එතුමන්ගේ රාජ්‍යය, සදාකාලික රාජ්‍යයක් වන බව,
- ❖ එම රාජ්‍යය, සියලු සතුරන්ගෙන් හිරිහැරයක් නොවන, සියලු සතුරන්ගෙන් නිදහස ලබන සාම රාජ්‍යයක් වන බව.
  මෙම තෙවැදෑරුම් මූලික කරුණු ගොඩ නඟන ප්‍රධාන දිවැසි වැකි වන්නේ

## යෙසායා 7/10-17, යෙසායා 9/1-7, යෙසායා 11/1-9

## මීකා 5/1-4, සෙකරියා 9/9-10

මෙසියස් යන සංකල්පය '' මෂියාහ්'' යනු හෙබ්‍රෙව් වචනයෙන් බිඳී එන්නෙකි. එහි අරුත වන්නේ ආලේප කරනු ලැබූ තැනැත්තා ය. ග්‍රීක භාෂාවෙන් '' ක්‍රිස්ටොස්'' යනුවෙන් හැඳින්වූයේ ද, මේ වචනම ය.

ඊශ්‍රායලය තුළ ''මෂියාහ් '' යනුවෙන් හැඳින්වූයේ ජෙරුසලෙම්හි රජතුමාව ය එකල රජවරුන් ආලේප කොට '' යාවේහ් ගේ ආලේප කළ තැනැත්තාණන් වශයෙන් හැඳින් වූහ. එහෙත් පශ්චාත් විප්‍රවාසීය යුගයේ දි රාජකීයත්වය ඊශ්‍රායෙලයෙන් අහෝසිවීමත් සමගම දේශය නියෝජනය කළ පූජකයත්ව ද ආලේප කරනු ලැබීය.
මෙ මගින් අපට මෙසියානික සංකල්පය හා බැඳි පවතින ප්‍රධාන අංක දෙකක් දැකිය හැක.

1 ආලේප කිරීම තුළ මෙසියානික සංකල්පය රාජකීයත්ව හා බැඳී ඇති බව.

2 පැරණි මැද පෙරදිග හැඳින්වූ ආකාරයට දෙවියන් වහන්සේ හා රජතුමා අතර ඇති සමබන්ධතාවය එනම් ''දෙවියන් වහන්සේ විසින් හදා වඩා ගන්නා දේව පුත්‍රයකු '' වශයෙන් පැහැදිලි කෙරෙන බව

මෙම අදහස් ඇතිව මෙසියානික සංකල්පය හා බැඳි පවතින පාඨ විස්තර කෙරේ.

## යෙසායා 7/1 -17 එමමානුවෙල් ලකුණ

මෙම පාඨය සඳහා ඓතිහාසික පසුබිමක් ඇත. ක්‍රි. පූ. 734 - 732 අතර කාලයේ දි ඩැමස්කස්හි රජවූ රෙසීන් ද, උතුරු රාජ්‍යයේ රජවූ පෙකා ද, අසිරියන් අධිරාජ්‍යාවූ ටිග්ලත් ප්ලෙසර්ගේ අසාධාරණ වූ බදු බරින් ජනතාව නිදහස් කරන්නට, ඒකාබද්ධවූ නමුත්, දකුණු රාජ්‍යයේ ආහාස් රජුගේ උපකාරය නොමැතිව එසේ කළ නොහැකි බව වටහාගෙන, ඔහුගේ ආධාරය පැතුහ. එහෙත් ආහස් රජු ඔවුනට උදව් නොදී, අසිරියන් රජු සමග එක්විය. එවිට රෙසින් හා පෙකා ටිග්ලත් ප්ලෙසර් සමග සටනට යෑම වෙනුවට, ජුදාහි රජ සමග සටන් කොට ආහස් රජුව පරාජය කළ හ. මේ අවස්ථාවේ දී දකුණු රාජ්‍යයේ වැසියන්ට මීට පෙර ක්‍රි.පූ. 922 දී රාජ්‍යය දෙකඩ වන විටදී අත්දුටුවාට වඩා, දුක් වේදනා හා පීඩාවන් විඳින්නට සිදුවිය. මෙසේ වූයේ දෙවියන් වහන්සේගේ සහය පැතීම ගැන, යෙසායා දුන් පණිවුඩය ගණන් නොගෙන, ආහාස් රජු දෙවන ටිග්ලත් ප්ලෙසර්ගේ වචනය කෙරෙහි විශ්වාස කරන්නට පෙළඹුණ නිසා ය. මෙම පසුබිම මතය ''එම්මානුවෙල් ලකුණ'' ගැන යෙසායා දිවැසිවරයා සිය වදන් පැවැසුයේ, යෙසායාට අවශ්‍ය වූයේ, නාතාන් මගින් දාවිත්ට දුන් පොරොන්දුව, ආහාස්ට මතක් කරමින් ''සිංහාසනය'' දාවිත්ගෙන් පැවැත එන්නෙකුට උරුම බව පැවැසීම ය.

දෙවියන් වහන්සේට අපක්ෂපාතිව, ආහාස් විසින් කරනු ලබන ක්‍රියාව පිළිබඳව අනතුරු හැඟවන යෙසායා දිවැසිවරයා, අසිරියන් අධිරාජ්‍යයා වෙත විශ්වාසය නොතබා දෙවියන් වහන්සේ වෙත පමණක් විශ්වාසය තබන්නටත්, ඒ නිසා එයට ලකුණක් වශයෙන් අහසින් හෝ ගැඹුරු පාතාලයෙන් හෝ යමක් ලබාදෙන ලෙස ඉල්ලන්ටත්, කියා ආහාස්ව යහපත කරන්නට නැඹුරු කළේ ය.

එයට පිළිතුරු වශයෙන් ආහාස් ප්‍රයෝගකාරී ලෙස පැවසූ දේ 7/12 වගන්තියෙන් පැහැදිළි කෙරේ. එනම් ''මම නොඉල්ලමි, සමිඳාණන් වහන්සේ පරීක්ෂා නො කරමි.'' යන්න ය. බැලූ බැල්මට මෙය ආහාස්ගේ බැහැපත් බයාදු ඉල්ලීමක් හා ආකල්පයක් ලෙස පෙනුනත්, ඔහු කපටි කමින් හා හොර රහසේ අසරියන් රජුගේ සහය ගන්නට කළ ප්‍රකාශයක් ලෙස දැක්විය හැක.

ආහාස්ගේ කපටි වදන්වලට දිවැසිවරයා දක්වන කෝපාවිෂ්ට ප්‍රතිචාර 7/13 වගන්තියෙන් මෙසේ විස්තර කරයි. ''එම්බා දාවිත්ගේ වංශය දැන් සවන් දෙන්න. නුඹලා මාගේ දෙවියන් වහන්සේගේ ඉවසීම වෙහෙසන්නේ නුඹලා මනුෂ්‍යයන්ගේ ඉවසීම වෙහෙසනවා මදිවාට ද? මෙසේ පවසන යෙසායා සිරියා පීඩනයට හසුව බලාපොරොත්තු බිඳී ගිය ජනතාව වෙත බලාපොරොත්තුවේ ලකුණක් දුන්නේ ය.

''බලන්න, කන්‍යාවක් ගැබ්දරා පුත්‍රයෙකු ප්‍රසූත කරන්නේ ය. ''එම්මානුවෙල්'' යන නම ඔහුට තබන්නේ ය.'' (යෙසායා 7/14)

හෙබ්‍රෙව් පිටපතේ තරුණ ස්ත්‍රියක් ''අල්මා'' යනුවෙන් ද සෙප්තුවාජින්ත බයිබලයේ ''පාර්තෙනොස්'' යනුවෙන් ද, කන්‍යාවක හැඳින්වීමට භාවිතා කරනු ලැබීය. මෙවැනි තැනැත්තියක් ගැබ්දරා පුත්‍රයෙකු බිහි කරන්නේ යයි කියමින්, මෙසියස් පිළිබඳව බලාපොරොත්තුවක් ඇති කිරීමටත්, එසේ පැමිණේන තැනැත්තාණන් හට එම්මානුවෙල් යන නම තබන බවත් යෙසායා පවසන්නේ ය.

| | | | | |
|---|---|---|---|---|
| ඉම්මානුවෙල් | - | ඉම්මානු | + | එල් |
| | | අප සමගය | + | දෙවියන් වහන්සේ |

මෙම ඉම්මානුවෙල් ලකුණෙන් හඟවනු ලැබුවේ බලාපාරොත්තු අතහැර සිටි, දෙවිඳුන් තමන්ගෙන් ඈත්ව සිටියේදෝ' යි සිතා සිටි ජනතාව සමඟ දෙවිඳුන් තමන් වික්‍රමාන්විත ක්‍රියා කිරීමට, ජනතාව ජයග්‍රහණය සතුට කරා ගෙනගොස් සාමය ලබා දෙන්නට, ජනතාව අතරට පැමිණෙන බවත් එනම් දේව රාජ්‍යය උදාවන බවයි. නැතහොත් මෙසියස් වහන්සේගේ පැමිණීම සමග දේව රාජ්‍යය මිහිපිට උදාවන, ස්ථාපිත වන බවයි.

එවැනි උදාවකට ගත යුතු පියවරයන් කිහිපයක් යෙසායා හඳුන්වා දෙන ලදී. නපුර එපාකර යහපත තෝරාගැනීමේ ක්‍රියාමාර්ගයකට එළඹිය යුතු බවත් එසේ කිරීමෙන්, දී කිරීත්, මී පැණිත් කෑමට ගත හැකි, සෞභාග්‍යමත්, එනම් සාමයේ රාජ්‍යයක් උදාකර ගත හැකි බවත් ඔහු පවසයි.

යෙසායා 7/16-17 වගන්තිවලින් දෙවියන් වහන්සේට විරුද්ධවන්නන්ට පැමිණෙන පීඩාවන් විස්තර කෙරේ. මේ අනුව ආහාස්ව බිය ගැන්වූ උතුරු රාජ්‍යයේ පෙකා හා සිරියාවේ රෙසින් යන රජවරු දෙදෙනාගේ දේශයන් පාළු කරන බවත්,

සාම රාජ්‍ය පැමිණෙන්නට පෙර, ආහාස් විසින් යුධ සහය බලාපොරොත්තුවූ අසිරියන් රජු වෙතින්ම ලැබෙන දරුණු විපත්ති සමය ගැන ද සඳහන් කරන දිවැසිවරයා, තම වචනයට සවන් නො දී අකීකරුවූ ආහාස් පිටත් දේශය පිටත්, ජනතාව පිටත් පැමිණෙන දරුණු විපත්තිත් පැහැදිළි කර දෙයි.

## යෙසායා 9/1-7 අනාගත සාම රාජයාණෝ

බලාපොරොත්තු සුන්වූ පීඩිත ජනතාවක් වෙත දිවැසිවරයා සුභාරංචියක් පවසයි.

එම සුභාරංචිය ආරම්භ කරන්නේ මෙතෙක් සතුරු ආක්‍රමණ නිසා අපකීර්තියට පත් මුළු පලස්තීනයට ම සාබුලොන්, නප්තලි, ගලීලය යන දේශයන් නිසා ගෞරවය පැමිණෙන බව කියමිනි.

9/2 වන වගන්තියෙන් පැහැදිළි කරන්නේ එසේ පැමිණි ගෞරවය නිසා උදාවූ නවතම තත්ත්වය ගැන සංකේතාත්මකව විස්තර කිරීමකි. එනම් සනදුරු මිටියාවතෙහි සැරිසරන්නන්ට, මග පෙන්වන්නට, ආලෝකයක් ලැබෙන බව යි.

මෙය එක්තරා අන්දමකින් අළුතින් උදාවන බලාපොරොත්තු සහගත තත්ත්වය ගැන ඉඟි කිරීමක් විය. මෙම නවතම තත්ත්වය තුළ බලාපොරොත්තුවේ සමය උදාවූ කළ එක්තරා ප්‍රිතියක් ඇතිවන බව දිවැසිවරයා උපමේයයන් දෙකකින් විස්තර කරයි.

(අ) අස්වැන්න කපන කාලයේ දී ඇතිවන ප්‍රිතිය මෙන්
(ආ) යුද්ධයට පසු ඇතිවන ප්‍රිතිය මෙන්

මෙවන් ප්‍රීතියකට හේතු වශයෙන් දක්වන්නේ, සතුරු ආක්‍රමණ සම්පූර්ණ ලෙස අහෝසි වීමත්, මෙතෙක් සතුරන් යටතට පත් ව තමන් අත්දුටු පීඩාවන් හා දරිද්‍රතාවයන්ගෙන්, විමුක්තියක් හා නිදහසක් ලැබීම ය. එය තවදුරටත් පැහැදිලි කරන 9/5 වගන්තිය, යුද්ධයට සම්බන්ධ සෑම දෙයක්ම ද එනම්, ආක්‍රමණය කරන හමුදාවේ පාවහන් ද, ලෙයින් තැවරුණු ඔවුන්ගේ ඇඳුම් සියල්ල ද, කිසිවක් ඉතිරි නො වන පිණිස ගින්නෙන් දවාලනු ලැබීම තුළ අහෝසි වීම, එම ප්‍රිතියට හේතුවන බව දක්වයි.

අනාගත සාම රාජාණන් පිළිබඳව පැවසෙන වාක්‍ය කණ්ඩයේම වැදගත් ම වගන්තිය වන්නේ 9/6 වැකියයි.

## අපට ළදරුවෙක් උපන්නේ ය.

මෙයින් අදහස් කරන්නේ මෙසියස් තුමා රාජශ්‍රීයට පත් වීමය. මෙසියස් තුමන් මගින් පිහිටුවනු ලැබන මෙසියානික රාජ්‍යය සඳහා අවැසි ගුණාංග හෙවත් සුලක්ෂණ හතරක් අපට ගෙනහැර දක්වයි.

## - අසිරිමත් උපදේශකයාණෝ

මෙමගින් පෙන්නුම් කරන්නේ, එතුමාණන් ප්‍රඥාවෙන් පූර්ණ වන බවයි. එනම් එතුමණෝ මිනිස් වෙස් ගත් දේව ප්‍රඥාව වන බවත්, එතුමාණන්ට මිනිස් උපදේශනයක් අවැසි නොවන බවත් පෙන්වා දෙමින්, එතුමාණන් තුළ ඇති දේවානුභාවයේ ස්වභාවය පැහැදිළි කරයි.

## - ප්‍රතාපවත් දෙවිතුමාණෝ ය.

පූරාණ කාලයේ දී රජවරුන් සතු පරමාධිපත්‍ය පෙන්වීමට මෙම නාමයෙන් ආමන්ත්‍රණය කරන ලදී. පසුකාලීනව, මෙම වචනය තුළ දේව අධිකාරිත්වය හඟවනු ලැබිණි. දෙවියන් වහන්සේගේ අති උත්කෘෂ්ටභාවය ගැන සැමවිටම කථාකරන යෙසායා දිවැසිවරයා, මෙසියස් තුමන් සම්බන්ධ පරමාධිපත්‍යයකට වඩා, දේව පුත්‍ර සංකල්පය තුළ මෙසියස් වහන්සේ සතු දේව අධිකාරි බලය මෙයින් ප්‍රකාශ කරනු ලබයි.

## - සදාතනික පියාණෝ ය.

මෙය වනාහි දේව නාමයකි. යෙසායා දිවැසිවරයාගේ පසුබිම අනුව, මෙවැන්නක් යෙදීම අස්වභාවික වුවත්, යෙසායා මෙහිදි පැහැදිලි කරන්නට උත්සාහ ගන්නේ, මෙසියානික රාජ්‍යයේ සදාතනික බවය. මෙය වනාහි දෙවියන් වහන්සේගේ රාජ්‍යයයි. පුරාණයේ දී රජතුමා එම රාජ්‍යයේ ජනතාවගේ පියා විය. එම නිසා මෙසියස් වහන්සේගේ සදාතනික රාජ්‍යයේ සදාතනික පියාණන් වුයේ මෙසියස් වහන්සේ ය.

## සාමයේ කුමාරයාණෝ ය.

එතුමාණන්ගේ රාජ්‍ය සමය සමග රාජ්‍යයටත් ජනතාවටත් සාමය ස්ථාපිත වී , සංහිඳියාවක් හා සතුටක් ඇතිවන බව හඟවනු ලබයි.

මෙවන් ගුණ පිහිටුවන මෙසියස් වහන්සේ දාවිත් රාජ වංශයේ පෙළපත් උරුමය ලබන බවත්, එම කුමරයා තුළ ලබන රාජ්‍යයේ සදාතනික සාමයක් වැඩි වර්ධනය වන බවත්, පවසන දිවැසිවරයා, එවන් තිරසාරවූ සාමයක් ඇති රාජ්‍යයක් ඇති කරන්නට එතුමාණෝ යුක්තියෙන් ද, ධර්මිෂ්ඨකමින් ද රජකම් කරන බවත් පැහැදිලි කරන්නේ ය.

**යුක්තිය යනු** - කෙනෙකුට ලැබිය යුතු අයිතියක් හෝ දීමනාවක් ලබා දීමට කටයුතු කිරීමයි.

**ධර්මිෂ්ඨකම යනු** - සැමවිටම දේව අභිමතය සොයමින්, කෙනෙකු තම ජීවිතය දේව අභිමතය මත හැසිර වීම යි.

## යෙසායා 11/1- 9 සාම රාජ්‍යය

දාවිත් රජ විසින් කරන ලද පාපය නිසා රාජ පරපුර පසු කාලයක දී දේව දඬුවමට පාත්‍ර වූව ද, බලාපොරොත්තු රහිත අවස්ථාවක දි අළුත් අංකුරයක් පැන නඟිමින් ජනතාවට බලපොරොත්තුවක් ඇති කරන බවත්, එය වනාහි මෙසියස් වහන්සේගේ ආගමනය පිළිබඳ බලාපොරොත්ත්ට බවත් යෙසායා සාම රාජ්‍යයේ උදානය ගැන පවසන්සේ ය.

මෙවන් උදානයක් ඇති කරන මෙසියස් වහන්සේ මත, දෙවියන් වහන්සේගේ ආත්මානුභාවය පතිත වන බවත් එමගින් ඇතිවන ප්‍රතිඵලත් දිවැසිවරයා පැහැදිලි කරන්නේ, දෙවිඳුන්ගේ මැවීමේ හා ගැලවීමේ ක්‍රියා කාරිත්වයත් දේවාත්මානුභාවය තුළ පණගැන්වෙන අයුරු පෙන්වමිනුයි. එසේම පුරාණ ගිවිසුම තුළ දෙවියන් වහන්සේගේ ආත්මානුභාවය රජවරුන් හා දිවැසිවරුන් ක්‍රියාකාරි කළ අයුරු දක්වාලයි.

උදාඃ 1 සාමුවෙල් 16/13-14

දේවාත්මානුභාවය නිසා ඇතිවූ ප්‍රතිඵල වනාහි

ප්‍රඥාව - ජීවිතයේ විවිධ අවස්ථාවන්හි යුක්ති සහගතව හා නිවැරදිව ද, සාර්ථකව ද, ක්‍රියාකාරිවීමට අවශ්‍ය ගුණාංගයයි.

නුවණ - යම් දෙයක් ඒ ස්වභාවයෙන් ම තේරුම් ගැනිමට ඇති හැකියාව. එනම් විදර්ශන ශක්තියයි. (යමක් පිළිබඳව විනිවිද දැක්ම මගින් එය තේරුම් ගැනිමට ඇති හැකියාවයි.)

### අනුශාසනා බුද්ධිය -

යම් පුද්ගලයෙකුට, තව කෙනෙකු සඳහා මගපෙන්වීම ලබා දිමට ඇති හැකියාවය. මේ සඳහා එම පුද්ගලයාට තමාගේ පරමාර්ථයන් හා ස්ථාවරයන් පිළිබඳව දැනිමක් තිබිය යුතුය. එමගින් හඟවනු ලබන්නේ, යමෙකුට මගපෙන්වීමට නම්, තමාට ද ඒ පිළිබඳව අවබෝධයක් තිබිය යුතුය. එය පිළිගත යුතුය.

### බලය -

මෙයින් අධිකාරිත්වය දක්වනු ලැබේ. බලය බොහෝවිට ශාරීරිකව යොදනු ලබන්නාවූ පීඩනයන් ලෙස දැක්විය හැකිවුවත්, මිනිස් ඇසින් බලන කළ, එමගින් ශිලධාර්මික දිවි පැවැත්මට හානියක් වන බව වැටහුණත්, මෙසියස් වහන්සේ තුළ පිහිටුවන ලබන බලය වනුයේ උන්වහන්සේගේ වචන හා එමගින් ඉදිරිපත් කරනු ලබන ක්‍රියාවන් තුළ ඇති බලගතු භාවයයි. එනම් දේව අභිමතය ක්‍රියාත්මක කරන්නට දක්වන ප්‍රබල පෙළඹීම යි.

**දැනගැනීම** - අත්දැකීම තුළින් ලබාගන්නා අවබෝධයයි.

**දේව ගරුබිය** - දේව අණපණත් අනුව දිවිගෙවනු සඳහා මුල් තැන දෙන්නට කෙනෙකුට ලැබෙන හැකියාව මෙ මගින් පැහැදිලි කෙරේ.

- දේවාත්මානුභාවය තුළ ක්‍රියාකාරිවන තැනැන්වහන්සේ තමන්ට ඇසෙන හෝ පෙනෙන සැටියට විනිශ්චයකට පෙර, ඒ ගැන කරුණු සොයා බලා, සාධාරණ විනිශ්චයක් දෙන සේක යනුවෙන් අපට අවධාරණය කරන සේක.
- එවැනි විනිශ්චයක් ලබාදෙන එතුමාණෝ ක්‍රියා කරන්නේ යටහත් පහත් අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ය. ඒ සඳහා දුෂ්ට ක්‍රියා කරන්නන් වෙත තම ප්‍රබල වචනය තුළින් පහර දෙන්නටත් විශේෂයෙන් තම අණ පණත් නැමැති යෂ්ටිය ඒ සඳහා භාවිතා කරමින් දේශයට පහර දෙන බවත් දිවැසිවරයා කියා පාන සේක.

  ආඥා යෂ්ටිය හා වචනය උපමේයයන් වශයෙන් යොදා ගන්නේ දේව විනිශ්චය සංකේතවත් කිරීමට ය.
- බලවත් විනිශ්චයක් ලබා දීමට, එතුමාණෝ සන්නද්ධ වන්නේ යුක්තිය නැමැති ඉගපටියෙන් හා විශ්වාසවන්තකම නැමැති බඳ පටියෙනි.

  එකල රාජ්‍ය පාලකයන්ගේ වස්ත්‍රයක මෙම ඉගපටිය තිබීමෙන් ඔහුගේ තත්ත්වය පිළිබිඹු කෙරුණි. එලෙසම මෙසියස් වහන්සේගේ තත්ත්වය හා අධිකාරිත්ව ය (ඉගපටිය හා බඳපටිය) ප්‍රකාශ කෙරුණේ යුක්තියත් විශ්වාසවන්ත කමත් නිසා ය.
- කීකරු කම හා විශ්වාසවන්තකම ගිවිසුම හා සබැඳිය. මෙම ගුණාංග දෙක සඳහන් කරමින් දිවැසිවරයා දක්වා ලන්නේ මෙසියස් වහන්සේ, ගිවිසුම් ජීවිතයකට කැපවී සිටින බව ය.

  යෙසායා දිවැසිවරයා මීලඟ වගන්ති සතරෙන් පැහැදිලි කරන්නේ මිනිසා හා සත්ත්ව ලෝකය අතර ඇති සංහිඳියාවයි. එකිනෙකා අතර ඇති සුහදතාවය හා සහෝදරත්ව දක්වාලන්නේ උත්පත්ති 1/29-30 වගන්ති වලින් ප්‍රකාශ කෙරුණ, පරිසරයට සමාන්තරවූ තත්ත්වයකි. එදා ලෝකය ආරම්භයේ දි, මිනිසුන් හා සතුන් නිල්පලා කෑහ. කිසිවකු ජීවිතය හඳුන්වන ලෙය අඩංගු කිසිවක් නොකෑහ. තවත් කෙනෙකු තමන් ආද්පත්‍යයට යටත් නොකරගත් හ. එදා පාපයට පෙර එසේ සංහිඳියාවක් හා සාමයක් පැවැතුණි. මෙසියස් වහන්සේගේ පැමිණීමත් සමග ඇතිවන මෙම සංහිඳියාව සාම රාජ්‍යයේ ලක්ෂණයන් ය.

## මීකා 5 /1- 4 ඉශ්‍රායෙල්ට අධිපතියෙක්

මීකා දිවැසිවරයා, තම දිවැසි වැකිය එල්ල කරන්නේ, ජනතාවගේ එඬේරුන් වශයෙන් සිටිය යුතු අසාධාරණ පාලකයන් වෙතට ය. පාලකයන්ගේ අසාධාරණකම නිසා හමුදා රැස්කරන්නට හේතුවන පරිදි සතුරාගේ උවදුරු නැමැති බීජය ඔවුන් අතරේ වපුරා ඊශ්‍රායෙල් රජවරුන්ගේ දුෂ්ටකම පහව යනසේ, දේව උදහස හා දඬුවම එවන බව මීකා දිවැසිවරයා කියා පාන්නේ, මෙසියස් තුමන්ගේ ආගමනයට සම්බන්ධවූ පරිසරයක් ගොඩ නගමින් ය.

බෙත්ලෙහෙම් එප්‍රාතා වෙත අමතන දිවැසිවරයා, විසිරි ගිය රාජකීයත්වය වෙනුවට ඊශ්‍රායෙල්හි නවක නායකත්වයක් සඳහා මෙසියස් තුමා, එම කුඩා ග්‍රාමයක උපදින බව කියයි. එප්‍රාතා යනු දාවිත් රජ තුමා උපන් නගරයකි. (1 සාමුවෙල් 17/12) එම පෙළපතේ මුල පුරාතීතයෙන් ද, පැරණි යුගයක් ද වන බව පවසමින්, බලාපොරොත්තුවේ සහනයක් ඇති කරයි.

5/3 වගන්තියෙන් දක්වන්නේ මෙසියස් තුමා පැමිණීමට පෙර, ජනතාව දේශයන්හි විසිර සිටිය බවක් එතුමන්ගේ පැමිණීමෙන් එම ජනතාව එකතු කරන බවක් කියන දිවැසිවරයා ක්‍රි. පු. 922 දී දෙකඩවූ රාජ්‍යය නැවත ඒකරාශී වන බවේත් විප්‍රවාසයෙන් හා පීඩනයෙන් විමුක්තිය ලැබෙන බවේත් බලාපොරොත්තුවක් ජනතාව තුළ ඇති කරයි.

මෙසියස් තුමාව මෙහිදි ඉදිරිපත් කරන්නේ ඊශ්‍රායෙල් එඬේරාණන් වූ, යාවේගේ ස්වරූපයෙනි. එමගින් දැහැමිවූ යාවේ නම් යහපත් එඬේරාගේ ජීවිතයට වඩා කුළිකාර එඬේරාගේ ජීවිතයේ ඇති පරස්පර විරෝධිභාවය හොඳින් උලුප්පා දක්වයි. '' සිය සෙනග පෝෂණය කරනු ඇත'' එතුමන්ගේ සෙනග

ආරක්ෂා සහිතව සිටින්නෝ ය. මෙය සාමය සහ සෞභාග්‍යයේ කාලයක් ගැන ඉඟි කරයි. එනම් එතුමන් පැමිණිවිට පොළොවතලයේ සීමාන්තයන් දක්වා සැම දෙනාටම සමෘධියත් සාමාදානයත් අත්දකින බව පවසන මිකා දිවැසිවරයා, එමගින් මෙසියස් තුමන් තුළ හිමිවන ගැලවීමත්, විමුක්තියෙත් විශ්වීය බව අවධාරණය කරයි.

## සෙකරියා 9/9-10 - සාම කුමාරයාගේ ආගමනය

9/9 සියොන් පුරාඟන ...................... ඔබේ රජතුමාණෝ ඔබ වෙත වඩින සේක.

මෙම දිවැසි වාක්‍යය රජතුමෙකුගේ ආගමනය අරභයා ජෙරුසලෙම හා සම්බන්ධව කියන ලද්දකි. ජෙරුසලමේ රජතුමා දාවිත් රාජ පරපුරෙන් පැවත එන්නෙක් ලෙස හඳුන්වා දෙයි. ජයග්‍රාහි ලෙස පැමිණෙන උන්වහන්සේ කොටළුවකු පිටපැමිණෙන බව කියමින්, උන්වහන්සේ තම බලය තුළින් උදම්වන කෙනෙකු නොවන බවත්, කිකරුකම හා බැහැපත්කම එතුමන්ගේ ගුණාංග බවත් පැහැදිලි කරයි.

- කොටළුවකු බව කීමෙන් පෙන්නුම් කරන්නේ සාමයේ යුගයක් උදාවන බවයි. එකල යුද්ධ පරිසරයක දී, රජවරු යුද්ධය සඳහා අසුන් පිට නැගී ගියහ. එහෙත් සාම සමයේ රජවරු ගියේ රාජකීය කොටළුකු පිට ය. මෙම අවස්ථාවේ දි ජනතාව වෙත පැමිණෙන මෙසියස් තුමා, කොටළුවකු පිට පැමිණිමත් නිසා සාම යුගයක් උදාවන බව පැහැදිලි කරයි. 9/10 වගන්තිය යුද්ධය හා සම්බන්ධ සියළුම දේ මෙසියස් තුමාගේ ආගමනයෙන් අහෝසි කෙරෙන බව පැහැදිලි කරයි. එමගින් සියළු ජාතින්ට සාමය උදාවන කාලයක් එළඹෙන බව පෙන්වා දෙයි. එප්‍රායිම් යනුවෙන් උතුරු රාජ්‍යය ද හඳුන්වා දෙමින්, රාජ්‍යයන් දෙකෙන්ම යුධමය තත්ත්වය ඉවත්කර, උන්වහන්සේගේ පාලනයට යටත් කරගන්නා බව '' උන්වහන්සේගේ ආණ්ඩුව මුහුදෙන් මුහුදටත්, යුප්‍රටීස් ගංගාවේ පටන් පොළොවේ සීමා දක්වාත් වන්නේ ය'' යනුවෙන් ප්‍රකාශ කරමින් මෙසියානික රාජ්‍යයේ උදාව විශ්වීය බව පැහැදිලි කරයි.

# 1.1.1.3.3 දුක් විඳින සේවකයා

දුක්විඳින සේවකයා යන මෙම සංකල්පය දෙවන යෙසායා හා සම්බන්ධව ගොඩ නැගෙන්නකි. මෙම කොටස සඳහා සේවකයා හා සම්බන්ධව ගීත හතරක් ඇතුලත් වන්නේ ය. මෙම ගිත මගින් සේවකයාගේ ගති ලක්ෂණ පෙන්නුම් කරන්නේ ය.

1 මෙහිදි සේවකයා විටෙක තනි පුද්ගලයෙකු ලෙසත් විටෙක සමුහයක් ලෙසත් ඉදිරිපත් කෙරේ.
2 සේවකයා විටෙක දිවැසියෙකුගේ භූමිකාවක ද තවත් විටෙක විමුක්ති දායකයෙකු ගේ භූමිකාවකුත් කරන පුද්ගලයකු ලෙස ඉදරිපත් කෙරේ.
3 මෙම ගීත තුළ සේවකයාගේ කාර්යය ඉතා අසිරු එකක් බවත්, ඒ සඳහා ඔහු දුක්විඳින සේවකයකු වන බවත්, එසේ කරන්නේ, එය ඔහු විසින් භාර ගන්නා ලද දූත කාර්යයේම කොටසක් නිසා බවත් මෙම ඉදිරිපත් කිරීම මගින් පෙන්වා දෙයි.
4 මෙම ගීත තුළ සේවකයාගේ කාර්යය ඉතා අසීරු එකක් බවත් ඒ සඳහා ඔහු දුක්විඳින සේවකයෙකු වන බවත් එසේ කරන්නේ එය ඔහු භාර ගන්නා ලද දූත කාර්යයේම කොටසක් නිසා බවත් මෙම ඉදිරිපත් කිරිම මගින් පෙන්වා දෙයි
5 සේවකයාගේ කාර්යය විශ්විය වන්නේ ය

### 1 වන ගීතය - යෙසායා 42/1-9

මෙම ගීතයෙන් ප්‍රකාශ වන්නේ සේවකයාට අයිති වැඩ කොටසක් නොව දෙවියන් වහන්සේ විසින් සේවකයා වෙත ප්‍රදානය කරන දූත සේවාවකි.

**''මා තෝරා ගත් මට ප්‍රියවූ තැනැත්තා මෙන්න''** යයි සඳහන් කරමින් සේවකයාට ස්වාමින් වහන්සේගේ සහය ලැබෙන බවත් සේවකයාව ස්වාමින් වහන්සේ විසින්ම තෝරාගෙන ඇති බවත් එම සේවකයා

දෙවියන් වහන්සේට ප්‍රිය ප්‍රසන්නවූ පුත්‍රයෙකු බවත් පැහැදිලි කරන අතර එසේ වන්නේ ප්‍රිය ප්‍රසන්න පුත්‍රයා උන්වහන්සේගේ අභිමතය ඉතාමත් කීකරු කමින් හා පක්ෂපාතිව ඉටු කරන නිසා බවත් අවධාරණය කරනු ලබන්නේ ය

- තෝරා ගත් සේවකයාට තමාගේ කාර්යය ඉටුකිරීමට '' **මාගේ ආත්මානුභාවය මා එතුමාට ප්‍රදානය කර ඇත** '' යනුවෙන් සඳහන් කරන දිවැසිවරයා දෙවියන් වහන්සේ විසින් සේවකයාට පවරා ඇති මෙහෙය සම්පූර්ණ කිරීම සඳහා සේවකයාව සුදානම් කරන බව පෙන්වයි. මෙසේ ආත්මානුභාවය ප්‍රදානය කරන්නේ පැරණි ගිවිසුම තුළ දෙවියන් වහනේසේ ගේ ආත්මානුභාවය එනම් මැවීමේ හා ගැලවීමේ බලය එකල පාලකයන්ට හෙවත් රජවරුන්ට ද දිවැසිවරුන් ට ද ප්‍රදානය කළාසේම මෙහිදි සේවකයා වෙතද, එම බලය සේවය සපුරාලන්නට, දෙවියන් වහන්සේ විසින් තිළිණ කරන්නේ ය යන්න සනාථ කිරීමට ය.

  සාම රාජ්‍යය සඳහා සේවකයාගේ මූලික කාර්යය වන්නේ **සියලු ජාතීන්ට යුක්තිය ගෙන දෙන්නට කට යුතු කිරීම ය.** මෙහිදි යුක්තිය ඉටුකරන සේවකයා ගැන සඳහන් වන්නේ දිළින්දා හා අසරණයා වෙත අයිතිවාසිකම් ලබා දීමට කටයුතු කරන තැනැතැතෙකු වශයෙනි. ඔහුගේ එම දූත කාර්යය ජාතියකට හෝ ප්‍රදේශයකට සීමා නොවන, එහෙත් සියලු ජාතීන් අතරට ගෙන යන විශ්වීය එකක් බව දිවැසිවරයා අවධාරණය කරන්නේ ය

- මෙසියස් තුමන්ගේ කාර්යය හා ක්‍රියාවලිය කොයි ආකාරයෙන් සිදු කරන්නේ ය යන්න පැහැදිලි කරමින් **''එතුමා උස්හඬින් මොරගසන්නේවත් කථා කරන්නේවත් නැත''** කියා සාමාන්‍යයෙන් රජ කෙනෙකුන් තම ජනතාවට උස් හඬින් කථාකර, වීථිවලට ඇසෙන පරිදි හඬ නගන ආකාරය, කොයි ලෙසකින්වත් එතුමන් තුළින් විද්‍යාමාන නොවන බව පෙන්වයි

- එසේම, එතුමන් ගන්නා තවත් ක්‍රියා මාර්ගයකි තැළුනු බට දණ්ඩක් නොකැඩීම හෝ නිවීගෙන යන පහන් තිරයක් නොවීම තැළුණු බට දණ්ඩත් නිවීගෙන යන පහන් තිරයත් දුබල වූ අත්හරින ලද ජන කොටස සංකේතවත් කරන ලදී. එම නිසා සේවකයා පිඩකයෙක්වත්, තමන්ගේ කාර්යය බලය යොදමින්, අන්‍යයන්ගේ දුබල කම තම වාසියට හරවාගන්නට ක්‍රියා කරන්නෙකුවත් නොවන බව, මෙමගින් පෙන්වා දෙයි.

- 42/4 වගන්තියෙන් පැහැදිලි කෙරෙන්නේ සේවකයාගේ යුක්ති ගරුක භාවයයි. යුක්තිය ඉටුකිරීමේ ප්‍රතිචාරයන් අභිමුවෙහිදි, සේවකයා කළකිරෙන්නේවත්, අධෛර්යයට පත්වන්නේවත් නැත, මෙය දිවැසිවර භූමිකාවක් තුළින් මතුවන අත්දැකිමකි. යුක්තිය ඉටු කරන්නට යෑමේ දි, බොහෝවිට දිවැසිවරයාට නැතහොත් දෙවියන් වහන්සේගේ කැමැත්ත කරන්නාට ප්‍රතික්ෂේප කිරීම හා පීඩාව පැමිණෙන්නේ ය.

- එවැනි දුෂ්කරතාවයකදි වුවද, තමන්ට පැවැරුණ කාර්යයභාරය ඔහු කැමැත්තෙන් ඉටු කරන්නේ ය. එසේම තමන්ට පැවරුණ වගකිම මුළු මිහිපිටම එනම් පොළවේ සිමාන්තයන් දක්වා ඉටු කරන බව දිවැසිවරයා පැහැදිලි කරන්නේය.

යෙසායා 42/5, වගන්තිය තුළ දිවැසිවරයා ලෝකාරම්භයේ දි මැවීම සම්බන්ධයෙන් වු සර්වබලැති දෙවිඳාණන්ගේ බලය කියාපාමින්, එම බලයම සේවකයාට පවරා දෙන බවත් එමගින් සේවකයා කරන්නට යන්නාවු කාර්යයට විශාල බලයක් හා ශක්තියක් දෙන බවත් පෙන්වයි.

- සේවකයාගේ කාර්යයට දෙවිඳාණන් විසින් සුවිශේෂාකාරයෙන් ඔහුව යොදාගත් ආකාරය දිවැසිවරයා පෙන්වා දෙන්නේ ය.
- **නුඹ කැඳවා ගතිමි, නුඹ අතින්ගෙන හැඩ ගැසිමි**, නුඹ පත් කළෙමි යන වගන්ති මගිනි. මෙය එක්තරා අන්දමකින් දිවැසිවර ව්‍යවහාරය තුළ කැඳවීමේ දි ද දැකිය හැකි දෙයකි.
- සමිඳාණන් වහන්සේ සේවකයාට විශේෂවු දූතකාර්යන් සඳහා තෝරා වෙන්කර ඒ සඳහා යොදවා ගන්නා බව **නුඹ කැඳවා ගතිමි** යන්නෙන් පැහැදිලි කරයි.
- එම දූත කාර්යය ප්‍රධාන වශයෙන් ගිවිසුම් සම්බන්ධයක් කියාපාන පිය - පුතු සබැඳියාවකි. දෙවියන් වහන්සේ **නුඹ අතින් ගෙන හැඩගැසිමි** කියා සේවකයාව හැඩ ගස්වන්නේ ය.

එමගින් සේවකයා ද ගිවිසුම් සබඳතාවය ගොඩනැගීමේ කාර්යයකට පුතෙකු ලෙස දායක විය යුතු බව, ඉඟි කරන්නේ ය.
- **නුඹ පත් කළෙමි යනුවෙන්**, සේවකයාට පැවැරෙන වගකිම් සම්භාරයක් ඉදිරිපත් කෙරේ.
- **ඒ සෙනග හා පියාණන් අතර ගිවිසුමක් වන පිණිස මෙමගින් සේවකයා හට, මැදිහත්කාරයෙකුගේ ස්වරූපයක් ලබා දෙන සේක.** එසේ කරන්නේ ජනතාව එක්රැස් කර, ඔවුන් හැමදෙනා ගිවිසුමට ඇතුළත් කරගනු සඳහා ය.
- **ජාතීන් අතර ආලෝකයක් වන පිණිස පාපි අන්ධකාරයේ සිටින ජනතාව අතර ආලෝකයක් වන** සේවකයා ජාතීන් සැමට දෙවියන් වහන්සේ වෙත පිය නැගීමේ ආලෝකය දී මාර්ගය පෙන්වන්නේ ය.

**දෙවියන් වහන්සේ සේවකයාට එසේ කරන්නේ**
- සේවකයා විසින් කරනු ලබන විමුක්ති දායක කාර්යය සඳහා ය. එය සංකේතාත්මකව
- අන්ධයන්ගේ ඇස් පැහැදීම
- සිරගෙයි සිරකරුවන් මිදීම
- දඟගෙයි ද අඳුරෙහි ද වසන අය ඉන් මුදනු ලැබීම යන කාර්යයන් සඳහා වන බව පෙන්වයි.

## 2 වන ගීතය - යෙසායා 49/1-7 - ජාතීන් හට ආලෝකයක්

මෙම ගීතය ආරම්භ කරන්නේ, සේවකයා විසින් තමන් ලැබූ කැඳවීම විස්තර කරමිනි. තමාගේ දූත කාර්යය දිවැසිවරය සඳහා බව පවසන මොහු ඒ සඳහා මව්කුසයේ සිටම තමන්ව තෝරාගෙන ඇති බව කියයි. එසේම තමාට ප්‍රකාශ කරන්නට ඇත්තේ විශ්වීය පණිවුඩයක් බව ද සේවකයා ප්‍රකාශ කරයි. (මෙය ජෙරමියා දිවැසිවරයාගේ කැඳවීම හා සමාන්තර බවක් දක්වයි. ජෙර 1/5 බොහෝ දෙනා ජෙරමියාගේ කැඳවීම පිළිබඳ පාඨයකින් උපුටා ගත්තක් ලෙස සලකයි.)

49/2 වගන්තියෙන් පැහැදිලි කරන්නේ සේවකයාගේ දිවැසි කාර්යය අසන්නාට අභියෝගයක් වන බවයි. **''එතුමාණෝ මාගේ වචන තියුණු කඩුවක්** යනුවෙන් සඳහන් කරමින් සේවකයාගේ වචනයේ ඇති බියගෙන දෙන ස්වභාවය පෙන්වයි. මෙසේ පවසන සේවකයාට සමිඳාණන් වහන්සේ සිය අතේ සෙවණැල්ලෙහි ආරක්ෂාව දෙන බව සංකේතාත්මකව පෙන්නුම් කරයි.

**''ඉශ්‍රායෙල් නුඹ මාගේ සේවකයා** ය'' මෙය දෙවි සමිඳාණන් විසින් සිය සේවකයා ගැන කියන ප්‍රකාශනයකි. එනම් සේවකයාගේ සාක්ෂි දැරීම තුළින් ජනතාව දෙවියන් වහන්සේට ප්‍රශංසා කරන බවත් දෙවියන් වහන්සේගේ මහිමය ප්‍රකාශ කරන බවත් ඉඟිකරයි. ඒ කෙසේ වෙතත්, සේවකයා තමාගේ කාර්යය ගැන ලබන අත්දැකීම් හා ආකල්ප දක්වයි. දෙවියන් වහන්සේගේ වචනය ප්‍රකාශ කිරීම තුළින් තමා බලාපොරොත්තුවූ දෙය ඉටු නොවන බවත්, ජනතාවගේ ප්‍රතිචාරය එතරම් යහපත් නොවන බවත් දක්වන සේවකයා, දිවැසිවරයෙකු මෙන් තම කාර්යය ගැන අධෛර්යමත් වෙයි. එහෙත් ඒ සමගම සේවකයා පවසන්නේ තමන්ගේ කාර්යය දෙවිඳුන් අතේ වන බවත්, ඒ මත තම විශ්වාසය තහවුරු වන බවත් ය.

සේවකයාට තවත් කාර්යයක් පැවරෙන බව, 49/5-6 වගන්ති වලින් පැහැදිලි කරන්නේ මා **උපදින්නටත් පෙර සෙනග ආපසු ගෙනෙන පිණිසත්** ........... යනුයෙනි. එනම් විසිරී සිටින ඊශ්‍රායෙල් ගෝත්‍රවලට අයත් ජනයා හෙවත් බැබිලෝනියානු විප්‍රවාසයට යටත්ව සිටි ජනතාව, ආපසු තමන්ගේ දේශයට ගෙන ඒමය. එසේත් නොමැති නම් ඔවුන් හැම පුනරුත්ථාපනය කිරීම ය. මෙම කාර්යය සඳහා සේවකයා දෙවියන් වහන්සේ තුළ යැපෙයි. මෙය විමුක්තිදායකයෙකුගේ කාර්යයකි.

අන්‍ය ජාතිකයන් උදෙසා මැදහත් වීම ඔහුගේ සේවයේ තවත් අංශයකි. එනම් එම සේවය තුළ සියලු ජාතීන්ට ගැලවීම ගෙන ඒම ය. මේ සම්බන්ධයෙන් සියළුම ජාතීන්ට ආලෝකයක් ලෙස සේවකයා විසින් මඟ පෙන්වනු ලැබිය යුතුවිය.

මෙහි දී දැක්වෙන අන්දමට ගැලවීමේ තේමාව තුළ, විශ්විය බව ඉදිරිපත්වීම, පශ්චාත් විප්‍රවාසීය හෙවත් ද්විතීය යෙසායාගේ කාලයේ දී ඇතිවූ සංකල්පයක් ලෙස අවබෝධ කරගත හැක.

## 3 වන ගීතය - යෙසාසා 50/4 - 11 සේවකයාගේ කීකරුකම

'' **පීඩාවට පත්වූවන් ශක්තිමත් කරන පිණිස ගුරුවරයෙකුමෙන්** ............. මා තුළ උනන්දුවක් ඇති කරන සේක'' යනුවෙන් සඳහන් කරමින් සේවකයාව මෙහිදි ඉදිරිපත් කර ඇත්තේ කීකරු, උද්යෝගිමත්, ශිෂ්‍යයෙකු ලෙස ය. එමනිසා සේවකයාගේ ප්‍රධාන කාර්යය වන්නේ, දෙවි සමිඳාණන් වහන්සේට විවෘතව සවන් දීමයි. ඔහු එසේ සවන් දෙන්නේ තමන් අනාවරණය කරගන්නාවූ වචනය තුළින් අන් අය ගොඩනැංවීමට ය. මෙය දිවැසිවරයෙකු සතු ලක්ෂණයෙකි. එනම් දෙවිඳුන්ගෙන් ලැබෙන වචනය ඒ ආකාරයෙන් ම ජනතාවට පැවැසීම එදා විසූ දිවැසිවරුන් විසින් ද කරන ලදී.

දිවැසිවර සේවකයාට, දේව පණිවුඩය අසනු සඳහා දෙවි සමිඳාණන් වහන්සේ ඔහුගේ කන් පහදා දෙන අතර, සේවකයා ප්‍රතිචාරයක් වශයෙන් තම ආකල්පය දක්වයි. එනම් පිටුපා නොයැමත්, කැරළි නොගැසීමත් තුළ සමිඳාණන් වහන්සේට පක්ෂපාතව ක්‍රියා කරන බවත් පෙන්වයි.

තම කාර්යයට දක්වන පක්ෂපාතිත්වය නිසාම තමන් ප්‍රකාශ කරන වචනය හේතුකොට ගෙන, සේවකයා පීඩාවට පත්වන බවක් පෙනේ. හෙතෙම සියල්ල ඉවසීමෙන් දරාගනී. එහෙත් 50/7 වගන්තියෙන් පෙන්වන ආකාරයට තමන්ට දරන්නට වන්නාවූ විපත් හා පීඩා දරාගන්නට තමාගේ පිහිටට සිටින පදනම ''මහෝත්තම දෙවි සමිඳාණන් මට උපකාර කරන බැවින් '' යන විශ්වාසවත් ප්‍රකාශය තුළ ඉදිරිපත් කරයි.

ඒ නිසා තමා කිසි වියවුලකට පත් නොවන බව සේවකයා ස්ථිරවම කියයි. දෙවිඳාණන් මා ළඟය. මා නිදොස් බව එතුවාණෝ පෙන්වන සේක.'' දෙවියන් වහන්සේ තමන් සමග සිට, සහය වීමේ, විශ්වාසය මත, තමා පිළිබඳව සාක්ෂිදරීමේ සත්‍යතාවය සම්බන්ධයෙන්, තම විරුද්ධ වාදින්ට ඔහු අභියෝග කරයි.

සේවකයාගේ අභියෝගයත් සමගම ප්‍රතිවාදින්ට අනතුරු ඇඟවීමක් කරමින් ඔවුන් වෙත දෙවියන් වහන්සේගේ විනිශ්චය දැඩිලෙස පතිත වන්නට යයි කෙරෙන ප්‍රකාශනයක් කරනු ලබන්නේ එය කාවුන් කා දමන පරණ වස්ත්‍රයක් මෙන් වන බවට සහතික කරමිනි.

## 4 වන ගීතය - යෙසාසා 52/13 - යෙසායා 53/12 දුක් උසුලන සේවකයාණෝ

මෙය වනාහි සේවකයා පිළිබඳව ඇති වඩා ප්‍රසිද්ධවූ ගීතය වේ. සේවකයාගේ දූත මෙහෙය හා ඔහුගේ ඔසවනු ලැබීම ගැන සමිඳාණන් වහන්සේ දැනුම් දුන්නේ, ජාතින්ගේ මවිතයට හේතුවන පරිදිය. දෙවියන් වහන්සේ එවැනි පුද්ගලයෙකු ඔසවනු ලැබීම, විශ්වාස කළ නොහැකි දෙයකැයි සමහරු කියති. එසේම සේවකයා විසින් ඔවුන් විඳිය යුතුව තිබූ වේදනාව හා මරණය, දරා ගන්නා ලද බව කියති.

මෙම ගීතය ආරම්භයේදීම ''බලන්න, මාගේ සේවකයාණන්ට ජයඅත්වේ'' යනුයෙන් සේවකයා මහිමයට පත් කරනු ලැබීම ඉදිරිපත් කර ඇත. 52/13 වගන්තිය තුළ එසේ ඉදිරිපත් කර ඇත්තේ, ඔහු විඳිනා කෲර මරණය, එවන් මහිමයකට පැමිණීමට හේතුවන නිසා ය. සේවකයා විඳින වේදනාව කොපමණ තදබලද, යන්න පෙන්වා දීමට, සේවකයා මිනිස් රූපයකට සමාන නොවන ආකාරයට විරූපිව අවලස්සණවී ඇති බවත්, එම විරූපී බව නිසාම ප්‍රතික්ෂේප කරනු ලබන බවත් පැහැදිලි කරයි. 52/15 වන වගන්තියෙන් නැවත වරක් ප්‍රකාශ කරමින් සේවකයාගේ දුක්විඳිම දරුණු අන්දමින් සිදුවන්නේ, කොපමණ ද, එපමණටම ජාතීන් මවිතයටත්, රජවරුන් විස්මයටත් පත්කරවන බවත් කෙසේ වෙතත්, සේවකයා වෙනුවෙන් දෙවියන් වහන්සේගේ අභිරහස්‍යම සැලැස්මක් ක්‍රියාත්මක වන බවත් ඔවුහු එමගින් තේරුම් ගනිති.

- විශේෂයෙන් රජවරුන් හා ජනතාව තුළ ඇතිවන ත්‍රාසයත් භීතියත් පෙන්වා දෙමින්, සේවකයාගේ දුක් විඳීම තුළින් දෙවියන් වහනසේගේ බලවත් හස්තයේ බලපරාක්‍රමය අනාවරණය කරයි.

53/2 වගන්තියෙන් සේවකයා සම්බන්ධ විස්තරයක් ඉදිරිපත් කරමින් හෙතෙම වියලි බිමෙන් මතුවන අංකුරයක් සේද, වැඩෙන පැලැටියක් සේ ද, ජනතාව තුළ බලාපොරොත්තු ඇති කළ කෙනෙකු සේ පෙන්වා දෙයි. එනමුත් බලාපොරොත්තු බිඳ දමමින් සේවකයා දුක් විඳීමට භාජනය වේ. ඔහුව ජනතාව විසින් එපා කරනු ලබයි. නෙරපනු ලබයි. එතුමන් ගැන සැළකිල්ලක් නොදක්වයි. ජනතාව ද අවසානයේ දී සේවකයා සම්බන්ධයෙන් තමන් දුරු ආකල්පයන් පිළිබඳව තමන්ගේ වරද පිළිගන්නට පටන් ගනී.

- 53/7, වගන්තියෙන් දුක් විඳිම සම්බන්ධයෙන් සේවකයා දුරු ආකල්ප පෙන්වන්නේ රූපක දෙකක් මගිනි. එනම්
- මරණයට ගෙන යන බැටළුවෙක්
- ලොම් කැපීම සඳහා ගෙන යන බැටළු දෙනක් වශයෙනි.

මෙම අවස්ථා දෙක මගින්ම සේවකයා කිසිදු ප්‍රතිවිරෝධතාවයක් නොදක්වා නිහඬ වීමෙන් තමාගේ දුක, කිසිදු කැරළි ගැසීමකින් තොරව ඉවසීමෙන් භාරගත් බව පෙන්වන්නේ ය.

- සේවකයාව අයුක්ති සහගතව සහ අසාධාරණව මරණයට පත්කරනු ලබන්නේය .
- එතුමාණන්ව අධර්මිෂ්ඨයන් හා සමග ගණන් ගනු ලැබුවේ ය.

එහෙත් භූමදාන කරනු ලැබුවේ ධනවත් පිළිගත් කෙනෙකුගේ සොහොන් ගැබ තුළය.

**53/10 වන වගන්තිය 4 වන ගීතයේ ඇති වැදගත් හා ප්‍රධාන වගන්තියකි.** එනම්

**''කෙනෙකු තව කෙනෙකු උදෙසා පූජා වීම ය''** හෙවත් පව් නසන යාගයක් වීම ය. මනුෂ්‍යයෙකු පූජාවන බව පරණ ගිවිසුමෙහි ඇත්තේ මෙතැන පමණ ය.

- එතුමන්ගේ එම දුක් විඳිම නිසා ජනතාව දේව සබඳතාවයට පත්වී දෙවියන් වහන්සේ සමග සමගි වේ. එහිදි, තමන් මෙතෙක් මුලාවී දෙවියන් වහන්සේගෙන් ඈත්ව සිටි බව ජනතාවට හැඟී යන්නේ ය.

- මෙම පව් නසන පූජාව නිසා, සේවකයාව මහිමයට පත් කරනු ලබන්නේ ය.

එය දිවැසිවරයා විසින් ඉදිරිපත් කරන්නේ එතුමාණන්ට ඇතිවන විශාල පරපුරත් දීර්ඝායුෂත් යන අදහස් මගිනි.

එතුමාණන්ගේ මැදිහත්වීම හෙවත්, අන්‍යයන් උදෙසා පූජාවීම තුළින් බොහෝ දෙනා ධර්මිෂ්ඨ කමට පමුණුවනු ලැබීය.

## 1.1.1.3.4 ඇදහිල්ල - යෙසායා 1/1-20

ජුදා ජනතාවගේ නොපණත් හැසිරීම සම්බන්ධව සමිඳාණන් වහන්සේ විසින් කරන දෝෂාරෝපණයක් මුල් කරගෙන මෙම ඉගැන්වීම ගොඩ නගන්නට යෙසායා දිවැසිවරයා උත්සාහ දරයි. එදා මැද පෙරදිග පුරාණ රජවරුන් විසින්, තමන්ට යටත්වූ විජිත රාජ්‍යයන්, තමන් සමග කළ ගිවිසුම් කඩ කළ අවස්ථාවන්හිදී, ඔවුන්ට චෝදනාකරන්නට භාවිතා කළ භාෂාවට සමාන ව්‍යවහාරයක් මෙහිදි ද දිවැසිවරයා භාවිතා කරනු ලබයි. දිවැසිවරයා මෙහිදි මතක් කරන්නේ, සීනයි කන්දේ දී දෙවියන් වහන්සේ, ''ඔබ මාගේ ජනතාවය, මම ඔබේ දෙවියෝ ය'' කියා ජනතාව සමග කළ ගිවිසුම, කඩ කිරීමේ වරදට ඔවුන් වගකිව යුතු බව ය.

1/2 වගන්තිය තුළ. ඊශ්‍රායෙල්වරු ගිවිසුම කඩකර ඇති බව තහවුරු කරනු සඳහා ද, එම පිටුපෑම පිළිබඳව සාක්ෂි දෙනු සඳහා ද සමිඳාණන් වහන්සේ කැඳවනු ලබන්නේ අහස හා පොළොවයි.

- ගිවිසුම් සබඳතාවය පෙන්නුම් කරන පිය පුතු සබඳකම මෙහිදි ඉදිරියට ගෙන එමින්, තමා හදා වඩා ගන්නා දරුවන්ගේ ස්වභාවයට වඩා විපරිතවූ ස්වභාවයකින් ක්‍රියාකරන ඔවුන්,

අයිතිකාරයා ගැන දැනුමක් නැති, පට්ටිය ගැන තේරුමක් නැති ගවයන්ට හා කොටළුවන්ට සමානකර දක්වයි.

- ගිවිසුමට පිටුපෑම, දිව්‍යසිවරයා සඳහන් කරන්නේ හිස් මුදුන සිට යටි පතුල දක්වා පැසවූ වණවලින් ද, තුවාල වලින් ද, තැලීම් වලින් ද පිරි, තුවාල සෝදා පිරිසිදු කරනැති පුද්ගලයෙකුට සමාන කරමින් ය.

මෙම තත්ත්වය යටතේ, ගිවිසුමට අපක්ෂපාතවූ ඇදහිල්ලක් නැති ජෙරුසලෙම, මිදි වත්තක මඩුවකට ද, කැකිරි වත්තක පැල්පතක් මෙන් ද පාළුවී ඇති බවත්, එසේවීම සොදොම් නුවර හා සමාන බවත් පවසමින්, එහි ඇති බරපතල බව දිව්‍යසිවරයා පෙන්වා දෙයි.
එනමුත් දෙවි සමිඳාණන්ගේ දයානුකම්පාව හා කරුණාව තුළ ටික දෙනෙකු ගලවන බවත් එයින් දේශයේ ප්‍රතිශ්ඨාපනය සඳහා බලාපොරොත්තුවක් තබමින්, ඔවුන් තුළ ඇති ඇදහිල්ල නිවැරදි කරගන්නට දෙවි සමිඳාණන් ආරාධනා කරන බවත් පෙන්වා දෙනසේක.
1/11-15 දක්වා කොටසින් දිව්‍යසිවරයා දක්වන්නේ, ඇදහිල්ලේ සම්ප්‍රදායයන් ලෙස මිනිසුන් කරන බාහිර දේවල් එනම් - නොයකුත් ආකාර මහා පරිමාණයෙන් කෙරෙන වන්දනා ගමන් ද, දුත්ඔසවා කරන අයැදීම් ද. ඔවුන් වහන්සේ විසින් නුරුස්සන බවත්, ඒවා දෙස නොබලා දෑස් අහකට හරවා ගන්නා බවත් ය.

- සැබෑ ඇදහිල්ල, බාහිර වත් පිළිවෙත් තුළ, නිශ්ඵල වන බවත් සැබෑ පසුතැවිල්ලක් තුළ වන්නාවූ අභ්‍යන්තරිකවූ ඇදහිල්ල පමණක් දෙවිඳුන් ඉදිරියේ ප්‍රසන්න වන බවත් කියන දිව්‍යසිවරයා, ඒ සඳහා වන ජීවිත ප්‍රතිපදාවක් යෝජනා කරයි.

❖ ස්නානය කොට පිරිසිදු වීම
❖ නපුරුකම් තවත් නොකර පව් දුරු කිරීම
❖ යහපත කරන්න ඉගෙන ගැනීම
❖ සමාජයට යුක්තිය ඉටු කරන්නට - පීඩා විඳින්නන්ට පිහිට වීම - අනාථයන්ගේ හිමිකම රැකදීම වැන්දඹුවන් උදෙසා ඉදිරිපත් වීම යනාදි යයි

- ඇදහිල්ල අර්ථවත් වන්නේ, සමාජ සාධාරණය හා, සමාජ සැලකිල්ල මත ය. වෙනත් වචන වලින් කිවහොත් සියළු දේට වඩා දෙවියන් වහන්සේට ආදරේ වෙන්නටත් උන්වහන්සේට ඇති ආදරේ නිසා අපට මෙන් අපේ අසල්වැසියාට ප්‍රේම කිරීමත් තුළය.
- ගිවිසුමට පක්ෂපාතව, සිය කැමැත්තෙන්ම උන්වහන්සේගේ අණ පණත් වලට කීකරු වන්නාහුනම්, සහෝදරයා කෙරෙහි යුක්තිය, සාධාරණය ඉටු කරන්නාහු නම්, ඔවුන්ගේ පව් කමා කරන බවේ, සහතිකයක් දෙන උන්වහන්සේ, සැබෑ ඇදහිල්ල තුළ දේශයේ සාරවත් බව අත්දකින්නට පුළුවන් බව අවධාරණය කරයි.
- දේශයේ සාරවත් බව - කිරෙන් පැණියෙන් ඉතිරෙන දේශය ගැනවූ බලාපොරොත්තුව හා පොරොන්දුව මතක් කරයි, ගිවිසුමට පක්ෂපාතවීම තුල ලැබෙන විපාකය අවධාරණය කරයි.

**ආමොස් 5 / 21 - 27**

ජනවන්දනාව පිළිබඳව මෙම නිර්ධය විවේචනය දිව්‍යසිවරයා එල්ල කරනුයේ, ඇදහිල්ලේ හරයවූ දේව අනාවරණයේ ඵලවන ධර්මිෂ්ඨකමට හා යුක්තියට එරෙහිව, ඔවුන්ගේ ජනවන්දනා කටයුතු සිදුවූ හෙයිනි. වෙනත් වචනවලින් කියතොත්, ජනතාව පවත්වාගෙන ආ ආගමික ඒකාධිකාරය හෙවත් බාහිර වත් පිළිවෙත් හා අභ්‍යන්තරිකවූ ශිලධාර්මික දිවි පෙවෙත අතර ඇති පරස්පර විරෝධී බවක්, දක්නට ලැබුණු හෙයිනි.

ලේඛන ශෛලීය තුළින් මතුකරන ප්‍රතිවිරෝධි සම්බන්ධතා අර්ථ ශූන්‍ය ඇදහිල්ල හා ගිවිසුම් ජීවිතයේ වගකීම්, යුතුකම් අතර පවතින, පරතරය ප්‍රබලම පැහැදිලි කරයි.
සදාචාරාත්මක බවින් තොරව, සමාජ සාධාරණත්වය සුළුකොට තකමින් කෙරෙන ඇදහිල්ලට දෙවියන් වහන්සේ ඉදිරියේ කිසිදු වටිනාකමක් නොමැති බව පෙන්වා දෙන දිව්‍යසිවරයා
'නුඹලාගේ මංගල්‍ය වලට මම ද්වේෂ කරමි. ඒවා මට රුස්සන්නේ නැත. නුඹලා දවන යාග පූජා ද, ආහාර පූජා ද, මට ඔප්පු කරන නමුත් මම ඒවා නොපිළි ගන්නෙමි. සහභාගිකමේ පූජා වශයෙන් මට

ඔප්පු කරන පිණිස නුඹලා තර කළ සතුන් මම නොපිළිගනිමි. නුඹලාගේ ගීත ඝෝෂාව නතර කරන්න. නුඹලාගේ වීණා නාදයට මම සවන් නොදෙමි.'' (ආමොස් 5/21-23 ) යන සමිඳාණන්ගේ පණිවුඩය ප්‍රකාශ කළේය.

සමිඳාණන් වහන්සේ එසේ ප්‍රකාශ කරන්නේ, ඔවුන් යුක්තියට හා දැහැමි කමට විරුද්ධව කරන්නාවූ ක්‍රියාවන් නිසා ය.

**එනම්:**

- යුක්තිය ඉටු කරන්නාට වෛර කිරීම
- අවංක ලෙස කථා කරන්නාව පිළිකුල් කිරීම
- දුප්පතුන් පාගාදමා ඔවුන්ගෙන් අධික ධාන්‍ය කොටසක්, බලයෙන් ගැනීම.
- දමිටුන්ට පීඩා කිරීම.
- අල්ලස්ගෙන උසාවිය මඟින් යුක්තිය ඉටුකරගැනීමට දුප්පතුන්ට ඉඩ නොදීම(ආමොස් 5/10-12 ) මේ නිසා සමිඳාණන් වහන්සේ අවධාරණය කරන්නේ '' යුක්තිය ගලා බහින දිය දහරක් මෙන් ද. ධර්මිෂ්ඨකම නොසිඳී ගලන ගඟක් මෙන් ද පැවැතිය යුතු බව ය. (ආමොස් 5/24)
- මෙනයින් බලන කල සාමාජීය වගකීම පිළිබඳව සම්පූර්ණ වගකීම පැවැරෙන්නේ ආගම ධර්මයට ය.
- ඊශ්‍රායෙලුන්ගේ මේ ශීලධාර්මික නොවූ ඇදහිල්ල, දෝෂදර්ශනයට ලක්කරන සමිඳාණෝ නික්මයාමේ සිද්ධිය ඉදිරියට ගෙනෙමින්, ගිවිසුම් ජනතාවක් ලෙස සිටියදි පවා විවිධාකාරවූ පුද පූජා නොපැවැත්වූ ඔවුන්, අසිරියානු ආක්‍රමණ නිසා ඉශ්‍රායෙල් ඇදහිල්ල තුළටසංක්‍රමණයවූ ''සක්කුත්'' ''කයිවාන් '' වැනි දේවතා වන්දනා වලට ඇබ්බැහි වීමත්, ඒවායේ වත් පිළිවෙත් තම ඇදහිල්ල තුලට ගැනීමත් නිසා, දමස්කයෙන් එපිට අසිරියාවේ වහල් කමට ගෙන යනු ලබන බව ඉඟියක් කරන්නාහ.

  ''ගිවිසුමට අපක්ෂපාතීව බහු දේව ඇදහිල්ලට යොමුවීම තුළ ජීවමාන දෙවිඳාණන්ගේ ගෘහයෙන් ඈත්වීමක් ලෙස පෙන්වා දෙන දිවැසිවරයා සැබෑ ඇදහිල්ල තුළ දේව හස්තයේ බලයටත්, එහි ආරක්ෂාවටත් ජනතාව නතුවන බව මතක් කර දෙයි.

## 1.1.3.5 යුගාන්තීය ධර්මය

මෙම යුගාන්තීය ධර්මය දිවැසිවර ඉගැන්වීම් තුළ තුන් ආකාරයකට දැකිය හැකිය

i ඊශ්‍රායෙල් රාජ්‍යය ප්‍රතිෂ්ඨාපනය කිරීම

ii ස්වාමින් වහන්සේගේ දවස යන සංකල්පය

iii දිවැසිවරයාගේ එළිදරව්වාදි දර්ශන

### i ඊශ්‍රායෙල් රාජ්‍යය ප්‍රතිෂ්ඨාපනය කිරීම

සාමාජීය හා දේශපාලනික ලෙස පිරිහිමට ලක්වූ ඊශ්‍රායෙල් රාජ්‍යය නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීම, අභ්‍යන්තරිකවූ හා ආධ්‍යාත්මික ප්‍රතිෂ්ඨාපනය හා එකාබද්ධව ඇති බව දිවැසිවරුන් තේරුම් ගත්හ. එම නිසා ඔව්හු ජිවිත වෙනස්කර නැවත පුනරුත්ථාපනයක් කරගත යුතු බව අවිවාදයෙන්ම කියා සිටිය හ.

### (අ) යෙසායා 65/17-25

මෙම ඡේදය තුළින් පැහැදිලි කෙරෙන අළුත් අහසක් හා අළුත් පොළොවක් මගින් සංකේතවත් කරන්නේ ජනතාවගේ හා ජෙරුසලෙමේ සංරක්ෂණයයි. මෙම සංකේතාත්මක ඉදිරිපත් කිරීම තුළ, ඊට පළමුව විප්‍රවාසය නිසා ඇතිව තිබුණාවූ වියවුල්, අප්‍රසාද ජනක තත්ත්වය ගැන, ව්‍යංගයෙන් ඉදිරිපත් කරනු ලබයි.

- විප්‍රවාසි තත්ත්වය තුළ ජනතාවගේ දේපල හා නිවාස නැතිවූ විට, අමුත්තන් පැමිණ ඒවා භුක්ති වින්දා හ. එහෙත් නවතම තත්ත්වය තුළ සංරක්ෂණය කළ විට ජනතාව දෙවියන් වහන්සේට කීකරුව හා පක්ෂපාතව සිටින්නා හ. 65/24 වගන්තියෙන්, පැහැදිලි කෙරෙන්නේ, ඔවුන්ගේ ආදරයට දෙවියන් වහන්සේ දක්වන්නාවූ ප්‍රතිචාරයයි.

''ඔවුන් අයදින්නට පෙර මම උත්තර දෙමි, ඔවුන් කථා කරද්දීම මම සවන් දෙමි''

මෙසේ පවසන සමිඳාණන්, ඔවුන්ගේ දේශයට ද, පවුල් වලට ද, ධන ධාන්‍ය වලට ද, දරුවන්ට ද, සාමයේ සංහිඳියාවේ පරිසරයක් ඇති කරන සේක, සෞභාග්‍යයේ දේශයක් ලබා දෙන සේක.

**(ආ) එසකියෙල් 36/ 24-30**

''විජාතීන් අතරෙන් නුඹලා රැගෙන, සියලු දේශවලින් නුඹලා රැස්කර නුඹලාගේම රටට ගෙනෙන්නෙමි'' දිවැසිවරයා මෙමගින් දක්වන්නේ, විදේශිය රටක විප්‍රවාසගතව. සියලු අයිතිවාසිකම් නැතිකරගෙන සිටි ජනතාවකට, දේශපාලනික හා සාමාජීය වූ ප්‍රතිෂ්ඨාපනයක් හා සංරක්ෂණක් ලබාදෙන බවයි.

එමගින් එතුමාණෝ, විප්‍රවාසය නිසා විසිරී සිටින ඔවුන් සැමදෙනාවම ඔවුන්ගේ ආදිපියවරුන් පොරොන්දුවූ ඔවුන්ගේම දේශයට ගෙනෙන බව කියයි. එම පොරොන්දුව වනාහි, උන්වහන්සේ ආබ්‍රහම් වෙත, එනම් කිරියෙන් පැණියෙන් ඉතිරෙන දේශය පිළිබඳව දුන් පොරාන්දුවයි. දේශය වෙත පැමිණවිමට ජනතාව විසින් යොමුවිය යුතු ක්‍රියාමාර්ගයක් විය.

නුඹලා පිරිසිදුවන ලෙස මම නුඹලා කෙරෙහි පිරිසිදු දිය ඉසින්නෙමි.

මෙය පුරාණ ඉශ්‍රායෙලීය සම්ප්‍රදායයේ පැවතෙන පිරිසිදු කිරිමේ පිළිවෙත හා සම්බන්ධය. සම්ප්‍රදායය තුළ දිය ඉසීමක් සිදුකෙරුණත් අභ්‍යන්තර ලෙස පවිත්‍රතාවයක් ලබන ජනතාවට, සමිඳාණන් කරන්නට යන දේ දිවැසිවරයා අවධාරණය කරන්නට උත්සාහ කරයි.

36/26 '' මම අළුත් හදක් නුඹලාට දී අළුත් සිතක් නුඹලා තුළ මවා නුඹලාතේ මුරණ්ඩු ගල් සිත පහකොට කීකරු සිතක් නුඹලාට දෙන්නෙමි.
හෙබ්‍රෙව් චින්තනය අනුව හදවත වනාහි මිනිස් ක්‍රියාකාරිතවය ඇති කරන ඉන්ද්‍රියයි. එම ක්‍රියාකාරිත්වය, ශාරීරික මානසීක හෝ චෛතසික ක්‍රියාකාරිත්වයම වෙනස් කරන බවක් ඉඟි කරයි. මෙමගින් ඇති කෙරෙන නව මුහුණුවර, පෙර තිබූ ගල් සිතෙන් සමුපූර්ණයෙන්ම වෙනස්වීම තුළ වඩාත් කැපී පෙනෙන, ආකාරයක් දන්වයි. ගල් සිත මගින් පෙන්නුම් කරන්නේ දෙවියන් වහන්සේට අකීකරුවූ නොනැමෙන, දැඩි සිතක් ය. මාංශමය හදක් මගින් පෙන්නුම් කරන්නේ දෙවියන් වහන්සේට කීකරු නම්‍යශිලි සිතක් ය.

- මාංශමය හදවතක ක්‍රියාකාරිත්වයට සමිඳාණන් වහන්සේ කුමක් කරන්නේ ද? මාගේ ආත්මානුභාවය නුඹලා තුළ තිදන් කොට නුඹලා මාගේ පණත් අනුව හැසිර මාගේ නියමයන් හරියාකර ඉටුකරන්න සලස්වන්නෙමි.

  දේවාත්මානුභාවය මගින් දේව අභිමතය අනුව කෙරෙන ක්‍රියාකාරිවයත් පෙන්නුම් කරයි. තවදුරටත් එය මිනිසාට දේව ගිවිසුමේ කොන්දේසි වලට කීකරු වන්නට, මිනිසා මෙහෙයවන බලයයි. මෙමගින් දක්වන ගිවිසුමේ කොන්දේසි වනුයේ, බොරු දේවතා පිළිම හා වත් පිළිවෙත් වලින් වැළකි සිටිම ය.

- මා විසින් නුඹලාගේ පියවරුන්ට දෙන ලද දේශයන්හි නුඹලා වාසය කොට මාගේම සෙනගව සිටිනු ඇත. මම ද නුඹලාගේ දෙවියන් වහන්සේ වන්නෙමි.

  මෙමගින් නැවත වරක් කියැවෙන්නේ, ගිවිසුම් වගන්තියයි. එනම් ගිවිසුමක් ඇතිකරගනිමින් සීනයිහිදි උන්වහන්සේගේ ජනතාව වශයෙන් භාරගැනීම නැවත අළුත් කිරීමක් කෙරෙයි.

- මෙසේ ගිවිසුම් ජනතාවක් වශයෙන් සමිඳාණන් වහන්සේ, එම ජනතාවට පවසන්නේ '' මම නුඹලාගේ සියළු අපවිත්‍රකම්වලින් නුඹලා ගලවන්නෙමි. නුඹලා පිට සාගතය නොපමුණුවා, බහුලව ධාන්‍ය උපදවා දී ඒවා වැඩි කරන්නෙමි. නුඹලා විජාතීන් අතරෙහි සාගතයේ නින්දාව තවත් නොලබන පිණිස මම ගස්වල එලද, කෙත්වල අස්වැන්න ද වැඩි කරන්නෙමි 36/29-30 යන ඉහත සඳහන් වගන්ති දෙක මගින් දෙවිඳුන් හා මිනිසුන් අතර

ඇතිවන නව සම්බන්ධතාවයක් පෙන්නුම් කරයි. ඒ බව සාමය හා සමෘධිය දේශය පිට පැමිණීම
මගින් දක්වයි. දේශයක, බහුලව ධාන්‍ය උපදවාලීම හා ඒ මගින් සෞභාග්‍යත්, විජාතීන් අතර
ප්‍රෞඪත්වයත් ලැබීම එම දේශයේ සාමය හා සශ්‍රිකත්වය ස්ථාපිත විමක් ලෙස සැලකේ. මේවා,
ගිවිසුමට පක්ෂපාත වීම තුළ ලබාගන්නාවූ ආශිර්වාදයන් ලෙස දිවැසිවරයා පෙන්නුම් කර දෙයි.

## ii ස්වාමින් වහන්සේගේ දවස

දිවැසිවර ඉගැන්වීම් වල දී, ස්වාමින් වහන්සේගේ දවස යන සංකල්පයෙන් පැහැදිලි කෙරෙන්නේ, දැමිටුවන්ට විපාකයත්, අදැමිටුවන්ට දණ්ඩනයත් දෙන්නට ස්වාමින්වූ ක්‍රිස්තුන් වහන්සේ මහිමාන්විතව පැමිණ මිනිස් ඉතිහාසය තුළ මැදහත් වන බවයි.

### ආමොස් 5/18-20

ස්වාමින් වහන්සේගේ දවස ගැන ආමොස් දිවැසිවරයා තම ඉගැන්වීම පවසන්නේ උතුරු රාජ්‍යයේ දුප්පතුන් තලා පෙළා, දරිද්‍රතාවය ඇති කරන්නාවූ ධනවතුන්ට ය. විශේෂයෙන් තමන්ගේ ධනය හා බලය නිසා ඇති නැති පරතරය වැඩිකරන පැලැන්තියට ය.

- දිවැසිවරයාගේ පණිවුඩය වන්නේ, ස්වාමින් වහන්සේගේ දවස ඔවුන්ට විනිශ්චයේ දවසක් වන බව ය. මේ බව සංකේතාත්මකව අන්ධකාරය හා ආලෝකය තුළින් පෙන්නුම් කරයි.
- මේ නිසාම 5/18 වගන්තිය ශාපයක ආකාරයෙන් ආරම්භ කරයි. එසේ කරන්නේ ස්වාමින් වහන්සේ ඉතිහාසය තුළ මැදිහත් වන විට, ඔවුන්ට බලාපොරොත්තුවක සේයාවක් කිසිවිටෙකත් තැබිය නොහැකි නිසා ය.

- දෙවියන් වහන්සේගේ විනිශ්චය පීඩකයා වෙත ඉතාමත් දැඩි හා නොවැලැක්විය හැකි ආකාරයෙන් ක්‍රියා කරන බව ය. ඒ බව රූපක දෙකක් මගින් විස්තර කෙරේ.
- සිංහයෙකුගෙන් පලා යන මිනිසා වළසෙකුට අසුවන බවත්,
- කිසිදු උපද්‍රයක් නොමැතිව ආරක්ෂා සහිතව තම නිවසට පැමිණෙන මිනිසෙකු බිත්තියට අත තැබූ පමණින්, සර්පයෙකු විසින් දෂ්ට කිරිමෙත් ය.

මෙම රූපක දෙක අනුව කෙනෙකුට තම කල්ක්‍රියාව අනුව ලැබෙන දණ්ඩනය වෙනස් කළ නොහැකි, නිශ්චිත දෙයක් වන බව දිවැසිවරයා පෙන්වා දෙයි.

## iii දිවැසිවරයාගේ එළිදරව්වාදි දර්ශන (ජොවෙල් 3/14-15)

මෙම කොටස එළිදරව්වාදි සංකේතාත්මක කොටසකි.
3/14 වගන්තියන් පෙන්නුම් කරන්නේ මිටියාවතක රැස්වී සිටින හමුදාවන් දෙකක් තීන්දුවක් ලැබෙන තුරු බලාසිටින දර්ශනයකි.

- ජයග්‍රහණය හෙවත් තීන්දුව දෙන්නේ ස්වාමින් වහන්සේගේ දවස තුළය.
- මෙහිදි ස්වාමින් වහන්සේගේ දවස යුද්ධමය පරිසරයක ඉදිරිපත් කර ඇති බව පෙනේ. එය සංකේතාත්මකව දක්වන්නේ යහපත හා අයහපත අතර යුද්ධමය තත්ත්වය තුළ ස්වාමින් වහන්සේගේ දවසේ දි විනිශ්චයක් ඇති කරන නිසා ය.
  ඉර හඳ අඳුරුවී ඇත. තරුවල දිප්තිය නිවී ගොස් ඇත. 3/15 වගන්තියෙන් පැහැදිලි කරන්නේ, මිනිස් ජීවිතය හා ග්‍රහ වස්තු අතර සැසැඳිමකි.
  මිනිස් ජීවිතය හා සසඳා බැලීමේදි, ඉර සඳ තාරකා නොවෙනස් වන සදාකාලික වස්තුන් ලෙස එදා ජනතාව සැලකුහ. නමුත් බයිබලිය කතුවරයා මෙහිදි පෙන්වා දෙන්නේ එම ග්‍රහ වස්තු ඔවුන්ගේ බලය සිඳී, ඔවුන්ගේ භූමිකාවෙන් මිදිමකි.

- මවන ලද කිසිවිටෙක ස්වාමින් වහන්සේගේ දවසේ දි, උන්වහන්සේගේ විනිශ්චය ඉදිරියේ නොසැලී සිටිය නොහැකි බව දිවැසිවරයා පෙන්වා දෙයි. එම නිසා, ඉතා බලගතු ඉරහඳ

සැලුණා නම් දෙවිඳුන්ගේ විනිශ්චය ඉදිරියේ සැම දෙයක් ම, මැවිල්ලක්ම, අසරණ වන බව පෙන්නුම් කරයි.

## 1.1.2. ප්‍රඥා සාහිත්‍යය

### හැඳින්වීම:

දේවවචනය විවිධ මාර්ගවලින් ජනතාව වෙත පැමිණේ. බයිබලයේ ඓතිහාසික ග්‍රන්ථ බිහිවූයේ, ආගමික කවයක් තුළ, ඉතිහාසය පිළිබඳව කරන ලද මෙනෙහි කිරීම්වල ප්‍රතිඵලයක් වශයෙනි. දිවැසිවරුන්ගේ පොත් වල ආරම්භය ඇති වූයේ දිවැසිවරුන් විසින් කරන ලද දේශනා වල ප්‍රතිඵලයක් වශයෙනි.

මනුෂ්‍ය හැසිරීම් පිළිබඳව උනන්දුවක් දැක්වූ සමහර කතෘවරු ප්‍රඥා සාහිත්‍යයට මුල් වූහ. මනුෂ්‍ය ජීවිතයේ විවිධ අවස්ථා, වැටීම් සහ නැගිටීම්, වස්තුවට හිමි තැන, තම ආශාවන් පාලනය කරන හා නොකරන අයට අයිති වන ඉරණම, ආදී මනුෂ්‍ය හැසිරීම් මුල් කරගෙන බයිබලයේ ප්‍රඥා සාහිත්‍යයේ ප්‍රභවය ඇතිවිය. දිවැසිවරුන්ගේ පොත්වල සඳහන් දේව වචනයත්, ඊට සමාන වු දේව වචනයත් මේ පොත්වල සඳහන් වේ. මේ වචනවලින් වෙනස් විදියේ අර්ථයක්, ආලෝකයක් දිස් වේ.

### එහි අන්තර්ගතය

පුරාණ ගිවිසුමේ පොත් හතක් ප්‍රඥා සාහිත්‍යයට අයත් වේ.
උදා: ජෝබ්, ගීතාවලිය, ධර්මදේශකයා, උපදේශකයා හෙවත් සිරාක්, ප්‍රේම ගී, ප්‍රඥා පොත් සහ හිතෝපදේශය යනුවෙනි. මෙම වර්ග කිරීමද ස්ථිර නැත. ගීතාවලියේ ඇති සංගීතවල සංගීත හැටියට ගණන් ගත හැක්කේ ඉතා ස්වල්පයක් පමණි. එලෙසම ප්‍රේම ගී වල ඇතුළත් වන්නේ ද ප්‍රේම ගී සමූහයක් මිස ප්‍රඥා ගී නොවේ. පොත් පහක් පමණක් මේ සනයට අයත් යයි සැළකෙන අතර තෝබිත් සහ බාරුක් යන පොත්වල සඳහන් සමහර කොටස් ද මෙයට අයත් යැයි සැළකිය හැක.

### ප්‍රඥා සාහිත්‍යයේ අරමුණ සහ ආධ්‍යාත්මිකත්වය

හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රධානතම අරමුණ වූයේ ජීවිතය සාර්ථක ලෙසත්, දැහැමි ලෙසත් ගෙවීමට, ජනතාව පෙළඹවීමයි. අනෙකුත් අරමුණු අතර, සමාජය තුළ පරිපාලනයට මෙන්ම, සාමාජීය ජීවිතයේ අර්ථය කුමක් ද? ඒ සඳහා තබාගත යුතු සීමාවන් අවබෝධ කර දීම ද වෙයි. දෙවි සමිඳාණන්ට ප්‍රසන්නවූ අර්ථවත් දිවියක් ගත කිරීමට, මෙම අරමුණු උපකාරිවු බව පැහැදිලි වේ. මෙමගින් අවධාරණය කෙරෙන්නේ **හෙබ්‍රෙව් ප්‍රඥාව හුදෙක් බුද්ධිමය ව්‍යායාමයක් හෝ සංස්ථාවක් නොව, කෙනෙකුට තම ජීවිතය සාර්ථකව ගෙවීමට, දෙවිඳුන් අරමුණු කොට ජීවත්වීම සඳහා සකස් වූවක් බවයි.**

### ප්‍රඥා සාහිත්‍යයේ ආරම්භය

ප්‍රඥා සාහිත්‍යය වර්ධනය වූයේ පුරාණ පෙරදිග රටවල ය. ඊජිප්තුවේ 'සෙබායිට්' නම් වූ ඉගැන්වීම මුලික කරගෙන ය. ප්‍රඥා සාහිත්‍ය බිහි විය. මෙය ක්‍රි.පූ. තෙවන ශත වර්ෂයේ සිට ක්‍රිස්තුන් වහන්සේගේ කාලය දක්වා විහිදුණි. මෙසපොතේමියාවේ මනුෂ්‍යයාගේ දුක්විඳීම පිළිබඳ ආප්තෝපදේශ ද, උපමා කථා ද, කාව්‍ය ප්‍රබන්ධ ද බිහිවිය. 'ධුම්බා' නම් වූ ආයතනය, තිපූර් හි පිහිටි ප්‍රඥා සාහිත්‍ය පිළිබඳ විශේෂ ස්ථානයකි. ක්‍රි.පූ. දෙවන ශතවර්ෂයේදී ලේකම්වරු ප්‍රඥා වගන්ති පිටපත් කරනු ලැබුයේ මේ ප්‍රඥා ග්‍රන්ථ වලිනි. අසිරියාවෙන් ආරම්භ වූ 'අට්කාර්' නම් වූ ප්‍රඥා පොත් ඇරමයික් භාෂාවෙන් ලියැවුණු අර්කාස්වලින් පැවතෙන්නකි.

ප්‍රඥා සාහිත්‍යයට ජාතියක් නැත. ආගමික සිතුවිලිවලට සුළු අවධානයක් දෙන අතර මනුෂ්‍ය ජීවිතයේ විවිධ අවස්ථාවන්ට වැඩි අවධානයක් යොමු කරයි. ඒවා ජීවිතය විග්‍රහ කරයි. එසේ කරනුයේ ග්‍රීකයන් මෙන් දර්ශනවාදයට බරව නොව, ජීවිත අත්දැකීම්වලට අවධානය දෙන අයුරිනි.

'අට්කාර්' කථාක්‍රිස්තු පූර්ව පස්වන ශත වර්ෂයේදී ලියන ලද පුස්කොළ පොත්වල සඳහන් වේ. මේ කථා, අරාබි කථා, කුරානය, ඊසොප්ගේ කථා වලට හා සභා පියවරුන්ට, ග්‍රීක දර්ශනවාදීන්ට සහ පුරාණ ගිවිසුමට පවා බලපෑමක් කරන ලද බවට නොඅනුමානය. තවද, මෙහි දරුවන්ගේ යහපත සඳහා විනයානුකූලව හැසිරීමේ ඇති වැදගත් කම පිළිබඳව තම සහෝදර සහෝදරියන්ගේ පුත්‍රයන්ට දෙන අවවාද අනුශාසනා සමුදායක් සඳහන්ව ඇත.

වේවැල භාවිත නොකළ හොත් ඔහු නපුරෙන් වළකා ගැනීමට නොහැකි වේ. දිව ප්‍රවේශම් කර ගැනීමත්, රජවරුන් ආශ්‍රය කිරීමේදී සිහිකල්පනාවෙන් කටයුතු කිරීමත්, රහස් ආරක්ෂා කිරීමත්, පිළිබඳ වැදගත් දේ ගැන ඒවායේ සඳහන් වේ.

එහි සඳහන් ප්‍රඥාව ජාත්‍යන්තර දෙයක් සැටියට සැළකේ. ඉශ්‍රායෙලය, අසල්වාසී රටවල් සමඟ සංසන්දනය කරන විට මේ පිළිබඳව උනන්දු වූයේ බොහෝ කාලයකට පසුව ය. ඉශ්‍රායෙල් ප්‍රඥා සාහිත්‍යය බොහෝ දුරට අවධානය යොමු කළේ මනුෂ්‍ය ජීවිතය පිළිබඳ සිද්ධීන්ට ය. සත්ත්ව ජීවිතය පිළිබඳව උනන්දු වූ අවස්ථාවන් ද නැත්තේ නොවේ.
**උදා:** ජෝබ් 38-41 පරිච්ඡේද සහ උපදේශකයාගේ පොතේ 30 පරිච්ඡේදය.

සලමොන් රජතුමාගේ ප්‍රඥාව අති විශිෂ්ට වූ දීමනාවක් ලෙස පුරාණ ගිවිසුමේ විදහා දක්වයි. 1 රාජාවලියේ 4:29-34 මේ බව සනාථ කරයි. ප්‍රඥාව නැමැති දීමනාව ගැන ඔහුගේ යාච්ඤාවේ සඳහන් වේ. (1 රාජාවලිය 3:5-14) වෛශ්‍යා ස්ත්‍රීන් දෙදෙනාගේ කථා සහ ෂෙබාහි රැජිනගේ පැමිණීම මෙයට හොඳ උදාහරණ වේ. 1 රාජාවලිය 3:16-28, 10:1, 4:30 වගන්තිවල සඳහන් වන්නේ සලමොන් රජතුමාගේ ප්‍රඥාව අනිකුත් සියළු රජවරුන්ගේ ප්‍රඥාව අභිබවා ගිය බව ය.

ජුදා සහ ක්‍රිස්තියානි සම්ප්‍රදායයන් මුළු ප්‍රඥා සාහිත්‍ය ම සලමොන් රජතුමාගේ කෘතියක් සැටියට සඳහන් කරයි. උපදේශකයාගේ ග්‍රන්ථයේ 1:1 එය සලමොන් රජතුමාගේ කෘතියක් බව සඳහන් කරයි. මෙම ග්‍රන්ථය සලමොන් රජතුමාට පැවරුවත්, පරිච්ඡේද 10-22 දක්වාත්, 25-29 දක්වාත් පූර්ව සමයන්ට අයිති වන අතර, කුමන කොටස් සලමොන්ගේ යුගයට අයත් වන්නේ දැයි නිශ්චය කළ නොහැක. එලෙසම ප්‍රේම ගී පොතේ 1:1 වගන්තියේ ද සඳහන් ය. උපදේශකයාගේ පොතේ කතෘ, ඉශ්‍රායෙලයේ ජෙරුසලමේ නගරයේ විසූ රජතුමෙකු බව 1:2 සඳහන් ය. ප්‍රඥා පොතේ 6:22 වගන්තියේ සලමොන් රජතුමා ගැන සඳහන් වේ.

ජේසු නිකායික රොඩරික් මැකෙන්සි පියතුමා (බිබ්ලිකල් ක්වාටලී) සඟරාවේ සඳහන් කරනුයේ, බයිබලයේ සෑම පොතකම ශුද්ධාත්මානුභාවයෙන් ලියන ලද නිසා ඒවා වල කතෘත්වය ප්‍රසිද්ධ පුද්ගලයන් මෙන්ම දිවැසිවරුන්ට පැවරීම එදා සාමාන්‍ය සිද්ධියක් වූ බව ය.

## ප්‍රඥා සාහිත්‍යයේ ජීවිත රටා පසුබිම

1 සාමුවෙල් 8:5,20 වගන්තීන්ට අනුව, ඉශ්‍රායෙලයේ රාජ්‍යතන්ත්‍රයේ සකස් වූයේ අසල්වැසි රාජධානි අනුගමනය කිරීමෙනි. ඊජිප්තුව තරම් තම සම්ප්‍රදායයන්ට ඇබ්බැහි වූ වෙන රාජ්‍යයක් නැත. සලමොන් රජ විවාහ වූයේ පාරාවෝ රජුගේ දියණිය සමග ය. (1 රාජාවලිය 3:1)

ඊශ්‍රායෙලයේ රාජ සභාව පවා සකස් වූයේ ඊජිප්තුවේ රාජ සභාවට අනුව ය. බයිබලයේ 2 සාමුවෙල් 8:15-18 සහ 1 රාජාවලියේ 4:1-7 හි දාවිත් සහ සලමොන් යන රජවරුන්ගේ රාජ සභා පූජකවරුන්, ලේකම්වරුන්, ප්‍රධානීන් ඇතුළු සේවකයින්ගේ නම් ලැයිස්තුවක් සඳහන් වේ. සලමොන් රජතුමා මේ අය රාජ සභාවේ විවිධ කාර්යයන් සඳහා පුහුණු කර, ඒ ඒ සේවාවන් ප්‍රතිසංවිධානය කරන ලද බව 1 රාජාවලිය 4:8-19 වගන්ති හි සඳහන් වේ.

පුරාණ ඊජිප්තුවේ රාජ්‍ය සේවකයින් පුහුණු කිරීම සඳහා විශේෂ පාඨමාලාවක් විය. "සෙබායිට්" හෝ ඉගැන්වීම් යන නමින් හැඳින්වුණ මේ ක්‍රියාදාමය ගැන ඊජිප්තුවේ ලියකියවිලි වල සඳහන් වේ. පාලනයට සුදුසුකම් ලද්දවුන් සහ රාජ සභා සේවකයින් පුහුණු කිරීම සඳහා සෙබායිට් නම් වූ මේ පාඨමාලාව යොදා ගන්නා ලදී. එහි සඳහන් වූයේ ජීවිතය සහ යහපත් හැසිරීම පිළිබඳ අනුශාසනා පද්ධතියකි. මේවා ගුරුවරුන්ගෙන් ගෝලයින්ට නොකඩවා පැවත ආවේය. මේ ලියවිලිවලත්, පුරාණ ගිවිසුමේ ප්‍රඥා

සාහිත්‍යයත් අතර ඉතා සමීප සමානතාවක් ඇත. ඒ නිසා මෙවැනි සාහිත්‍යයකට රාජ සභා සැලැස්ම මුල පිරූ බව සිතීම සාධාරණ ය. (හිතෝපදේශ 16-25 පරිච්ඡේද)

සමහර බයිබල් විශාරදයින් මේවායේ ප්‍රභවය, පවුල දක්වා විහිද යා යුතු බව සඳහන් කරයි. ප්‍රඥා සාහිත්‍යය රාජ සභාවට නොගැලපෙන බව පවසයි. ඔවුන් තර්ක කරන්නේ රාජ සභාවෙන් මේවා ආරම්භ නොවූ බවත්, මුඛ පරම්පරා ගත සම්ප්‍රදායයන් තුළින් මේවා රාජ සභාවට සපැමිණි බවත් ය. ප්‍රඥා සාහිත්‍යය ආරම්භ වූයේ සලමොන් රජතුමාගෙන් නොවේ. එය බොහෝ කලකට පෙර තිබුණ බවත්, එහි ආරම්භයේ සාමාන්‍ය පරිසරය වූයේ පවුල බවත් ය. තෝබිත් 4 පරිච්ඡේදය සහ හිතෝපදේශ 31:1-9 දක්වා වගන්ති මීට දෙස් දෙයි. හිතෝපදේශයේ 4 වන පරිච්ඡේදයේ සඳහන් වන, 'මගේ පුත්‍රය' යන වචනය රාජ සභාවේ භාවිතා වන වචනයක් නොව, සාමාන්‍ය පවුල තුළ භාවිතා වන වචනයකි. ඒ නිසා මෙහි ආරම්භය පවුල තුළ සිදුවූ බවට මෙය කදිම සාක්ෂියකි.

එදා තරුණයින්ට අධ්‍යාපනය දීම පවුල තුළ සිදුවිය. පියෙක් තම පුතුට දෙන අවවාද ප්‍රඥා සාහිත්‍යයේ සඳහන් වේ. මෙවැනි අවවාද රාජ සභා සේවකයින් පුහුණු කිරීම සඳහා භාවිතා කළේ යයි සිතීම උගහට ය. ඒ නිසා පුරාණ ගිවිසුමේ, ප්‍රඥා සාහිත්‍යයේ උපත සහ වර්ධනය, පවුල සහ රාජ සභාව තුළ සිදු වූයේ යයි අවසාන ලෙස අපට සිතිය හැක.

## මේ අනුව හෙබ්‍රෙව් ප්‍රඥාවේ මූලික ලක්ෂණ ලෙස

i පැරණි ගිවිසුමේ බොහෝවිට දක්නට ලැබෙන මූලික තේමාවන් වන ගිවිසුම, නික්මයාම වැනි දේ කෙරෙහි එතරම් අවධානයක් යොමුවී නැති බවත්

ii පැරණි මැද පෙරදිග ප්‍රඥාවේ ආභාෂය, මෙයට ඉතා සමීපව ඇති බවත් දැකිය හැක.
ඉහත දැක්වූ අන්දමට හෙබ්‍රෙව් ප්‍රඥාව විවිධාකාරව සමාජය තුළ දැකිය හැකිය. එහි මූලික කොටස් වන්නේ

### (අ) පවුල් හෝ ගෝත්‍රික ප්‍රඥාවක් ලෙස Family or tribal Wisdom

පවුල හෝ ගෝත්‍රය ආරක්ෂා කිරීම සඳහා වූ නීති රීති සම්ප්‍රදායයන් මෙහි අඩංගුය. මේවා නිසා පවුල් සංස්ථා හා ගෝත්‍රික අනන්‍යතාවයන් සුරක්ෂිත වන බවේ අවබෝධයක් ලබා දුනි.

### (ආ) රාජ්‍ය සභා ප්‍රඥාවක් ලෙස Court Wisdom

සමාජයේ ඉහළ සිටින අයට තම කාර්යයන් සඵල කරගැනීම සඳහා දෙන අධ්‍යාපනය මෙමගින් පෙන්නුම් කරයි. රජ දරුවන්, පාලකයන්, නායකත්වය සඳහා පුහුණු කිරීම. සමාජය සමග ඇසුරු කිරීමේ ක්‍රම වේදය, ආදිය මෙමගින් අවධාරණය කරන ලදි. මෙය බොහෝදුරට, සමාජයේ ප්‍රභූ පිරිස සඳහා වෙන්වූවක් ලෙස සැලකුණි. (උදාඃ සලමොන්ගේ ප්‍රඥාව 6/1-11)

### (ඇ) අභිධාර්මික ප්‍රඥාවක් ලෙස Reflective or Philosophical Wisdom

මෙමගින් කෙරෙන්නේ ජිවිතයේ තිබෙන ගැටළු හෝ විශ්වාසය සම්බන්ධව ප්‍රශ්න ගැඹුරු අන්දමින් සාකච්ඡා කිරීමකි. මෙය ඥාණික අංශය කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වයි.(උදාඃ ජෝබ්, ධර්මදේශකයා)

### (ඉ) ප්‍රායෝගික ප්‍රඥාවක් ලෙස Practical form of Wisdom

මෙය එදිනෙදා ජීවිතය සාර්ථකව ගෙන යාම සඳහා දෙන උපදේශනයකි. මෙහිදී මිත්‍රත්වය ගැන සාකච්ඡා කරමින් ප්‍රඥාව පිළිබඳව ආකල්ප ගොඩනගයි. (උදාඃ උපදේශකයා 6/5-17) (හිතෝපදේශය 6. 25 පරිච්ඡේද)

**ඉහත කී හෙබ්‍රෙව් ප්‍රඥාව විවිධවූ සාහිත්‍යමය ශෛලින් මගින් ඉදිරිපත් කෙරේ.**

## i ප්‍රස්ථා පිරුළු Proverbs

යම් කිසි සත්‍යතාවයක් කෙටියෙන් කා වදින ලෙස ඉදිරිපත් කිරීම කි.
(මෙය කවියක්. ගීතයක්, වැකියක් මගින් ඉදිරිපත් කෙරේ)

## ii උපදේශ Exhortations

මේවා පියෙක් පුතෙකුට ඉදිරිපත් කරන ආකාරයට බොහෝවිට ''මාගේ පුත්‍රය'' යනුවෙන් සඳහන් වේ. එහෙත් මෙහි ඇත්තේ පිය පුතු සම්බන්ධතාවයකට වඩා ගුරු ගෝල සබඳතාවයකි. - මෙය සෙබයිට් ප්‍රඥාවේ ආභාෂයකි.

## iii කියමන් Sayings

මේවා වනාහි ජීවිතයට සාර්ථකව මුහුණ දුන් අයගෙ,් එනම් ප්‍රඥාවන්තයන්ගේ කියමන් ය.

## iv උපමා Parables

යම්කිසි පණිවුඩයක් ඉදිරිපත් කිරීම සඳහා ස්වභාධර්මය හෝ එදිනෙදා ජීවිතයෙන් ගත් දෙයක් සංසංදනාත්මකව ඉදිරිපත්කර, අසන්නාට යම්කිසි ආකාරයක අභියෝගයක් එල්ල කරන සාහිත්‍යමය උපක්‍රමයකි.

## v කථාන්තර Stories

මේවා නාට්‍යාකාරයෙන් සත්‍ය ගැඹුරු පණිවුඩයක් ඒත්තු ගැන්වීමට යොදා ගන්නා ඉතා සරල ක්‍රමයනි. (උදාඃ ජොබ්)

## vi ගීත Songs

මෙය බොහෝවිට සලමොන්ගේ ප්‍රඥාවේ අවසාන පරිච්ඡේද දෙක තුළ දැකිය හැක.

## පුරාණ ගිවිසුමේ ප්‍රඥාව

### ප්‍රඥාව ඉතා සංකීර්ණ දෙයකි.

1) ශිල්පියෙකුගේ දක්ෂතාවයට ප්‍රඥාව යෙදිය හැක. ඇඳුම් මසන්නා (නික්මයාම 28:3), වඩුවා (නික්මයාම 31:3-5, 36:1).
2) දුක් වෙන්නන්ගේ හා නාවිකයන්ගේ දක්ෂතාවය (ජෙරමියා 9:17:ගීතාවලිය 107:27).
3) ප්‍රඥාවන්තයෙක් යනු, රජුන්ට අනුශාසනා කරන්නෙකි. (ජෙරමියා 50 :35, හිතෝපදේශ 31:1)
4) තීක්ෂණ බුද්ධියක් ඇති මහළු ස්ත්‍රියකි. (2 සාමුවෙල් 20:16).
5) දේව භය නැමැති අධ්‍යාත්මික වටිනාකමක් ඇත. (හිතෝපදේශ 1:7: සිරාක් 1:9-10)
6) ප්‍රඥාවේ යම්කිසි දේවත්වයක් ඇත. (හිතෝපදේශ 8: සිරාක් 24)

### ප්‍රඥාව සහ අත්දැකීම්

අත්දැකීම් සහ නිරීක්ෂණයන් ප්‍රඥාවේ අභ්‍යන්තර ආලෝකයන් සැටියට හඳුනා ගත හැක. එය ප්‍රඥාවේ අත්දැකීමයි. එය විවිධ අවස්ථාවලදී, මනුෂ්‍යයා සත්‍යයට විවෘත වීමෙන් ලැබෙන ප්‍රතිඵලයකි. ඒවාට ඔහු

දක්වන ප්‍රතිචාරය, ඒවා තේරුම් ගැනීමට සහ පාලනය කිරීමට දරන උත්සාහයකි. මෙලෙස ඔහු ලබන අභ්‍යන්තර ආලෝකය, සත්‍ය වටහා ගැනිමට උදව්වකි. අවසානයට එය සාමාන්‍ය නිතියක වලංගුතාවය ඇති කරයි. එලෙස ''වැටීමට පෙරටුවෙන් උඩඟුව'' යන කියමනෙන් (හිතෝපදේශ 16:18) සත්‍ය, දීර්ඝ කාලයකට පසු වැටහේ. (හිතෝපදේශ 18:12) මෙලෙස ස්වභාව ධර්මය හා මනුෂ්‍ය හැසිරීම පිළිබඳ වූ උපමා ඇතිවුණි. දීමට පොරොන්දු වී නොදී සිටින අය, වැහි නොදෙන සුළං හා වළාකුළුවලට සමානකර ඇත. (හිතෝපදේශ 25:14).

## ප්‍රඥාව, සිල්වත් හැසිරීම සහ වන්දි ගෙවීම

ප්‍රඥාවේ සහ ධර්ම ගුණවල ඇති සම්බන්ධතාව පැහැදිළි ය. හිතෝපදේශ 10 පරිච්ඡේදයේ යහපත් හා අයහපත් අය අතර ඇති පරතරය පෙන්වා දෙයි. රාජ සභා පුහුණුව, ශීලධර්මය හා සම්බන්ධ වූවාට කිසිම අනුමානයක් නැත. ඊජිප්තුවේ ප්‍රඥාවේ සමහර ක්‍රියා දේව කැමැත්ත හා සබඳතාවක් පෙන්වයි.

සමහරවිට හිතෝපදේශය හැඳින්වීමේ දක්නට ලැබෙන හොඳ ම නිදසුන් විප්‍රවාසයෙන් පසු ලියන ලද ඒවා ය. දේව ගරුබිය ප්‍රඥාවේ මුල් පියවර වේ. ප්‍රඥාවන්තයාගේ විපාකය වනුයේ දෙවියන් වහන්සේ හා මිනිසුන් අභිමුව ප්‍රසාදයට හා කීර්තියට පාත්‍ර වීම ය. (හිතෝපදේශ 3:4) ඒ හැමට වඩා ප්‍රඥාව යනු ජීවිතයයි. (හිතෝපදේශ 8:35). එදිනෙදා ජීවිතයේ ප්‍රායෝගික පැත්ත ශීල ධර්මයන්ට අමුද්‍රව්‍ය මෙන් වේ. ඒ නිසා තමාගේ නරක මිතුරන් පිළිබඳ ඇගයීම කුමක් විය යුතු ද? (හිතෝපදේශ 1:8-19: 2:14). ඊර්ෂ්‍යාව මනුෂ්‍යයෙකුට කරන්නේ කුමක් ද? උඩඟුව මිනිසා ගෙනයන්නේ කොහි ද? වෛශ්‍යාවන් දෙස අපි බැලිය යුත්තේ කෙලෙසට ද? (හිතෝපදේශ 13:20: 14:30: 29:33: 23:26).

තව දුරටත් කරුණාව ප්‍රයෝජනවත් ය. අකරුණාව විනාශකාරී ය. (හිතෝපදේශ 11:17). කලහයක් එකවරම සමථයකට පත් කරන්න. (හිතෝ. 17:12). දුශ්ශීල ක්‍රියා පෙන්වා දෙයි. අසාධාරණ ලබා ගැනීම් (10:2) බොරු සාක්ෂිය (25:18), අල්ලස් (24:23-24), බොරු කීම සහ ඉච්ඡා බස් දෙඩීම (26:28) සමහර ශීල ධර්ම මඟින් අවධාරණය කරයි. දුප්පතුන්ට කරුණාව දැක්වීම (14:31), දේව ගරු බිය (19:23) සමිඳුන් කෙරෙහි පිපාසය (28:25) විශේෂ ය.

නීති ගරුකව ජීවත් වීම සහ ප්‍රඥාව අනුව යාම යහපත් ජීවිතයක මිණුම් දණ්ඩ වේ. සිරාක් 24:22 සහ බාරුක් 4:1 හි පංච පුස්තකය (ටෝරා) ප්‍රඥාව බව නිසැකව ම පවසයි. ප්‍රඥාව ලබා ගත් අයට ලැබෙන විපාකය නම් දැහැමි ජීවිත මාවතය. (හිතෝපදේශ 12:28), ප්‍රඥාව ලබා ගැනීම හා ගුණධර්ම ජීවන වෘක්ෂය හා (හිතෝ. 11:30: 13:12: 15:4) ජීවන උල්පත හා සම්බන්ධ වේ. (හිතෝ. 10:11: 16:22).

අමරණීයභාවය පිළිබඳ ධර්මය සහ එහි වර්ධනය ප්‍රඥා සාහිත්‍ය හා සම්බන්ධ වේ. ජෝබ් කථාව සහ ධර්මදේශකයා මීට සාක්ෂි දරයි.

## ප්‍රඥාව සහ දෙවියන් වහන්සේ

දෙවියන් වහන්සේ ප්‍රඥාව බව අවසන් නිගමනයේ දැක්වේ. (ජෝබ් 12:13: දානියෙල් 2:20). එය උන්වහන්සේගේ මැවීමේ කාර්යයේ විශේෂ ලක්ෂණයකි. මැවීම තුළ දෙවියන් වහන්සේ නිර්මාණ ශිල්පියෙකු ලෙස දැක්වේ. (ගීතාවලිය 104: හිතෝපදේශ 3:19, 8:30, ප්‍රඥා 9:9) මැවිල්ල තුළ කිසිතැනක ප්‍රඥාව සොයා ගත නොහැක. එය ලබාගන්නා මාර්ගය දන්නේ දෙවියන් වහන්සේ පමණි. ප්‍රඥාවන්තයා ඒ ගැන නොදන්නේ ය. මනුෂ්‍ය ඉතිහාසය සැබවින් ම ගැළවීමේ ඉතිහාසයකි. ආදම්ගේ සිට නික්මයාම දක්වා ප්‍රඥාව මනුෂ්‍යයා මිදීමේ කාර්යයෙහි යෙදුණි. (ප්‍රඥා 9:18: 10:18)

මෙලෙස විස්තර කිරීමේ දී, ප්‍රඥාව මනුෂ්‍යයෙක් ද යන පැනයට මුහුණ දෙන්නට සිදුවුණි. ප්‍රඥා පොතේ ප්‍රඥාවේ අනන්‍යතාවය හඳුන්වන්නේ දෙවියන් වහන්සේගේ 'ස්ප්‍රීතුව' (ප්‍රඥාව) වශයෙනි. නැතහොත් උපදෙස් ගැන ශුද්ධාත්මයාණන්ගේ ස්ප්‍රීතුව වශයෙන් නම් කර ඇත. (1:5). ඉහළින් ගලා එන ශුද්ධාත්ම ස්ප්‍රීතුව 9:17-18 හි හඳුන්වා දෙයි.

පසුව ඇති වූ ප්‍රඥා සාහිත්‍යයේ ප්‍රඥාවට සප්‍රාණික වූ බවක් ගෙනහැර දක්වයි. මෙය දක්නට ලැබෙනුයේ හිතෝපදේශ 1:33: 8:1, 36: සිරාක් 24:1-22: ප්‍රඥා 12:9-18 සහ 7:22-30 හි ය. දෙවියන් වහන්සේගේ සුලක්ෂණ සප්‍රාණික ලෙස දැක්වීම පුරාණ ගිවිසුමට පොදු වූවකි.

- ඔබේ දැහැමි සිරිය ඔබ ඉදිරියෙන් ගමන් ගන්නේ ය. (යෙසායා 58:8)
- කරුණාව හා සත්‍යය පණිවිඩකාරයන් මෙන් සමිඳුන් ඉදිරියෙන් ගමන් කරනු ඇත. (ගීතාවලිය 88:15).
- දෙවියන් වහන්සේගේ ස්ප්‍රීතුව (ප්‍රඥා 1:7). දෙවියන් වහන්සේගේ වචනය (ප්‍රඥා 8:15).

අප වටහා ගතයුතු කරුණක් නම්, මේ ප්‍රඥා සාහිත්‍යය සකස් කිරීමේ දී ඉශ්‍රායෙලය හා අසල්වැසි රටවල් අතර සම්බන්ධතාවක් ඇතිවූ බව ය. ඒ නිසා ප්‍රඥා සාහිත්‍යය ජාත්‍යන්තර ලෙස සැලකිය හැක. ඉශ්‍රායෙල් ජනතාව විසින් නිදහසින් එකතුකරගත් කාණ්ඩය සැටියට මෙය සැළකිය හැකි ය. එහෙත් තමා උකහා ගත් දෙය හොඳින් ජීරණය කරගෙන තමාගේ ම ශෛලියෙන් නැවත ප්‍රකාශ කිරීම ඔවුන්ගේ සිරිත විය.

## 1.1.2.1. ගීතාවලිය

### හැඳින්වීම හා පසුබිම

ගිතාවලිය යනු යාච්ඤාමය පද්‍යන් 150 ක එකතුවෙන්, එකම පොතක් ලෙස සකස් වූවෙකි. මේ සැම පද්‍යක්ම තත් සහිත වාද්‍ය භාණ්ඩයක් සමග ගායනා කළ ඒවා විය. මෙම සංගීත බොහෝමයක් දෙවියන් වහන්සේගේ යහපත් කම නිසා, පිරී ඉතිරී යන සතුටකින් හා ප්‍රශංසාවකින් කියන ලද ඒවාය. තවත් සමහර සංගිත දුක විලාපය හෝ පශ්චාත්තාපයේ ස්ප්‍රිත්තුව ඇතිව ගයන ලද ඒවා ය. සමහර සංගීත ඉලක්ක කරගනු ලැබුවේ ලෙඩ දුක් හා හා ජිවිතයේ අමිහිරි අත්දැකිම් වෙනුවෙනි, එහෙත් මේ හැම දෙයකින්ම අපට දැකිය හැක්කේ බයිබලයේ අනෙක් ඕනෑම පොතකට වඩා, යාවේ දෙවිඳුන් වෙත ඉශ්‍රායෙලිය ජනතාවගේ ආකල්පයන්හි පුළුල් බව හා ගැඹුරත්වයයි.

හෙබ්‍රෙව් භාෂාවෙන් මෙම සංගීත පොත හඳුන්වනු ලබන්නේ ''තෙහිලීම්'' යනුයෙනි. එනම් ප්‍රශංසාව යනුයෙනි. මෙම නාමය මගින් ද. අනෙකුත් ඕනෑම වචනයකට වඩා ගීතාවලියේ ඇතුලාන්ත අරුත ගෙනහැර පාන්නේය. ඉතාමත් ගැඹුරු දුකකින් හෝ වේදනාවකින් පැවැසුවත්, ඒ හැම එකක් තුළින්ම දෙවිඳුන්ගේ යහපත කෙරෙහි විශ්වාසයත් යැපි සිටිමත් හඟවනු ලබන්නේ ය.

වර්තමානයේ දි ඉදිරිපත් කර ඇති මෙම සංගීත 150, එකම විෂයයක් යටතේ හෝ, එක් කෙළවර සිට අනෙක් කෙළවර දක්වා වර්ධනය වන තේමාවක් ආකාරයෙන් හෝ සඳහන් නොවේ. මෙය කුඩා කොටස් වල එකතුවක් ලෙස දැක්විය හැක. බොහෝ සංගිත ''දාවිතීය'' (Davidic) ගිත වශයෙන් ද ආසාප් (Asaph) ගීත වශයෙන් ද, ''කෝරා'' ගේ (Korah) ගීත වශයෙන් ද ආරම්භයේ දීම හඳුන්වා දී ඇත. මෙමගින් හඟවනු ලබන්නේ දාවිත් හෝ ආසාප් හෝ කෝරා හෝ මේවා ලියූ බවක් නොව, ඔවුන් විසින් මේවා එකතු කරන ලද බවකි. බොහෝ දාවිතිය ගීත, රාජකීය ගීත වශයෙන් සැලැකිය හැකිවන අතර, ආසාප්ගේ ගීත දේව මාලිගා ගීත එකතුවකින් ලැබුණ ඒවා බව කිව හැක.

පෙර කිව් පරිදි කුඩා ගිත කොටස් වලින් සැදුන මෙම සංගීත පොත කුඩා පොත් 5 කට බෙදිය හැකි වන අතර එය බොහෝ දුරට පංච පුස්තකයේ හැඩ රුව ගන්නේය.

| | | | | |
|---|---|---|---|---|
| පළමු පොත | - | සංගිත 1 - 41 | - | දාවිතීය ගිතවල මුල් එකතුවකි. |
| දෙවන පොත | - | සංගිත 42 - 72 | - | උතුරු රාජ්‍යයේ ගීත එකතුවකි. |
| තෙවන පොත | - | සංගිත 73 - 89 | - | දේව මාලිගා ගායකයන්ගේ ගීත එකතුවකි. |
| සිව්වන පොත | - | සංගිත 90 - 106 | - | අළුත් අවුරුද්දක් සඳහා රාජකීය ගිත එකතුවකින් ලැබුණකි. |
| පස්වන පොත | - | සංගිත 107- 150 | - | ද්විතීය හෙවත් විකාශනය කරනලද, දාවිතිය,රාජකීය ගීත එකතුවක් ලෙස ගත හැක. |

මේ සැම පොතකම බෙදීමේ අවසානයේ දි ඇති පදය තුළින් යාච්ඤාමය ස්වරූපයක් පිලිඹිබු කෙරේ. ''ඉශ්‍රායෙල් ජනතාවගේ දෙවිඳුන් හට ප්‍රශංසා වේවා. ආමෙන් !ආමෙන් !
ගීතාවලිය 41/13; ගීතාවලිය 72/19; ගීතාවලිය 89/52; ගීතාවලිය 106/48; ගීතාවලිය 150/06;

## කර්තෘත්වය

සාම්ප්‍රදායිකව දාවිත් රජතුමා මෙහි කර්තෘ ලෙස හඳුන්වනු ලැබුවත් ගීතාවලියෙහි ඇති ගීතවල දක්නට ලැබෙන පොදු බවත්, ඒවා තුළ භාවිතා කර ඇති භාෂාමය විලාශයේ විවිධත්වයත්, පසුකාලින සිද්ධින් පිළිබඳව ඉදිරිපත් කරන ඉඟි සියල්ලත්, කර්තෘත්වය සම්බන්ධව, ගැටළු සහගත තත්ත්වයක් ඇති කරයි. දාවිත් රජතුමාගේම නමින් වෙන්කර ඇති ගීතවල පසුකාලිනවූ භාෂා විලාශයන් දක්නට ලැබීමත්, පසුකාලින සිද්ධින් ඉඟිකිරීමත් දක්නට ලැබේ. උදාහරණයක් වශයෙන් 51 වන ගීතයේ 18,19 වන වගන්ති තුළින් ජෙරුසලෙම් විනාශයෙන් පසු අවධියක් ඉඟි කෙරේ. මෙම ගීතයේ දක්නට ලැබෙන හෙබ්‍රෙව් ශෛලීය, විප්‍රවාසිය යුගයට අයත් එකක් යයි, බොහෝ විශාරදයන්ගේ පිළිගැනීමයි එසේම ගීතාවලියේ සමහර ගීත, ඉතාමත් ඉපැරණි ඒවා වීමත් (ගීතා 110) තවත් ප්‍රශ්නයකි. සමහර ගීත දාවිත්ගේ සමයේ දී පිළියෙල වූවා යයි පිළිගත හැක. සමහරුන් පවසන අන්දමට ගීතාවලියේ ආරම්භය ද, දාවිත්ගේ කාලයේ යැයි සිතිම සාධාරණය. එහෙත් ගීතාවලියේ සම්බන්ධව ඇති, ඉහත කී කරුණු ආශ්‍රිතව එහි කර්තෘත්වය, දාවිත්ට ආරෝපණය කර ඇති බව පෙනේ.

## සංගීත වර්ගීකරණය

මෙම පොතෙහි අඩංගු සංගීතයන්හි අලංකාරය අගය කිරිමට නම්, ඒ එක් එක් සංගීතයේ භාෂාව ද, එමගින් හඟවනු ලබන ප්‍රතිරූපය ද. එහි අද්වීතීය බව හා පුද්ගලීකත්වය දෙස ද බලා අප ගීතාවලිය කියවිය යුතුය. මේ එක් එක් සංගීතයේ ඇති ඒකීයභාවය අධ්‍යයනය කරමින් බයිබලයේ විශාරදයෝ මෙම පොතෙහි ඇති ගීත ප්‍රධාන කොටස් 7කට බෙදා වෙන් කර දැක්වූහ.

**i ප්‍රශංසා ගීත** 8,19,29,112, 150
දෙවියන් වහන්සේ විසින් ලබාදෙන ලද මැවිමේ සැලැස්මටත් ගැලවීමේ සැලැස්මටත් උන්වහන්සේගේ ගුණාංගයන්ටත් ස්තුති කියන්නට මෙම ගීත ගායනා කරන ලදි.

**ii විලාප ගීත** 3,4,51.109, **(පෞද්ගලික විලාප ගී)**
12,44,94,129,137 (සාංඝික හෝ ජාතික ආයාචනයක් )
තමන්ගේ කරදර අවස්ථාවන් හා දුක් වේදනා වලදි දෙවියන් වහන්සේට කළ ආයාචනයක් වෙනුවෙන් මෙම ගීත ගායනා කරන ලදි.

**iii ස්තුතියි ගීත** 18, 30, 67, 105. 107
දෙවියන් වහන්සේ වෙතින් ලැබුණ සැම දීමනාවකටම, ස්තුති කිරීමටත්, කෘතගුණ දැක්වීමටත් මෙම ගී ගායනා කළහ.

**iv ප්‍රඥා ගීත 1, 19, 36, 49, 73, 87**
සාධාරණ හා යුක්තිසහගත ජීවිතයක් ගත කරනු සඳහා, දෙවිඳුන් කෙරෙහි විශ්වාසය තබමින් මෙම ගී ගායනා කළහ.

**v රාජකීය ගීත 2, 18, 20, 72, 110**
රාජකීය විවාහ මංගල්‍යයන්හිදි හා රජවරුන්ගේ මෞලි මංගල්‍යයන්හිදී ද, මෙම ගීත ගායනා කළහ.

**vi සියොන් ගීත හෙවත් වන්දනා ගීත** 48, 84,87, 122, 125
ජෙරුසලෙමේ ශ්‍රි විභූතිය ගැන ප්‍රශංසා කිරීමට, විශෙෂයෙන් වන්දනා ගමන් වලදි, මෙම ගී ගායනා කළහ.

**vii විශ්වාසයේ ගීත 23, 46, 62, 63, 71**
දෙවියන් වහන්සේ වෙත විශ්වාසයත්, ඒ මත යැපීමත් තබමින් ගායනා කරන ලද ගී, මෙම ගණයට අයත් වේ.

ගීතාවලියෙහි සඳහන් මෙම ගීත, ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයේ විශේෂ අවස්ථාවන්හිදී ද, උන්වහන්සේගේ ඉගැන්වීම් වලදී ද, භාවිතා කරන ලදී.

| | | | |
|---|---|---|---|
| උදාහරණ : | කන්ද උඩ දේශනාවේ දී | - | ගීතාවලිය 6/8. 24/3-4, 37/11, 48/ 2 |
| | කුරුස ගස මතදී | - | ගීතාවලිය 22/1 |

**ධාර්මික වැදගත්කම**

ගීතාවලිය, ඊශ්‍රායෙල් ජනතාවගේ ජන ජීවිතය තුළ දෙවි සමිඳාණන් වහන්සේව අත්දුටු බවට ඇති හොඳම සාක්ෂියකි. දෙවි සමිඳාණන් වහන්සේගේ ප්‍රබල ක්‍රියා, එනම් විශ්වය මැවීම, ඉතිහාසයේ බලවත් ලෙස මැදිහත්වීම, උන්වහන්සේගේ විශේෂ ගුණාංග සම්බන්ධ අත්දැකීම් වලට ප්‍රතිචාරයක් වශයෙන් ප්‍රශංසා ගී නිර්මාණයවී ඇත. මිනිස් දුබලතාවයන් නිසා ඇති වන විවිධාකාර දුක, වේදනාව, මරණය හා කටුක අත්දැකීම් තුළ දෙවි සමිඳාණන් වහන්සේට කන්නලව් කිරීම ද, උන්වහන්සේගේ බලවත් මැදහත්භාවය පැතීම ද, සම්බන්ධව උන්වහන්සේගෙන් ලැබුණාවූ සෑම වරප්‍රසාදයකටම ස්තුති දීම ආදී විවිධ මානව ප්‍රතිචාරයන් ජනතාවගේ ආධ්‍යාත්මිකත්ව තහවුරු කරන්නේ ය. මෙයින් ඉදිරිපත් කෙරෙන සත්‍යාවයක් වන්නේ සමිඳාණන් වහන්සේ විශ්වාසනීයත්වය රක්ෂා කරන බව ය. එය උන්වහන්සේගේ සර්වබලධාරිත්වය හා අපරිමිත කරුණාව මත රඳා පවතින්නේ ය. එම නිසා ගීතාවලිය සෑම අතින්ම යාච්ඤා නිධානයක් ලෙස හැඳින්විය හැක.

## 1.1.2.2. හිතෝපදේශය

**හැඳින්වීම**

හිතෝපදේශයක් යනු, යම් මූලික සත්‍යයක් හෝ ප්‍රායෝගික ඉගැන්වීමක් ප්‍රකාශ කරන ඉතා කෙටි වාක්‍යයකි. මෙය පරම්පරානුගතව පැවත එන අත්දැකීම් සම්භාරය මත පදනම්වූ නිගමනයක් වන්නේ ය. හිතෝපදේශ පොත ගැන සලකා බලද්දී, එය ආචාර ධර්ම හා ආගමික ඉගැන්වීම් වලින් සමන්විතව ඇති බව කිව හැක. ඒවා ඉදිරිපත් කර ඇත්තේ, විවිධ කියමන් හා හිතෝපදේශ වශයෙන් ය.

**''දේව ගරුබිය ප්‍රඥාවේ මුල් පියවර වේ''** යන්න මෙම පොතේ ආදර්ශ පාඨය ලෙස සැලකිය හැක. මෙය වනාහි ජීවනයේ උල්පතකි. ප්‍රඥාව නැණවතුන්ගේ ඉගැන්වීම් වලින් පමණක්ම නොලැබේ. එසේම මිනිස් හැසිරීම් රටාව නිරීක්ෂණය කිරීමෙනුත් පූර්ණ ප්‍රඥාවක් ලබා ගත නොහැක. ප්‍රඥාව ලැබෙන්නේ දේව ගරු බිය කෙනෙකුගේ හෘදයාභ්‍යන්තරයේ ඇතිවූ විට ය. මෙහිදී සඳහන් දේව ගරු බියෙන් හැඟවෙන්නේ, බියට පත්වුණු කෙනෙකුගේ අත්දැකීමකට වඩා, ප්‍රේමයෙන් හා බලයෙන් පිරිපුන් දෙවි සමිඳාණන් වහන්සේ ඉදිරියේ බැතිමතෙකු තුළ ඇතිවන ගෞරවය මූලික කෙරුණ බියකි.

දේව ගරු බියෙන් යුතුව දිවි පෙවෙතක් ගත කරන්නාට, දේවාශිර්වාදය ලැබෙන බව හිතෝපදේශය පොතේ ඇති මූලික විශ්වාසයකි. ඒ අනුව දුදනාට දඬුවම් ලැබිය යුතුමය. ඒ කෙසේ වුවත්, අවසන් තීරණය ඇත්තේ දෙවියන් වහන්සේ වෙතය. අනෙකුත් බයිබලිය මෙන්ම මෙම පොත ද නම් කර ඇත්තේ, හෙබ්‍රෙව් බයිබලයේ මෙන්, මෙය පටන් ගන්නා මුල් පදයේ මුල් පාඨය අනුව ය. එනම් ඊශ්‍රායෙල් රජවූ දාවිත්ගේ පුත් සලමොන් පැවැසූ හිතෝපදේශය යනුවෙනි.

හිතෝපදේශය පොතේ ඇතුළත්වී ඇති කෙටි කියමන් බොහොමයක් ඉපැරණි ඊශ්‍රායෙල් නැණවතුන්ගේ කියමන් ය. මේවායින් වැඩි කොටසක් එදිනෙදා ජීවිතයට උපකාරි වන ආචාර ධර්මයන්ගෙන් ද, තව කොටසක් සමාජ සබඳතා, පවුල් සබඳතා හා ව්‍යාපාර සබඳතා පවත්වාගෙන යන්නට දෙනු ලැබූ ඔවදන් ය. මේ සම්බන්ධව ප්‍රකාශ කෙරුණ හිතෝපදේශය කියමන්, මිතුරන් හා පවත්වාගත යුතු සුහදතාවය, දෙමව්පියන්ට දැක්විය යුතු කීකරු පක්ෂපාතිත්වය, ඉවසීම, දෛනික ජීවිතය තුළ මහන්සිවී වැඩකිරීම, නැණ නුවණ, දුප්පතුන් කෙරෙහි දැක්විය යුතු සැළකිල්ල හා සුදානම මහත් ඉහළින් පැසසුමට ලක් කරයි.

**ව්‍යුහය**

මෙය මූලික වශයෙන් පිළිවෙලක් ඇතිව ඉදිරිපත් කළ දෙයක් නොවේ. මෙය තේමාවන් අනුව ද කොටස් කළ නොහැකිය. එයට හේතුව වන්නේ විවිධ යුගයන්හි තිබූ ප්‍රස්ථා පිරුළු හා උපදේශයන් එක්කර මෙය ඉදිරිපත් කර තිබීමය.

**දළ වශයෙන් හිතෝපදේශයේ පරිච්ඡේද කාණ්ඩ කළ විට**

1-9 පරිච්ඡේද - පද්‍යයෙන් ඉදිරිපත් කරන ඉගැන්වීම් මෙම කොටස තුළින් දැකිය හැක.

10-29 පරිච්ඡේද - මූලික වශයෙන් මෙම කොටසෙහි ප්‍රස්ථා පිරුළු දැකිය හැක.

30-31 පරිච්ඡේද - ගීත ආකාරයට මෙම කොටස ඉදිරිපත් කරතත් ඒවායේ කිසිදු සම්බන්ධතාවයක් දැකිය නොහැක.

**හිතෝපදේශය තුළ දක්නට ලැබෙන, ආවේණික ලක්ෂණ කිපයකී.**

- **එහි සමන්විතව ඇති පද්‍ය රේඛාවන් එකිනෙකට අනුරූපවී තිබේ**. එනම් මෙසේ ඇති සමාන්තර පද්‍යයන් වල දෙවන පදය, පළමුවන පදයේ අදහස, නැවතත් ඉදිරියට ගෙන එමින් ප්‍රකාශ කරයි.

  උදා: - මද්‍යපානය කේලාම්කරුවෙකි,
  - සුරාපානය කළහකරුයෙකි 20/1

- **ප්‍රතිවිරෝධි සමාන්තර කියමන්වල දෙවන පදය පළමු වැන්නට ප්‍රතිවිරෝධි වේ.**

  උදා: - වංක අය සමිඳුන්ට පිළිකුලකි.
  - අවංක අය එතුමන්ට සතුටකි 11/20

- **මුල් පදයේ අදහස, දෙවැනි පදයෙන් තවත් ඉදිරියට ගෙන යෑම සමාන්තර සංස්ලේෂි ගද්‍ය තුළ දක්නට ලැබේ.**

  උදා: - වංචාවෙන් පොහොසත් වන මිනිසාගේ වස්තුව මීදුමක් මෙන් පහව යයි.
  - ඔහු මරණයේ මලපත් වලට ද පැටැලේ. 21/6

- **සමහර උපදෙශයන් අංක අනුව ගොනු කර ඇත.**

  උදා: - සමිඳාණන් වහන්සේ නුරුස්සන කරුණු සයකි.
  - එතුමන්ට පිළිකුල් කරුණු සතකි. 6/16

ඉහත දැක්වූ ලක්ෂණ ඇතිව, හිතෝපදේශයේ සඳහන් කරුණු මාතෘකා අනුව කොටස් නවයකට පෙළගැස්විය හැක.
ඒවා දීර්ඝ සංග්‍රහයන් හතරකින් හා තවත් කෙටි උපග්‍රන්ථයන් පහකින් සමන්විතය.

| | | |
|---|---|---|
| i | හැඳින්වීම - ප්‍රඥාවේ වටිනාකම | 1/1 - 9/ |
| ii | සලමොන්ගේ හිතෝපදේශයන්හි පළමු එකතුව | 10/ 1 - 2/16 |
| iii | ප්‍රඥාවන්ත කියමන් | 22/17 - 24/22 |
| iv | සලමොන්ගේ හිතෝපදේශයන්හි දෙවන එකතුව | 25/1-29/27 |
| v | අනෙකුත් නැණ වදන් | 24/23-34 |
| vi | ආගුර්ගේ ඔවදන් | 30/1-6 |
| vii | සංඛ්‍යාමය හිතෝපදේශයන් | 30/7-33 |
| viii | ලෙමුවෙල්ට පැවැසූ ඔවදන් | 31/1-9 |
| ix | සත්ගුණවත් බිරිඳකගේ අගය | 31/10-31 |

**කර්තෘත්වය හා කාලය**

හිතෝපදේශයේ කර්තෘත්වය සලමොන් රජුට ආරෝපණය කර තිබුණ ද එහි ඇති විවිධ හිතෝපදේශයන් හා ප්‍රඥා කියමන් එකතුව විවිධ කාලයන් හා සම්බන්ධ බව බොහෝ විශාරදයන්ගේ පිළිගැනීමයි. මේ හේතුවෙන් එය හිතෝපදේශ සංග්‍රහයක් ලෙස පිළිගැනේ.

ඉහත දැක්වූ බෙදීම අනුව ග්‍රන්ථයේ **ii** හා **iv** කොටස් සලමොන් වෙතටම පවරා ඇත. එසේ වන්නේ ඔහු හෙබ්‍රෙව් ප්‍රඥවේ, භාරකාරයා නිසා ය. ග්‍රන්ථයන්හි **vi** වන කොටස ආගුර් ගේ ද **viii** වන කොටස ලෙමුවෙල්ගේ ද වශයෙන් දැක්වූවත් ඊට අමතරව කිසිදු දැනගැනීමක් ඒ පිළිබඳව නැත. **iii** වන හා **v** කොටස් ප්‍රාඥයන් වෙතට පවරා දී ඇත. අනෙකුත් කොටස් නිර්නාමික ය.
හිතෝපදේශ ඊජිප්තු හා මෙසපොතේමියානු ආභාෂය ලැබී ඇත. උදාහරණ වශයෙන් දැක්වුවහොත්, බැබිලෝනියාවේ අභාකාර්ගේ ප්‍රස්ථා පිරුළු බොහෝමයක් අපට මෙහිදී දැකිය හැක. මේවා අවම වශයෙන් ක්‍රි.පු. 6 වන ශත වර්ෂයට අයිතිය.

- එසේම මෙම ග්‍රන්ථය පැරණි ග්‍රීක සාහිත්‍යයේ ආභාෂය හා සම්බන්ධය. එනම් ග්‍රීක චින්තනය මෙයට බලපා ඇත. එය ක්‍රි.පු. 7-8 යන ශත වර්ෂ අතරදී සිදුවිය.
- කෙසේ වෙතත්, අද ශුද්ධවූ බයිබලයේ තිබෙන ආකාරයට සකස් වී ඇත්තේ, විප්‍රවාසීය යුගයෙන් පසුව යයි සැලකිය හැක.

## ධාර්මික කරුණු

මෙම හිතෝපදේශයෙන් උගන්වන, පැණවත් වදන්, මිනිස් ක්‍රියාකාරිත්වයේ හා දේව ක්‍රියාකාරිත්වයේ ඉතා පුළුල් ක්ෂේත්‍රයක් ආවරණය කරන්නේය. එනම් ලෞකිකම වූ කාරණාවන්ගේ සිට ශීලධාර්මික හා ආගමික සත්‍යතා මෙම ග්‍රන්ථය මගින් අවධාරණය කරන්නේ ය.
විශේෂයෙන් දෙවි සමිඳාණන්ගේ බලපරාක්‍රමයද (19/21) උන්වහන්සේ විසින් සලසනු ලබන දිව්‍ය සංරක්ෂණය ද (20/21-24) යහපත ද (15/29) උන්වහන්සේ නිසා සියල්ල අත්හරිනු ලැබීමෙන් උදාකර ගන්නා සතුට හා ශක්තියද වේ. (16/20.3/5-8, 18/10)
මේ අනුව මෙම මුළු ග්‍රන්ථය මගින්ම ස්ථාවරවූ ආගමික පදනමක් ඇති කරන අතර එය මූලිකවම '' දේව ගරු බිය ප්‍රඥවේ මුල් පියවර වේ'' යන්න සනාථ කරයි (1/7)

## 1.1.2.3. ධර්මදේශකයා

මෙම ග්‍රන්ථයට ධර්මදේශකයා යන නාමය ග්‍රීක පරිවර්තනය තුළ දෙනු ලැබුවේ එය හෙබ්‍රෙව් වචනයෙන් වන **''කොහෙලෙත්''**(Qoheleth) හි අර්ථය ගෙන දෙන එනම් ' **සභාවක් ඉදිරියේ දේශනා කරන පුද්ගලයා'** යන අදහස ඉදිරියට ගෙන ඒමට ය. මෙම පොත කොහෙලෙත් යනුවෙන් හෙබ්‍රෙව් බයිබලයේ හඳුන්වනු අතර, එය ''කාහල් '' හෙවත් '' එක්රැස් කිරීම'' යන අරුත ඇති වචනයෙන් බිඳි එන්නකි. ජුදෙව් මංගල්‍ය වලදී මෙය කියවන්නට යොමුවූ අතර. එය හෙබ්‍රෙව් බයිබලයේ තුන්වන කොටස හෙවත් ලේඛන සනයට අයත් පොත් පහෙන් එකක් වන්නේ ය.

- මෙම පොත පිළිවෙලකට ලියා ඇත. මෙහිදී කතුවරයා, සලමොන්ගේ චරිතය පිටුපස සිට ලියන්නෙකු වශයෙන් ජීවිතයේ අවිනිශ්චිත භාවය පෙන්නුම් කිරීමට උත්සාහ කරයි.
- මෙය පැරණි බැබිලෝනියානු අභාෂයට සම්බන්ධතාවයක් ඇති බව පෙනේ. විශේෂයෙන් ස්වාමියෙක් හා සේවකයෙක් අතර ඇති සම්බන්ධතාවය බොහෝවිට නිරූපණය වේ. ඒසේම පැරණි ග්‍රීක් චින්තනයේ ආභාෂයද මෙයට ලැබී ඇත.
- මෙම චින්තන දෙකේ බලපෑම තුළ බයිබලයේ අනෙකුත් ග්‍රන්ථ සසඳා බැලීමේදී මෙහි ඉදිරිපත් කෙරෙන අදහස් බොහෝවිට අවිනිශ්චිතය. අඳුරු ස්වභාවයක් දක්වයි. එය ඔහු දක්වන්නේ, තමාගේ දෛනික ප්‍රායෝගික ජීවිතය මුල්කරගෙනය. විටෙක නොගැඹුරු ජනප්‍රිය අදහස් වලින් ද, තවත් විටක සමාජයේ වැඩිදෙනා පිළිගත් මත වලින් ද සමන්විතය. කෙසේ වූවද මෙම ග්‍රන්ථය ලියූ කතුවරයා ''අඳුරු මගෙහි ගමන් කරන අවිනිශ්චිත පුද්ගලයෙක් ලෙස අදහස්

ඉදිරිපත් කරතත් දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තැබූ කෙනෙකු වශයෙන් ස්ථාවරයක සිටියි.

**කතුවරයාගේ අවිනිශ්චිත භාවය පෙන්නුම් කරන්නේ**

**i සලමොන් ප්‍රඥාවන්තයෙක් ලෙස පෙන්වමින් ඒ තුළින් එකිනෙකාගේ ජීවිතය විමර්ශනය කරමින් ය.**

එමනිසා, ප්‍රඥාවන්තයා තුළ කිසි විශේෂත්වයක් නැති බව පෙන්වයි. නැණවතාගේත්, මෝඩයාගේත් ජීවිතයේ අවිනිශ්චිත බව තුළ දෙදෙනාවම එකම තලයක තබා ඔහු කථා කරයි.

**ii යස ඉසුරු දක්වමින්**

- යස ඉසුරු වලින් කිසිදු ප්‍රයෝජනයක් නොවන බව ඔහු පෙන්වයි.
  යස ඉසුරු කොතරම් තිබුණත් මිනිසාට එයින් තෘප්තියක් ලැබෙන්නේ නැත.

**මෙම පොතෙහි විස්තර කෙරෙන වෙනත් කරුණු නම්:**

- වර්තමානයේ දී තමා සිටින්නාවූ මට්ටමේ සිට පවා, තම ජීවිතය සම්බන්ධවය එතුමාණන්ගේ අනගි සැලැස්මක් තිබෙන බව පිළිගෙන තම ජීවිතය අළුතින් ආරම්භ කළ යුතු බවත්,
- විවිධ කාරණා සම්බන්ධව, නියමිත කාලයක් එතුමාණන් විසින් නියමිත කර ඇත. (3/1-8) එය තේරුම් ගැනීම තුළින්, මිනිසාට, තම ජීවිතයට එන ඕනෑම අභියෝගයකට මුහුණ දිය හැකි බවත්. (3/11)
- මෙසේ අපේ විචාරත්මකභාවය තුළින් නිරික්ෂණයට එළඹෙනු ඇති බවත් ( 8/16,17)

- වේදනා සහ පීඩා සහිත කාලවලට මුහුණ දීමට සිදුවන නමුත්, ජීවිතය ප්‍රීතියෙන් ගත කර දෙවියන් වහන්සේට මහිමය දීම අපේ යුතුකමය. මෙය නිරන්තරයෙන්ම සිදුවිය යුතුය. (2/24- 26, 3/12-13, 22, 5/18-19, 8/15, 9/7-9) මේ සියළු කාරණා තුළ කිසිදු නොවටිනා බවක් නොමැති බවත් ය.

**ග්‍රන්ථයෙහි අඩංගු කරුණු මෙසේ බෙදා වෙන් කළ හැක.**

| | |
|---|---|
| - ජීවිතයෙන් වැඩක් නැත | 1/1 - 11 |
| - අත්දැකීමෙන් ලත් ගුරුකම් | 1/12 - 2/26 |
| - හැම දෙයටම වේලාවක් හා අවස්ථාවක් ඇත | 3/1 - 15 |
| - ජීවිතය පිළිබඳ විවිධ කල්පනා | 3/16 - 10/20 |
| - ප්‍රඥාවන්තයාගේ චරිත ලක්ෂණ | 11/1 - 8 |
| - තරුණ අයට අවවාද | 11/9-12/8 |
| - සම්පිණ්ඩනය | 12/ 9 14) |

**පරමාර්ථය**

මෙම පොතේ පෙර වදනින්ම එහි තේමාව ප්‍රකාශ වේ. එනම්:
''සියල්ල නිස්සාරය, සියල්ල නිස්සාරය, හැම දෙයම නිස්සාරයයි ධර්මදේශකයා පවසයි (1/2)
එසේම පොතේ අවසාන කිරීමේ පාඨයේ දී, දෙවියන් වහන්සේ ට ගරු බිය දක්වා එතුමාණන්ගේ. ආඥා පිළිපදින ලෙස, කතුවරයා ඉල්ලා සිටි(12/13) එසේ වන්නේ. යම් දිනයක එතුමාණන්ගේ විනිශ්චයට සියල්ල භාජනය වන නිසා ය. (12/14)

මෙම පොතේ දර්ශනය හා පරමාර්ථය ඉහත සඳහන් අදහස් තුළ අන්තර්ගතය වී ඇත. මෙලොව ජීවිතය පරාජිත වුවත්, සියල්ල පිළිගෙන ඕනෑම තත්ත්වයකට මුහුණ දෙමින්, තව දුරටත් ප්‍රීතියෙන් ජීවත්වීමට බලයක් ඇති බව අවබෝධ කෙරේ.

මෙලොව ජීවිතය අරුත් සුන්‍ය, ජීවිතයට අරුතක් ලැබෙනුයේ දෙවියන් වහන්සේගෙන් පමණි.

## 1.1.2.4. උපදේශකයා හෙවත් සිරාක්

### හැඳින්වීම

මෙම පොත උපදේශන වලින් පිරී ඇත. මුලින්ම හෙබ්‍රෙව් භාෂාවෙන් ලියන ලද මෙය පසුකාලීනව එනම් ක්‍රි. පූ. 2 වන සියවසේ දී ''බෙන් සිරාක් '' නැමැත්තෙකු විසින් ග්‍රීක භාෂාවට පරිවර්තනය කරන ගද්‍ය නිසා, එම ජුදා ජාතිකයාගේ නම ම, මෙම පොත හැඳින්වීමට භාවිතා කෙරිණ. ග්‍රීක දර්ශනයට හා ග්‍රීක චින්තනයට මුළාවූ, ඒක දේව වාදය පිටු දක සිටි ජනතාවට, දේව නීතිය හා දේව වන්දනාව ගැන අවධාරණය කිරීම, කතුවරයාගේ අදහස වීය. **එසේම සැබෑ ප්‍රඥාව වන්නේ, දේව නීතියට ගරු කිරීමත්, දේව ගරුබිය පෑමත් ය.**

නීති පොත් ද, දිවැසිවරුන්ගේ පොත් ද, ආගමික ලියකියවිලි ද අධ්‍යයනය කිරීම සඳහා 'බෙන් සිරාක්' වන කතුවරයා, තම කාලය කැප කළ නිසා, මෙහි ඇතුළත් කරුණු තුළ, එම අධ්‍යයනයන්ගේ ආභාෂය, සමහර අවස්ථාවලදී දැකිය හැක. මෙම පොත පළමුව හෙබ්‍රෙව් භාෂාවෙන් ලියන ලදි. පසුකාලීනව ඔහුගේ මුණුපුරෙකු විසින් ක්‍රි. පූ. 132 දී මෙය ග්‍රීක භාෂාවට පරිවර්තනය කරන ලදී.

උපදේශනයන්, උපමාකථා, කියමන් ප්‍රශංසා ගීත, අයැදීම්, යාච්ඤා හා ආප්තෝපදේශයන්, මෙම පොතෙහි අඩංගුය. හෙබ්‍රෙව් බයිබලය අනුව සෑම පේළි 22 න් 22ටම ඒකකයක් ආරම්භ වේ. (22 හෙබ්‍රෙව් හෝඩියේ අකුරු ගණනයි) එක කොටසක් අවසාන කර, තව කොටසක් ආරම්භ කරන විට මෙම ස්වරූපය දක්නට ලැබේ. අන්තිම ඒකකයේ සඳහන් වන්නේ ඉශ්‍රායෙල් මුතුන් මිත්තන්ගේ නම් ලැයිස්තුවක් ය. (උදා: ඒනොක් නෝවා, ආබ්‍රහම්, ඊසාක්, ජාකොබ්, මෝසස්, ආරොන් )

### ප්‍රධාන තේමා

### (අ) දේව ප්‍රඥාව පැසැසීම

24 වන පරිච්ඡේදය, සිරාක්ගේ පොතේ පැසැසීම සම්බන්ධව ඇති ඉතාමත් හොඳ කොටස වේ. ප්‍රඥාවට පුද්ගලීකත්වයක් ආරූඪ කරමින්, ඕ තොමෝ දෙවිඳුන්ගේ පළමු මැවිල්ල ලෙසත්, සෑම මැවිල්ලක් තුළම ඇය මැදිහත් වීමේ භූමිකාවක් ක්‍රියාවට නගන බවත් පවසයි.
ඉශ්රායෙල් හි දෙවිසමිඳාණන්, සැබෑ ප්‍රඥාවේ මූලාශ්‍රය ලෙස ඉදිරිපත් කරන සිරාක්, එතුමාණෝ මානව සංහතිය වෙත, ප්‍රඥාවන්තවූ ඕ තොමන් මගින්, සිය ප්‍රඥාව වගුරුවාලීම ගැන ප්‍රශංසාව පුද කරයි.

බෙන් සිරක් මෙසේ තම ප්‍රශංසාව පුදකරන්නේ, මැවීමේදි උන්වහන්සේ මුඛයෙන් පිටවූ සෑම වචනයක්ම, ප්‍රඥාව ජීවමාන වීම පිළිබිඹු කළාසේ, ප්‍රඥාවන්ත තොමෝද උන්වහන්සේගේ වචනයෙන් බලවත් වූ තැනැත්තියක් වන නිසාය. මෙසේ බලවත් වීම පොළව වසාලු මීදුමකට සමාන කරමින්, එම මීදුම හෙවත් ප්‍රඥාව ''රුවාහ් එලොහිම්'' හෙවත් දේවාත්මානුභාවය බව පැහැදලි කරයි.

### (අ) දේව ප්‍රඥාව හා මිනිස් පිළිතුර

බෙන් සිරාක් විසින් මෙම තේමාව පැහැදිලි කරන්නේ, මැවිල්ල තුළ ජීවමානවූ දේව ප්‍රඥාව, සංවර්ධනය කරමින්, මිනිසා විසින් කෙසේ කෙසේ ප්‍රතිචාර දැක්විය යුත්තේ ද යන්න අවධාරණය කරමිනුයි. බයිබලීය ප්‍රඥාව, දේව ප්‍රඥාවේ ප්‍රතිබිම්බයක් ලෙස සිරාක් දක්වාලයි. මේ නිසා දෙවි සමිඳාණන්ගේ විශේෂ වරප්‍රසාදයක් ලෙස ප්‍රඥාව ලත් මිනිසා, මැවීම සම්බන්ධව දෙවියන් වහන්සේ වෙත ණයක් ගෙවිය යුතු ආකාරයට, මැවිල්ල වෙනුවෙන් වගකිවයුතු බව පැහැදිලි කරන්නේ ය.

- තමන් ලත් උතුම් දායාදය වන ප්‍රඥාව අනුව කටයුතු කිරීමේ හෝ එයට එරෙහිව කටයුතු කිරිමේ හෝ නිදහස මිනිසා සතුව පවති. ඒ කෙසේ වූවත් මිනිසා ගන්නා තීරණය මත, ඔහු දක්වන ප්‍රතිචාරය මත, එක් එක් පුද්ගලයාට පෞද්ගලිකවම වන්දි ගෙවීමට සිදුවන බවත්, එසේ හෙයින් අදමිටුකම් නොකරන්නට පරෙස්සම් වන්නයැයි කරුණාවන්ත දෙවිසමිඳාණෝ අවවාද කරන බව සිරාක් මෙමගින් අවධාරණය කරන්නේ ය.

### ප්‍රඥාව හා ධර්මගුණ

මෙම ග්‍රන්ථයේ කතුවරයා, ප්‍රායෝගික ශික්ෂාවන් කෙරෙහි ද සිත යොමු කරමින් පරිච්ඡේද කිහිපයක්ම ඉදිරිපත් කරන්නේ, පවුල් ජීවිතයේ හා සමාජයේ හැසිරීම රටාව පිළිබඳව විවිධ පැතිකඩයන් සම්බන්ධව ගුණධර්ම අවධාරණ කරමින් ය.
බෙන්සිරාක් තම ග්‍රන්ථකරණය මගින් දෙන දායකත්වය තුළ ප්‍රඥාව හඳුනා ගන්නේ, මෝසෙස්ගේ ව්‍යවස්ථාව හා සබැඳිවය. (සිරාක් 24/23-24) විශේෂයෙන්, ව්‍යවස්ථාව, පිළිපැදිම තුළ, කෙනෙකු විසින් අනිවාර්යයෙන්ම, අනුගමනය කළයුතු ආගමික වත් පිළිවෙත් ඔහු මෙමගින් මතක් කර දෙන්නේ ය.
ජනවන්දනාත්මක ක්‍රියාකාරිත්වය සඳහා තමා තුළ ඇති නැඹුරුතාවය පදනම් කරගෙන, කළගුණ සැළකිම, දන්දීම, දුෂ්ඨකමින් හා අයුතුකමින් හැරීයාම වැනි ගුණධර්මයන් ද, දයාව, යුක්තිය, සාධාරණය. ධර්මිෂ්ඨකම වැනි ජීවිතයේ පදනම් ලෙස තබාගත යුතු සීක්ෂා පදයන් ද දක්වා ලයි. (සිරාක් 35 /1-16)

### ප්‍රායෝගික අවවාද

විමුක්තිදායක දෙවිඳාණෝ දිළින්දා සමග සිටිමින්, අසරණවූ ඔවුන් නගා සිටුවන්නේ ය යන සංකල්පයන්ට එකඟවන බෙන් සිරාක්, එවන් දෙවිඳාණන් කෙනෙක්ට. දියයුතු කෘතගුණභාවය සඳහා ප්‍රායෝගික අවවාදයන් කිහිපයක් ඉදිරිපත් කරයි. මෙම අවවාදයන්, අනෙකුත් ප්‍රඥා සාහිත්‍ය කතුවරුන් අභිබවා යන තරමට, සෘජුවම ඉදිරිපත් කෙරෙන්නේ ය.

එකල ග්‍රීක පාලකයන්ගේ ආධිපත්‍යයට හා සූරාකෑමට ලක්ව සිටි සිය ජනතාව වෙනුවෙන්, ප්‍රතිවිරෝධිතාවයක් දක්වන බෙන් සිරාක්, මහා දිවැසිවරුන්ගේ ආදර්ශයන් අනුගමනය කරමින්, යුක්තිය, සාධාරණය, දැහැමියාව හා දයාව වැනි ප්‍රායෝගික වටිනාකම් තුළ, සැබෑ විමුක්තියක් අත් කර ගන්නට ජනතාවට ආරාධනා කරයි. එක්තරා අන්දමකින් මෙම කෘතිය තුළින් ඔහු උත්සාහකරන්නේ හෙලනිස්ත ආර්ථික රටාව තුළ ඇති කෙරෙන පිඩනය නිසා, ගුණහීනවූ පවුල් සබඳතා හා පෙළපත් සබඳතා ගොඩනගා, යහපත් සමාජයක් ඇති කිරීමටයි. ඒ සඳයා ප්‍රායෝගික අවවාදයන් රැසක්ම ඉදිරිපත් කරයි.

- දෙමාපියන් වෙත දරුවන්ගේ යුතුකම් - සිරාක් 3/1-16
- සියල්ලෙහිදි බැගැපත්වීම - සිරාක් 3/17-25
- මුරණ්ඩුකමින් ඇතිවන පාඩුව - සිරාක් 3/26-29
- දිළිඳුන් කෙරෙහි සංවේදි වීම - සිරාක් 4/1-10
- සියල්ලේ දි ආත්ම විශ්වාසය ඇතිව සිටිම සිරාක් 4/20
- මිත්‍රත්වය - සිරාක් 6/5-17, 9/16)
- සැබෑ මිතුරෝ සහ ව්‍යාජ මිතුරෝ - සිරාක් 12/8-18

# 1.2 නව ගිවිසුම

## 1.2.1. ශුද්ධවර ජොහන් තුමාගේ සුබ අස්න

### 1.2.1.1. කර්තෘත්වයඃ

පැරණි සම්ප්‍රදාය අනුව සිව්වැනි සුභාරංචිය ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයෙකු වූ, සෙබදිගේ පුත්‍රවූ ජුවාම් වෙත පවරා ඇත. මෙය ලියොන්හි රදගුරුවූ ඉරනේයුස් තුමන් විසින් ක්‍රි. ව. 180 දී පමණ ලියන ලද බව වර්තා වෙයි. නූතන යුගයේ දී පවා සෙබදිගේ පුත් ජුවාම් වෙත යොමු කෙරෙන කර්තෘත්වය ගැන ප්‍රශ්න කරති. මේ පිළිබඳව පිළිතුරු සැපයීමේ දී ගත් එක් උත්සාහයක් ලෙස, මෙම සිව්වැනි සුභාරංචියේ අධිකාරිත්වය අපෝස්තුළුවර ජුවාම් වෙතටම පැවැරෙන බවත්, පසුකාලීනව වෙනත් අය විසින් සංස්කරණය කරමින් ගොඩනැගු බවත්, ඉදිරිපත් කරයි. මෙම ඉදිරිපත් කිරීම තුළ අදහස් තුනක් දැක්විය හැක.

1. සිව්වැනි සුවිශේෂයේ අපෝස්තලික අධිකාරිත්වය සඳහා මුලිකවූත්, පදනමක් ලෙසත් අපෝස්තුළුවර ජුවාම්ගේ ඇසින් දුටු සාක්ෂි පිළිබඳ කෙරුන දේශනා කිරීම යොදා ගෙන ඇති බවයි.

2. සුවිශේෂක අපෝස්තුළුවරයා තම ඇසින් දුටු සාක්ෂිය ලිඛිතව ඉදිරිපත් කරමින් වර්ධනය වන්නාවූ ක්‍රිස්තියානි සභාව තුළ දේව ධාර්මික පසුබිමක් ගොඩනගන බවයි.
3. ශ්‍රාවක සංස්කාරකයා මුල් පිටපත්වලට තවත් යමක් එකතු කරමින් සිව්වන සුභාරංචිය ගොඩනැගූ බවය.

කෙසේ වෙතත් ජොහානිය ජන සමාජය තුළ විවිධ අවස්ථාවලදී සම්ප්‍රදායයන් කිහිපයක් බලපෑම මත දෙවන හෝ තෙවන ක්‍රිස්තියානි පරම්පරාවල විශ්වාසයේ ජීවිතය තුළ මෙම සිව්වැනි සුභාරංචිය හැඩ ගැන්වුණු බව කිව හැක.

එසේම සුභාරංචි ග්‍රන්ථයේ අවසාන පරිච්ජේද කිහිපය තුළ "ප්‍රේමවන්ත ගෝලයා" ගේ චරිතය සුභාරංචි ග්‍රන්ථයේ ගැඹුර දක්වනවා පමණක් නොව ග්‍රන්ථයේ රචනා ශෛලියේ කේන්ද්‍රීය මඟ සලකුණක් ලෙස දැක්වේ. (13:23-26, 18:15-16, 19:26-27, 20:2-10, 21:20-24) මෙම ප්‍රේමවන්ත ගෝලයා මඟින් දැක්වෙන්නේ ජොහානිය ජන සමාජයේ ගැඹුරු ධාර්මික දැක්මයි. මේ කරුණු මඟින් කර්තෘත්වය ශුද්ධවූ ජොහාන් නැමැති අපෝස්තුළුවරයා වෙත යොමු කිරීමේ අර්ථාන්විත බවක් අපට පිළිගත හැකිය.

## 1.2.1.2. පරමාර්ථයඃ

ජුවාම්තුමාගේ පරමාර්ථය, ක්‍රිස්තුන් වහන්සේ මිනිස් බව ගත් දේව පුත්‍රයා බවත්, එතුමන්ව ඇදහීමෙන් ගැලවීම ලබන බවය. සුළු ආසියාවේ සිටි ක්‍රිස්තු භක්තිකයින්ගේ ඇදහිල්ල සවිමත් කිරීමට එය යොදා ගන්නා ලදි.

මෙය ජොහාන් සුභාරංචියේ 20:31 මඟින් කතුවරයාම පැහැදිලි කර දෙයි. "එහෙත් මේවා ලියන ලද්දේ ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රවන ක්‍රිස්තුවරයාණන් බව ඔබ අදහාගන්නා පිණිසත්, ඇදහීමෙන් ජීවනය ලැබන පිණිසත් ය."

මෙය පරමාර්ථය කොටගෙන ජුවාම්තුමා සුභාරංචිය ලියුවේ පළමු සියවස අගභාගයේ දී මුල් කිතුනු සභාවට මුහුණ දෙන්නටවූ ප්‍රධාන ප්‍රශ්න දෙකක් මුල් කර ගෙනය.
1. ක්‍රිස්තියානි යුගාන්ත ධර්මය
2. ක්‍රිස්තු ධර්මයට විරෝධිවූ ඥාන වාදය

ක්‍රිස්තුස් වහන්සේගේ දෙවන පැමිණීම තමන්ගේ කාලයේ දී හදිසියේ ඉක්මණින් සිදුවෙතැයි ආදිම කිතුබැතියෝ බලාපොරොත්තු විය. එම ආදි කිතුනු පරම්පරාව ක්‍රමයෙන් අඩුවේගෙන යනවිට, ඔවුන්ගේ එම බලාපොරොත්තුව වූ නැවත පැමිණීම සිදු නොවූ නිසා නව බලාපොරොත්තුවක් ඇති කිරීම සඳහා යුගාන්තිය ධර්මයට නව අර්ථ කථනයක් දීමට ජුවාම් තුමා සුභාරංචිය ලියන ලදි.

ඥානවාදය හෙවත් නොස්ටික් වාදය තුළින් ක්‍රිස්තුන් වහන්සේගේ පැවැත්ම පිළිබඳව ක්‍රිස්තියානි විරෝධි අදහස් ඉදිරිපත් කිරීම නිසා, එවැනි තර්කය හා දර්ශනය පිළිබඳ ලෝකය තුළ පැවති ප්‍රවනතාවය තුළ, එවැනිම ආකාරයකින් සුභාරංචි පූර්විකාව ලියා එම ප්‍රශ්නයට පිළිතුරු දී ජේසුස් වහන්සේ ලෝකයේ පැවැත්මට පෙර, දෙවියන් වහන්සේවම සිටි බව සුභාරංචිය තුළින් ඉදිරිපත් කිරීමට ජුවාම්තුමා කටයුතු කරයි.

## ජොහාන් සුභාරංචිය පිළිබඳ අවබෝධයඃ

ජොහාන් සුභාරංචිය ලිවීමට, සමදර්ශක සුභාරංචි යොදා ගත්ත ද යන්න විවෘත ප්‍රශ්නයකි. එහෙත් ජුවාම්, මාර්ක් සුභාරංචිය හා ලූක් සුභාරංචිය තුළ ඇති කරුණු දැන සිටිය බව සමහර කරුණු තුළින් පැහැදිලි වේ.

ජුවාම් සුභාරංචියේ සඳහන් දේ වලින් 90% ක් සමදර්ශක සුභාරංචිවලට වඩා වෙනස් ඉතාම සුළු කොටසක් පමණක් සමාන්තර බවක් දක්වයි.
❖ ස්නාවක ජොහාන්ගේ මෙහෙය - ජුවාම් 1:19-36 - මාක් 1:4-8

- ❖ දේව මාළිගය පවිත්‍ර කිරීම - ජුවාම් 2:13-22 - මාක් 11:15-17
- ❖ රාජ්‍ය නිලධාරියාගේ පුත්‍රයා සුව කිරීම - ජුවාම් 4:46-54 - ලූක් 7:1-10

**ශුද්ධවූ ජොහාන් තුමාගේ සුභාරංචිය පිළිබඳ අවබෝධය සිව්වන සුභාරංචිය බෙදීම:**

**(අ) හැඳින්වීම**

1. පූර්විකාව (1/1-5: 9/14 16-18) - ධර්මයාණන් ගැන
2. උන්වහන්සේ පිළිබඳ සාක්ෂිය (1/19-51)

- ❖ ස්නාවක ජොහාන්ගේ සාක්ෂිය (1/19-34)
- ❖ ශ්‍රාවක පිරිසගේ සාක්ෂිය (1/35-51)

**(ආ) සළකුණු (Book of signs)** (2/1-12/50)

මෙම සලකුණු සහිත කොටස කථා පුවත් 7 කින් යුක්තය. සෑම කථා පුවතකටම වෘතාන්තයක් හා ඒ මත ගොඩනැඟුන දේශනයක් ද ඇත.

# පළමු කථා පුවත

## *තේමාව: නව ආගමික පසුතලයක් බිහිකළ නිර්මාතෘවරයාණන් 2/1-4/42*

ජේසුස් වහන්සේ පැරණි දේ නවතාවයකට පත්කරමින්, මෙම කාර්යභාරය ඉටු කළ සේක. මෙම කථා පුවතට වෘතාන්ත දෙකක් හා දීර්ඝ දේශනයක් ඇතුළත් වේ.

### 1 වෘතාන්තය - කානා නුවර විවාහ මංගල්‍යය (2/1-12)

මෙහිදී ජේසුස් වහන්සේ තමන් වහන්සේගේ වේලාව පැමිණිවිට පැරණි දේ වෙනුවට නව දෙයක් ඇති කළ සේක. ජලයෙන් පිරුණු ගල් භාජන වෙනුවට, මිදි රසින් පිරුණ භාජන ඇති කළ සේක. මෙය මෙසියානික තිළිණයක් පිළිබඳ සංකේතයක් විය. මෙහිදී දේව මාතාවන් ඉදිරිපත් කෙරෙන්නේ මැදිහත්කාරිය වශයෙන් නොව දේව ජනතාවගේ නියෝජිතවරියක් වශයෙනි.

### 2 වෘතාන්තය - දේව මාළිගය පවිත්‍ර කිරීම (2/13-15)

පැරණි සම්ප්‍රදාය තුළ වන්දනාවේ කේන්ද්‍ර ස්ථානය වුයේ දේව මාළිගයයි. ජේසුස් වහන්සේ "මෙම දේව මාළිගය කඩා දමා, තෙදිනකින් එය මම ගොඩනඟමි" යනුවෙන් පවසා උත්ථානවූ තමන් මඟින් එම වන්දනාව තමන් වහන්සේගේ ශරීරය වෙත අනාගතයේ දී යොමු කෙරෙන බව ඉඟියක් කළ සේක.

### 3 උපදේශනය- නැවත ඉපදීම පිළිබඳව. (3/1-21 22-36)

මෙමඟින් පැරණි ජීවිත පැවැත්ම ඉවතලා, නව ජිවිත පැවැත්මකට නැවත ඉපදිය යුතු බව නිකදේමුස්ට අවධාරණය කරයි. මෙය ජලයෙන් හා ශුද්ධාත්මයාණන්ගෙන් වන ඉපදීමක් බවත්, එය ස්වර්ගීය ක්‍රියාකාරිත්වයක් බවත් පෙන්වයි.

### i සාක්ෂිය - ස්නාවක ජුවාම් තුමා (3/22-26) *(ඇඳුරිඳුනි.....ඔබ විසින් සාක්ෂි දරනු ලැබුවාවූ ද තැනැත්තේ බව්තිස්ම කරමි")*

**4 උපදේශනය - සමාරිය ස්ත්‍රීය සමඟ කළ සංවාදාත්මක දේශනය (4/1-42)**

- **ජීවන ජලය** - මෙහිදීද නැවත වරක් මෙතෙක් ඔවුන් පානය කළ ජාකොබ්ගේ ලිඳෙහි වතුර වෙනුවට, ජීවන ජලය හඳුන්වා දෙනු ලැබේ. එය හඳුන්වන්නේ සදාතන ජීවිතයේ මූලාශ්‍රයක් වශයෙනි. (4/1-15)
- **සැබෑ වන්දනාව** - දේව මාලිගය පවිත්‍ර කිරීමේදී මෙන්ම මෙහිදී සැබෑ වන්දනාව ජෙරුසලෙමේ දේව මාළිගයෙහිත්, සමාරියේ ගෙරසීම් කන්දේ ඇති වන්දනාවෙහිවත් නොව, ආත්මානුභාවත් සත්‍යතාවයත් ඇති තමන් වහන්සේ තුළ බව පැහැදිලි කරයි.
- **පියාණන්ගේ කැමැත්ත** - තමන් වහන්සේගේ භෝජනය වන්නේ
  1. පියාණන්ගේ කැමැත්ත ඉටු කිරීමත්
  2. පියාණන්ගේ කාර්යය නිම කිරීමත් බව පැහැදිලි කළ උන්වහන්සේ සදාතන ජීවිතයක් ලබා ගැනීමට එවැනි භෝජනයක අවශ්‍යතාවය පෙන්වා දෙමින් ජනතාවට ද එවැන්නකට ආරාධනා කරනු ලබයි.

### ii සාක්ෂිය - ස්ත්‍රියගේ සාක්ෂිය (4/39-42) *(මා කළ සියල්ල උන්වහන්සේ මට වදාළසේක. ඒ නුවර සමාරියයන්ගෙන් බොහෝ දෙනෙක් උන්වහන්සේ අදහා ගත්හ)*

## දෙවන කථා පුවත

***තේමාව: ජීවනදායක වචනය (4/43-5/47)***

මෙම කථා පුවතට වෘතාන්ත දෙකක් හා උපදේශනයක් අඩංගු වේ.

1. වෘතාන්තය - නිලධාරියාගේ පුත්‍රයා සුවපත් කිරීම (4/46-56)
2. වෘතාන්තය - බෙතේස්දා පොකුණ අසල කොරා සුවපත් කිරීම (5/1-18)
3. උපදේශනය - ජීවනදායක වචනය (5/19-30)

### iii සාක්ෂිය - පියාණන්ගේ සාක්ෂිය (5/31-47) *("මට ඇති සාක්ෂිය ජොහන්ගේ සාක්ෂියට වඩා උතුම් එකකි.....මා එවා වදාළ පියාණන් වහන්සේම මා පිළිබඳව සාක්ෂි දරා ඇත"*

### 1 වෘතාන්තය - නිලධාරියාගේ පුත්‍රයා සුවපත් කිරීම

මෙහිදී ජේසුස් වහන්සේ දුරතියාම තම **වචනය මඟින්** නිලධාරියාගේ මරණාසන්නව සිටි පුත්‍රයාව සුව කළ සේක. මෙම සිද්ධිය තුළින් විශ්වාසයේ වර්ධනය වීමක් දැක්වෙයි. ප්‍රාතිහාර්යය තුළ මෙතෙක් වර්ධනය වූ විශ්වාසය, මෙහිදී ක්‍රිස්තු වචනය තුළ වර්ධනය වෙයි. අවසානයේ දී තම මුළු ජීවිතයෙන්ම ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි ඇති විශ්වාසය තුළ යටත් වීමකට නිලධාරියා ද යොමු වන්නේ ය.

### 2 වෘතාන්තය - බෙතෙස්දා පොකුණ අසල කොරා සුවපත් කිරීම (5/1-18)

මෙහිදී ජේසුස් වහන්සේ, 38 අවුරුද්දක් කොරව සිටි තැනැත්තාට නව ජීවිතයක් ලබා දුන්නේ ය. මේ අවස්ථාවේ දී සුවය දානය කරනු ලැබුවේ ජේසුස් වහන්සේගේ **ජීවනය දෙන වචනය** හා එම කොර මිනිසා ප්‍රතිචාරයක් වශයෙන් එම වචනයට දැක්වූ කීකරු වීම මතය.

### 3 උපදේශනය- ජීවනදායක වචනය (5/19-30)

ජේසුස් වහන්සේ මෙහිදී **ජීවනය ලබා දෙන වචනය** හුදෙක් ශාරීරික ජීවිතයක් ලබාදීමට පමණක් නොව, උත්ථානවූ ජීවිතයක් ලබාදීම සඳහාම බවත් එය විනිශ්චයේ දී ලබාදෙන බවත් පවසයි. (5/21, 28) උන්වහන්සේගේ මෙම ප්‍රකාශන

(අ) ස්නාවක ජුවාම් තුමාගේ (5/33-35)

(ආ) දෙවි පියාණන්ගේ සාක්ෂිය මත තහවුරු වන්නේ

i ජේසුස් වහන්සේ කරන ක්‍රියාවන් හා
II. ශුද්ධවූ ලියවිල්ල තුළිනි (5/39)

## තෙවන කථා පුවත

***තේමාව: ක්‍රිස්තුන් වහන්සේ ජීවනදායක භෝජනයයි. (6/1-71)***

මෙම කථා පුවතට වෘතාන්ත දෙකක් හා උපදේශනයක් ඇතුලත් වේ.
1. වෘතාන්තය - පූප වැඩි කිරීම (6/1-15)
2. වෘතාන්තය - මුහුද මත ඇවිදීම (6/16-21)
3. උපදේශනය - ජීවනදායක භෝජනය (6/22-59)

**පළමු වෘතාන්තයට** පසුබිම් කෙරෙන්නේ පාස්කුවට ලං වූ කාල පරිච්ඡේදයකි. මෝසස් වැනි දිවැසිවරයෙක් (ද්වි.නි. 18/15) එදා පාළුකරයේ දී ජනතාව පෝෂණය කරන්නට මැදිහත් වූවාක් මෙන් මෙහිදී ද ජේසුස් වහන්සේ ජනතාවට අනුභව කිරීමට පූප දුන් සේක. ජනතාවගේ ප්‍රතිචාරය වූයේ උන්වහන්සේව රජකමට පත්කර ගැනීමට සැරසීමය. උන්වහන්සේ වඩින්නට සිටින දිවැසිවරයාණන් ලෙස හඳුනා ගැනීමය. (6/14)

**දෙවන වෘතාන්තය** ඇරඹෙන්නේ පළමු වෘතාන්තයෙන් එතුමාණන්ට ලැබෙන වැරදි ප්‍රතිචාරය නිවැරදි කිරීමටය. ඒ සඳහා උන්වහන්සේ තවත් ලකුණක් එනම් මුහුද මත ඇවිදීමේ සලකුණ දුන් සේක. (6/16-21) එමඟින් තමන් වහන්සේ කවුරුන්ද කියා තම ගෝලයන්ට පෙන්වා දුන් සේක. මේ ''මම'' යන වගන්තිය තුළ පුරාණ ගිවිසුම තුළ කළ දේව අනාවරණයට සමාන අනාවරණයක් දුන් සේක. (නික්. 20/5, ද්වි.නි. 5/5-9, යෙසායා 43/10, 44/6)

**තෙවන උපදේශනය ජීවනදායක භෝජනය** (6/22-59) - ජේසුස් වහන්සේ මෙහිදී නික්මයාමේ ගමනේ දී මෝසස් දුන් මන්නා ආහාරය සැබෑ වූ ආහාරයක් නොවන බවත්, පියාණන් වහන්සේ තමන් වහන්සේ තුළ සැබෑ වූ ජීවනදායක භෝජනය දෙන බවත් පෙන්වා දුන් සේක. (6/26-34) ඒ නිසා තමන් වහන්සේ සැබෑ වූ ජීවනදායක භෝජනයම බව තහවුරු කළ සේක. (6/35-50) මෙම උපදේශනයේ අවසාන කොටස යොමු වන්නේ, දිව්‍ය සත්ප්‍රසාදය වෙතය. එනම් මාංශය අනුභව කරන, රුධිරය පානය කරන යනුවෙන්, දිව්‍ය සත්ප්‍රසාදීය ශරීරය හා රුධීරය තමාගේම ශරීරය හා රුධීරය වන බවත්, එයින් සදාතන ජීවිතය ලැබිය හැකි බවත් පෙන්වයි. (මන්නා කෑ අය මැරුණහ. නමුත් දිව්‍ය භෝජනය ලබන අය සදාතන ජීවිතය ලබන්නාහ.) (6/60-65) මේ නිසා උන්වහන්සේ පසුපස ආ බොහෝ අය උන්වහන්සේ හැර පියා ගියහ. පේදුරු අනෙකුත් අය නොදන්නා අදහසක් ඉදිරිපත් කරමින් ජේසුස් වහන්සේගේ අනන්‍යතාවයට සාක්ෂි දැරූහ. **''ස්වාමිනි අප කවරෙකු වෙතට යන්න ද, සදාතන ජිවිනයේ වචන ඇත්තේ ඔබවහන්සේ වෙත ය. ඔබ වහන්සේ ......බව අපි අදහමු.''** (6/68-69) මෙම අවසාන කොටස සමදර්ශකවල ඉදිරිපත් කෙරෙන සෙසෙරෙයා පිලිප්හි පේදුරුගේ මහා ප්‍රකාශනයට සමාන්තරය. (මාක් 8/27-30)

මෙහි පොදු තේමාව - ජීවනය යි. (1 හා 2 කථා පුවතෙහි තේමා සමඟ සම්බන්ධය)

## හතරවන කථා පුවතඃ

***තේමාව: ලෝකයේ අලෝකය හා ජීවනය (7/1-8/59)***

මෙම කථා පුවතට වෘතාන්තයක් හා උපදේශනයක් ඇතුළත් වේ.
1. වෘතාන්තය (7/1-13) මගින් පැහැදිලි කරන්නේ තමන් වහන්සේගේ ඥාතීන් විසින් කළ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ ජේසුස් වහන්සේ, අවසානයේ දී හැමටම හොර රහසේ කූඩාරම් මංගල්‍යට සහභාගිවීම සඳහා ජෙරුසලෙමට යෑමේ සිද්ධියයි.

2. මෙහි සඳහන් උපදේශනය (7/14-8/59) ජේසුස් වහන්සේගේ අනන්‍යතාවය තහවුරු කරන්නට ජුදෙව්වරුන් සමඟ ඇති කරගත් සංවාද 7 ක් මෙම කොටසින් පැහැදිලි කෙරේ. (7/53-8/11) දක්වා සඳහන් පව්කාරියට ගල් ගැසීමේ සිද්ධිය අතරට පැමිණිය ද අනෙක් කොටසෙහි ඉහත සඳහන් උන්වහන්සේගේ අනන්‍යතාවය පැහැදිලි කරන්නේ ය. එම සංවාද තුළින්

❖ ජේසුස් වහන්සේ ජීවනදායකයාණන් බවත් (7:37-39)
❖ ජේසුස් වහන්සේ ලෝකයේ ආලෝකය බවත් (8:12)
❖ ඒ සමගම මා හඳුනන්නා පියාණන් වහන්සේව හඳුනන්නේය. (8/19**) මම දෙවියන්** වහන්සේ කෙරෙන් මෙහි පහළ වී දැන් මෙහි සිටිමි. (8/43) යනුවෙන් තම අනන්‍යතා තහවුරු කළ සේක.

මෙහිදී මෙම සංවාදයට පදනම් වූයේ ජොහාන්ගේ සංඝ සමග ඇති වු කථාවකි. පළමුව ඔව්හු ජේසුස් වහන්සේව මෙසියස් හෙවත් ආලේප කළ තැනැත්තාණන් වශයෙන් හඳුනාගෙන ඇදහිල්ලක් ඇති කරගත්තත් පසුව එතුමාණන්ට චෝදනා කරමින් ක්‍රිස්තු අභිධර්මය අවතක්සේරුවට ලක් කළහ. මේ නිසාම උන්වහන්සේ තමන්වහන්සේගේ උපත දෙවියන් වහන්සේගෙන් බවත් එය ආබ්‍රහම් උපදින්නට පෙර පවා තිබුණු බවත් පැහැදිලි කරන්නට යෙදුණේ ය.

## පස්වන කථා පුවත

***තේමාව: අලෝකය මඟින් වන විනිශ්චය (9/1-10/42)***

මෙම කථා පුවතට වෘතාන්තයක් හා උපදේශනයක් ඇත.

❖ **වෘතාන්තය** - ජාත්‍යාන්ධයා සුවපත් කිරීම (9:1-12) මුල් කරගෙන ගොඩනැගේ.
එම සිද්ධිය ව්‍යාප්ත වන්නේ පරිසිවරුන්ගේ නඩු විභාග දෙකක් (9:13-23) (9:24-34) මඟිනි. මෙම වග විභාග අවසන්වූයේ පරිසිවරුන්ගේ ඉලක්කය වූ ජේසුස් වහන්සේ පිළිබඳ ජාත්‍යාන්ධයා දුන් සාක්ෂිය මඟින්ය. එනම් තමාව සුව කළේ දෙවියන් වහන්සේ වෙතින් පැමිණි, දේව භක්තිය ඇති, දේව කැමැත්ත කරන තැනැත්තාණන් කෙනෙකු බව ඔහු සාක්ෂි දැරුවා පමණක් නොව, තමාගේ එක සිතින් උන්වහන්සේ පිළිගත්තේ ය.

මෙහිදී ඇස් පෙනීම තිබූ පරිසිවරුන්ට ජේසුස් වහන්සේ පවසන්නේ ඔවුන් විශ්වාසයේ අන්ධයන් වන බවය. කෙසේ වෙතත් සැබෑ විනිශ්චයකරුවා හා බලධාරීන් විනිශ්චය කරන්නා වන ජේසුස් වහන්සේ, පෙනීම ඇත්තන් හා පෙනීම නැත්තන් (විශ්වාසය තුළ) විනිශ්චය කරන්නට පැමිණි බවය. (9:34-41) මෙමගින් ජුවාම්තුමා පෙන්වන්නට වෑයම් කරන්නේ විශ්වාසයේ ආලෝකය ලබා ගනිමින් දේව විපාකය ලැබීමේ විනිශ්චයකට අප සැදී පැහැදී සිටිය යුතු බවය.

❖ **උපදේශනය**
මෙම කතා පුවතෙහි සඳහන් උපදේශනය ගොඩනැගෙන්නේ යහපත් එඬේරා පිළිබඳ සිද්ධිය මුල්කරගෙනය. එහි පසුබිම වන්නේ (එසකියෙල් 34) පරිච්ඡේදයෙහි සඳහන් කරනු ලබන කුලීකාර එඬේරුන් යැයි සලකනු ලැබූ ඊශ්‍රායෙල්හි නායකත්වයට විකල්පයක් වශයෙන් කෙරෙන ඉදිරිපත් කිරීමක්ය.

එසකියෙල් 34 පරිච්ඡේදයේ ඊශ්‍රායෙල් නායකත්වය හෙවත් එඬේරිකත්වය දේව විනිශ්චයට පාත්‍රවන බව පෙන්වයි. එහෙත් ඊශ්‍රායෙල් නායකයන් මෙන් නොව තමා යහපත් එඬේරෙක් වන බවත්, තමා ජනතාව සඳහා ජනතාව වෙනුවෙන්, ජනතාව සමඟ සිටින එඬේරෙක් වන බවත් පවසා නායකත්වයට බයිබලීය පදනමක් ගොඩනගයි.

ඒ අනුව සැබෑ නායකයා යනු;
- තමාගේ ජීවිතය, ජනතාව වෙනුවෙන් පුදන තැනැත්තාය. (10:11, 17)
- තම ජනතාව හඳුනන තැනැත්තාය. (10:15)

- තම ජනතාව සැබෑ ලෙස එකමුතු කරන, ඒකත්වයට ගෙනෙන තැනැත්තා ය. (10:16)
- තම ජනතාවට සදාතනික ජීවිතය දෙන තැනැත්තාය. (10:28)

මෙහි එන ජීවනයේ තේමාව මීළඟ කථා පුවත දක්වා විකාශනය වේ.

### හයවන කථා පුවත:

***තේමාව: මරණය අභිබවා ජයගත් ජීවනය (11:1-53)***

මෙම කථා පුවතෙහි වෘතාන්තය හා උපදේශනය වෙන වෙනම දැකිය නොහැකි සේ එකිනෙකට වෙළී පවති. ලාසරස් මළවුන්ගෙන් නැගිටුවීම පාදක කරගනිමින් ඒ පිළිබඳ උපදේශනය පරිච්ඡේදයම ආවරණය කෙරෙමින් විහිදෙයි. එමඟින් සිව්වැනි සුභාංරචි කතුවරයා, දේව ධාර්මිය අර්ථයක් හා නව නැම්මක් එම වෘතාන්තයට ලබා දුනි. ලාසරස් උත්ථාන කිරීම, උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ විසින් තමන්ට ප්‍රේම කරන ගෝලයන්ට ලබා දෙන උත්ථානීය ජීවිතය හෙවත් පුනර්ජීවනය සංකේතවත් කරනු ලබයි.

මෙම සිද්ධිය තුළින් සාක්ෂි දෙන්නේ එය දුටු, එම අත්දැකීම ලැබූ, ජන සමූහයා ය. ඔවුන්ට ක්‍රිස්තුන් වහන්සේ කළ දෙය දකින්නට විශ්වාසයේ ආලෝකය තිබිණි. ඒ නිසාම ඔව්හු ඇදහිල්ලෙන් දෙව් සරණ ගියෝය. මරණය මත ජේසුස් වහන්සේ තුළ ඇති බලය නිසාම ලැබුණු ජනප්‍රියත්වය, සැන්හෙඩ්‍රින් සභාව හෙවත් ශ්‍රේෂ්ඨාධිකරණය ඉතා ඉක්මණින් කැඳවීමට හේතු විය. (11:45-53)
කයිපාස් විසින් ජාතික ආරක්ෂාව යන මුවාවෙන් කාලයට යෝග්‍ය වූ දෙයක් ලෙස තර්කයක මඟ විවෘත කරනු ලැබිණි. (11:50)

### හත්වන කථා පුවත:
***තේමාව: මරණය මඟින් ජීවිතය (12:1-50)***

මෙම කථා පුවතේ වෘතාන්ත දෙකක් හා උපදේශනයක් අඩංගු වේ.

මෙහි පළමු කථාව හෙවත් බෙතානියේ දී මරියා විසින් ආලේප කරනු ලැබීම, ජයශ්‍රියෙන් ජෙරුසලෙමට ඇතුළත් වීමට පෙර සඳහන් කරයි. ආලේප කරනු ලැබූ තැනැත්තා හෙවත් මෙසියස් යන අදහස මෙමඟින් තීව්‍ර කරමින් උන්වහන්සේ තම මරණය හා උත්ථානය තුළින් මෙසියානික මහිමයට ඇතුළත් වීමට, මරියා විසින් කල්මත්තෙන්ම ආලේප කළාය යන දිවැසිවර ක්‍රියාව ගැන පැහැදිලි කිරීමක් කරන ලදි. (12:7)

දෙවන වෘතාන්තය වනුයේ රාජශ්‍රියෙන් ජෙරුසලෙමට වැඩම කිරීමය. (12:12-15)
මෙහිදී ස්වාමින් වහන්සේ තමන්ට විරුද්ධව කුමන්ත්‍රණය කරන ජනතාවට සැබෑ සාමයේ පණිවුඩයක් දෙනු සඳහා සාමයේ සංකේතයක් වූ කොටළු වස්සකු පිට පැමිණෙයි. (සෙකරියා 9:9-10) සඳහන් ලෙසට ජෙරුසලෙමෙහි යුද්ධ රථ ද, අශ්වයන් ද, යුද්ධ දුන්න ද කපා ජාතීන්ට සාමය ගෙනෙනු සඳහා පැමිණෙන සාම කුමාරයා වෙන කෙනෙකු නොව තමාම බව, කොටළු වස්සකු පිට පැමිණීමෙන් පෙන්නුම් කරයි. (12:16-19) කොටසින් සුවිශේෂකවරයාගේ මෙනෙහි කිරීම හෙවත් ජීවිත ප්‍රත්‍යාවර්තනය (Reflection) ඉදිරිපත් කෙරේ. මෙහිදී අන් අවස්ථාවලදී මෙන් නොව, උන්වහන්සේගේ ශ්‍රාවකයින් පවා එය තේරුම් ගත්තේ, උන්වහන්සේ මහිම ප්‍රතාපවත් වීමෙන් පසුවය.

තම අරමුණු ඉෂ්ඨ කරගැනීමට ජුවාම් තුමා වෙන අවස්ථාවලට වඩා වෙනස් ආකාරයට සාක්ෂි දීමක් කැඳවනු ලබයි. මෙම අවස්ථාවේ දී මුළු ලෝකයම උන්වහන්සේ පසුපස යාමේ සිද්ධිය 19 වන වගන්තියෙහි සඳහන් කරමින් ජුවාම් තුමා විශ්ව සාක්ෂිකරුවෙකු උන්වහන්සේ වෙනුවෙන් ඇති බව සඳහන් කරයි.

මෙම අවසාන කථා පුවතෙහි උපදේශනය තිරිඟු බීජය සම්බන්ධව 12:23-36 උපමාව මඟින් පැහැදිලි කෙරෙයි. ග්‍රීක භාෂාව කථා කරන ජනතාව විසින් අසන ලද ප්‍රශ්නයකට ජේසුස් වහන්සේ තිරිඟු බීජයක ක්‍රියාකාරීත්වයෙන් තමන් වහන්සේ කවුදැයි කියා හඳුන්වා දෙනු වෙනුවට, තමන් වහන්සේගේ කාර්යය හඳුන්වා දුන් සේක. උන්වහන්සේ පියාණන්ගේ කැමැත්ත තුළ මරණය පිළිගන්නා බව සහ දේව මහිමය

ප්‍රකාශයට පත් කරන බව සඳහන් කරන ජුවාම් තුමා මෙහිදි සාක්ෂි දෙන්නේ අන් කිසිවකු නොව පියාණන් වහන්සේම බව පැහැදිලි කිරීමටය.

මෙම සලකුණු සහිත කොටසේ ජේසුස් වහන්සේ පිළිබඳ දෙන සාක්ෂි ක්‍රම ක්‍රමයෙන් උච්ච ස්ථානය වෙත යොමු කරන්නේ ය.

- ❖ ජන සමූහයා 11:45
- ❖ මුළු ලෝකයම 12:19
- ❖ පියාණන් වහන්සේ 12:28

12:37-50 දක්වා කොටසින් දක්වනු ලබන්නේ සළකුණු පිළිබඳ කථා පුවත්වල සංක්ෂිප්තයයි. මෙම කොටසින් සුවිශේෂකවරයා මෙතෙක් ඉදිරිපත් කරන ලද ජේසුස් වහන්සේ පිළිබඳ ප්‍රබල වචන හා ප්‍රබල ක්‍රියා පිළිබඳව එකිනෙකට වෙනස් ප්‍රතිචාරයන් දෙකක් ගෙනහැර පායි. එනම්;

- ❖ යෙසයා 6:10 හා යෙසායා 53:1 මෙන් වැඩි දෙනෙක් විශ්වාසයේ සිත් අන්ධ වීම නිසා උන්වහන්සේව අදහා නොගත් බවත්
- ❖ ජුවාම් 12:37-43 බොහෝ දෙනෙකු උන්වහන්සේව අදහා ගත් නමුත් මිනිසුන්ගෙන් ලැබෙන ගෞරවය නිසාම උන්වහන්සේ ගැන සාක්ෂි දෙන්නට බියවූ බවත් පෙන්වයි.

මේ නිසාම උන්වහන්සේ 12:44-50 දක්වා කොටසින් තමා ගැන අනාවරණයක් දෙන උපදේශනයක් දෙන සේක. එහි සංක්ෂිප්ත ලෙස,

- ❖ ක්‍රිස්තුන් වහන්සේ අදහන්නාවූ තැනැත්තා පියාණන්ව අදහන බවත්
- ❖ උන්වහන්සේව දකින තැනැත්තා පියාණන් වහන්සේව දකින බවත්ය.

ඒ නිසාම තමන් වහන්සේ ලෝකයට ආලෝකයක් සේ පැමිණ සෑම දෙනා අන්ධකාරයෙන් මුදන බවත්, තමන් වහන්සේ පැමිණියේ විනිශ්චයට නොව, විනිශ්චය දෙන්නේ පියාණන් වහන්සේ බවත් අප අවධානය යොමු කරන්නේ ය.

## Book of Glory - මහිමවත් බව ප්‍රකාශවීමේ පොත (13/1-20/31)

සළකුණු සහිත කොටස හා සංසන්දනය කිරීමේ දී මෙම කොටසෙහි ද උපදේශනයන් හා වෘතාන්ත දක්නට ලැබුණත් යොදා ඇති පිළිවෙල වෙනස් කිරීමට කතුවරයා උත්සාහ ගත් ආකාරය දැකිය හැක. මෙම පරිච්ඡේද හත ඇතුළතදිම ඇත්තේ එකම දීර්ඝ උපදේශනයක් හා වෘතාන්තයකි.

සළකුණු සහිත කොටසේ වෘතාන්තයට පසු උපදේශනය යොදා තිබුණත් දුක්ප්‍රාප්ති වෘතාන්තයට පසු උපදේශනයක් දිය නොහැකි නිසා, මෙම කොටසේදී දීර්ඝ උපදේශනයට (13/1-17/26) පසු දුක්ප්‍රාප්ති වෘතාන්තය (18/1-20/31) යොදා තිබේ.

### I උපදේශනය - සමුගැනීමේ කථා මාලාව 13/1-17/26 ( fairwell discourse )

ගෝලයන්ගේ පාද සේදීම (13/1-30) වෘතාන්තයක් ලෙස ආරම්භ කළත් 13/15 වගන්තියේ සඳහන් වන පරිදි උන්වහන්සේ අපට පවසන්නේ බැහැපත් ක්‍රියාවක් කරන්නට පමණක් නොව ඊට වඩා බැරෑරුම්වූ කාර්යය භාරයක් ඉෂ්ඨ කරන්නට ය. එනම් යහපත් එඬේරාගේ උපමාවේ දී මෙන්ම මෙහිදී ද

- බැටළුවන් උදෙසා ජීවිතය පූජා කිරීම (10/11)
- මා නැවත ලබන පිණිස ජීවිතය පූජා කරමි. (10/17)

මෙය ඇත්ත වශයෙන්ම ඊළඟ දිනයේ දී උන්වහන්සේ කරන්නට යන ජීවිත පූජාව සංකේතාත්මකව ඉදිරිපත් කිරීමකි. එනම් පාද දෝවනය කුරුසිය මත පුදන ජීවිත පූජාවේ පෙර සළකුණකි. මෙය පේදුරුතුමා වටහා නොගත්තේ ය. ඒ නිසාය පේදුරුතුමා ඇසූ ප්‍රශ්නයට ''මා කරන්නේ කුමක්දැයි ඔබ දැන් නොදන්නෙහිය. එහෙත් පසුව ඔබට වැටහෙනු ඇත'' යනුවෙන්

ජේසුස් වහන්සේ පැවැසුවේ. මෙහිදි උතුරු සළුව ගැලවීම උන්වහන්සේගේ ජීවිතය පූජා කිරීම ද (13/4) නැවත උතුරු සළුව හැඳ ගැනීම උන්වහන්සේගේ උත්ථානය ද සංකේතවත් කිරීමට ජුවාම් තුමා යොදා ගෙන ඇත. මෙයින් උන්වහන්සේ තම ශ්‍රාවකයන් තවත් උපදේශනයකට යොමු කළ සේක.

**ii උන්වහන්සේ ගේ වෙන්වීම හා නැවත පැමිණීම පිළිබඳ උපදේශනය (13/31 - 14/ 31)**

මෙම උපදේශාත්මක කථාවේ මූලිකම අදහස වනුයේ තමන් වහන්සේගේ සැබෑ ශ්‍රාවකයන් හට තම වියෝවීම පිළිබඳව දැනුවත් කර තමාගේ ප්‍රේමය ඔවුනට ප්‍රකාශ කරමින් නව පණතක් හඳුන්වා දීම ය. (13/31 -35) ***''මම ඔබට අළුත් ආඥාවක් දෙමි. එකිනෙකාට ප්‍රේම කරන්න. මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න. ඔබ එකිනෙකාට ප්‍රේම කරන්නාහු නම් එයින් ඔබ මාගේ ගෝලයන් බව සියල්ලෝ දැන ගනිති''*** යනුවෙන් පැවසුවේ ය. මෙම හඳුන්වා දීමෙන් පසු පේදුරු තුන් වරක් උන්වහන්සේව ප්‍රතික්ෂේප කරන බව උන්වහන්සේ දැන්වූ සේක. ((13/36-38)

ඒ කෙසේ වෙතත් 'පියාණන් වහන්සේ වෙතට තමන් වහන්සේ ගොස් එහිදී ඔවුනට නිවසක් පිළියෙල කරන බව ද පියාණන් සමග උන්වහන්සේ ගේ මහිමය භුක්ති විඳීමට අවස්ථාව සලසන බව ද ඒ සඳහා ජේසුස් වහන්සේ නැවත පැමිණෙන බව ද දැන්වූ සේක. (14/1-5)

(14/6-11) පියාණන් වහන්සේ වෙතට යන එකම මාර්ගය තමන් වහන්සේ වන බව ප්‍රකාශ කළසේක.
(14/12-14) තමන් වෙන්වීමෙන් පසු තමන් වහන්සේගේ නාමයෙන් අයදින කවර අදහසක් වූවද ඉටුකර දෙන බවට සහතිකයක් දෙනු ලබන සේක.
(14/15-25) යම් කෙනෙක් ස්වාමින් වහන්සේගේ ප්‍රේමයේ ජීවිතය තුළ උන්වහන්සේගේ ආඥා පිළිපදින්නේ නම්, යුගාන්තය දක්වා ඔවුන් සමග සිටින්නට සහනදායකයෙකු එවන බවට එනම් සත්‍යතාවේ ආත්මයාණන් එවන්නටත් උන්වහන්සේ පොරොන්දු වූසේක.
(14/25-26) තමන් වහන්සේගේ නාමයෙන් පියාණන් වහන්සේ එවන සහනදායකයාණෝ ඔවුන්ට සියල්ල උගන්වමින් තමන්වහන්සේ වදාළ සියල්ල ඔවුන්ට සිහිපත් කරන සේක.
(14/26-31) තමන් වහන්සේ පියාණන් වහන්සේ වෙතට යාම තුළ සිත් කැළඹීමක් හෝ බියක් ඇති කර නොගන්නා ලෙසටත්, උන්වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් හා ප්‍රේමයෙන් ජීවත්වීම තුළ ප්‍රීතියක් හා ශාන්තියක් ඔවුන්ට අත්වන බවත් ජේසුස් වහන්සේ ඔවුන්ට පෙන්වා දුන් සේක.

**iii ක්‍රිස්තුන් වහන්සේත් උන්වහන්සේගේ සංසයත් පිළිබඳ උපදේශනය (15/1 - 16/35)**

ක්‍රිස්තුන් වහන්සේත් සභාවත් අතර ඇති සම්බන්ධතාවය මිදි වැල හි එහි අතු අතර සම්බන්ධය උපමේයක් තුළින් ප්‍රකාශ කරමින් ලෝකයා කොපමණ ද්වේෂ කළත්, උන්වහන්සේ අපට ප්‍රේම කළ ආකාරයට අපත් එකිනෙකාට ප්‍රේම කළයුතු බවත් තමන් වහන්සේගේ ප්‍රේමයට සාක්ෂි දැරිය යුතු බවත් ය. (15/1 - 16/4)

ශුද්ධාත්මයාණන් පැමිණි කළ සිදුවන ඉමහත් දේ, එනම් පාපය ගැන ද, ධර්මිෂ්ඨකම ගැන ද, විනිශ්චය ගැනද ලෝකයාට වටහා දෙන බවත් සත්‍යතාවේ මාර්ගයත් ඒ තුළ ජීවනයත් ශ්‍රාවකයන්හට ලැබෙන බවත් සහතික කරන සේක. (16/5 - 15) ඒ නිසාම ඔවුන් විඳිනා දොම්නස සොම්නසට හැරෙන බව ද මතක් කර දෙන සේක. (16/16 - 33)

## 1. උත්තම පූජක යාච්ඤාව 17 / 1-26

**මේ උත්තම පූජක යාච්ඤාව තුළ ප්‍රධානවූ කොටස් තුනක් දැකිය හැක.**

i ජේසුස් වහන්සේ පළමුව යාච්ඤා කරන්නේ පියාණන් වහන්සේ විසින් තමන් වහන්සේව මහිමයට පත් කිරීම මගින් හා එම මහිමය තුළින් පියාණන් වහන්සේ ගේ මහිමවත් වැඩ සිටීම ප්‍රකාශ කරන්නට ය. (17/1 - 15)

ii ජේසුස් වහන්සේ දෙවනුව තමන් වහන්සේගේ ශ්‍රාවකයන් වෙනුවෙන් යාච්ඤා කළ සේක.(17/6-19)

ශ්‍රාවකයන්ගේ අවශ්‍යතා රැසක් පියාණන් වහන්සේ වෙත ඉදිරිපත් කරමින් විශේෂ ඉල්ලීම් 3 ක් කරනු ලබයි.

අ. පියාණන්ගේ නාමයෙන් අනුහසින් එතුමන්ලා මෙන් ශ්‍රාවකයන්ව ද ඒකත්වයකට පමුණුවන පිණිසත් (17/11)

ආ. නපුරාගෙන් ඔවුන් ආරක්ෂා කරගන්නා පිණිසත් (17/15)

ඇ. සත්‍යයෙහි ඔවුන් කැප කරන ලෙසත් ය. (17/17)

iii තුන්වෙනුව ශ්‍රාවකයන්ගේ වචනය අදහාගෙන විශ්වාස කරන සියල්ලන් වෙත ද යාච්ඤා කරමින් ඒකත්වයක් වන පිණිස අතීතයත්, වර්තමානයත්, අනාගතයත් තමන් වහන්සේ තුළ ඒකාබද්ධ කළ සේක. (17/20 - 20)

## 2. දුක්ප්‍රාප්ති වෘතාන්තය (18/ 1-19-42)

මෙම දුක්ප්‍රාප්ති වෘතාන්තය ඉතාමත් පරික්ෂාකාරීව සංස්කරණය කරමින් කොටස් තුනකට බෙදා ඇත.

අ. අත් අඩංගුවට ගැනීම හා සැන්හෙඩ්‍රින් සභාව ඉදිරියේ නඩු විභාගය (18/1-27)

ආ. පිලාත් ඉදිරියේ නඩු විභාගය (18/28 - 19/16)

ඇ. කුරුසියේ ඇණ ගැසීම මරණය හා භූමිදානය (19/17-42)

මෙම දුක් ප්‍රාප්ති වෘතාන්තයේ කේන්ද්‍රිය සිද්ධිය වන්නේ ඔබ ජුදෙව්වරුන්ගේ රජ ද? (18/33 - 40) (19/14-15) නැතහොත් ඔබ මෙසියස් ද? යන ප්‍රශ්නයයි. මෙය දුක්ප්‍රාප්ති වෘතාන්තයේ ආරම්භයේදි හා අවසානයේ දි සඳහන් තිබිමෙන් එම වෘතාත්තයේ කේන්ද්‍රිය තේමාව ලෙස ගණන් ගත හැක.

**A** අත්අඩංගුවට ගැනීමේ සිද්ධිය සඳහන් කරන සිව්වැනි සුබාරංචි කතුවරයා ඒ පිළිබඳව ජේසුස් වහන්සේ සියලු දේ දැන සිටි බව වාර්තා කරයි. (18/4-7) එසේම උන්වහන්සේට මග හැරයාමේ අවස්ථාව හොඳින් එළඹියත් ඉතාමත් කැමැත්තෙන් තමාගේ කාර්යය කරන්නට දෙවරක්ම ඔවුන් විචාරමින් ''ඒ මමයි '' කියමින් අභියෝගයට මුහුණ දුන්නේ ය. මෙය එක්තරා අන්දමකින් නික්මයාම 3/6 මගින් පිළිඹිබු කළ යාවේ දෙවියන් වහන්සේගේ නාමය අනාවරණය කිරීමට සමාන අවස්ථාවකි) (18/4-7) එසේම තම ශ්‍රාවකයන්ගේ ආරක්ෂාව ගැන ද සිතුවේ ය.

සමදර්ශක සුබාරංචි වල මෙන් සිව්වැනි සුබාරංචි තුළ සැන්හෙඩ්‍රින් සභාව ඉදිරියේ කෙරෙන නඩු විභාගයක් සඳහන් නොවේ. 18/12-27 දක්වා කොටසින් අන්නාස් විසින් ප්‍රශ්න කරනු ලැබ උන්වහන්සේව කයිපාස් වෙතට යවනු ලැබූ බවත් සඳහන් කරයි. 5 වන පරිච්ඡේදයේ සිට ජුදා පාලකයන් විසින් ජේසුස් වහන්සේව අල්ලා ගන්නට කුමන්ත්‍රණ කරන බවත් එය දේව අපහාස වචන කීවාය යන අදහස මූලික චෝදනාව වශයෙන් එල්ල කර ගනිමින් ගොඩ නැගූ බවත් කියයි. අන්නාස් විසින් කරනු ලැබූ ප්‍රශ්න කිරීම පේදුරු තුමාගේ අපලාපය මගින් එක්තරා රාමුවකට ඇතුලත් කරයි.

**B** **පිළාත් ඉදිරියේ නඩු විභාගය**

පිළාත් ඉදිරියෙහි වූ නඩු විභාගය, කේන්ද්‍රිය සිද්ධියවූ කටු ඔටුන්න පැළඳවීම හා ගල් කණුවේ බැඳ කස පහර දීමේ සිද්ධිය මගින් කොටස් දෙකකට වෙන් කෙරේ. මෙම කොටස් දෙක ප්‍රිටෝරියම් නඩු ශාලාවෙන් පිටත හා ඇතුළත වශයෙන් සැලකිය හැක.

### රජවාසල පිටත සිදුවීම්

- ජුදෙව්වරුන් විසින් ජේසුස් වහන්සේව පිළාත් වෙත ඉදිරිපත් කිරීම. (18/28-32)
- රජකම ගැන, පිළාත් ක්‍රිස්තුස් වහන්සේගෙන්, අභියෝගාත්මක ලෙස ප්‍රශ්න කිරීම (18/33-38 බී)
- කටු ඔටුන්න පැළඳවීම හා කස පහර දීම (19/1-3) (මෙය කේන්ද්‍රිය සිදුවීම ය)

### රජවාසල ඇතුළත සිදුවීම්

- මෙන්න ඒ මනුෂ්‍යයා (19/4-7)
- බලය පිළිබඳව නැවතත් ප්‍රශ්න කිරීම (19/8-11)
- සීසර් හැර වෙන රජෙක් නැත 619/12-16)

මාක් සුබාරංචියේ (15/15) කුරුසියේ ඇණ ගැසීමට පෙර කස පහරදීම සිදුවුවත් ජොහාන් සුබාරංචියේ. ඉහත දැක්වූ ලෙස කේන්ද්‍රය ලෙස යොදා ඇත්තේ යෙසායා 53 දක්වන ආකාරයට ක්‍රිස්තුස් වහන්සේගේ රජකම මෙසියානික රජකමක් හා සෙවකයාගේ දුක් විදීමක් බව පෙන්වීමටය. සිව්වැනි සුබාරංචි කතුවරයා උපහාසයට පත්වෙන ජේසුස් වහන්සේ ගැන සඳහන් කරමින් එසේ උපහාසයට වන්නේ, අවිශ්වාසවත්, ජුදෙව්වරුන්ට පමණක් බවත්, උන්වහන්සේගේ රජකම, අන්‍යජාතිකයන් වූ සොල්දාදුවන් හා පිළාත් මගින් ප්‍රකාශයට පත් වන බවත් පෙන්වා දෙයි.

## C. කුරුසියේ ඇණ ගැසිම, මරණය හා භූමිදානය (19/ 17-42)

පුරාණ ගිවිසුමේ දි මෙන්, තවත් ඒක ජාත පුත්‍රයෙක්, තවත් ඊසාක් කෙනෙක් ලෙස, මෙහිදි ක්‍රිස්තුස් වහන්සේම, තම කුරුසිය උසුලාගෙන කපාල පිටිය වෙත ගමන් කරන සේක.

- උන්වහන්සේව කුරුසියේ ඇණ ගැසිමෙන් පසුව සියළු දෙනාටම කියවා ගත හැකිවන පරිදි ''ජුදෙව්වරුන්ගේ රජවු නාසරෙත් හි ජේසුස් ''යන පාඨය ලියා තැබීමෙන් ක්‍රිස්තුස් වහන්සේගේ රජකම මෙසියස් බවට විරුද්ධවාදී මත දුරුවද, අවසානයේ ද නිහඬවම ජුදෙව්වරුන් විසින්ම ප්‍රකාශයට පත් කරන ලද බව පෙන්වා දෙයි.

- ගීතාවලිය 22/18 සඳහන් උන්වහන්සේගේ ඇඳුම වෙන් නොකර දාදු දැමුවේ ය. එය කිසිදු වාටියක් හෝ නොදමා තිබිමෙන් සංකේතවත් කළේ උන්වහන්සේගේ සංඝයේ එකමුතුකම හෝ නායක පූජකයාගේ සළුවය.
- උන්වහන්සේ කුරුසපත් වන අවස්ථාවේ දී කුරුසිය පාමුල උන්වහන්සේගේ ප්‍රේමවන්ත ගෝලයා හා මෑණියන් සිටිනවා දැක, ඔවුන් එකිනෙකාට භාර කිරිම තුළ ප්‍රේමවන්ත ගෝලයා ජේසුස් වහන්සේගේ ප්‍රේමයට පාත්‍රවූ අනුගාමිකයෙකුද, ස්ත්‍රිය හෙවත් උන්වහන්සේගේ මෑණියෝ දේව ජනතාව හෙවත් සභාව ද, එහිදි සංකේතවත් (19/25-27) කරන ලදී.

- ජේසු ස්වාමින් වහන්සේගේ භූමිදානය සබත් දිනට පෙරදින සූදානම්වීමේ දවසේ දී සිදුවූ බව පවසන ජුවාම් තුමා ජේසුස් වහන්සේ නියත වශයෙන්ම මරණයට පත්වි තිබුණ නිසා උන්වහන්සේගේ පාද නොකඩන ලද බවත්, මෙම සිදුවිම එක්තරා අන්දමකින් පුරාණ ගිවිසුම් වැකියක් ඉෂ්ට කිරීමක් වගේම පුරාණ ගිවිසුමේ බැටළුවාගේ සිද්ධියත් මතකයට ගෙනේ. එදා පාස්කු බැටළුවාගේ ඇට කිසිවක් නොබිඳ උගේ ලෙය ගැලවීමේ සංකේතයකටත් උගේ මස එතරවීමේ ගමනට ශක්තියක් සැපයුවාසේ මෙහිදි ජේසුස් වහන්සේගේ ද කකුල් නොකඩන ලද අතර, උන්වහන්සේ ද ජනතාවට ගැලවිමත් පෝෂණයත් ලබා දුන් දේව අජපොව්වා වූ සේක.

- මෙම අවස්ථාවේදි 19/34 වගන්තියේ සඳහන් පරිදි හෙල්ලයකින් උන්වහන්සේගේ ඇලයට ඇනීම මගින් උන්වහන්සේගේ සිරුරෙන් රුධිරයත්, ජලයත් වහනය විය. එය ජනතාවගේ ගැලවීම හා විමුක්තිය සඳහා උන්වහන්සේ කළ ජීවිත පූජාවේ අවසාන රුධිර බිංදුව විය. එය ඔවුන්ගේ ජීවිතවලට නව ජීවිතයක් හා ශක්තියක් විය. මෙම නව ජීවනය හා පෝෂණය ලබාදෙන ප්‍රසාද ස්නාපනයට හා දිව්‍ය සත්ප්‍රසාදීය සක්‍රමේන්තු සංකේතවත් කරන ලදි.

## 3. ජේසුස් වහන්සේගේ උත්ථානය (20/ 1 - 31)

**a.** ජොහානිය උත්ථාන වෘතාන්තය කථා පුවත් දෙකකින් සමන්විතය.
හිස්වූ සොහොන සම්බන්ධව උන්වහන්සේගේ උත්ථානය සහතික කරන කණ්ඩායම් දෙකක් සිටිති.

1. ජේදුරු සහ ප්‍රේමවන්ත ගෝලයා (20/2-10)
2. මරිය මග්දලේනා (20/1-11-18)

පළමු අවස්ථාවේ දී හිස්වූ සොහොනේ මෘත ශරිරය ඔතන ලද රෙදි තිබිමෙන් කිසිවෙකු විසින් මෘත ශරීරය සොරකම් නොකරන ලද බවට ඉගියක් කෙරුණි. එහෙත් ශරීරය නොමැති නිසා ඇත්ත වශයෙන්ම එතෙක් ඔවුන් තේරුම් නොගත් දෙයක් අවබෝධ කරගත හැකිවූ බව එනම් උන්වහන්සේ උත්ථානවූ බව පැහැදිලි කෙරේ. එම අවබෝධය නිසා එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රේමවන්ත ගෝලයා ඇතුලට ගොස් එය දැක විශ්වාස කළේ යයි 20/8 සඳහන්වේ.

මෙහිදී පේදුරුගේ විශ්වාසයක් සඳහන් නොවේ. මෙමගින් සුබාරංචි කතුවරයා පෙන්වා දෙන්නේ ක්‍රිස්තුස් වහන්සේට ඇති දැඩි සම්පතාවය හා ප්‍රේමය නිසාම ප්‍රේමවන්ත ගෝලයාට උන්වහන්සේව සළකුණු දැක විශ්වාස කිරීමේ අත්දැකීම ලැබුණ බවයි.

දෙවන අවස්ථාවේ දි මරිය මග්දලේනා හිස් සොහොන වෙත ගියවිට ජේසුස් වහන්සේ එහි සිටියත් ඇයට එතුමන්ව හඳුනා ගැනීමට නොහැකි විය. ජේසුස් වහන්සේ මරියා කියා ඇමතු විට පමණක් ඇයට උන්වහන්සේව හඳුනා ගැනීමට හැකිවිය. ජුවාම් 10/27 හි සඳහන් මාගේ බැටළුවෝ මාගේ කටහඬ හඳුනති යන්න ඉහත සිද්ධිය මගින් සනාථ කෙරේ. එසේම එතුමෝ මරියාට ආරාධනා කළේ අතීත සබඳතා ආවර්ජනය කරනු වෙනුවට තමන් වහන්සේ හා ශ්‍රාවකයන් අතර නැවුම් නව සබඳතාවක් ඇති කරන තානාපතිවරියක් වන ලෙසට ය.

## b. අනෙකුත් ගෝලයන්ට දර්ශනය වීම

මෙම අවස්ථාවේ දි වඩා වැදගත් වන්නේ ජේසුස් වහන්සේ විශේෂවූ බලයකින් දොරවල් වසා තිබූ එම ශාලාවට ඇතුළුවීම නොව. උන්වහන්සේ තමන් පොරොන්දුවූ ප්‍රකාරයට තම උත්ථානයේ තිළිණයන් තම ගෝල පිරිස වෙත ප්‍රදානය කිරීම ය.
ඒවා නම්

1. ශාන්තිය වේවා යන සාමයේ පැතුම (20/19)
2. උන්වහන්සේගේ අනුගාමිකයන් ලෙස අපෝස්තුළුවරුන් යවනු ලැබීම
3. ශුද්ධාත්ම තිළිණය පිළිගැන්වීම (20/22)
4. පව්කමාවේ බලය දානය කිරීම (20/23)

### තෝමස්ට දර්ශනයවීම (20/24-29)

උත්ථානවූ ජේසුස් වහන්සේ මෙහිදී තෝමස් කැමතිවූ පරීක්ෂණය කරන්නට තම සිරුර ඔහුට භාර කරයි. ඒ තුළ එම අත්හදා බැලීම කරන්නට ආරාධනා කරයි.

එමගින් ඔහුගේ අවිශ්වාසය, විශ්වාසයකට පෙරළා ගන්නට අභියෝග කරයි. මෙමගින් අත්දැකීමෙන් විශ්වාසය තහවුරු කර ගන්නවාට වඩා නොදැක විශ්වාස කිරීමෙන් කෙනෙකුට භාග්‍යවන්ත බව ලබා ගත හැකි බවත්, සැමවිටම විශ්වාසයේ දැස් විවෘතව තබා ගැනීමේ අවැසිතාවයත් ඒ තුළ මතු පරම්පරාවට බලාපොරොත්තුවක් ඇති කර ගැනීමේ භාග්‍යවතුන්වීමේ අවස්ථාවන් ද, ඔවදන් ලෙස ඉදිරිපත් කෙරේ.

## c. අවසානය (20/30-31)

සුබාරංචි කතුවරයා තම ග්‍රන්ථය අවසාන කිරීමේ දී තමන් විසින් තෝරාගන්නා ලද බොහෝ කරුණු අතරෙන්වූ ස්වල්පය එකම අරමුණක් ඉටු කර ගැනිමට යොදා ගෙන ඇති බව පෙන්වයි. එනම් සුබාරංචියේ පරමාර්ථය කෙරෙහි තම සංඝයේ විශ්වාසය තර කරන්නට ඔහු අරමුණු කරයි.

# උපග්‍රන්ථය (21/ 1-25)

මෙම කොටස ජොහන්ගේ සංඝය තුළ ඇතිවූ හා දැනටත් ඇතිවෙන්නාවූ ප්‍රශ්න දෙකක් නිරාකරණය කරන්නට පසුකාලීනව එකතුකරන ලද කොටසක් හැටියට බයිබල් විශාරදයෝ අදහස් දක්වති. එනම්:-

1 සුබාරංචිය අවසානයේ දී පේදුරුගේ තත්ත්වය කුමක් ද?
2. පේදුරු සහ ප්‍රේමවන්ත ගෝලයා අතර කිනම් සම්බන්ධතාවයක් තිබුණේ ද?

ඉහත කී ප්‍රශ්න දෙකට පිළිතුරු දෙන, මෙම උපග්‍රන්ථය ප්‍රධාන කොටස් තුනකට බෙදිය හැක.

1. - 21/1-14 ගලීලයේ ශ්‍රාවකයන් වෙත දර්ශනයවීම

2. - 21/15-23 පේදුරු ප්‍රේමවන්ත ගෝලයා සහ ජේසුස් වහන්සේ
3. - 21/24-25 (දෙවැනි අවසානය ලෙස විශාරදයන් හඳුන්වති)

1. මෙම කොටසින් ගලීල හා ජෙරුසලෙම් සම්ප්‍රදාය පිළිබඳව මිශ්‍රණයක් දැකිය හැක. වරක් මිනිසුන් අල්ලන්නන් හැටියට හැඳින්වූ ඔවුන්ට, මෙහිදී මසුන් කිසිවක් අල්ලන්නට නුපුලුවන් විය.
මාගෙන් වෙන්ව කිසිවක් කරන්නට ඔබට නොහැකිය. ( 15/5) එහෙත් උත්ථානවූ සමිඳාණන් හඳුනාගත් පසු මසුන් 153 ක් වැනි විශාල ප්‍රමාණයක් හසුකර ගැනීමට ඔවුන් වෙත පැවරුණු විශ්විය දූත කාර්යය සම්පූර්ණත්වයයට පත්වීමේ ප්‍රතිඵලය සංකේතවත් කරනු ලබයි. ඉන්පසු ඔවුන්ව ආහාරයකට කැඳවනු ලබයි. මෙය දිව්‍ය සත්ප්‍රසාදයට ලකුණකි. එමනිසා අපෝස්තලිත දූත සේවාවත් දිව්‍ය සත්ප්‍රසාදයත් අතර සබැඳියාවක් ඇති බව පෙන්වයි. දිව්‍ය සත්ප්‍රසාදය ස්වර්ගීය මංගල භෝජනය පෙර රසවිඳීමකි.

**2. 21/15-23**

මෙම කොටසින් පේදුරු සහ ජුවාම් අතර සම්බන්ධතාවයක් ඇති බව තහවුරු කරයි. සුබාරංචිය තුළ මෙතෙක් පේදුරු ගැන ඔහුගේ දුර්වලතා ගැන නොයෙක් වාර්තා කෙරුණත්, මෙහිදී ජුවාම් තම සංසයට පේදුරුගේ නායකත්වය හඳුන්වා දෙන්නේ ජේසුස් වහන්සේ විසින් ප්‍රශ්න කරන ලදුව පේදුරු විසින් සේවයට, සහාවට, උන්වහන්සේට ආදරේ යයි කියමින් අනුමත කරන ලද තුන් ප්‍රකාර පොරොන්දුව මගිනි. පළමුව පේදුරු උන්වහන්සේව තුන්වරක් ප්‍රතික්ෂේප කරනු ලබයි. එයට ප්‍රතිචාරයක් වශයෙන් මෙහිදි නැවත ආදරෙයි කියමින් තුන් වරක් ප්‍රතිඥා දෙන ලදි. මෙය ජේසුස් වහන්සේගේ බැටළු රැළ රැකීමට පේදුරු විසින් ක්‍රි.ව. සමග ඇති කර ගන්නා ලද කොන්ත්‍රාත්තුවක් බව පෙන්නුම් කෙරේ.
ජේසුස් වහන්සේගේ උත්ථානයෙන් සිද්ධියෙන් පසු පේදුරුගේ ජීවිතය තුළ පුනරුත්ථාපනයක් ඇතිවූ බව පෙනේ. එපමණක් නොව ස්වාමින් වහන්සේගේ බැටළු රැළ රැකගැනීමේ පූර්ණ අධිකාරිත්වය දක්වා ඔහුගේ තත්ත්වය ද උසස් කරනු ලැබූ බවක් පෙන්නුම් කරයි. (21/15-17) එමගින් නවක විශ්වාසිකයන්ගේ ඇදහිල්ල ශක්තිමත් කිරිමත්, සමස්ථ විශ්වාසිකයන්ගේ මාර්ගෝපදේශකයා වීමත්, සියලුම විශ්වාසිකයන් රැකබලා ගැනීමත් සඳහා වගකීම පවරන්නට යෙදුණි.

මෙම උසස් කරනු ලැබීමට පේදුරුට අයත් වන මරණය කවරාකාර එකක් වන්නේ ද යන්න ඉඟි කරයි. (21/18) එකල කුරුසියේ මරණයට කෙනෙකුව යටත් කරනු ලැබුවේ එම පුද්ගලයාව කුරුස ගස මත බැඳ තැබීම මගිනි. ඉඟටිය බැඳීම පිළිබඳව දුන් ඉඟිය මගින් පෙන්නුම් කළේද, පේදුරුට අනාගතයේ දී අත් දැකීමට සිදුවෙන්නාවූ ඉරණම ගැනය.

එවැනි සාක්ෂි දැරීමක් සඳහා පේදුරුගේ ජීවිතය ද යොමුවන බව හැඟවීමට මෙම අවස්ථාවේ දී ජේසුස් වහන්සේ මා අනුව එන්න යැයි ආරාධනයක් කරයි. (21/19) කලින් අවස්ථාවකදී මා යන තැනට ඔබට දැන් පැමිණිය නොහැකිය. (13/36) යනුවෙන් වදාළ ජේසුස් වහන්සේ, ප්‍රේමයෙන් ජීවත්වීමත්, ප්‍රේමය උදෙසා සාක්ෂි දැරීමක් තමා අනුගාමි වීමට සුදුසු කමක් ලෙසට මෙමගින් පැහැදිලි කර දක්වයි.

## දෙවැනි අවසානය (21/24-25)

මෙම දෙවැනි අවසානය තුළ 24 වන වගන්තියෙන් ගම්‍ය කෙරෙන්නේ (20/30) මගින් සඳහන් වුණාවූ සුබාරංචිය පරමාර්ථය හා සම්බන්ධවූ ජුවාම් කතෘත්වය සනාථ කිරිමකි.

21/25 මගින් පෙන්නුම් කරනුයේ සුබාරංචිය, ඒ ඒ කතුවරයා විසින් තම සංසයේ අවශ්‍යතාවය අනුව තම පරමාර්ථයන් ඉටු කරගැනීමට ඇසූ දුටු කථා පුවත් තෝරා බේරා සංස්කරණය කර ඇති බවයි.

## සුභාරංචියේ ප්‍රධාන ලක්ෂණ:

1. ජේසුස් වහන්සේ මෙසියස් බවට සාක්ෂියක් සමදර්ශක සුභාරංචිවල සඳහන් කරන්නේ උන්වහන්සේගේ බලවත් ක්‍රියා හා ගලීලයේ දූත සේවාව උච්ච අවස්ථාවට පැමිණි විටය.

❖ එහෙත් සිව්වන සුවිශේෂයේ ආරම්භයේ සිටම උන්වහන්සේ මෙසියස් බවට සාක්ෂි ඉදිරිපත් කෙරේ.
උදා: ස්නාවක ජුවාම්, සමරිතානු ස්ත්‍රීය

2. අන් සුවිශේෂකවරුන් තම සුභාරංචි දේව රජ්‍ය අරමුණු කොට ලියන ලදි.

❖ ජොහාන් තුමා තම සුභාරංචියට නව අරුතක් දෙමින් සදාතන ජීවිතය තෙක් යොමු කරයි.

3. ජේසුස් වහන්සේගේ ප්‍රධාන වූ ප්‍රබල ක්‍රියාවන්හි උච්ච සිද්ධීන් ලෙස අශුද්ධ ආත්මයන් දුරු කිරීම සමදර්ශක සුභාරංචිවල දක්වා තිබේ.

❖ ජොහාන් තුමා එවැනි ක්‍රියා කිසිවක් සඳහන් නොකරයි.

4. අනෙකුත් සුවිශේෂකවරු ජේසුස් වහන්සේගේ මෙහෙය ප්‍රධාන වශයෙන් ගලීලයේ දී සිදුකළ බවත් අවසානයේ දී තම පාස්කුව සිදු කරන්නට උන්වහන්සේ ජෙරුසලෙමට ගිය බවත් සඳහන් කරයි.

❖ ජොහාන් තුමා ජේසුස් වහන්සේගේ මෙහෙය ප්‍රධාන වශයෙන් ජෙරුසලෙම අවට සිදු වූ බව, පාස්කු මංගල්‍යයන් තුනක් සඳහන් කිරීමෙන් පැහැදිලි කරන්නට උත්සාහ කරයි. (2/13, 6/14, 3/55)

5. සමදර්ශක සුභාරංචිවල ඉගැන්වීමේ ක්‍රමවේදයක් ලෙස ජේසුස් වහන්සේ උපමා උපයෝගි කරගත් බව සඳහන් ය.

❖ එනමුත් ජොහාන් තුමා තම ඉගැන්වීම් ඉතා දීර්ඝ ධර්ම සාකච්ඡා මගින් කරන අතර බොහෝ අවස්ථාවලදී ''මම'' කියමන් පාදක කරගනිමින් සංවාදය දිගටම කරගෙන යයි.

6. සමදර්ශකවල අන්තිම රාත්‍රී භෝජනය පාස්කු මංගල දිනත්, කුරුස පත්වීම ඊට පසු දිනත් සිදුවූ බව සඳහන්ය.

❖ එනමුත් ජොහාන් තුමා ජේසුස් වහන්සේගේ කුරුස පත්වීම, පාස්කු මංගල දිනට පෙර දින වූ බව කියයි. (19/31)

7. සමදර්ශක සුභාරංචිවල ජේසුස් වහන්සේගේ උපත, බෞතීස්මය, පරීක්ෂාවන්, රූප විපර්යාසය, අන්තිම රාත්‍රී භෝජනය, සුභාරංචියේ පරමාර්ථය ඉටු කරගැනීමට උපයෝගී කරගෙන ඇත.

❖ ජොහාන් තුමා සෘජුවම එම සිද්ධීන් ඉදිරිපත් කර නැතත්, ඒවා ගැන දැන සිටි බවක් ඉඟි කරන්නේ ය.

8. ජොහාන් තුමා ලකුණු හෙවත් බලසම්පන්න ක්‍රියා සඳහන් කිරීමෙන් උත්සාහ කරන්නේ ජේසුස් වහන්සේගේ මහිමයත්, උන්වහන්සේ සැබෑ ක්‍රිස්තුවරයාණන් බව ජනතාවට පෙන්වීමටය.

9. ජොහාන්තුමාගේ සුභාරංචියට විශේෂිත වූ මම කියමන් 7 ක් ජේසුස් වහන්සේ යොදාගෙන ඇත්තේ "මම උන්වහන්සේමය" යන දිව්‍ය නාමය හා තමන් වහන්සේව හඳුන්වා දීමටය.

10. ශුද්ධාත්මයාණන් පිළිබඳ තේමාව, ජුවාම් සුවිශේෂයට විශේෂය. අනෙක් සුභාරංචිවල මේ ගැන සඳහන් වී නැත.

11. සමදර්ශක සුභාරංචි තුළ බලවත් ක්‍රියා සිදුකළ පසු, බොහෝ විට එය අනාවරණය නොකරන්නට එනම් මෙසියානික රහස පවත්වා ගෙන යන්නට ස්වාමින් වහන්සේ ආරාධනා කරයි.

ජොහාන් සුභාරංචියේ ආරම්භයේ සිටම, ජේසුස් වහන්සේ තමන් වහන්සේගේ අනන්‍යතාවය ප්‍රකාශ කරයි.

## ''මම'' කියමන්

ජොහාන් තුමාට විශේෂවූ මෙම 'මම' කියමන් මූලික ලෙසට මම වනාහි යන පැරණි ගිවිසුමේ දෙවියන් වහන්සේ හා සම්බන්ධ වාග් මාලාවට ඉතාමත් කිට්ටු වේ. නික්මයාම 3/14 හි සඳහන් 'මම වනාහි ස්වයම්භූ තැනැන්වහන්සේ 'ය යන වදන එදා සෙමිත පසුබිමෙහි දක්වූවාවූ කෙනෙකුගේ චරිත විග්‍රහය මෙහිදී ද ජුවාම් තුමා ඉදිරියටම ගෙන එයි. මේ සඳහා ජුවාම් තුමා

1. 6/35 - '' ජීවනදායක භෝජනය මම වෙමි ''
2. 8/12 - '' ලෝකයේ ආලෝකය මම වෙමි ''
3. 10/7-9 - '' බැටලුවන්ට දොරටුව මම ය ''
4. 10/11 - '' මම යහපත් එඬේරා වෙමි ''
5. 8/12 - '' පුනරුජ්ජීවනය ද ජීවනය ද මම වෙමි ''
6. 14/6 - '' මාර්ගය ද, සත්‍යය ද, ජීවනය ද මම වෙමි''
7. 15/1 - '' සැබෑ මිදි වැල මම ය ''

මෙම වගන්ති තුළින් පෙන්නුම් කෙරෙන්නේ ජේසුස් වහන්සේගේ අනාවරණය තුළ එතුමාණන්ට පූර්ණ පෞරුෂයකුත් අධිකාරිත්වයකුත් තිබුණ බවය.

## ජොහාන් සුවිශේෂයේ සංකේතාත්මක යෙදීම්:

හතරවන සුවිශේෂයේ සංකේත භාවිතාය අපට පැහැදිලිවම දැකිය හැකිය. ජීවන ජලය, අන්ධ මිනිසා, යහපත් එඬේරා ආදි සංකල්ප උදාහරණ කිහිපයකි. මේවායේ සැබෑ අර්ථය තේරුම් ගැනීමට පුරාණ ගිවිසුමේ සහ හෙලනිස්ත ලෝකයේ පසුබිම, අපට වැදගත් වේ. 4 වන සුවිශේෂයේහි ඇති සංකේතාත්මක යෙදීම් සමදර්ශක සුවිශේෂවල ඇත්තාවූ උපමා රූපි යෙදුම් හා සමානතාවයක් දරයි.

## ජුවාම් සුභාරංචියේ ද්විත්ව අර්ථ:

හතරවන සුවිශේෂයේහි ඇති භාෂා ශෛලීන්ගෙන් කැපී පෙනෙන එකක් ලෙස ද්විත්වාර්ථය දැකිය හැක. යෙදෙන්නාවූ ප්‍රකාශයෙහි මතු පිටින් ඇති අර්ථය වරදවා තේරුම් ගන්නා බවක් පෙන්නුම් කරන අතර ජේසුස් වහන්සේ එය නිවැරදි කරමින් සත්‍ය ධර්මය උගන්වන සැටි මේ යෙදුමෙන් පෙනේ.

2/19-20 දේව මාලිගය → ජෙරුසලෙම් දේව මාලිගය
→ ක්‍රිස්තුන් වහන්සේ

3/4 - 5 නැවත ඉපදීම → මාංශිකව උපත
→ ආත්මයාණන්ගෙන් උපත

4/9-15 ජීවන ජලය → ස්වභාවික ජලය
→ ආත්මයාණන්ගේ ජලය

## 1.2.1.3 ජොහාන් සුවිශේෂයේ ප්‍රධාන ඉගැන්වීම්

## 1.2.1.3.1 ධර්මයාණෝ

තම පරමාර්ථය ඉටුකර ගැනිමට සමදර්ශක සුවිශේෂකවරු ජේසුස් වහන්සේගේ පැවැත්ම පුරාණ ගිවිසුම හා සම්බන්ධකර උන්වහන්සේගේ පැවැත්ම තිබූ බව කියයි. එනම් මිනිසා හා ලෝකය මවන්නට පෙර තිබූ දේව පැවැත්ම ගැන කථා කරයි.

## ධර්මයාණන් පිළිබඳ කවිය

i දෙවිඳුන් වෙතින් පොළවටත්
ii පොළොවෙන් නැවත දෙවිඳුන් වෙතට ගමනක් විස්තර කරයි.

- ❖ දෙවිඳු වෙතින් - ආරම්භයේදී ධර්මයාණෝ සිටිසේක. උන්වහන්සේ දෙවිඳුන් සමඟ සිටිසේක.
- ❖ පොළොවට - ධර්මයාණෝ මිනිස් බව ගෙන අප අතර වැඩ විසුසේක.
- ❖ නැවත දෙවිඳු වෙතට - කිසිවෙක් කිසි කළෙක දෙවියන් දුටුවේ නැත. පියාණන්ගේ දකුණු පසෙහි වැඩ හිඳින දේව පුත්‍රයාණෝ අපට උන්වහන්සේ අනාවරණය කළ සේක.

ජීවමාන වචනය වන (ලෝගොස්) සංකල්පය වශයෙන් හඳුන්වා දෙන ධර්මයාණන් පිළිබඳ ඉගැන්වීම 1/1-5, 1/9-14, 1/16-18 වගන්ති මගින් පියගැට පෙළක් මෙන් ආරෝහණ ක්‍රමයට එහෙත් සමාන්තර බවක් පිළිඹිබු කරමින් උච්ච අවස්ථාවට ගොඩනැගෙන්නක් ලෙස සඳහන් කර ඇත.

අන්ධකාරය කිසිවක් ග්‍රහණය නොකරයි
ආලෝකය අන්ධකාරයෙහි බබලයි.
ඒ ජීවය මනුෂ්‍යයන්ගේ ආලෝකය විය.
මවන ලද සියල්ල උන්වහන්සේගේ ජීවයෙන්ම විය.
උන්වහන්සේ විසින් සියල්ල මවන ලදි.
අනාදියේදී දෙවියන් වහන්සේ සමග සිටිසේක.
ධර්මයාණෝ දෙවියන්වම සිටිසේක.
ධර්මයාණෝ දෙවියන් සමග සිටිසේක.
අනාදියේදි ධර්මයාණෝ සිටිසේක.

### අනාදියේදී

උත්පත්ති 1/1 හි සඳහන් ආරම්භයේ දී යන වචනය මෙහිදි භාවිතාකරයි. එනම් මැවිල්ල ජීවමාන කරන්නට භාවිතාවූ ක්‍රියාකාරි වචනය (ආලෝකය වේවා) යන්න තිබූ බව දක්වමින් මැවිල්ලට පෙර පැවැති සදාතන වර්තමානය මෙමගින් අදහස් කරයි.

### ධර්මයාණෝ සිටිසේක.

මෙහිදි සිටිසේක යනුවෙන් සඳහන් කිරීමෙන් මැවුම්කරු විසින් මවනලද කෙනෙකු ලෙස නොව මැවුම්කරු සමග පැවැත්ම බෙදාගත් සම්බන්ධතාවයක් පැවැති කෙනෙකු ලෙස දක්වයි. දේව පියා

අනාදියේ සිට මිනිසාට කථා කරයි. තම ස්වභාවය ප්‍රකාශ කරයි. දේව පියාගේ පූර්ණ අනාවරණය දේව පුත්‍රයාණෝ ය. එමනිසා ධර්මයාණෝ දෙවිඳුන්ගේ ප්‍රකාශිත වචනය වනසේක.

### 1/1 ධර්මයාණෝ දෙවියන් වහන්සේ සමග සිටිසේක.

මෙහිදි දෙවියන් වහන්සේ සමග සමාන ස්වභාවයෙන් සිටි බවේ අදහස ගෙන දෙයි.

### ධර්මයාණෝ දෙවියන් වහන්සේවම සිටිසේක.

පිත් පුත් දෙදෙනා එකම දෙවිඳාණන් වන බවත් එකම දේව ස්වභාවය දරණ බවත් වහන්සේලා දෙදෙනෙක් වුවත් එකම දෙවියන් වහන්සේ බවත් කියයි.

### 1/2 අනාදියේ දි උන්වහන්සේ දෙවියන් වහන්සේ සමග සිටිසේක.

දෙවියන් වහන්සේත් පුත්‍රයාණන් වහන්සේත් අතර අනන්‍යතාවය වෙනස් ය. ''සමග'' යන්නෙන් පිය පුත් එකමුතුව සඳහන් කරමින් පෙන්වන්නේ, ඔවුන් දෙදෙනෙක් වන බවය.

### 1/3 සියල්ල උන්වහන්සේ විසින් මවන ලදී. මවන ලද කිසිවක් උන්වහන්සේ නොමැතිව නොමවන ලදී.

මෙහිදී මැවීමේ ක්‍රියාවලිය පණ ගැන්වීමට හේතුකාරකය වූයේ, දෙවිඳුන්ගේ එල දරණ වචනයම (Logos) බව පෙන්නුම් කරයි. එය උත්පත්ති 1/1 ට සම්බන්ධය ජුදා පසුබිම තුළ ධර්මයාණන් ලෙස හැඳින්වූයේ මිනිස් වෙස්ගත් දිව්‍ය ප්‍රඥාවට ය.

### 1/4 මවන ලද සියල්ල උන්වහන්සේගේ පීවයෙන්ම විය. ඒ ජීවය මනුෂ්‍යයන්ගේ ආලෝකය විය.

මෙම වගන්තියේ ප්‍රධාන වචන (Key words) ලෙස දක්විය හැක්කේ ජීවනය හා ආලෝකයයි. ජොහාන් තුමාට විශේෂවූ මෙම තේමාවන් දෙක උත්පත්ති පොතේ මැවිමේ කාර්යාවලිය හා සම්බන්ධය.

### 1/5 ආලෝකය අන්ධකාරයෙහි බබලයි. අන්ධකාරය කිසි කළෙක එය ග්‍රහණය නොකළේය

මෙය උත්පත්ති 3/1-15 කොටස හා සම්බන්ධය අන්ධකාරය හෙවත් පාපය නැමැති යක්ෂයා ආලෝකය හෙවත් දේව ජීවනය ග්‍රහණය කර ගන්නට උත්සාහ කළත් අවසානයේ දි අඳුර ජය ගැනීමට සර්පයාගේ හිස පොඩි කර දැමීමට ස්ත්‍රියගේ වංශය සමත් වෙයි. (උත්. 3/15) එනම් ජීවනයත් ආලෝකයත් වූ ධර්මයාණන් මගින් ජය ලබයි. මෙය මාංශගතවූ ''**වචනය**'' තුමන් මගින් පූර්ණව ඉටු කෙරුණු මානව ගැලවීමේ ඓතිහාසික ක්‍රියාවයි. ජොහන් සුවිශේෂයෙහි අන්ධකාරය සංකේතවත් කෙරෙන්නේ දෙවියන් වහන්සේ වෙතින් ඈත්වීමයි. එහෙත් ධර්මයාණන් තුළින් ගලා එන ආලෝක ධාරාව ඉදිරියෙහි අන්ධකාරයේ බලය සදහටම බෙලහීන වන බව ග්‍රහණය නොකළේය'' යන වචනය යොදමින් සනාථ කරන්නේ ය.

### 1/9-14- මෙම කොටසින් ජේසුස් වහන්සේ ආලෝකය බව සනාථ කෙරේ.

ජේසුස් වහන්සේ සැබෑ ආලෝකය ය. මෙය සංකේතාත්මක බාහිර ආලෝකයක් නොව අභ්‍යන්තරික අවිද්‍යාවෙන් මිනිසා මුදා ගන්නා සැබෑ ආලෝකයාණෝ ය. උන්වහන්සේ ලෝකයෙහි සිටි සේක. ලෝකය ඇතිවූයේ ද උන්වහන්සේ කරණකොට ගෙන ය.

සිව්වන සුබාරංචිය තුළ ලෝකය යන වචනය 78 වරක් සඳහන් ය. සමදර්ශකවල සඳහන් වන්නේ 14 වරකි. මෙහිදි ලෝකය යනුවෙන් මුළු මැවිල්ලම යන්න අවධාරණය කරයි. ලෝකාරම්භයේ දී වචනය වූ ධර්මයාණන් මගින් ලෝකය ඇතිවිය. මැවිල්ල උන්වහන්සේ තුළ ජිවමාන විය.

එහෙත් ලෝකයා උන්වහන්සේ හැඳින නොගත්හ.
ජේසුස් වහන්සේ පැමිණීමට පෙර ලෝකය අන්ධකාරව තිබුණි. ලෝකය අන්ධකාරය තුළ නැති නොවන පිණිස දෙවියන් වහන්සේ තම පුත්‍රයා වන ධර්මයාණන් ලොවට එවා වදාළ සේක. එනමුත්

අන්ධකාරයට රුචිවූ හැම, තම හදවත් දැඩි කරගෙන අයහපත වෙත යොමුවූවා මිස ආලෝකය හඳුනා ගන්නට ග්‍රහණය කරගන්නට අකමැති විය. මේ අදහස තුළ 4 වන සුබාරංචි කතුවරයා ලෝකයාට ආරෝපණය කරන්නේ සෘණාත්මක වටිනාකමකි. එනම් අයහපතට නැඹුරුවූ ජීවිත රටාවකි.

### 12/13 උන්වහන්සේ පිළිගත් සියල්ලන්ට ......... දේව දරුවන් ලෙස

අන්ධකාරයෙන් අවිද්‍යාවෙන් මිදී විශ්වාසයේ ආලෝකය ලත්, එයින් සපිරි සැමට එනම් සත්‍ය වූ ආලෝකයාණන් පිළිගත් සැමට ලැබුණාවූ ත්‍යාගය වූයේ දේව දරුවන් ලෙස උපත ලැබීමේ වරමයි. එම වරම ආබ්‍රහම්ගේ පරපුරට අයත් වූ පමණින් නොලැබිණි. ඒ සඳහා දේව වචනය පිළිගැනීම හා අදහා ගැනීම අවශ්‍ය විය.

### එසේ උපත ලැබුයේ මානව සංහතියෙන් වත් ......දෙවියන් වහන්සේගෙන් ම ය.

විශ්වාසය හා ඇදහිල්ලේ ජීවිතය මිනිසා විසින් මිනිසා සඳහා ප්‍රදානය කර ගත හැකි දෙයක් නොව, දේව අනාවරණය ලබා ගැනීමේ මාර්ගයක් ලෙස ද, දේව දරුවන් බවට පත්වීම සඳහා දෙවිඳුන් වෙතින් ලැබෙන දේව දීමනාවක් බව ද අවබෝධ කර දෙන්නේ ය.

### 1/14 ධර්මයාණෝ මිනිසත් බව රැගෙන අප අතර වැඩ විසූ සේක.

මෙය ලෝගෝස් ගීතයේ, පූර්විකාවේ උච්චතම අවස්ථාවයි. 1වන හා 2වන පදයේ සඳහන් වූ පසු නැවත මෙහිදී සඳහන් කරයි. මෙම ධර්මයාණන් අන් කවරෙකුවත් නොව දේව වරප්‍රසාදය හා සත්‍යය වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ බව (1/17) ජොහාන් පෙන්නුම් කරන්නේ එකල පැවැති නොස්ටික් හා හෙලනිස්ත වාදී ඉගැන්වීම් වලට පටහැනිවූ දේව වචනය මිනිසත් බව ගත්තා ය යන සත්‍යතාව අවධාරණය කෙරුමට ය.

### 'Logos ' හෙවත් ධර්මයාණන් පිළිබඳ සංකල්පය ජුවාම් තුමා ඉදිරිපත් කරන්නේ ඇයි?

එකල හෙලනිස්ත පරිසරය තුළ ජීවත්වූ ජනතාවගේ හෙබ්‍රෙව් මනස හා බලාපොරොත්තුව අරමුණු කොට, එකල මිත්‍යා ආගම් වල මැවීම පිළිබඳව තිබූ බලය හා කාරකය සම්බන්ධ කර, කතුවරයා ගැඹුරු අදහසක් දෙන්නට උත්සාහ කරයි. ඒ නිසා උත්පත්ති පොතෙහි සඳහන් මැවීම පිළිබඳව ක්‍රියාකාරිවූ හා අනාවරණය වූ දෙවියන් වහන්සේගේ උත්තරීතර වචනයේ බලය මෙම මාංශගතවූ තැනැන්වහන්සේම මිස වෙන කවරෙකු නොවන බව ග්‍රීක යුදෙව්වරුනට අවබෝධ කර දී, ඔවුන්ගේ විශ්වාසය වර්ධනය කිරිමට උත්සාහ දරමින්, ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේ බවත්, දෙවියන් වහන්සේ සමග සිටි, දෙවියන් වහන්සේ සමග සිටින තැනැත්තාණනන් බවත් පැහැදිලි කර දෙයි. ''ලෝගොස්'' හෙවත් ධර්මයාණන් යන වචනය මගින් ස්ටොයික් වාදීනට හැඟීගොස් තිබුණේ එය. සකල විශ්වයේ නිර්මාණය හා පිළිවෙලට හේතුවූ බුද්ධිමය බලවේගයක් වශයෙනි. ග්‍රීක් යුදෙව්වරුන් වන ඔවුනට එය විශ්වයේ මැවීමට හේතුවූ ප්‍රබල දේව වචනය හෙවත් මිනිස් වෙස් ගත් දේව ප්‍රඥාව විය.

## 1.2.1.3.2 ජීවනදායක භෝජනය

ජීවනදායක පුපය යනු ක්‍රිස්තුන් වහන්සේගේ සත්ප්‍රසාදික ඉගැන්වීම් පිළිබඳව පාඨකයාට හඳුන්වා දෙන සිව්වන සුවිශේෂයේ තේමාවයි. මේ සඳහා ජුවාම් තුමා 6 වන පරිච්ඡේදයම කැප කර ඇත. ජන සමාජය තුළ තිබූ දිව්‍ය සත්ප්‍රසාදීය පිළිවෙත ගැන අදහසක් ලබා ගත හැක. දිව්‍ය සත්ප්‍රසාදය ග්‍රීක් වදනක් අනුව **එව්කරිස්ටෙයින්** වේ. මෙහි අදහස

- තුති පිදීම
- මහිමය ප්‍රකාශ කිරීම
- ආශිර්වාද කිරිම වේ.

එදා මුල් කිතුනු සභාවල සාමුහික පැවැත්මේ හා බෙදා ගැනීමේ කේන්ද්‍රස්ථානය වූයේ සත්ප්‍රසාදීය සැමරුමයි. (ක්‍රියා 2/42) ජොහාන් කතුවරයා 6 වන පරිච්ඡේදය තුළින් අවධාරණය කරන්නේ මේ හා සම්බන්ධවූ අනෙක් පැත්තයි. එනම් සාමුහික පැවැත්මේ වැදගත් අරමුණු සුරකින අතර, එක් එක් සාමාජිකයා ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සමග සම්බන්ධතා ගැඹුරුව පැවැත්විය යුතු බවයි.

**6 වන පරිච්ඡේදය කොටස් තුනකින් සමන්විත වේ.**

- පූප වැඩි කිරීම - 6/1-15
- මුහුද මත ඇවිදීම - 6/16-21
- ජීවනදායක පූපය පිළිබඳව දේශනය 6/35 - 50, 51 - 58

**A** 6 වන පරිච්ඡේදය සැකැස්ම ගොඩනැගී ඇත්තේ උන්වහන්සේගේ ගලිල දූතික සේවාවට අනුකූලවයි. මෙම ප්‍රාතිහාර්යයට පසුබිම වශයෙන් ජුදෙව්වරුන්ගේ ප්‍රධාන උත්සවයවූ පාස්කුව සැලකිය හැක. ජුවාම් 6/4 මෙය ජේසුස් වහන්සේගේ නව පාස්කුව ජනිත කරවන පෙර නිමිත්තක් ලෙස ද, ජීවනදායක පූපය ගැන පසුව කරන දීර්ඝ දේශනයට පිවිසීමක් ලෙස ද දක්වෙයි.

ලූක් 22/19 සඳහන් අවසන් භෝජනයේ ක්‍රියාවම ජේසුස් වහන්සේ මෙම පූප වැඩි කිරීම තුළින් ද, ඉටු කරයි. එනම්:-

පූප රැගෙන - තුති පුදා - බෙදා දුන් බව මෙහි දී ද සඳහන් වෙයි.

මෝසස් ප්‍රමුඛ දේව ජනතාව පාළුකරයේ දී මන්නා වැළඳූ බව6/31 පවසන ජුවාම් තුමා, ජේසුස් වහන්සේගේ, ජීවනය දෙන ආහාරය ගැන ඇසූ ජනතාව, මේ පූප අපට සැමදා දෙන්න යයි ඉල්ලන බව පවසයි. 6/34 මෙය පුරාණ ගිවිසුමේ විමුක්ති ගමනට, නව විමුක්තියක්, ශක්තියක් වන බව හඟවයි. මෙය පාදක කරගෙන එම නව විමුක්තියේ ශක්තිය එනම් ජීවනදායක පූපය ජේසුස් වහන්සේම බව මෙම යෙදුම තුළින් ඉස්මතු කරයි. එසේ ඉස්මතු කරන්නට ඔවුනට ව්‍යාංගයෙන් ස්වාමින් වහන්සේ "නැතිවී යන ආහාරය සඳහා නොව, සදාතන ජීවිතයට ඉවහල් වන ආහාරය සඳහා වීර්ය වඩන්න, මේ ආහාරය ඔබට දෙන්නේ මනුෂ්‍ය පුත්‍රයාණෝ යයි වදාරමින්, තමා සදාතන ජීවනයේ මුද්‍රාව බවත්, තමන් වහන්සේව අදහා ගැනීම පියාණන් වහන්සේගේ කැමැත්ත බවත් ප්‍රකාශ කළසේක යනුවෙන් සඳහන් කරයි.

## B මුහුද මත ඇවිදීම 6/16-21

මෙම ප්‍රාතිහාර්යයත් සත්ප්‍රසාදික තේමාවට අනුකූල ය. පූප වැඩී කිරීමේ ප්‍රාතිහාර්යයෙන් පසු ඔවුන් තුළ ඇතිවූ ආකල්ප සෘණාත්මකමක ය. ප්‍රතිචාරය වැරදිය ඒ නිසා අපට කැම දෙන තැනැත්තාව අපි රජකමට පත් කරගන්නෙමු යන බලහත්කාර අදහසක් ඉදිරිපත් කරන්නට සැරසුණහ. පළමු සළකුණ තේරුම් නොගත් නිසා උන්වහන්සේ තවත් සළකුණක් මෙහිදි ඉදිරිපත් කරයි. එය වනාහි මුහුද මත ඇවිදීමයි. 6/16-21 මෙහිදි උන්වහන්සේ තමා කව්දැයි තම ශ්‍රාවකයන්ට හඳුන්වා දෙයි. ***ඒ මම වෙමි*** 6/20 බැලූ බැල්මට මෙම කොටස අසම්බන්ධිත කොටසක් ලෙස පෙණුනත් මෙය සත්ප්‍රසාදික ඉගැන්වීම් සම්බන්ධිත වන පුරුකක්සේ හැඳින්විය හැක.

ගිනිපඳුර තුළින් තම දිව්‍යමය එළිදරව්ව මෝසස්ට දුන් දෙවි සමිඳාණෝ මෝසස් ඇසූ පැණයට තමන් වහන්සේව හඳුන්වා දුන්නේ මම වනාහි ස්වයම්භූ තැනැන්වහන්සේ වෙමි යන අර්ථය ගෙන දෙන ***මම වනාහි මම*** යි ප්‍රකාශ කරමිනි. (නික්මයාම 3/14) ඒ මගින් එදා දෙවිඳාණෝ තමන් මහිමවත් සර්වබලධාරි තැනැන් වහන්සේ බව අවධාරණය කරන ලදි. තවද එවන් සර්වබලධාරි කෙනෙකු සැටියට ජේසුස් වහන්සේම මුහුද මත ඇවිදීම මගින් පිළිබිඹු කෙරිණි. එමගින් උන්වහන්සේගේ බලයත් අධිකාරිත්වයත් ප්‍රකාශ විණ.

එය ඉහත දක්වූ අන්දමට පූප වැඩි කිරීම සම්බන්ධව ඔවුන් තුළ තිබූ පටු ආකල්පය තුරන් කිරීමට ප්‍රබල සාක්ෂියක් විය. එනම් (ජොහන් 6/14/15) සඳහන් ***මොහු දිවැසිවරයාණන්ගෙන් කෙනෙක් ය. රජකමට සුදුස්සකු වන්නේ ය*** යනුවෙන් ඔවුන් අදහස් කළ මෙලොව රජ කෙනෙකු වෙතින් ලබා ගත හැකි වාසි විශේෂයෙන්ම කෑමබීම නොමිලයේ ලබා ගැනීම වැනි අදහස් මෙමගින් බිඳ හෙලනු ලැබිණ. එමනිසා මෙතෙක් මනුෂ්‍ය රජෙකු ලෙස සිතා සිටි ඔවුන්ගේ අදහස ස්වභාව ධර්මය පාලනය කරන්නට හැකි පූර්ණ අධිකාරිත්වයක් ඇති දේව පුත්‍රයා වෙත කේන්ද්‍ර කෙරිණ.

මෙම සිද්ධිය තුළින් පුරාණ ගිවිසුමේ තිබූ යාවේ හා සබැඳි ජලය මත බලපෑමේ අධිකාරිත්වය මෙම කොටසින් ඉදිරියට ගෙන එන්නට ද ජුවාම් තුමා උත්සාහ කරයි.

උදා: - උත්පත්ති 1: 2, 6
- නික්මයාම 15/ 8-19
- ගීතාවලිය 77/17-20

ඉහත කී ආභාෂය තුළ ජේසුස් වහන්සේ ද නව මැවිල්ලේ ස්වාමියා ලෙස හා සියලුම බලතාවයන් අභිබවා යන්නෙක් ලෙස ජුවාම් තුමා පෙන්නුම් කරයි.

මෙම සිද්ධිය තුළින් තවත් පැරණි ගිවිසුමේ මතකයන් දේව ධාර්මිකව ඉදිරිපත් කරන ජුවාම්තුමා එදා රතු මුහුදෙන් එතරවීම සඳහා දේව ජනතාවට දෙවියන් වහන්සේ වෙතින් ලැබුන මන්නා භෝජනය නිසා දෙවියන් වහන්සේගේ ගැලවිමදායක ක්‍රියාකාරිත්වය අත්දැකීමට හැකිවුවාසේ නව ගිවිසුමේ ජනතාව ද තම වන්දනා ගමන සඳහා අවශ්‍ය ශක්තිය හා පෝෂණය සඳහා ජේසුස් වහන්සේගේ ජීවනදායක භෝජනය මගින් ශක්තිය ලබන්නේ, දෙවියන් වහන්සේගේ ගැලවීමදායක ක්‍රියාකාරිත්වයට, නව පාස්කුවට, ජීවිත එතෙරවීමකට ය.

**පුරාණ ගිවිසුමේ**

මෝසස් ⟶ රතු මුහුදින් එතරවීම ⟶ මන්නා ⟶ පොරොන්දු දේශය

**නව ගිවිසුමේ**

නව මෝසස් ⟶ පාස්කුව තුළින් එතරවීම ⟶ ජීවනදායක භෝජනය ⟶ දේව රාජ්‍යය
(ජේසුස් වහන්සේ) (ඒ මම ය) (දිව්‍ය සත්ප්‍රසාදය)

## C ජීවනදායක භෝජනය පිළිබඳ දේශනය 6/35- 50. 51-58

ජීවනදායක පුපය පිළිබඳව ඉගැන්වීම කරන්නට පෙර ස්වාමින් වහන්සේ තවත් පැහැදිලි කිරිමක් කරයි. එනම් ***නැතිවී යන ආහාරය පිළිබඳව පමණක් වැඩ නොකරන්න*** යන පණිවුඩය මතුකර දැක්වීමයි. ගෝලයන් සමග සිටියදි සියල්ල පොදුවේ තබා ගත් ජේසුස් වහන්සේ ඉන් කොටසක් දුගින්ට දීමේ චාරිත්‍රයක් පැවැත්වූ සේක. උදා: 12/6, 13/29 අනුව ජෙරුසලෙම්හි මුල් කිතුනු සංඝය ද, සියල්ල පොදුවේ තබා ගත්හ. ක්‍රියා 2/42, ක්‍රියා 4/32

කල්යාමේ දී ජොහාන් තුමා ද තම සංඝයට එවැනිවු බෙදාහදා ගැනීමේ ජීවිතයක් අවධාරණය කරන්නට මෙම කොටස උපයෝගි කරගනී. මුල් කිතුනු සංඝයේ සහෝදරත්වය නිසාම බොහෝ දෙනෙකුගේ සිත් හැරී ජේසුස් වහන්සේව අදහා ගත්හ. එහෙත් තවත් බොහෝ දෙනෙක් වාසි තකා සභාවට ඇතුල්වූහ. මෙය වැරදි බව ජේසුතුමා ද පෙන්වා දුන්සේක.

ලෝකානුබද්ධ රාජ්‍යයක් සඳහා මිනිසා පතන සියලු සැප පහසුකම් දුරලා මිස කිතුනු සාංඝිකත්වය අත්දැකිය නොහැකි බවත් තමා ඒ සඳහා නොවන බවත්, ක්‍රිස්තුන් වහන්සේ අවධාරණය කරයි. ජේසු පසුපස යන අපගේ පරමාර්ථය විය යුත්තේ ආර්ථිකය හා ජන ජීවිතය සමෘධිමත් කිරීම නොව දෙව්පියා සමග එක්වීම ය.

ඒ නිසාය දෙවියන් වහන්සේගේ අභිප්‍රාය අනුව වැඩ කරන පිණිස තමන් විසින් කුමක් කළ යුතුදැයි ඇසූ ප්‍රශ්නයට දෙවියන් වහන්සේ එවා වදාළ තැනැත්තාණන් හෙවත් ධර්මයාණන් ඔවුන් විසින් අදහා ගතයුතු යයි ජේසුස් වහන්සේ පැවසුයේ. මෙහිදී උන්වහන්සේ සාමාජීය වෙනසකට පදනම වශයෙන් පෙන්නුම් කරන්නේ සුපුවත අදහාගෙන ඒ තුළ ලබන ජීවය ජීවත් කිරීම ය. එය මනුෂ්‍ය රාජ්‍යයක් සඳහා නොව දේව රාජ්‍යය තැනිමට හා ව්‍යාප්ත කිරීම සඳහා ය. එමගින් දෙව් මිනිස් සබඳතාවය වැඩි වර්ධනය වන්නේ ය.

**ජීවනදායක භෝජනය පිළිබඳ ඉගැන්වීම් 6/35-51**

ජුදා ජනතාව, පාස්කු මංගල්‍ය මගින් මිසරයේ නික්ම යෑම සැමරූහ. එම නික්මයා මේ පාස්කුව තමන් වහන්සේගේ පාස්කුව හා සමග සම්බන්ධ කළ ජේසු සමිඳාණෝ තම පාස්කුව තුළින් ඔවුන් ශක්තිමත් කරන ජීවනදායක භෝජනය තිබෙන බව පෙන්වීමට මෙම අවස්ථාව උපයෝගී කරගනී. 33 වන වගන්තියෙහි සඳහන් පරිදි ක්‍රිස්තුන් වහන්සේ මෙහිදි හඳුන්වා දෙන්නේ ලෝකයට ජීවනය දානය කිරීම පිණිස ස්වර්ගයේ සිට පැමිණෙන දෙවියන් වහන්සේගේ පූපය ගැනය.

එමනිසා එම ආහාරය ශාරීරික තෘප්තියක් සඳහා හෝ ශක්තිය වෙනුවෙන් ඇති ආධ්‍යාත්මික දේව අනාවරණයක් හෝ පණිවුඩයක් නොව, දෙවියන් වහන්සේගේම පූර්ණ අනාවරණය හා ජීවනයම බව ද, එය සදාකාලික බව ද, 35 වන වගන්තියෙන් අවධාරණය කරමින් දක්වයි. එවැනි සදාකාලික ජීවනයක් ලබන්නට අප තුළ විශ්වාසයේ බීජය රෝපණය විය යුතු බව පෙන්නුම් කරන ජුවාම් තුමා එමගින් අපේ පිපාසාව සංසිඳෙන බව ද, පැහැදිලි කරයි.

ජේසුස් වහන්සේ තමන් තුළ ජීවනය දෙන්නේ උන්වහන්සේව අදහා පිළිගන්නා අයට ය. මෙය තමන් වහන්සේගේ මාංශගතවීමේ පරමාර්ථය බව පෙන්වන ජේසුස් වහන්සේ 38 වන වගන්තිය මගින් පියාණන් වහන්සේගේ කැමැත්ත සියල්ලන්ම උත්ථාන කරනු ලබන බව අවධාරණය කරයි. මරණයක් නොමැතිව උත්ථානයක් ඇතිවිය නොහැක. ඒ නිසා තමන් වහන්සේගේ මරණය හා උත්ථානය අත්දකින පාස්කුව සැබවින්ම ජීවනය ලැබීමේ මාර්ගය බව පෙන්නුම් කරයි. මෙම සමිඳු මරණය හා උත්ථානය පාස්කු අභිරහසකි. එලෙසම දිව්‍ය සත්ප්‍රසාදය ද සදාතන ජීවනය ගෙනෙන අභිරහසක් වන බව ජුවාම්තුමා ව්‍යාංගයෙන් පෙන්නුම් කරයි.

දිව්‍ය සත්ප්‍රසාදය තුළ ඇති මේ මහගු තිළිණය පිළිගැනිමට ඇදහිල්ල අවශ්‍ය වේ. එවැනි ඇදහිල්ලක් ඇති තැනැත්තා මෙලොවෙහි සදාතන ජීවිතය අත් කර ගන්නේ ය. අවසානයේ දී උත්ථානය ද සදාතන ජීවිතය ද පිරිපුන් බවට පත්වේ එමනිසා දිව්‍ය සත්ප්‍රසාදය අනුභව කරන සෑම කෙනෙකුම මූලිකවම ජේසු සමිඳුන්ගේ වැඩසිටීම පිළිගත යුතුය. දෙවනුව උන්වහන්සේගේ කැඩුණු බිඳුණු සිරුරට සම්පූර්ණයෙන් ම තමාව කැප කරනු ලැබීම තුළ සාමය උදා කරගත යුතුය.

**ජීවනදායක භෝජනය පිළිබඳ 11 ඉගැන්වීම් 6/51 - 58**

මෙම වගන්ති කොටස තුළ දිව්‍ය සත්ප්‍රසාදීය, අන්තර්ගතය පැහැදිළිවම දැකිය හැක.

අනුභව කරන්න → ← පානය කරන්න
මාංශය → ← රුධිරය
↓
සදාතන ජීවනය
(ස්වර්ගයෙන් පහලවූ ජීවනදායක ආහාරය)

මෙම වචන දිව්‍ය සත්ප්‍රසාදීය අර්ථය තවත් තීව්‍ර කරයි. සමදර්ශක සුබාරංචිවල මෙන් නොව, සිව්වැනි සුවිශේෂයේ දිව්‍ය සත්ප්‍රසාදයේ ස්ථාපිත වැකිය ලෙස සඳහන් කෙරෙන්නේ 6/51 වගන්තියයි. ස්වර්ගයෙන් පහළ වන ජීවනදායක භෝජනය මම ය. (51 බී) මා විසින් දෙනු ලබන... සමිඳුන්ගේ මරණය මින් අදහස් කෙරේ. එම මරණයෙන් මිනිසාට සදාතන ජීවනය ලැබේ. මෙම සත්ප්‍රසාදීය පිළිවෙත ජුවාම් තුමා ඉදිරිපත් කරන්නේ යාගික පසුබිමක් තුළ ය. - දුක්විඳීම - මරණය - උත්ථානය සංකේතවත් කරන උන්වහන්සේගේ ජීවිතයේ හරය වූ - පරිත්‍යාගය හා බෙදා ගැනීම පිළිබිඹු කළ සැමටම ජීවනය ලබා දුන් දිව්‍ය සත්ප්‍රසාදය සැබවින්ම ස්වර්ගීය ආහාරයකි. මෙම දිව්‍ය භෝජනයට සහභාගිවීමෙන් සමිඳුන් හා සහභාගිවන්නා අතර, සුහද බන්ධනයක් ඇතිවේ. එය ශාරීරික සබඳතාවයක් පමණක් නොව ජීවිතයකට ජීවිතයක් එක්වූ ලේ නෑ කමකි. මෙම ලේ නෑකම තහවුරු වන්නේ නැතහොත් සාක්ෂාත් වන්නේ සහභාගිත්වය ලබන්නා කුරුසියේ මරණය තුළ ක්‍රිස්තු අත්දැකීම ජීවත් කළහොත් පමණකි.

## 1.2.1.3.3 ශුද්ධාත්මයාණෝ

සමදර්ශක සුවිශේෂ තුළ ආත්මයාණන් පිළිබඳව ඉගැන්වීම කෙරෙන්නේ ගැලවීමේ ක්‍රියාකාරිත්වයට ශුද්ධාත්මයාණන් පූර්ණව සහභාගිවූ ආකාරයටය.

උදා:- **මාංශගතවීම, බෞතිස්මය**

පරික්ෂා තුන හා වනාන්තරයට පිවිසීමත් වැනි සිද්ධීන් සමදර්ශක සුබාරංචි තුළ සඳහන් වුවත් ජොහාන් තුමාගේ ඉගැන්වීම් ඊට බොහෝසේ වෙනස් ලෙසට ඉදිරිපත් වේ.
ජොහන් තුමා බොහෝවිට ආත්මයාණන් තුළින් උපත ලැබිය යුතු බව ප්‍රකාශ කරයි. (ජොහාන් 3/1-8) මෙහිදි ජේසුස් ස්වාමින් වහන්සේ නිකදේමුස්ට කොන්දේසියක් වශයෙන් දක්වනුයේ ස්වර්ග රාජ්‍යයට යැමට නම් ජලයෙන් හා ශුද්ධාත්මයාණන්ගෙන් නැවත ඉපදිය යුතු බවයි. මෙහිදි නැවත ඉපදීම කායික ඉපදීමක් ගැන සිහිපත් කළේ ය. එහෙත් ජේසුස් වහන්සේ ඉන් අදහස් කළේ ආත්මයාණන් කරණකොට ගෙන ඇතිවන ආධ්‍යාත්මික ජීවිතයයි.

සභා සම්ප්‍රදායය තුළ සුළඟ සහ ජලය යන වදන් දෙක තුළම ශුද්ධාත්මයාණන් පිළිබඳව අර්ථය නිරූපනය කරයි. මෙය පාදක කෙරෙන ක්‍රිස්තුන් වහන්සේගේ වදන් වලින් පෙන්නුම් කෙරෙන්නේ ශුද්ධාත්මයාණන් තුළින් නව උපතක් ලැබිය යුතු බවයි. මෙය කෙනෙකුගේ විශ්වාසය මත උදාවන නව ජීවිතයයි. එදා ස්නාවක ජුවාම් තුමා ජලය වත් කිරිමෙන් දුන්නේ පසුතැවිල්ලේ ස්නාපනයකි. එහෙත් උත්ථානයේ නව ජීවිතයට ඇතුළු වීමට නම් විශ්වාසය පදනම්වූ ජලයෙන් හා ආත්මයාණන්ගෙන් බෞතිස්මය ලැබිය යුතු බව ජේසුස් වහන්සේ මතක් කර දෙයි. ජොර්දාන් නදියේ දී ජේසුස් වහන්සේ ජලයෙන් හා ආත්මයාණන්ගෙන් බෞතීස්ම ලැබුවා මෙන් ද ඒ තුළ ක්‍රිස්තුස් හෙවත් ආලේප කරනු ලැබූ තැනැත්තා වශයෙන් හඳුන්වනු ලැබුවා මෙන් ද, කිතුනුවා ද ප්‍රසාද ස්නාපනයේ දී ජලයෙන් හා ආත්මයාණන්ගෙන් ආලේප කරනු ලැබ, ක්‍රිස්තුස් වහන්සේගේ කාර්යය භාරයට ඇප කැප වන්නේ ය. මෙයයි දේව දරුකම වන්නේ.

## ශුද්ධාත්මයාණන් හා කිතුනු ජීවිතය

සැනසිලි දායකයාණෝ හෙවත් ආත්මයාණෝ මෙලොව ජීවිතයේ ඵලදැරීම සඳහා කිතුනුවන් ක්‍රියාකාරි කරවයි. මෙම සහනදායකයාණෝ කිතු බැතියනට උද්යෝගය, එකමුතුවීම, මග පෙන්වීම ලබා දෙන සැටි අවසන් දෙසුම තුළින් සිව්වැනි සුවිශේෂක කතුවරයා මනාසේ පෙන්නුම් කරයි. ජුවාම් ජනසමාජය තුළ ද ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දහමට සාක්ෂි දැරිම සඳහා අනුගාමිකයන්ට හැකියාව හා බලය ලබා දුන්නේ ශුද්ධාත්මයාණෝ ය. උත්ථානවූ ක්‍රිස්තුස් වහන්සේ දේව ජනතාව තුළ සිටින්නේ ආත්මයාණන් තුළින් ය. (ජොහන් 14/15-20)

ලෝකය තුළ ක්‍රියාකාරිවීමේ දි ලෝකයේ මග නොගෙන, විශ්වාසයේ මග යෑම සඳහා ආත්මයාණෝ මග පෙන්වන්නා හ. ජුවාම් සුවිශේෂයට විශේෂවූ ලෝකයා යන වචනය සඳහන් කිරීමෙන් මෙහිදී පෙන්නුම් කරන්නේ අවිශ්වාසවන්ත ජනතාවය. (ජුවාම් 14/17)

මෙලොව ජීවත්වීමේ දී
- ප්‍රශ්න වලට මුහුණ දිමටත්
- වැරැද්ද පිළිගනිමින් වරදට පොළඹවන දේ ප්‍රතික්ෂේප කරන්නටත්, උන්වහන්සේ අපව මෙහෙය වන සේක. එමගින් ආත්මයාණෝ දේව ජනතාව සත්‍යයෙහි පිහිටුවන සේක.
- එසේම සහයදායකයාණන් පැමිණි කළ, ජේසුස් වහන්සේ නොඅදහන ජනතාවට. ඇදහිල්ල මදිකම නිසා ඇතිවන පාපය ගැන ද, ජේසුස් වහන්සේ ධර්මිෂ්ඨ, නිදොස් කෙනෙකු බව උන්වහන්සේ දෙවියන් වහන්සේගේ දකුණු පාර්ශ්වයේ වැඩ සිටිමෙන් ද, ලෝකයේ පවතින අඳුර අයහපත් බලවේග බිඳදමන, විනිශ්වය ද ගැන ද වටහා දෙන්නේ, අර්ථවත් කිතුනු ජීවිතයක් ගත කරනු සඳහා බව, ජොහන් තුමා ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වය ගැන පහදා දෙන සේක. (16/ 8-15)

## 1.2.2. පාවුළු තුමාගේ සංදේශ

## 1.2.2.0 පාවුළුතුමා කව්ද?

මෙතුමා පිළිබඳ දැනගැනීමට
* අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතේ 9 වන පරිච්ජේදයෙන් ඔබ්බට හා
* පාවුළුතුමාගේ ලිපි - මූලාශ්‍ර වශයෙන් ගත හැක.

## පාවුළුතුමාගේ උපත හා ළමා කාලය

වර්තමානයේ දි තුර්කීය ලෙස හැඳින්වෙන, එකල සිලිසියේ ප්‍රාන්තයක්වූ තාර්සස් හිදි මෙතුමා උපත ලැබීය. මෙය මහා රෝම අධිරාජ්‍යයේ බල ප්‍රදේශයට යටත්වූ ප්‍රාන්තයකි. (ක්‍රියා 22/3, 21/39, 9/30, 11/25) බොහෝදෙනා විශ්වාස කරන සැටියට, ක්‍රි.ව. 1 වන සියවසේ මුල්කාලයේ එනම් ක්‍රි.ව. 5-10ත් අතර තාර්සස් හි හෙතෙම උපත ලැබුවේ ප්‍රබලවූ ජුදා සංඝයක සෙවන ලබමින් ය. එම සංඝය වාණිජ හා කර්මාන්ත කටයුතු වල නිරත වූහ. පාවුළුගේ දෙමව්පියන් පරිසිවරුන් වූහ. (ක්‍රියා 23:6, ක්‍රියා 23/16) මගින්, අනාවරණය කරන්නේ පාවුළුතුමාට සොහොයුරියක් ද, බෑනා කෙනෙකු ද, ජෙරුසලමෙහි සිටි බවයි. ඒ හැරුණු කොට ඔහුගේ පවුලේ හෝ ඥාතියෙකු ගැන වෙන සටහනක් නැත. කෙසේ වෙතත්, ඔහු තමන්ගේ පරම්පරානුගත ජුදෙව් කම ගැන පාරට්ටු කරන්නේ ය.(පිලිප්පි 3/5)

## පාවුළු තුමාගේ නම කෙසේ වීද?

ක්‍රියා පොතේ 9 වන පරිච්ඡේදය වර්නා කරන අන්දමට **"ස්වාමින් වහන්සේ ගත් ඉල්ලා ගත්"** යන අර්ථය ඇති "සාවුල්" යන්න, ඔහුගේ ජන්ම නාමය විය.

- මේ තැනැත්තා ආබ්‍රහම්ගේ පෙළපතට ද, බෙන්ජමින්ගේ ගෝත්‍රයට ද අයත් ඊශ්‍රායෙල් ජාතිකයෙකු වන බව. රෝම 11/1, මගින් අනාවරණය කරයි.
- එසේ ම පිලිප්පි 3/5, හා ගලාති 1/14 මගින් ඔහු ජුදා සම්ප්‍රදාය ගරු කරන ජුදා ආගම උදෙසා, ක්‍රිස්තියානින්ට පීඩා කරන පීඩකයකු වශයෙන් ද හඳුන්වා දෙයි. එම නිසා සිත් හැරීමට පෙර, "තාර්සස්" හි සාවුල්ට, හෙබ්‍රෙව් පසුතලය හා ජුදා චින්තනය, ප්‍රබලව බලපෑ බව පෙනේ.

## පාවුළු හෙවත් පාවුලොස්

- මෙමගින් ඔහුගේ ග්‍රීක බව හෝ හෙලනිස්ත බව හෝ පෙන්වයි.
- එතුමන්ගේ ලිපි තුළින් ද, ග්‍රීක සංකල්පය මතුකර දක්වයි.
- එතුමන් ග්‍රීසියට අයත් අන්තියෝකයේ උපත ලද නිසා ග්‍රීක ආභාෂයන් හා නාමය එතුමාගේ ජීවිතයට ආවේණිකව තිබේ.
- තම ලිපි තුළ, ඔහු සෙප්ටුවාජින්ත බලිබලයේ පිටපත හොඳින් භාවිතා කර ඇති බවක්, පුරාණ ගිවිසුම් පාඨ උපුටා දැක්වීම තුළ අපට දැකිය හැකිය.
- පාවුළුතුමන් තාර්සස්හි සිටි බව ඔහුගේ ලිපිවල දක්නට නොලැබුණත් ලූක් තුමන්, තම ක්‍රියා පොත මගින් එසේ සිටි බවට තහවුරු කර දක්වයි.
- පාවුළු තුමා ඉගෙනීම ලැබුවේ, ජෙරුසලෙම්හි ගමාලියල් නැමැති ප්‍රධාන රබ්බි යටතේ ය. දෙමාපියන් පරිසිවරුන්වූ පවුලක, දරුවකු එසේ අධ්‍යාපනය ලැබීම, පරිසිවරුන්ගේ සම්ප්‍රදාය අනුව සාමාන්‍ය දෙයක් විය. ඒ නිසාම, නිරතුරුව සිනගෝග වල යාච්ඤා මෙහෙයයන් වලට ද, ටෝරා හෙවත් ව්‍යවස්ථාවලිය කියවන්නට හා පහදා දීමට ද ඔහු සහභාගි විය. (ක්‍රියා 22/3, ක්‍රියා 5/34-39) ගමාලියෙල් වනාහි ශ්‍රේෂ්ඨ ගුරුවරයෙකුවූ හිලෙල්ගේ පුත්‍රයෙකු හෝ බෑණනුවෙකි. ඔහු ක්‍රි.ව. 20 ත් 50 අතර කාලයෙදි ගුරුවරයකුව සේවය කළේය. පරිසිවරු, ව්‍යවස්ථාවලිය, **හලක්කා** (ගමන සඳහා නීති) සහ **හග්ගදා** (වෘත්තාන්ත) වශයෙන් කොටස් දෙකකට බෙදන ලදි. යම් කිසිවකු මෙම ටෝරා හෙවත් ව්‍යවස්ථාවලියේ ආචාර්ය පදවියක් හොබවන්නට කැමතිද, ඔහුට, සාහිත්‍යමය වශයෙන් මෙම හලක්කා හා හග්ගදා යන කොටස් දෙක කටපාඩම් කිරීමටත්, එය පහදා දීමටත, ඒ සඳහා ඉගෙනීමටත් සිදුවිය. මේ සඳහා අවුරුදු 4 ක් හෝ 5 ක කාලයක්, ව්‍යවස්ථාවලියේ ඇදුරන් යටතේ (under Masters of Law) ගැඹුරු අධ්‍යයනයක යෙදෙන්නට සිදුවිය. නමුත් පාවුළුතුමා තමාට නියම වූ මේ රබ්බි වරුන් විසින් කළයුතු ඉගෙනීම, 19 හෝ 20 වන විය ලබනවා සමගම අවසන් කළේ ජෙරුසලමේ දීය. (ඔහුගේ උපත ක්‍රි.ව. 5-10 ටත් අතර වුණිනම්, ඔහු රබ්බි වරයෙකු වූයේ ක්‍රි.ව. 24 ටත් 30ටත් අතර කාලයේදී ය) මේ නිසා පාවුළු තුමා ද ලාබාල රබ්බි වරයෙකු ලෙස හැඳින්විය හැක.

## පාවුළු තුමා කුමනාකාර පුද්ගලයෙක් ද?

- පාවුළු තුමාගේම ලිපිවලින් දැක්වෙන අන්දමට, එතුමා එතරම් ප්‍රතාපවත් පෙනුමක් ඇති කෙනෙකු නොවන බව පෙනේ (2 කොරින්ති 10/10)
- එසේම පාවුළු තුමන්ට ශාරීරික ආබාධයක් තිබූ බව 2 කොරින්ති 12/7 වගන්තියෙන් පැහැදිලි කෙරේ. ඒ නිසා ඔහු දෙවියන් වහන්සේගෙන් ඉල්ලන්නේ තමාට වැළඳී ඇති රෝගය සුව කරන ලෙසයි.
- පාවුළුගේ ජීවිතය තුළ අභ්‍යන්තර ගැටුමක් ඇතිවී තිබුණ බව දක්වයි. එනම් ජුදා නීතිය හා සම්ප්‍රදාය ද, අනෙක් පැත්තෙන් ක්‍රිස්තුන් වහන්සේ තුළ ඇති විශ්වාසය නිසා, අන්‍ය ජාතිකයන් වෙත සුබ අස්න දේශනා කිරීමේ අවශ්‍යතාවය ද, මේ ගැටීම ඇති කෙළේ ය.
- පාවුළුතුමා ගමාලියෙල් යටතේ අධ්‍යාපනය හැදෑරූපරිසියෙක් වුවත් සම්ප්‍රදායයන් පිළිබඳව අධිවේගී චින්තනයක් තිබූ කෙනෙක් විය.

**පාවුළු තුමාගේ ලිපි වලින් පිළිඹිබු කෙරෙන ශාස්ත්‍රීය බව**

i කතුවරයා මේ ලිපි ආරම්භ කරන්නේ, තමාගේ හෝ සහවරයාගේ නම ද ඇතුළත් කර ගෙන ය.
ii ලිපිය යවන අයගේ නම ද එහි සඳහන් කරයි.
iii ආරම්භකව ආචාරයක් පිළිගන්වයි.
iv ලිපියේ ප්‍රධාන කොටස තුළ දේව ධාර්මික චින්තනය ගැබ් කරයි.
v ලිපිය අවසානයේදි ආසිරි තුති පැතුමක් දෙයි.

**පාවුළු තුමාගේ චින්තනයේ වර්ධන කාලය**

(අ) ක්‍රි.ව. 50 - 51 කාලයේ දී මැසිඩෝනියාවේ කොරින්ති නගරයේ සිට 1 වන හා 2 වන තෙසලෝනික ලිපි ලියන ලදි. මේවායේ ඇති ක්‍රිස්තියානි ධර්මයේ මූලික ඉගැන්වීම් හෙවත් "**කෙරිග්මා**" ඉතා සරලවූ චින්තනයකි.

(ආ) 1 වන හා 2 වන කොරින්ති, ගලාති හා රෝම ලිපිවල ඉගැන්වීම් විශේෂිත ය. එනම් ක්‍රිස්තුන් වහන්සේ තුළ ගැලවීම ලැබෙන බව කියමින්, දේව ධාර්මික පසුබිමක් ක්‍රම ක්‍රමයෙන් ගොඩ නගයි. ක්‍රි.ව. 56-60 අතර කාලයක මෙම චින්තනය ගොඩ නැඟුණි.

(ඇ) කොලොස්සි , එපීසි, පිලිප්පි ලිපි වනාහි, පාවුළු තුමා, රෝමයේ සිරගතව සිටින කාලයේදි ලියන ලද ඒවා ය. පෙර චින්තනයම ඉදිරියට ගෙන යමින්, විශ්වයේ ගැලවීම ගැන කථා කරයි. (උදා: වශයෙන්, මැවිල්ල තුළ ක්‍රිස්තුන් වහන්සේගේ ආධිපත්‍යය පෙන්නුම් කරයි. මෙම ලිපි ක්‍රි.ව. 61- 63 ත් අතර කාලයකදි ලියැවෙන්නට ඇත.

(ඉ) 1 හා 2 තිමෝති හා තීතස් යන ලිපි ක්‍රි.ව. 66-67 අතර කාලයේ දී ලියැවුණි. මේවා එඬේරික ලිපි වශයෙන් හඳුන්වනු ලැබේ.

**පාවුළු තුමාගේ හසුන්පත්වල අරමුණු**

* ධර්ම ප්‍රචාරය
* කිතුනු සභාවල වර්ධනය
* අලුතින් ආරම්භ කළ කිතුනු සභාවල තත්කාලින ප්‍රශ්න සාකච්ඡා කිරීම
* කිතුනු සංඝවල පැන නැගුණ ප්‍රශ්න දෙස බැලිය යුතු ආකාරය තමන් පිළිගත් දේව ධර්මය අනුව පෙන්වාදීම.
* කලින් ආරම්භ කළ සභාවල කිතුනු ජන කොටස් හමුවීමට, ඇති අපහසුතාවය පිරිමසා ගැනීම.
* අන්‍ය ජාතීන් හා සමග වෙසෙන කිතුනුවන්ගේ, කිතුනු පැවැත්ම තහවුරු කිරීම
* කිතුනු විශ්වාසය මගින් දේව සම්බන්ධතාවය ගොඩ නඟන ආකාරය පැහැදිලි කරදීම.
* අවවාද අනුශාසනා හා ජන්වන්දනා වත්පිළිවෙත් හඳුන්වා දීම.
* දේව පණිවුඩයේ ශුද්ධවත් බව රැක ගැනීම.
* සංවාදය මගින් ප්‍රශ්න වලට පිළිතුරු දීම.
* සමස්ත ලෝක වටිනාකම්වලට වඩා ක්‍රිස්තුන් වහන්සේ හා සමග ඒකාබද්ධවීමේ වැදගත් බව පෙන්වීම.

* ක්‍රිස්තුන් වහන්සේ මගින් පමණක්, ව්‍යවස්ථාවේ සියළුම පරමාර්ථ පරිපූර්ණත්වයට පත්වූ බව දැනුවත් කිරීම.
* ක්‍රිස්තුන් වහන්සේගේ දහම, මුළු විශ්වයටම සාධාරණ දහමක් බව ඒත්තු ගැන්වීම.
* බෞතිස්ම ස්නාපනය මගින් ක්‍රිස්තුන් වහන්සේ තුළ නව ජීවිතයක් අරඹන බව.
* නව කිතුනු ජීවිතය ශක්තිමත් කරගැනීමට, ආරක්ෂා කර ගැනීමට හා වර්ධනය කරගැනීමට උදව් දීම.
* කිතුනු ජීවිතය වර්ධනය කරගැනීම සඳහා ශුද්ධාත්ම වරම් අවශ්‍ය බව පෙන්වාදීම.
* අබ්බා පියාණන් තුළ දේව පුත්‍රභාවයට කැඳවා ඇති බව ජීවිත පැවැත්මෙන් පෙන්වා දිය යුතු බව.

## 1.2.2.1 රෝමවරුන්ට ලියන ලද හසුන

පාවුළු තුමා විසින් ලියන ලද දීර්ඝතම හසුන වූ මෙය, නව ගිවිසුමේ හසුන් අතරින් ප්‍රථම ස්ථානය ගන්නාසේම, ශත වර්ෂ ගණනාවක් තුළ ක්‍රිස්තියානි චින්තනය කෙරෙහි දක්වා ඇති බලපෑම සම්බන්ධයෙන් ද වැදගත් ස්ථානයක් දරණ බව පැහැදිලිය. ඓතිහාසික අතින් ද මෙම ලිපිය අති සුවිශේෂ බවක් දක්වන්නේ, ජුදා සම්භවයක හැදුණු වැඩුන, කිතු දහම, එම තත්ත්වයෙන් බැහැර කොට, ජුදා දහමේ මුහුණුවර වෙනස් කරන්නට දුන් දායකත්වය නිසා ය. එම නිසා ක්‍රිස්තියානි ඇදහිලලෙහි අඩංගු ධර්මතා වටහා තේරුම් ගැනීමට අවශ්‍යවන කිසිවෙකු හට, මෙම හසුනෙහි පරිච්ඡේද 1-11 දක්වා ද, දෙවියන් වහන්සේගේ කැමැත්ත අනුව ක්‍රිස්තියානි ඇදහිල්ලෙහි ජීවත්වීමට අදහස් කරන්නෙකු හට පරිච්ඡේද 12 -15 දක්වා ඉදිරිපත් කෙරෙන පාවුළු තුමාගේ අවවාද හා අනුශාසනා ගැන ද නොසලකා සිටිය නොහැක. එපමණක් ද නොව මෙම සංදේශ පත්‍රය, වඩාත් හොඳින් අධ්‍යයනය කරන්නෙකුට පාවුළු තුමාගේ අනෙකුත් ලිපි, කිසිදු අපහසුතාවයක් නොමැතිව වටහා ගත හැකි බවයි, නූතන විශාරදයන්ගේ මතය වී ඇත්තේ.

රෝමවරුන්ට ලියන ලද මෙම හසුන වටහා ගැනීමට පාවුළුතුමා අන්‍ය ජාතන් අතර කළ සේවය ආශ්‍රිත විවිධ ගැටළු ද, ඔහු සේවය කළ කාලය ද, වටහා ගත යුතුය. මෙම රෝම ලිපිය ක්‍රි.ව. 56 - 57 අතර කාලයේ දී කොරින්තියේ සිට ලියන ලද බවත්, ජෙරුසලෙම් සභාවට ආධාර ගෙන යන්නට පෙර විවේක ගත් අවස්ථාවේ දී එසේ කළ බවත් පැහැදිලිය.

**මේ ලිපියේ අන්තර්ගතය ප්‍රධාන කොටස් 7 ක් යටතේ පෙළ ගැස්වේ.**

| | | |
|---|---|---|
| i | හැඳින්වීම හා තේමාව | (1/1-17) |
| ii | සර්වධාරණයවු දෙවියන් වහන්සේගේ අනාවරණය ඉදිරියේ මිනිසා | (1/18 - 3-20) |
| iii | සර්වධාරණයවු දෙවියන් වහන්සේගේ අනාවරණය | (3/21 - 4-25) |
| iv | සාධාරණිකරණය ලෙස විමුක්තිය | (5/1-8/39) |
| v | ඇදහල්ලෙන් වන සාධාරණය සහ ඉශ්‍රායෙලුන්ගේ අවිශ්වාසය | (9/1 - 11/36) |
| vi | ඇදහිල්ලෙන් සාධාරණිකරණය වූ අයගේ ජීවිතය | (12/1 - 15/13) |
| vii | සැලසුම් සහ ආචාරය | (15/14- 16/27) |

## 1.2.1.1. රෝම ලිපියේ ප්‍රධාන තේමා

### i ඇදහිල්ල තුළ දේව සබඳතාවය රෝම 3:21-31

මිනිසුන් දමිටු බවට පමුණුවාලීමේ දෙවියන් වහන්සේගේ ක්‍රියාමාර්ගය වූ කලී, ව්‍යවස්ථාවලිය හෝ දිව්‍යසාවලිය ඉටු කිරීම මගින් සිදුවන ක්‍රියාවලියක් නොව, ජේසුස් වහන්සේ කෙරෙහි ඇති ඇදහිල්ල කරණකොටගෙන, අදහන සියල්ලන් දමිටු බවට පත්කරනු ලැබීම ය.

මෙමගින්, දෙවියන් වහන්සේගේ පූර්ණ අනාවරණය ක්‍රිස්තුන් වහන්සේ වන බවත්, ඒ නිසාම එසේ ලැබෙන අනාවරණය අදහා ගැනීම තුළ, මිනිසාට දේව සබඳතාවට හෙවත් ගැළවීම ලබා ගත හැකි බවත් පාවුළු තුමා ප්‍රකාශ කරයි.

සියල්ලන්වම දමිටු බවට පත් කරන බව පෙන්වන පාවුළු තුමා, ව්‍යවස්ථාවලියෙන් හා දිව්‍යසාවලියෙන් තොරව වුවද, ''ඇදහිල්ල'' එනම් ක්‍රිස්තුන් වහන්සේ වෙත ඇති ඇදහිල්ල මත, '' විශ්වීය කැඳවීමක් '' මානවයාට ඇති බවත්, එය ක්‍රිස්තුන් වහන්සේගේ ගැලවීමේ කාර්යය තුළ මානව ඉතිහාසයට නව යුගයක් උදාකළ බවත් පෙන්නුම් කරයි.

රෝම 5/1-11

- මිනිසා දමිටු බවට පමුණුවන්නේ තමාගේ ඇදහිල්ල නිසාය. ඇදහිල්ල තුළ ලබන දැහැමි බවේ මෙම දේව වරප්‍රසාදය නිසා, ක්‍රිස්තුන් තුළ දේව සබඳතාවයට මිනිසාව පමුණුවනු ලබන්නේ ය.
- ඇදහිල්ල නිසා දේව සබඳතාවයට පත් කරනු ලබන්නට, ජේසුස් වහන්සේ, අප අනාථව සිටිය දි පවුකාරයන් වූ අප වෙනුවෙන් දිවි පිදූ සේක.
- දේව සබඳතාවයට පත් කරගනු ලබන්නට, අප උදෙසා ඇති දෙවියන් වහන්සේගේ ප්‍රේමය ප්‍රත්‍යක්ෂ වන්නේ. අප පව්කාරයන්ව සිටිය දී අප උදෙසා ක්‍රිස්තුස් වහන්සේ දිවි පිදූ බැවිනි.

### ii ක්‍රිස්තුන් වහන්සේ තුළ නව ජීවනය

රෝම 6/1-14

- ක්‍රිස්තුන් වහන්සේ තුළ නව ජීවනය කිතුනුවා ලබන්නේ, බෞතිස්ම ස්නාපනයෙනි. එමනිසා පාවුළු තුමා බෞතිස්ම ස්නාපනය තේරුම් කරන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ මරණයට හා උත්ථානයට සහභාගි විම තුළින් උන්වහන්සේට අනුරූපීවීමක් ලෙසටය. එනම් පාපයෙන් නිදහස් විම සහ දෙවියන් වහන්සේ තුළ ජීවත්වීමය.
- පාවුළු තුමා සඳහන් කරන මෙම ධර්මතාවය තේරුම් ගත යුත්තේ, පැරණි බෞතිස්ම පිළිවෙත ආශ්‍රයෙනි. ජීවිතය ලැබිම (උත්. 2/4-6) හා මරණයට පත්විම (උත්. 7-8) එමගින් සංකේතවත් කෙරුණේ ජලයේ ගිල්වා (IMMERSED ) ස්නාපනය කිරිමෙන් කෙනෙකු ක්‍රිස්තුන් වහන්සේ සමඟ පාපයට මළ බවත්, ජලයෙන් නැවත නැගිටිමෙන් (EMMERGED) උන්වහන්සේ සමඟ නව ජිවිතයකට උත්ථාන වන බවත් පාවුළු තුමා පැහැදිලි කරදෙයි.
- බෞතිස්ම ස්නාපනයේදි ක්‍රිස්තුන් වහන්සේගේ මරණයට හා උත්ථානයට සහභාගි වන අප, එම අත්දැකීම, ජීවිතයේ සෑම මොහතකදීම සමරන්නට සෑදි පැහැදි සිටිය යුතු බව සඳහන් කරන පාවුළු තුමා, මිනිස් අප තුළ ඇති පූර්ව මිනිස් බව හෙවත් පාපයට පෙළඹෙන ස්වභාවයත්, මාංශික තෘෂ්ණාවන් සියල්ලත් මඟින් කෙරෙන වහල්වීම්වලට යටත් නොවි, එම ආශාවන් මරණයට පත්කිරිමෙන් නිදහස් දරුවන් ලෙස නව ජිවිතයක් සැමවිටම අත්දැකිය යුතු බව අවධාරණය කරයි. ඔබේ ඉඳුරන් අදමිටුකමෙහි ආයුධ වන ලෙස පාපයට භාර නොදී දමිටුකමෙහි ආයුධ වන ලෙස උන්වහන්සේට භාර කරන්න.
- මෙහිදි පාවුළු තුමා ව්‍යවස්ථාව හෙවත් නීතිය, පාපයට සමාන කරමින් බෞතිස්මය ලබන තැනැත්තා ව්‍යවස්ථාව යටතේ නොව, දේව වරප්‍රසාදය යටතේ ජිවත් වන බව පවසයි.

## දේව වරප්‍රසාදය යනු

දෙවියන් වහන්සේගේ දයානුකම්පාව තුළ ක්‍රිස්තුන් වහන්සේ මගින් මානව සංහතිය ලත් දේව තිළිණය යයි. එමනිසා පාපයට මැරී, වහල්ව සිටි මානවයා නිවහල්ව, නව ජීවිතයක් ලැබුවේ ක්‍රිස්තුන් වහන්සේ මගින් ය.

**රෝම 12/3-8**

- මිනිස් සිරුරෙහි ඇති බොහෝ අවයවයනට, එකම ක්‍රියාකාරීත්වයක් නැතිවා සේම, ක්‍රිස්තුන් වහන්සේ හිස වුත් අනෙකුත් අවයවයන්ගෙන් සැදුම් ලත් ශරිරය නම් වූ සභාවේ සියලු දෙනාට, වෙන් වෙන්වූ කාර්යභාරයක් ඇත්තේය. එහෙත් ඒ හැම අවයවයකටම විවිධත්වය තුළ ශරිරයේ වර්ධනය, ඒකත්වය සඳහා ක්‍රියා කිරීමේ වගකීමක් ඇත.
- ප්‍රසාද ස්නාපනය තුළ ඇදහිල්ලේ ජීවිතයකට සහභාගි වූ සැමදෙනාටම, තම කිතුනු සංඝයේ ජීවනය හා වර්ධනය ගොඩ නැංවෙන පිණිස, වරප්‍රසාද ප්‍රදානය කරන සේක.
- දේව වරප්‍රසාදය අනුව කුසලතා, සභාවේ උන්නතිය සඳහා ය.

**කුසලතාවයඃ-**

- දහම් දෙසීම නම් - ඇදහිල්ලේ ප්‍රමාණයට දහම් දෙසිය යුතුය
- සුබසාධක සේවය නම් - එම සේවයෙහි නිරත විය යුතුය.
- ඉගැන්වීම නම් - ඉගැන්වීමේ නිරත විය යුතුය.
- ආධාර දෙන්නෙකු නම් - ත්‍යාගශීලිව දිය යුතුය.
- මූලිකත්වය දරන්නෙකු නම් - උද්යෝගිමත්ව සිටිය යුතුය.
- සුව සේවය නම් - ප්‍රීතියෙන් ලෙඩ දුකට පිහිට විය යුතුය.

## iii ව්‍යවස්ථාව හා ගැලවීම

**- රෝම 2ඃ12-19**

පාවුළු තුමා තම ලිපි තුළ නීතිය හෙවත් ව්‍යවස්ථාව යන වචනය බොහෝ විට භාවිතා කරන්නේ, නික්මයාම, ගණන් කථාව, ලෙවි කථාව හා ද්විතීය නීති සංග්‍රහය යන ග්‍රන්ථයන් හි දක්නට ලැබෙන මෝසස්ගේ ව්‍යවස්ථාවට අර්ථ කථන උපුටා ගනිමින් ය.

- මෙම පාඨය ගොඩ නැගෙන්නේ, මෝසෙස්ගේ නීතිය බල නො පාන්නාවූ අන්‍ය ජාතිකයන්ගේ ජීවත් වීම සම්බන්ධව ය. අන්‍ය ජාතිකයන් ව්‍යවස්ථාව නො දැන පව් කිරීමෙන් නිතියට අනුව විනිශ්චයක් නො ලබා විනාශ වන බව දක්වන පාවුළු තුමා, සෑම මනුෂ්‍යයෙකුම ධර්මිෂ්ඨ වනුයේ ව්‍යවස්ථාව ඇසීමෙන් හෝ කියවීමෙන් හෝ නො වන බවත්, එය පිළිපැදීමෙන් බවත් පැහැදිලි කරයි.

- 2ඃ 4 පදයෙන් ඉඟි කෙරෙන්නේ සෑම මනුෂ්‍යාගේම හෘදයාභ්‍යන්තරයේ ස්වභාවික නීතියක් ක්‍රියාත්මක වන බවයි.

- එම නිසා දෙවියන් වහන්සේ ඉදිරියේ නීතිය හෙවත් ව්‍යවස්ථාව, මනුෂ්‍යයාගේ ජීවිතය සම්බන්ධයෙන්, මාර්ගෝපදේශකයක් ලෙස හඳුන්වා දෙන පාවුළු තුමා, ජුදෙව්වාට මෝසස්ගේ නීතියත් අන්‍යජාතිකයාට තම හෘදය සාක්ෂියට සම්බන්ධ නීතියත් ක්‍රියාත්මක වන බවත්, එම නිසා තමන්ගේ හෘදය සාක්ෂිය අනුව ක්‍රියාකරන්නට දේව අනුග්‍රහය ලැබෙන බවත් ප්‍රකාශ කරයි.

- ව්‍යවස්ථාව ඇසීමෙන් හා කියැවීමෙන් ගෙවන ජීවිතයට වඩා වෙනස් වූ ජීවිත පැවැත්මක්, දේව අනුග්‍රහය ලැබීම තුළ ඔවුන්ගේ සිත්වල ලියවෙන නිසා, එය සැමටම දකින්නට ලැබෙන බව තර්කානුකුලව පෙන්වා දෙන පාවුළු තුමා ව්‍යවස්ථාවට යටත්ව සිටින ජුදයින්ට ඔවදනක් වශයෙන් දෙන්නේ, අන්‍යන්ට නීතිය දේශනා කිරීමට පෙර,

තමන්ම එය පිළිපැදිය යුතු බවත්, එසෙත් නැතහොත් ඔවුන් නීතියට අවමාන කරන බවත් ය.

**2.1.2 රෝම 7:7-20**

මෙම කොටසින් පැහැදිලි කෙරෙන්නේ ශුද්ධවූ පාවුළු තුමා මෝසෙස්ගේ නීතිය පිළිබඳව සිතන ආකාරයයි. එම දැක්ම තුළ පාපය හා නිතීය අතර ඇති සබඳතාවය පැහැදිලි කර දෙන සේක. ඒ අනුව

- ව්‍යවස්ථාව තුළ පනවනු ලබන තහනම මගින් පාපය පිළිබඳ අනාවරණයක් ඇති වන බව පවසන පාවුළු තුමා ආදම්ව ඉදිරියට ගෙන එමින්, ආදම්ගේ කාලයේ ව්‍යවස්ථාවක් නො තිබුණ බවත්, එහෙත් ඔහු ව්‍යවස්ථාව දැනගත් නිසා පාපය පණ ගැන් වී ඒ තුළ ඔහුට විනිශ්චයක් ලබා දුන් බවත් පැහැදිලි කරයි.

- ව්‍යවස්ථාව ගැන දැනුම ඇති තැන, තණ්හාව හා ආශාව වැනි පාපය රජ කරයි.

- එහෙත් ව්‍යවස්ථාව ශුද්ධවන්තය. ආධ්‍යාත්මික ය. එසේ වන්නේ සදාචාරාත්මක ජීවිතයක් ගොඩනගන්නට, එයට කීකරුවන, පිළිපදින අයට ජීවිතය දෙන්නට, දෙවියන් වහන්සේ විසින් ම දුන් දෙයක් නිසා ය.

- නීතිය මිනිස් හදවත් තුළ සට්ඨනයක් ඇති කරයි. නීතිය යහපත් නිසා එය එක් අතකින් මිනිසාට ප්‍රිය මනාප වේ. එහෙත් නීතිය දැනගැනීම මගින් පාපය පණගැන්වී පාපිෂ්ඨ ආශා, මාංශික තෘෂ්ණා පැන නගින නිසා, යහපත, අයහපත අතර සට්ඨනයක් මිනිසා තුළ ඇති කරයි.

- මෙම තෝරා ගැනීමේ දී යහපත කිරීමට ඇති ආශාව මිනිසාට තම ස්වඋත්සහායෙන් ම කළ නො හැකි බව පෙන්වා දෙන පාවුළු තුමා ව්‍යාංගයෙන් පවසන්නේ ඒ සඳහා දේව අනුග්‍රහය අවශ්‍ය වන බව ය.

## iv ආත්මයාණන් තුළ ජීවනය

**- රෝම 8:1-18**

♦ පාපයේ හා මරණයේ නියමයෙන් අප නිදහස් කරනු ලබන්නේ, ක්‍රිස්තුන් වහන්සේ තුළවූ ජීවනදායක ආත්මයාණන්ගේ ආධ්‍යාත්මික ප්‍රතිපත්ති නිසාය.
♦ ජේසුස් වහන්සේ, පාපයේ බලය බිඳින පිණිස මිනිස් කයක් ගැනීමත් පියාණන් වහන්සේ පාපි දුබල බවට හසුවන එම මිනිස් කයට මරණයේ තීන්දුව දීමත් නිසා, මෝසස්ගේ නිතියට කළ නොහැකි දෙය, දෙවියන් වහන්සේ විසින් ඉටු කළ සේක.
♦ මාංශය අනුව ජීවත් වන්නෝ මාංශය අනුව ද (එනම් පාපී ක්‍රියාවලට ද) ආත්මයාණන් අනුව ජීවත් වන්නෝ ආධ්‍යාත්මික දේවලට ද යොමු වන්නෝ ය.

- **මාංශය අනුව ජීවත් වන්නන්ගේ ක්‍රියා**
  කාමමිථ්‍යාචාරය, අපවිත්‍රකම, සල්ලාලකම, රූප වැඳිම, කොඩිවින, සතුරුකම් විවාදය, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, යසස්කාමය, පක්ෂභේද, ආරවුල් වෛරය, බීමත්කම, සුරාධූර්තය.(ගලාති 5/9-21)

- **ආත්මයාණන් අනුව ජීවත් වන්නන්ගේ ක්‍රියා**
  ප්‍රේමය ප්‍රීතිය, සාමය, ඉවසීම, කරුණාව, යහපත්කම, විශ්වාසය, මෘදුකම හා ආත්ම දමනය (ගලාති 5/22-23)

♦ **මාංශික චේතනාවේ විපාකය** - මරණය වේ - ඔවුන්ට දෙවියන් වහන්සේව සතුටු කළ නොහැක.
♦ **ආධ්‍යාත්මික චේතනාවේ විපාකය** - ජීවනය හා ශාන්තිය වේ.

යම් කෙනෙකු තුළ ආත්මයාණන් ජීවත් වන්නේ නම් ඔහු ආත්මයාණන් තුළ ජීවත් වන බවත්, ක්‍රිස්තුස් ජේසුස් වහන්සේට අයිති බවත්, ඒ ලබන දමිටු බව තුළ ආධ්‍යාත්මය ජීවමාන වන බවත්, පාවුළුතුමා අවධාරණය කරයි.

- දේවාත්මයාණන් විසින් මග පෙන්වනු ලබන්නෝ දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ ය. එය මාංශය නිසා පෙර තිබූ බිය ගෙන දෙන තත්ත්වය නොව, ආත්මයාණන් නිසා ''අබ්බා පියාණනි ''කියා යාච්ඤා කළ හැකි අවකාශය සලසා දෙන පුත්‍රකම ලැබීමේ තත්ත්වයකි. මේ දරු කම, උරුමක්කාරකමක් සලසා දෙන්නකි.

## 1.2.1.2. කිතුනු වටිනාකම්

ලිපි ලිවීමේ, තම සුපුරුදු ශෛලීයයෙන් මැත්වන ශුද්ධවූ පාවුළු තුමා, රෝම සභාවට නව ක්‍රිස්තියානි වටිනාකම් මාලාවක් රෝම 12,13 පරිච්ඡෙද මගින් ඉදිරිපත් කරයි. සාමාන්‍යයෙන් ධර්මෝපදේශ ඒකකයක් වශයෙන් හඳුන්වනු ලබන මෙම අනුශාසනාත්මක කොටස, එක්තරා අන්දමකින් සදාචාරාත්මක ප්‍රකාශනයක් පමණක්ම නොව, රෝමවරුන්ට ක්‍රිස්තියානි ජීවිත පැවැත්මක් සඳහා, මෝසෙස්ගේ නෛතික නියෝග තවදුරටත් ඔවුන් කෙරෙහි බලනොපැවැත්වෙන බව පැහැදිලි කෙරෙන, අපිළිවෙලකට වුවත්, එතෙක් සාරධර්ම ඉදිරිපත් කෙරෙන ලියවිල්ලක් වශයෙන් පිළිගන්වා ඇත.

විශේෂයෙන් මෙම කිතුනු වටිනාකම් පාවුළු තුමා ඉදිරිපත් කරන්නේ රෝම සභාව පිළිබඳව ඉදිරිපත් කෙරෙන වාර්තාවක් ලෙස නොව, අතීතයේ දී එතුමාට රෝම සභාව තුළ මුහුණ දී විසඳන්නට සිදුවූ ප්‍රශ්න වලට අනුකූලතාවය දක්වන්නාවූ විස්තරයක් ලෙසිනි. එම නිසා මෙම කොටස, රෝමයේ විසූ කිතුනුවනට දෙවියන් වහ්න්සේගේ කරුණාවට ප්‍රතිචාරයක් වශයෙන් දිය යුතු, එලෙසම රැකිය යුතු, ජීවිත පැවැත්මකට, කෙරෙන යෝජනා වලියක් විය.

### - ක්‍රිස්තියානි ජීවිතයේ ප්‍රතිපත්ති (රෝම 12/9-21)

කිතුනුවාගේ ප්‍රේමය, ප්‍රෝඩාකාරි හෝ ව්‍යාජ ආරුඪයකින් හෝ තොරවූ අවංක දෙයක් විය යුතු බව කියන ශුද්ධවූ පාවුළු තුමා, ඒ සඳහා ගතයුතු වූ දයාවන්ත වූ ක්‍රියා මාර්ගයන් පිළිබඳව උපදෙස් මාලාවක් හෙවත් ආප්තෝපදේශයන් කිහිපයක් ඉදිරිපත් කරයි. පුරාණ ගිවිසුමේ ප්‍රඥා සාහිත්‍ය ගත් කතුවරයාමෙන් පාවුළු තුමා ද, අති විශේෂවූ ජීවිත සංයමයක් ද, මහත් ඉවසිමකින් යම් යම් දේ දරාගැනිම ද, සමාව දීම ද, යන මේ සියළුම දේ (රෝම 12/2) අනුව ලෝක ව්‍යවහාරය අනුව නොව, ක්‍රිස්තුන් වහන්සේ ආරම්භ කළාවූ, නව යුගයක් උදා කරන්නට යොදාගත යුතු, බව අවධාරණය කරන්නේ ය.

- නපුර පිළිකුල් කරන, යහපතට ඇලුම් වන, තමාට වඩා අනෙකුත් උතුම් කොට සලකන සුහද **<u>සහෝදර ප්‍රේමයෙන් ප්‍රේම කිරීම</u>** (මෙය වනාහි අගාපේ තරම් අතී විශේෂිතවුත්, එතරම්ම, පුළුල් ලෙස ඉටු කළයුතු වුත් යුතුකමක් ලෙස, ක්‍රිස්තියානි සංසයට පෙන්වා දෙයි )
- අලසකමින් තොරව, කාර්ය ශිලීව, උද්යෝගිමත් හදකින් **<u>ස්වාමින් වහන්සේට සේවය කරන්න</u>** මෙය වනාහි සෑම කිතුනුවකුටම, එකම චේතනාව වන දේව රාජ්‍යය සඳහා තිබිය යුතු කිතුනු ජීවිත පැවැත්මයි. මෙය හරියාකාරව, ඉටු කරන්නේ නම්, ඔබ සැබෑ ලෙස, කාලයේ අභියෝගයනට මුහුණ දෙන්නේ ය, යන්න ද පැහැදිලි කරයි.
- බලාපොරොත්තුවෙහි ප්‍රීති වීම ද, විපතේ දී ඉවසිලිමත් වීම හා **<u>නොකඩවා යාච්ඤාවෙහි යෙදීම.</u>**
- සැදැහැවතුන්ගේ ඕනෑ එපාකම් වලදී උපකාර කිරිම හා ආගන්තුක සත්කාරයේ යෙදීම - පාවුළු තුමා ඉඟියකින් මෙන් මෙහිදි පවසන්නේ රෝම සභාව ජෙරුසලෙම් සභාව වෙත දානමය කටයුතු කිරීමේ දි අවධානය යොමු කළ බවය.

- **<u>පීඩා කරන්නන්ට ආශිර්වාද කිරීම.</u>**

- මෙය ජේසුස් වහන්සේ (මතෙව් 5/44) (ලූක් 6/27-28) මගින් කරන ලද වචන පුනරුච්චාරණය කිරීමකි.

- **<u>ශෝක වන්නන් සමග ශෝක වීම</u>**
- ප්‍රඥාවන්ත යයි සිතා උඩඟු නොවී, අහංකාර නොවී, යටහත් පහත් අය ආශ්‍රය කරමින්, **<u>හැම දෙනා සමග එක් සිත්ව සිටීම</u>**

- **<u>පළිගැනීමෙන් තොරව, යහපතින් නපුර පරාජය කිරීම</u>**

### - කීකරුකම (රෝම 13 /1-7)

සිවිල් නීතිය හා සිවිල් පාලකයන් කෙරෙහි කිතුනුවාට තිබිය යුතු වගකීම පාවුළු තුමා විස්තර කරයි. විශේෂයෙන් එකල රෝමයෙහි ජීවත්ව සිටි කිතු බැතියන්ට, රෝම රජය සමග මුහුණ පෑමට සිදුවූ ප්‍රශ්න ආශ්‍රිතව, මෙමගින් මගපෙන්වීම, පාවුළු තුමාගේ අදහස විය.

- රාජ්‍ය පාලකයන්ට සැම දෙනාම කීකරු විය යුතු බව
- පාලක බලයට විරුද්ධවන, අකීකරුවන අය, දේව නියමයට විරුද්ධව වන බව.
- රාජ්‍යය පාලකයෝ අයහපතට මිස යහපතට, එරෙහිව බිය නොකරන බව.
- රාජ්‍ය පාලකයා, සැමගේ යහපත පිණිස, දෙවියන් වහන්සේ විසින් පත්කළ සේවකයකු බව.
- එකිනෙකාගේ හෘදය සාක්ෂිය නිසා ඒ අනුව පාලකයන්ට කීකරු විය යුතු බව.
- දිය යුතු දෙය දීමත් පිදිය යුත්තා පිදීමත්, ගරු කළ යුත්තාට ගරු කිරීමත් සමාජය තුළ තිබිය යුතුය.

### - සහෝදර ප්‍රේමය ( රෝම 13 /8-10 )

සිවිල් පාලකයන් වෙත තිබිය යුතු කීකරු කම අවධාරණය කළ ශුද්ධවූ පාවුළු තුමා, ඉන් ඔබ්බට යමින් දයාව කෙරෙහි ඇති යුතුකම පහදා දෙන්නේ ය. එමගින් මෝසස් නීතියෙන් සීමාකර තිබූ මිනිසාව නව නිදහස් කිරීමකට එතුමෝ අවතීර්ණ කරන්නේ ය. ඒ නිසා දයාව හෙවත් ප්‍රේමය ගැන නව දැක්මක් ඇති කරන්නේ ය.

- එකිනෙකාට ප්‍රේම කිරීම හැර අන් කිසිවක් ගැන කිසිවෙකුට ණය ගැති නොවීම. මෙමගින් පාවුළු තුමා ගෙන හැර දැක්වූයේ මිනිස් ලොවේ අනෙකුත් දේ ගැන නොව කිතුනුවා ප්‍රේමය දීමට සැම විටම, සැම කෙනෙකුටම ණය ගැතියකු විය යුතු බවත්, එය කොපමණ දුන්නත් එම ණය ගෙවා අවසන් කළ නොහැකි නිසා සැම විටම ඒ සඳහා වෙහෙසිය යුතු බවත් ය. මෙම ප්‍රේමයේ ණය ගැති බව කිතුනුවන් අතර පමණක් නොව ඉන් ඔබ්බට ද යා යුතු බව ද පාවුළු තුමා මතක් කර දෙන්නේ ය.
- ජේසුස් වහන්සේ මෝසස්ට දෙන ලද දස පණත උපුටා දක්වමින් මාර්ක් 12/28-34 මගින් පැහැදිලි කළ ශ්‍රේෂ්ඨතම ආඥාව නැවත මතක් කරදෙන පාවුළු තුමා, ''අසල්වැසියා '' යනුවෙන් මෙතෙක් අරුත් ගැන්වූ ''සහෝදර ජුදයෙක් '' ය යන අදහස වඩාත් පුළුල් මට්ටමකට ගෙන එන්නටත්, එමගින් හඟවනු ලබන්නේ සැමදෙනාවම බව පැහැදිලි කරන්නටත්, උත්සාහ කරන්නේ ය.
- ''ප්‍රේමය නම් ව්‍යවස්ථාව සම්පූර්ණයෙන්ම ඉටු කිරීම ය'' යනුවෙන් පවසන ශුද්ධවූ පාවුළු තුමා එය පැහැදිලි කරන්නේ, මූලික ක්‍රිස්තියානි සිද්ධාන්තයක් මගිනි. (රෝම 10/4) සඳහන් අන්දමට ක්‍රිස්තුන් වහන්සේ, ව්‍යවස්ථාවේ පරමාර්ථය සපුරාලුවාක් මෙන් උන්වහන්සේ ගේ ගැලවීමේ ක්‍රියාදාමය මගින් (රෝම 8/35) පිළිඹිබු කරනු ලැබූ උන්වහන්සේගේ ''ප්‍රේමය '' මගින් ද, ව්‍යවස්ථාව සම්පූර්ණ කරනු ලබන බව ය. මෙම ධර්මතාවය, මගින් අවධාරණය කරනු ලබන ජීවිත පැවැත්ම කිතුනුවාට, ව්‍යවස්ථාව වෙනුවට නියම ආදේශකයා බව පාවුළු තුමා පැහැදිලි කරන්නේ ය.

## 1.2.2.2. කොරින්තිවරුනට ලියූ පළමු හසුන

රෝම ප්‍රාන්තයක් වු අකයියා හි අගනුවර වූ කොරින්තිය, වාණිජයම වූ වරාය නගරයකි. නැගෙනහිරින් ඒජියන් මුහුද ද, බටහිරින් ආද්‍රියාතික් මුහුද ද ඇතිව, පළලින් සැතපුම් 4 ක පමණ වූ අර්ධද්වීපයක් වූ නිසා, විවිධ ජාතින්ගේ ගනුදෙනු මධ්‍යස්ථානයක් ලෙස මෙම නගරය ඉතා ප්‍රකටය. කොරින්තියේ සිටි ජනතාව තුළ පැන නැගුණ අර්බුද නිසා ව්‍යාකූලත්වයට පත් ජීවිතයන්හි තත්ත්වය පැහැදිලි කරමින්, එම තත්ත්වයෙන් මිදීමට, සදාචාර සම්පන්න ප්‍රතිපදාවක් යෝජනා කරන්නේ ය.
සමාජ සම්මතයට පටහැනිවූ, කොරින්ති සමාජය තුළ පැණ නැගුන ප්‍රශ්න ලෙස පාවුළු තුමා දකින්නේ බහු ජාතික බහු සංස්කෘතික හා බහු ආගමික සමාජයක් තුළ බිහිවූ අනාචාර ලිංගික පුරුදුද, විවාහකයන් අතර වූ අවිචාරවත් සබඳතා ද, වැරිදි ලෙස පවත්වනු ලබන ජනවන්දනා වත්පිළිවෙත් ද, කොරින්ති සභාවේ පුද්ගලයන්ගේ විවිධ භූමිකාවන් ද සංශෝධනය කළ යුතු බව ය. මෙම කොරින්ති ලිපිය ක්‍රි.ව. 54/55 යන කාලයේ දී, එපිසයේ දී පාවුළු තුමා විසින් ඇදහිල්ලට වෙත යොමු කරගත්, ජුදෙව්වරුන්ට හා අන්‍යජාතිකයන් වෙත ලියන ලද බව පිළි ගැනේ.

මෙහි අඩංගුවී ඇති අන්තර්ගතය ගැන සැළකිමේ දී ප්‍රධාන කොටස් අටකට බෙදිය හැක.

| | | | |
|---|---|---|---|
| i | ආමන්ත්‍රණ /සුබ පැතීම සහ ස්තුතිය | - | 1/1-9 |
| ii | සභාවේ විවිධ කණ්ඩායම් අතර පවතින භේද | - | 1/10-4/21 |
| iii | ලිංගික සදාචාරය හා පවුල් ජීවිතය | - | 5/- 7/40 |
| iv | කිතුනුවන් හා අන්‍ය ජාතිකයන් | - | 8/1 -11-1 |
| v | ආධ්‍යාත්මික දීමනා හා ප්‍රේමයේ ප්‍රතිචාරය | - | 11/2 - 14 /40 |
| vi | ක්‍රිස්තුන් වහන්සේගේ සහ කිතුනුවන්ගේ උත්ථානය | - | 15/1-58 |
| vii | පාවුළු තුමාගේ ගමන් සැලැස්ම සඳහා සහනාධාර | - | 16/1-18 |
| viii | පාවුළු තුමාගේ සුබ පැතීම හා අවසානය | - | 16/19-24 |

## 1.2.2.3.1 ප්‍රධාන තේමා

### (i) කුරුසියේ බලය හා පණිවුඩය
### - 1 කොරින්ති 1/18 - 2/5

ශුද්ධවූ පාවුළු තුමා දක්වන අන්දමට, කුරුසිය මගින් දෙන පණිවුඩය දෙවියන් වහන්සේ වෙතින් ලැබෙන බලයකි. එමනිසා කුරුසියේ පණිවුඩය තේරුම් නොගෙන ලෞකික ප්‍රඥාව තුළ ක්‍රියා කරමින් දෙවිඳුන්ගෙන් ඈත්ව විනාශ වන අයට එම කුරුසියේ පණිවුඩය මෝඩ කමකි, විකාර දෙඩුමකි. එහෙත් කුරුසියේ පණිවුඩය තුළ විමුක්තියේ මගට පිවිස ගැලවීම ලබන අයට, දෙවියන් වහන්සේගේ ගැලවීමේ බලය, අනාවරණය වීමකි.

- පුරාණ කාලයේ දී මෙන්ම, මිනිසුන් පාරට්ටු කරන දෙවියන් වහන්සේ, මිනිස් ප්‍රඥාව වියවුල් කරන නිසා, මිනිස් ප්‍රඥාව තුළ දෙවියන් වහන්සේව අනාවරණය කරගැනීමට මිනිසාට නොහැකිවේ. මේ නිසා පාවුළු තුමා පවසන්නේ එසේ ගැලවීම හෝ දේව සැලැස්ම අනාවරණය කරගත හැක්කේ, අන් මගකින් නොව කුරුසියේ පණිවුඩය තුළ පමණක්ම වන බවය.

- හාස්කම් ඉල්ලන ජුදාවරුන්ට කුරුසියේ පණිවුඩය ප්‍රලාපයකි. එහෙත් කැඳවීම ලත් ජුදෙව් වරුන්ට හා ග්‍රීකවරුන්ට, කුරුසියේ ඇණගැසෙමින් පනිවුඩයක්, දුන් ක්‍රිස්තුස් වහන්සේම දෙවියන් වහන්සේගේ බලය හා ප්‍රඥාව වේ.

- ලෝක මිම්ම අනුව මෝඩ යයි සම්මත දේද, ලෝක මිම්ම අනුව දුබල යයි සම්මත දේද ලෝකයා පහත් කොට සලකන, හෙළාදකින, එමෙන්ම වැදගැම්මක් නැතැයි සළකන දේ ද, දෙවියන් වහන්සේ විසින් තෝරාගනු ලබන්නේ ප්‍රඥාවන්තයන් ලජ්ජාවට පමුණුවන්නටත්, බලවතුන් ලජ්ජාවට පමුණුවනු පිණිසත් ය. එසේ කරමින් දෙවියන් වහන්සේ, කුරුසියේ බලය තුළ අප හැම, ක්‍රිස්තුන් වහන්සේ තුළ එකාබද්ධ කරන්නටත්, උන්වහන්සේ කරණකොට අප දමිටු කරනු ලබන්නටත්, එමගින් නිදහස් කරන්නටත් ක්‍රියා කරන්නටත් ක්‍රියා කළ සේක.

- මෙම කුරුසයේ පණිවුඩය තේරුම් ගැනීමට නම්, කිතුනුවා ආත්මයාණන්ගේ බලයට නතුවෙමින්, අනෙකුත් ලෝක මිම්ම අනුව සම්මත වටිනා දේ අමතක කර ක්‍රිස්තුන් වහන්සේ හා උන්වහන්සේගේ කුරුසගත වීම පමණක් සිතිය යුතු බව පාවුළු තුමා අවධාරණය කරයි.

## ii කිතුනු විවාහය

### කිතුනු සභාව තුළ පවුල
1 කොරින්ති 7/1-16

- සමාජය තුළ අනාචාරය බහුලව පවතින නිසා ස්වාමි පුරුරෂයා හා භාර්යාව එකිනෙකා සම්බන්ධයෙන් තම තමාගේ යුතුකම් ඉටු කළ යුතුය.
- විවාහය තුළ භාර්යයාවගේ අයිතිය පුරුෂයාටත්, පුරුෂයාගේ අයිතිය භාර්යාවටත් ඇති නිසා, ඔව්හු අනිවාර්යෙන්ම එකිනෙකා මත යැපිය යුතුය.
- එකිනෙකාට දෙවියන් වහන්සේගේ විශේෂ දිමනා දී ඇති නිසා තම ආධ්‍යාත්මික ජීවිතයට අනුකූලව, අවිවාහකයන් හා වැන්දඹුවන් ඔවුන් ජීවත්වන තත්ත්වයේ සිටින ලෙසත්, ස්ව පාලනයකට යටත් විය නොහැකි නම්, කාම රාගයෙන් දැවීමට වඩා, විවාහවීම යහපත් බවත් පාවුළු තුමා අවධාරණය කරයි.
- නිත්‍යානුකූල විවාහ, දික්කසාද කළ නොහැකිය. යන ක්‍රිස්තු ආඥාව පාවුළු තුමා පෙන්වා දෙයි.
- කිතුනු, නොකිතුනු විවාහය ගැන පවසන පාවුළු තුමා ප්‍රධාන කරුණු කිහිපයක් පෙන්වා දෙයි.

♦ නොකිතුනු ස්ත්‍රිය හා පුරුෂයා, කිතුනු, පුරුෂයා හෝ ස්ත්‍රිය සමග විවාහයේ රැඳී සිටිමට කැමැත්තේ නම්,
එම විවාහය දික්කසාද නොකළ යුතුය. එසේ වන්නේ කිතුනු නොවන ස්වාමි පුරුෂයාත්, ස්ත්‍රියත්, තම කිතුනු භාර්යයාව හෝ පුරුෂයා නිසා දෙවියන් වහන්සේට කැප වන නිසාය. ඒ නිසාම ඔවුන්ගේ දරුවෝ දෙවියන්ට අයිති වන්නෝය.

♦ නොකිතුනු විවාහකයා, තම කිතුනු ස්වාමි පුරුෂයාගෙන් හෝ ස්ත්‍රියගෙන් වෙන්වන්නට කැමැත්තේ නම් එසේ කළ හැකි බවත් මෙවැනි අවස්ථාවලදී කිතුනු පාර්ශ්වයට විවාහ බැඳීමෙන් නිදහස්වීමේ අයිතිය ඇති (Pauline's Privilage) බවත් පාවුළු තුමා අවධාරණය කරයි.

♦ කිතුනු භාර්යාව හෝ පුරුෂයා තම නොකිතුනු පුරුෂයා හෝ භාර්යාවගේ ගැලවීම සලසනු සඳහා සමාදානයෙන් ජීවත්වීමට දෙවියන් වහන්සේ විසින් කැඳවා ඇත්තේ ය.

## iii රාත්‍රි භෝජනය

1 කොරින්ති 10/14-17

වාණීජමයවූ විවධ ජන සමාජයකින් යුත් කොරින්ති සභාවේ තිබූ, ඇති නැති, උස් පහත් භේද හමුවේ ඔවුන් දක්වන අර්ථ ශූන්‍ය සමාජ හැසිරීම නැති කරන්නට පිළියමක් වශයෙන්, පාවුළු තුමා ඔවදන් දෙන්නේ ක්‍රිස්තු භෝජනය වළඳන අය තුළ තිබිය යුතු එකමුතුකමේ, සහෝදරත්වයේ, බෙදාගැනීමේ, ආකල්පය ගැනයි.

- එකම කුසලානෙන් පානය කරන, එකම පූපයක් අනුභව කරන නිසා අප හැම ක්‍රිස්තුන් වහන්සේ හා ඒකාබද්ධ වෙමු.
- ක්‍රිස්තුන් වහන්සේ හා ඒකාබද්ධ වූ අප එම සම්බන්ධතාවය නිසාම, එකම භෝජනයකට හා එකම කුසලානයකට සහභාගි වීමෙන් එකිනෙකා සමඟඒකාබද්ධ වෙමු.
- එමනිසා ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයේ අවයවයන් වන්නාවූ අපි, අප ලබා ඇති ඒ ඒකාබද්ධතාවයේ උතුම් ඵලයන් එනම් ක්‍රිස්තු ජීවය, ශක්තිය, බලය, අප කුඩා හෝ ලොකු අවයවයක් වුවත් ශරීරයේ පොදු යහපත සඳහා අනෙකුත් අවයවයන් හා බෙදා ගත යුතුය. එම අවයවයන්ද ගුණෙන්, බලයෙන්, සවියෙන් පණගැන්විය යුතුය.

1 කොරින්ති 11/17-34

- කොරින්ති සභාව තුළ ස්වාමින් වහන්සේගේ රාත්‍රි භෝජනය(දිව්‍ය සත්ප්‍රසාදය)සිදු කෙරුනේ ක්‍රිස්තියානි සහෝදරත්වය හා බෙදාගැනීමෙන් තොරවය.
- තමන් සමග ගෙන ආ රාත්‍රි ආහාරය, අන්‍යයන් සමග බෙදා නොගනිමින් ඔව්හු ආත්මාර්ථකාමී ලෙස තමන්ගේ ආහාර තමන්ම වැළඳූහ. එහෙත් මෙම පිළිවෙත අර්ථවත්ව සිදු කිරීමට හැකිවනුයේ, තමන් සතු දෙය බෙදා ගනිමින් සහෝදරත්වය අත්දැකීමෙන් පසුවය. එහෙත්, ඔවුන් අතර වූ භේද භින්නතා, කෑදරකම් හා සුරාවට ඇති ගිජුකම නිසා එය ස්වාමින් වහන්සේගේ රාත්‍රි භෝජනය සැමරීමක් නොවිණි. (11/17-22) මෙම නිසා ය, පාවුළු තුමා, දෙවියන් වහන්සේගේ සභාවට නිගරු කරන, දිළිඳුන් ලජ්ජාවට පත් කරන කොරින්ති ජනතාවට ඉතා තදින් දොස් පවරන්නේ.
- කොරින්ති ජනතාවට තමන් විසින් හඳුන්වා, උගන්වා වදාළ පිළිවෙත ස්වාමින් වහන්සේගෙන්ම ලැබූ බව කියන පාවුළු තුමා, නව ගිවිසුමක් පිහිටුවන්නට, තුති පුදා, කඩා, බෙදා දුන්, රොටිය හා මිදිරස කුසලාන තමාගේ ශරීරය හා රුධිරය බව, ප්‍රකාශ කරමින් සැම දෙනාට ද එය ස්වාමින් වහන්සේගේ ආරාධනයෙන් ''සිහිකිරීම පිණිස සිදුකරන්නට'' වගකීමක් ඇති බව පැහැදිලි කළසේක.
- එනම් අද අප සිහිකරන, සිදුකරන, දිව්‍ය සත්ප්‍රසාදය වනාහි එදා ක්‍රිස්තුන් වහන්සේ විසින් අන්‍යයන් උදෙසා තමන්ව මරණයට, පවරා දෙනු ලැබීමත්, උන්වහන්සේගේ ජීවිත පරිත්‍යාගයත්, (11/23-25) බව පැහැදිලි කරයි.
- මෙම පිළිවෙතට සහභාගිවන සැම කිතුනුවකුම උන්වහන්සේ මෙන් තම ජීවිතය (අතීතය, අනාගතය හා වර්තමානය) තුළින් දෙවිඳුන්ට තුති පුදන්නටත්, එම ජීවිතය පරාර්ථකාමීව බෙදාගන්නටත් යොමුවී, අන්‍යයන් උදෙසා ක්‍රිස්තුන් වහන්සේගේ ගැලවීමදායක මරණය අනුස්මරණය කරන්නටත් එම යාගික ජීවිතය පණගන්නවන්නටත් ක්‍රියා කළයුතු බවයි. පාවුළු තුමා අවධාරණය කරන්නේ.
- මෙවන් පූජනීය අමිලවූ ජීවිත පූජාව සිහි කරනු වෙනුවට, එහි අරුත උඩු යටිකුරු කරන, නුසුදුසු ලෙස එම පිළිවෙත සමරණ සැමදෙනා කරනු ලබන්නේ දේව විනිශ්චයට හා දණ්ඩනයට පාත්‍රවිය යුතු වරදක් බව පාවුළු තුමා අනතුරු ඇඟවීමක් කරයි.

## iv ශුද්ධාත්ම දීමනා

### ශුද්ධාත්ම දිමනා
### 1කොරින්ති 12/1-12

- ආත්මයාණන් වහන්සේ කරණකොටගෙන විවිධ දිමනා දානය කරන සේක.
- සමාජය තුළ විවිධ දිමනා ක්‍රියා කරතත්, ඒ හැම දානය කරන්නේ එකම ශුද්ධාත්මයාණෝය. විවිධාකාර සේවා ඇතත්, සිටින්නේ එකම ස්වාමින් වහන්සේය. විවිධාකාර දේව බල ක්‍රියා කරතත්, සිටින්නේ සියල්ලන් තුළ ක්‍රියාකරන එකම දෙවියන් වහන්සේය.

- විවිධාකාර බලයන් උත්පාද කරමින්, ඒවා මිනිසාට දානය කරමින්, එම දිමනා සේවාවන් සඳහා යෙදවිය යුත්තේ අන්‍යෝන්‍ය යහපත සඳහා පමණක් මිස, තම තමාගේ පෞද්ගලික යහපතට නොවේ.

- **මෙසේ අන්‍යෝන්‍ය යහපත සඳහා යොදවන්නට ආත්මයාණන් එකිනෙකා තුළ ප්‍රකාශ වන්නේ**
- කෙනෙකුට උවදෙස් දීමේ ප්‍රඥාවද
- කෙනෙකුට ධර්මය පහදා දීමේ ඥානය ද
- කෙනෙකුට විශ්වාසයද
- කෙනෙකුට සුව කිරීමේ වරමද

- කෙනෙකුට හාස්කම් කිරීමේ බලයද
- කෙනෙකුට දිවැස්වැකි කීමේ බලයද
- කෙනෙකුට ආත්ම විසඳීමේ හැකියාවද
- කෙනෙකුට විවිධ ශබ්දවලින් කතා කිරීමේ හැකියාවද
- කෙනෙකුට එම ශබ්ද පහදාදීමේ ශක්තියද
  දානය කරමින් ය.
- එකම ආත්මයාණන් වහන්සේත්, එකම ක්‍රිස්තුන් වහන්සේත්, එකම දෙවියන් වහන්සේත්, වැඩ වසන නිසා, විවිධ දීමනා තුළ ක්‍රියාකරන්නෝ ද එකම අරමුණක් සඳහා එක්රැස් විය යුතුය.

### 2.4.2.2 1කොරින්ති 14/1-19

- මිනිස් ජීවිතයේ පරමාර්ථය විය යුත්තේ ප්‍රේමය ය. ආත්මික දීමනාවන්ගෙන් ප්‍රධාන කොට දිවැස්වැකි දෙසීමේ දීමනාව අයිති කර ගැනීමට වීර්යය වැඩිය යුතුය.
- එම නිසා, අන් භාෂා කථනය හෙවත් ධ්‍යානයට සමවැදී, අන්‍යයන්ට තේරුම් ගත නොහැකි භාෂාවක් කතා කිරීම සම්බන්ධයෙන් පාවුළුතුමා පවසන්නේ එය දිවැස්වැකි කීමේ දීමනාව තරම් ඵලදායි නොවන බවයි.

- අන් භාෂා කථනය කරන විට පැහැදිළිව කතා කිරීමද, කියන දේ තේරුම් ගැනීමද, සිදුනොවන්නේ නම් එය හිස් දෙයක් වන නිසා, අන් භාෂාවක් කතා කිරීමේ දීමනාව ලබන්නා, තමාට එම අන් භාෂාව විසඳා දීමට හැකිවන ලෙස යාච්ඤා කළ යුතු බව අවධාරණය කරන පාවුළු තුමා, සැම කෙනෙක් ම, තමන් ලැබූ අන් භාෂාව කථා කිරීමේ, දීමනාව ගැන දෙවියන් වහන්සේට ස්තුති කළ යුතු බවත්, එහෙත් තම තමන්ගේ සභා වලදී අන් භාෂා කථා කරමින් දොඩන වචන දහයකට වඩා තේරුම් ගත හැකි, අන්දමින් දොඩන වචන දහයකට වඩා තේරුම් ගත හැකි, අන්දමින් දොඩන වචන පහක් මගින් එම සභාවට වඩාත් විශාල සෙතක් හා වාසියක් සැලසිය හැකි බව පැහැදිලි කරයි.

## V ප්‍රේමය 1 කොරින්ති 13/1-13

කොරින්තියේ සිටි සමහර කිතු බැතියන්, විවිධ ශබ්දවලින් කතා කිරීම වැනි දීමනා, අනෙකුත් දීමනාවන්ට වඩා වටනේ යැයි පිළිගත්හ. ඒ නිසාම ඔවුහු අනෙකුත් මානව වටිනාකම් සුළු කොට තැකූහ. එම නිසා පාවුළු තුමා ඉතා දැඩි ලෙස අවධාරණය කර සිටින්නේ ප්‍රේමයෙන් බැහැර වූ කිසිදු දීමනාවකට කිසිදු වටිනාකමක් නැති බවයි.

- ප්‍රේමය නොමැති තැන ලෞකික හෝ ලෝකෝත්තර හැකියාවන්ගෙන්ද මහත්වූ පරිත්‍යාගයෙන්ද ඵලක් නැත. දිවැසි දෙසුවත්, සකල ඥානය තිබුණත්, බලවත් විශ්වාසයකින් ක්‍රියා කළත්, සියලු දේ දන් දුන්නත්, සිරුර පූජාවක් කළත්, එතැන ප්‍රේමය නොමැති නම් ඒ දේවල් නිශ්ඵල වන්නේය.
- ඉවසීම,කරුණාව, ඊර්ෂ්‍යා නොවීම, පාරට්ටු නොකිරීම, උඩඟු නොවීම, හනික නොකිපීම, අවිනීත නොවීම, ආත්මාර්ථකාමී නොවීම, නපුර සිතේ තබා නොගැනීම, හරි දේ ගැන ප්‍රීති වී අනුන්ගේ වරද ගැන ප්‍රීති නොවීම, වැනි මානව වටිනාකම් තුළින් පෙන්නුම් කරන්නේ ප්‍රේමය අන්‍යයන්ට සෙතක් විනා අවැඩක් නොකරන බවයි.
- විශ්වාසය හා බලාපොරොත්තුව අරුත් බර කරන්නේ ප්‍රේමයයි. විශ්වාසයටත් බලාපොරොත්තුවටත් ඉමක්, නිමක්, අගක් නැති වුවත්, ප්‍රේමය සදාතනික වනවා පමණක් නොව අනෙකුත් සියලු දේ පහවී ගියත් ඒවා අසම්පූර්ණ වුවත් ප්‍රේමය සියල්ල සම්පූර්ණත්වයට පත්කරන්නේය.

මෙම ඉගැන්වීම මත සියලු තරාතිරමකම, ජාතියකම, ආගමක, පෞද්ගලිකත්වයක, භේදයන් අමතක කර පොදු සහෝදරත්වයෙන් බැඳුන ජීවිතයකට සහභාගි වන්නට පාවුළු තුමා සැමදෙනාටම ආරාධනා කරන්නේය.

## vi පුනරුජ්ජීවනය

1 කොරින්ති 15/35 -44

- ක්‍රිස්තුන් වහන්සේ උත්ථානකරනු ලැබීම, කිතුනුවාගේ උත්ථානයට සහතිකයකි, යන පදනම තුළ, ශරීරයේ පුනරුජ්ජීවනය ගැන ඉගැන්වීම අවධාරණය කරන්නට පාවුළු තුමා උත්සාහ කරයි.

- තිරිඟු බීජයක හා තිරිඟු පැලයක ස්වභාවය උපහැරණයක් සේ ගනිමින්, මැරෙන සුළු දිරායන සුලු දෙයට වඩා, උත්ථාන වන දෙය ස්වභාවයෙන්ම වෙනස් වන බව පෙන්වා දෙන පාවුළු තුමා කොරින්ති සභාව තුළ, භෞතික ශරීරය පුනරුජ්ජීවනය කළ නොහැකිය යන උත්ථානයේ යථාර්ථය ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රවණතාවය නිවැරදි කරන්නට, උත්ථාන වන ශරීරය භෞතික ශරීරයක් නොව, ආධ්‍යාත්මික ශරීරයක් බවට තර්ක කරයි.

- මෙම භෞතික ශරීරය හා ආධ්‍යාත්මික ශරීරය පිළිබඳ තර්කය ගොඩ නඟන ශුද්ධවු පාවුළුතුමා අපුරු සැසඳීමක් ඉදිරිපත් කරයි.

වළලනු ලබන සිරුර දිරායන්නකි
-උත්ථාන කරනු ලබන්නේ නොදිරන්නෙකි.
වළලනු ලබන්නේ අගෞරවාන්විත වූවකි
-උත්ථාන කරනු ලබන්නේ තේජාන්විත වුවකි
වළලනු ලබන සිරුර දුබල වූවකි
-උත්ථාන කරනු ලබන්නේ ප්‍රබල වූවකි.
වළලනු ලබන්නේ ස්වභාවික ශරීරයකි
-උත්ථාන කරනු ලබන්නේ ආත්මික ශරීරයකි.

## 1.2.2.2. කිතුනු වටිනාකම්

### i ලිංගික සදාචාරය හා පවුල් ජීවිතය

නොකිතුනුවන් සිටින සමාජ පරිසරයක් ඇති කොරින්තියේ සභාවට සමාජ සදාචාරය, පවත්වාගෙන යෑමට ඇති වගකීම ගැන තදින් අවවාද කරන ශුද්ධවූ පාවුළුතුමා 1 කොරින්ති 5-17 වන පරිච්ඡේද තුළින් පවුල් ජීවිතය ගොඩනංවන්නට, සභාවක පැවැතිය යුතු ජීවිත රටාව කෙලෙසදැයි නූතන පාඨකයනට වටහා දෙයි. 1 කොරින්ති 5/1-13 කොටසින් පුද්ගලයෙකු තමාගේම පියාගේ බිරිඳ හා සංවාසයෙහි යෙදීම සමාජයට කරන්නාවූ බරපතළ වැරැද්දක් හා බලවත් කැළැලක් බව පහදා දෙන පාවුළු තුමා, එවැනි ක්‍රියා ගැන අප සැමවිටම සංසයක් වශයෙන් දුක් විය යුතු බවත්, එවැනි වරදවල් නිවැරදි කිරීමට හෝ එවැන්නන් සඳහා දැඩි පියවරවල් ගැනීම යෝග්‍ය බව 1 කොරින්ති 5/2 හා 1 කොරින්ති 5/5 වගන්ති වලින් ''නෙරපා දැමිය යුතුය'' ''සාතන්ට භාර කළ යුතුය '' යන යෙදුම් වලින් පැහැදිලිය.

- මෙවන් සදාචාරාත්මක පැවැත්මක් සඳහා දැඩි ක්‍රියාමාර්ගයක් කුමන කරුණක් නිසා ගත යුතුද කියා 7 වන වගන්තියෙන් පැහැදිලි කරන ශුද්ධවූ පාවුළු තුමා එමගින් මුළු සංසයම හැම අතින්ම පවිත්‍ර කරනු ලබන බව අවධාරණය කරන අතර, (මතෙව් 18/15-17) සඳහන් ආකාරයට ක්‍රියා කරන්නට මතක් කර දෙනු ලබන්නේ ය.

### විවිධත්වය තුළ ඒකත්වය

### ii 1 කොරින්ති 1/ 10-17

ශුද්ධවූ පාවුළු තුමා කොරින්තියේ සභාව තුළ බෙදීම සම්බන්ධයෙන් අප්‍රසාදය පළ කරයි. විවිධ අපෝස්තුළුවරයන් වටා කල්ලි ගැසී එකිනෙකාට විරුද්ධ කැරළි ගැසීම මෙයට හේතුවහි. ''මම කේපස්ගේ ය, මම පාවුළුගේ ය, මම අපොල්ලොස්ගේ ය, මම ක්‍රිස්තුස් වහන්සේගේ ය. එක එක පැති ගැනීම නුසුදුසු යයි කියමින් අවධාරණය කරන්නේ, අප හැමදෙනාටම බෞතිස්ම ස්නාපනය දෙනු ලබන්නේ එකම ක්‍රිස්තුන් වහන්සේ නිසා පාවුළු ගේ හෝ අපොල්ලොස්ගේ හෝ, කේපස්ගේ හෝ සේවය ලැබුවත්, ඒ ඒ පුද්ගලයන්ගේ පැත්ත ගැනීමට වඩා, ඒ අයව සේවයට යොමු කළ ක්‍රිස්තුස් වහන්සේ තුළ අප සැම දෙනාම එකමුතු විය යුතු බවයි. මේ නිසා එකිනෙකා අතර බෙදීමක් සිදු නොවිය යුතු බව පැහැදිලි කරයි.

### 1 කොරින්ති 1/ 12-31

- විවිධාකාරවූ ක්‍රියාකාරිත්වයන් ඇති අවයවයන්ගෙන් හෙබී ශරීරයක්, ඒකත්වය සඳහා ක්‍රියාකරන්නාක් මෙන් ක්‍රිස්තුස් වහන්සේ හා සම්බන්ධ ශුද්ධවූ සභාවද ඒකත්වයක් සඳහා ක්‍රියා කළයුතුය.

- ශරිරයක් කිසිම අවයවයක් තම තමා වෙනුවෙන්ම නොවී, අන් අවයවයන්ගේ යහපත සඳහා වැයවන්නාක් මෙන්, සේවය සළසන්නාක්මෙන්, ශුද්ධවූ සභාව තුළ අප හැම දෙනාම ලබා ඇති කුසලතා අනුව, අප අපටම යන ආකල්පයෙන් මිදී, අප සැමටය, සැමදෙනාම අපටය යන අදහස පෙරදැරි කරගෙන ක්‍රියා කළ යුතුය.

- ඒකත්වයක් ඇති ශරීරයේ සෑම අවයවයක් අතරේ ලොකු හෝ කුඩා හෝ වැදගත් හෝ අවැදගත් හෝ ප්‍රධාන හෝ සුළු හෝ, වශයෙන් භේදයක් නැතිවාසේ සභාව තුළ සෑම සේවාවකටම භේදයක් නොමැති නමුත් එම අවයවනට සමාන ප්‍රමුඛතාවයක් හෝ සමාන ගෞරවයක් නැත්තේ ය, යන අදහස පාවුළු තුමා ඉදිරිපත් කරයි.

### විශිෂ්ඨ දිමනා (1 කොරින්ති 12/ 1-12)

- දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ ආත්මයාණන් කරණකොටගෙන, විවිධ දීමනා දානය කරන සේක.
  සමාජය තුළ විවිධ දීමනා ක්‍රියා කරතත්, ඒ හැම දානය කරන්නේ එකම ශුද්ධාත්මයාණෝ ය. විවිධාකාර සේවා ඇතත් සිටින්නේ එකම ස්වාමින් වහන්සේ ය. විවිධාකාර දේව බල ක්‍රියා කරතත් සිටින්නේ සියල්ලන් තුළ ක්‍රියාකරන එකම දෙවියන් වහන්සේ ය.
- විවිධාකාරවූ බලයන් උත්පාද කරමින් ඒවා මිනිසාට දානය කරමින් ශුද්ධාත්මයාණෝ විවිධාකාර සේවාවන් කරන්නට විශිෂ්ඨ දිමනා දානය කරන සේක. මෙසේ ආත්මයාණන් තම තමාගේ සේවය සඳහා එකිනෙකා තුළ ප්‍රකාශ වන්නේ ය.

**ඒ සඳහා කෙනෙකුට**

- උවදෙස් දීමේ ප්‍රඥාවද,
- ධර්මය පහදා දීමේ ඥානය ද,
- විශ්වාසය ද,
- සුව කිරීමේ වරම ද,
- හාස්කම් කිරීමේ බලය ද,
- දිවැස් වැකි කීමේ බලය ද,
- ආත්ම විසඳීමේ හැකියාව ද
- එම ශබ්ද පහදාදීමේ ශක්තිය ද දානය කළ සේක.

**1 කොරින්ති 14/ 1 - 19**

- මිනිස් ජීවිතයේ පරමාර්ථය විය යුත්තේ ප්‍රේමය ය.
- ආත්මික දිමනාවන්ගෙන්, ප්‍රධාන කොට දිවැස් වැකි දෙසීමේ දීමනාව අයිතිකර ගැනීමට, වීර්යය වැඩිය යුතුය.
- අන් භාෂාවක් කථනය හෙවත් ධ්‍යානයට සමවැදි අන්‍යයන්ට තේරුම් ගත නොහැකි භාෂාවක් කථා කිරිම, දිවැස් වැකි කීමේ දිමනාව තරම් ඵලදායි නොවේ.
- අන් භාෂාවන් කථා කරන විට පැහැදිලිව කථා කිරිම ද, කියන දේ තේරුම් ගැනීම ද, සිදු නොවේ නම් එය හිස් දෙයක් ය. එමනිසා අන් භාෂාවක් කථනය කරන්නා එය, විසඳා දීමට හැකිවන ලෙස යාච්ඤා කළ යුතුය.
- එසේම සෑම කෙනෙක්ම තමන් ලැබූ අන් භාෂාවක් කථා කිරීමේ දීමනාව ගැන දෙවියන් වහන්සේට ස්තුති කළ යුතුය.
- තම තමන්ගේ සභාවලදි අන් භාෂා කථනය කරමින් දොඩන වචන දහයකට වඩා, තේරුම් ගත හැකි අන්දමින් දොඩන වචන පහක් මගින් එම සභාවට විශාල සෙතක් හා වාසියක් සැලසෙන බව අවබෝධ කරගත යුතුය.

## 1.2.2.2. කොරින්තිවරුනට ලියූ දෙවන හසුන

පාවුළු තුමාගේ තෙවන ධර්මදූත චාරිකාවේ දී එනම් ක්‍රි. ව. 57 දි පමණය. මසිදෝනියාවේ පිලිප්පි නුවර සිට කොරින්තියේ සියලුම වැසියන්ටත් අකයියාවේ සියලුම ජනතාවටත් මෙය ලියා ඇත.
රෝම ලිපියට හා 1 කොරින්ති ලිපියට වඩා වෙනස් ස්වරූපයක් ගන්නා ගැටළු හා ප්‍රශ්න වලින් සපිරි, එසේම ගැඹුරු අධ්‍යයනයට යොමු කළ ලිපියකි. මෙම 2 කොරින්ති ලිපිය ලියන ලද්දේ පාවුළු තුමාත් කොරින්තියේ සභාව අතරත් පැණ නැගුණු අර්බුදකාරි අවස්ථාවක දීය. පාවුළු තුමාට විරුද්ධව එම සභාවෙහි සිටි යම් යම් පිරිස් දොස් පවරා තිබිමත්, එම චෝදනා හා අපහාස වලට විරුද්ධව පාවුළු තුමා වේගවත්ව තදින් පිළිතුරු දීමත් තුළ එම කොරින්ති ජනතාව සිත් හරවාගෙන, සාමයෙන් සිටිමත් ගැන පාවුළු තුමා ඇති කරගන්නාවූ සතුට මෙම කෘතියේ මුල් කොටසින් පැහැදිලි කෙරේ. මෙම පොතෙහි අවසාන කොටසින් පැහැදිලි කෙරෙන්නේ තමා ලබා ඇති ප්‍රේරිත තනතුර ජේසුස් වහන්සේගෙන් ලැබූ සැබෑ නිර්ව්‍යාජ තනතුරක් බව පැහැදිලි කිරිම ය.
මෙම පොතෙහි අංඩගු වී ඇති අන්තර්ගතය පිළිබඳ සැකිල්ල මෙසේ දක්විය හැක.

i පෙර වදන 1:1-11

| | | |
|---|---|---|
| ii | පාවුළු සහ කොරින්ති ජනතාව | 1: 12- 7: 16 |
| iii | ජුදා දේශයේ කිතුනුවන් සඳහා පඬුරු | 8: 1-9:15 |
| iv | පාවුළු දූරු ප්‍රේරිත තනතුරෙහි අධිකාරි බලය | 10:1-13:10 |
| v | අවසානය | |

## 1.2.2.3.1 ප්‍රධාන තේමා

### i සහෝදරත්වය

**2 කොරින්ති 8/1-15**

- මසිදෝනියාවේ සිටි කිතුනුවන්, සිය කැමැත්තෙන් නිර්ලෝභිව සහනාධාර පරිත්‍යාගි කිරීම ගැන සඳහන් කරන පාවුළු තුමා කොරින්තියෙන් ද, එම ආදර්ශය අනුගමනය කළ යුතු බව අවධාරණය කරමින්, කොරින්තියන්ගේ ඇදහිල්ල, අන්‍යයන් වෙත ඔවුන් තුළ ඇති ත්‍යාගශිලිවීම තුළින් පිළිබිඹු කළ යුතු බව පවසයි.

- මෙවන් සහෝදරත්වයක් සඳහා ජීවිත පැවැත්මක් යෝජනා කරන පාවුළු තුමා එවැන්නක් සඳහා තම කිසිවිටෙකත් අණ නොකරන බවත්, එය ඔවුන්ගේ ප්‍රේමයේ සැබෑ තත්ත්වය සෝදිසි කිරීමට කරන ආරාධයක් බවත් පවසයි.

- දිළිඳු බව වැළඳගනිමින්, ත්‍යාගිශිලී වූ ක්‍රිස්තුස් වහන්සේ මෙවැනි පරිත්‍යාගිශිලි සේවාවක් සඳහා වන ඉගැන්වීමක පදනම බව ද පෙන්වා දෙයි. (8:8-9)

### ii ව්‍යවස්ථාව

**2 කොරින්ති 3/1-18**

- මෙහිදි පාවුළු තුමා දැහැමි දිවියක් සඳහා නව ගිවිසුමේ සේවකයෙකු ලෙස තමා කරන මෙහෙය හා මෝසස් පුරාණ ගිවිසුමේ දී කළ මෙහෙය සංසදනය කරමින්, තමන් දේශනා කරන, ක්‍රිස්තුස් වහන්සේ තුළවූ නව ගිවිසුම, මෝසස්ගේ මෙහෙයවීම යටතේ ඇති කරගත් පුරාණ ගිවිසුමට වඩා උසස් බව පෙන්වා දෙයි.

- අකුරෙන් අකුර ලියා මෝසස්ට දෙන ලද ව්‍යවස්ථාව මහා තේජසින් පැමිණියත්, එම ව්‍යවස්ථාව මගින් මිනිසාට මරණය උරුම කරදුන් බව පවසන පාවුළු තුමා මිනිසාව දේව සබඳතාවයට පමුණුවන, ආත්මයාණන් තුළ ඇති කරන දේව අනුග්‍රහය ව්‍යවස්ථාවට වඩා තේජසින් පැමිණෙන බවත් දන්වා සිටින්නේ ය.

- තේජසින් පැමිණෙන ව්‍යවස්ථාව නොදකින පිණිස ඉශ්‍රායෙල් සෙනගට වැස්මකින් මුහුණ ආවරණය කරගන්නට සිදුවුවත් නව ගිවිසුමේ ජනතාවක් වශයෙන් ස්වාමීන් වහන්සේ වෙත හැරීම හේතුකොටගෙන එම ආවරණය ඉවත්කෙරෙන බව පවසන පාවුළු තුමා ස්වාමීන් වහන්සේගේ ආත්මයාණන් කරණකොටගෙන, නිදහසක්, දේව අනුග්‍රහය කරණකොටගෙන ජීවනයත් ලැබෙන බව අවධාරණය කරයි.

- මෙසේ ආත්මයාණන් කරණකොටගෙන ලැබෙන දේව අනුග්‍රහය තුළ, ව්‍යවස්ථාවෙන් නිදහස්ව නව ජීවනය අත්දකින්නේ ය.

- නිදහස් පුද්ගලයෙක් වශයෙන් ක්‍රිස්තුස් වහන්සේව හඳුනා ගන්නට, අප ආධ්‍යාත්මික වශයෙන් විවෘත විය යුතුය. ඒ සඳහා මාංශික තෘෂ්ණා වලට ගැති නොවී ජීවත් විය යුතුය.

- මේ සියල්ල පැමිණෙන්නේ දෙවියන් වහන්සේගෙන් ය. දෙවියන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේ කරණකොටගෙන පාපයෙන් පරාජයවූ අප සැම තමන් වහන්සේ හා සමගි කරගත්සේක. සමගි කිරිමේ සේවය මිනිසාට පැවැරු සේක.

- ක්‍රිස්තුස් වහන්සේගේ සමගි කිරීමේ සේවය ලත් අපි, ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් දූන් සමගි කිරිමේ සේවය සඳහා තානාපතියන් වෙමු.

- දෙවියන් වහන්සේ, පාපය නොදත් ක්‍රිස්තුස් වහන්සේ මිනිසා උදෙසා මනුෂ්‍ය පාපි බව හා සමවිමට සැලැසුයේ, මනුෂ්‍යයන් ධර්මිෂ්ඨ කරනු සඳහා ය යනුවෙන් සඳහන් කරන පාවුළු තුමා එසේ ලැබූ නව ජිවනයේ, සේවයේ දීමනාව අපතේ නොහරින ලෙස ආයවනාකරයි.

## 1.2.2.3.2. කිතුනු වටිනාකම්

### i පරිත්‍යාගිශිලීවීම 2 කොරින්ති 8/1-9/15

- ජෙරුසලෙම් සභාව සඳහා සම්මාදම් ලබා දිමේ පරිත්‍යාගිශිලි ක්‍රියාව හඳුන්වා දෙන පාවුළු තුමා, ඉතා දිළිඳු වුවත් මසිදෝනියාවේ සභාව කළ පරිත්‍යාගයන් පැසැසුම් මුඛයෙන් කථා කරයි.

- එසේම ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසියේ මරණය තුළ පෙන්වා දුන් සැබෑ ත්‍යාගිවන්ත කම සිහිගන්වමින්, සැබෑ කිතුනු ක්‍රියාකාරි ඇදහිල්ල යනු, අන්‍යයන්ගේ ජිවිත ගොඩ නැගුමට, ඔවුන් වෙත ත්‍යාගිශිලිවීම තුළින් අවධාරණය කරයි.

- ''සම්මාදම'' එකමුතුකමේ සහ බෙදාගැනීමේ ලකුණක් ලෙස පෙන්වා දෙමින් මසිදෝනිවරුන් ආදර්ශයට ගෙන, ආධාර එකතුකිරිමට කොරින්ති වරුන් ගන්නා උත්සාහයය, කිසි විටෙක අසාර්ථක වන්නට ඉඩ නොදෙන ලෙසත්, එසේ වූවොත් තමා ලජ්ජාවට පත්විය හැකි හෙයින් ඒ ගැන අවධානය යොමු කරන ලෙසත් පාවුළු තුමා ඉල්ලා සිටිය හ.

- ''සතුටු සිතින් දෙන්නාට දෙවියන් වහන්සේ ප්‍රේම කරන සේක'' යනුවෙන් ත්‍යාගශිලීභාවයේ ප්‍රතිඵල ගැන පැහැදිලි කරමින් වපුරන්නාට බීජ ද, කැමට ආහාර ද සපයා දෙන දෙවියන් වහන්සේ ඔබට බීජ සපයා දී ඒවා වැඩෙන්නට සලස්වා ඔබගේ ත්‍යාගශිලි බවේ අස්වැන්න සරුසාර කරන සේක යයි කියයි. (9/10)

- මසිදෝනිවරුන්ට නිර්ලෝභි ලෙස දීමනා පරිත්‍යාග කිරීමට පෙළඹවූ දෙවියන් වහන්සේගේ කරුණාව කොරින්තිවරුන් හට ද. පරිත්‍යාගිශිලිව ක්‍රියා කිරීමට මග සලසනු ඇත යනුවෙන් ආශිංසනයක් ද කරයි.

### ii වැරදිකරුට සමාව
### 2 කොරින්ති 2/ 5 - 10

- තමා හා මහත් සිත් තැවුලක් ඇති කළ තම පාඨකයන් නිසා තමාට ඇතිවූ තද වේදනාව ගැන කරුණු පැහැදිලි කරන ශුද්ධවූ පාවුළු තුමා, අප සංසයන්හි කිසිවෙකු වෙනත් කෙනෙකු වෙත දුක් වේදනාවක් හෝ සිත් තැවුලක් දුන්නොත්, එම තැනැත්තා කළ වරද උලුප්පා දක්වමින් ඔහුව අධිකතර ශෝකයට පත්කරනවා වෙනුවට ඔහුට කමාවීම හා යහපත කිරීමට ධෛර්යය දීම නියම යුතුකම බව පෙන්වා දෙයි.
- අප සංසයන්හි සිටින වරද කරන්නන්ට අප සැබවින්ම ප්‍රේම කරන බව සහතික කරනු සඳහා, ඔවුනට කමා විය යුතු බවත්, එසේ කළ යුත්තේ, සාතන්ගේ උපායට හසුවී පරාජය නොවන පිණිසත් ක්‍රිස්තුස් වහන්සේ අබිමුවෙහි ජය ගන්නා පිණිසත්, කළ යුතු බව පාවුළු තුමා අවධාරණය කරයි.

### iii නොගැලපෙන සබඳතා වලින් වැලකීම
**2 කොරින්ති 6/14-7/1**

- බැලූ බැල්මට මෙම කොටසින් පාවුළු තුමා කොරින්ති වරුනට, තමාගේ විරුද්ධවාදීන් හා ආශ්‍රය කිරීමට එදිරිව, කරන අනතුරු හැඟවීමක් හෝ, නොඑසේ නම් අභක්තිකයන්ගෙන් හා මිසදිටුවන්ගෙන් ප්‍රවේසම් වීමට අවවාදයක් දීම පිළිබඳව සිතිය හැකි වූවත්, මෙය කොරින්ති වරුන් කෙරෙහි පාවුළු තුමා තැබූ විශ්වාසය පිළිබඳව රෙකමදාරුවක් බව එතුමන්ගේ ගැඹුරු දේව ධාර්මික දැක්ම තුළින් පැහැදිලි කර ගත හැක.

- කිතුනුවන් දෙවියන් වහන්සේගේ මන්දීරයන් වන බවත්, එම මන්දීර තුළ දෙවියන් වහන්සේ ගැවසෙමින්, එම මාලිගයන් තුළ වැඩ වසන බවත් පවසන ශුද්ධවූ පාවුළු තුමා, ඔවුන්ට පුරාණ ගිවිසුමේ දේව ජනතාව හා දෙවිඳුන් අතර සබඳතාවය ගිවිසුම් වගන්තිය මගින් (2 කොරින්ති 6/16) අවධාරණයකරමින් බහු දේව වාදි ඇදහිලි වලින් වෙන්වී සිටින්නටත්, එවැනි දේ ස්පර්ශ කිරීමෙන් වැලකී සිටින්නටත් අවවාද කරයි.

- පාවුළු තුමාගේ එම අවවාදය පිළිගෙන සිත කය කෙළෙසන, සියලු දෙයින් වැළකි, තම තමන්ම පවිත්‍ර කරගනිමින් දේව ගරුබිය ඇතිව, ශුද්ධවන්තකම පරිපූර්ණ කරගන්නා කොරින්තිවරුන්ව දෙවිඳාණෝ දූ පුතුන් ලෙස භාරගන්නා බව පවසමින් නැවතත් ගිවිසුම් සංකල්පය තුළ දිවැසිවරු දෙසූ පිය පුතු සම්බන්ධතාවය පැහැදිලි කරදෙයි.

## 1.2.2.4. ගලාතිවරුනට ලියන ලද ලිපිය

ක්‍රියා පොතෙහි සඳහන් කරන ආකාරයට පාවුළු තුමාගේ පළමු ධර්මදූත ගමනේ දි රෝම ප්‍රාන්තයක්වූ ගලාතියෙහිදි විජාතිකයන්ව සභාවට ඇතුළු කරගැනීම සඳහා කළ සාකච්ඡාවක ප්‍රතිඵලයක් ලෙසින් මෙම සභාව ස්ථාපිත කළා යයි කිව හැක.

මෙම ලිපිය කවරදා කාහට ලියන ලද්දේදැයි නිශ්චිතව කිව නොහැක. එහෙත් මෙම ගමන සහනාධාර හා දීමනා රැගෙන ගිය ගමනක්බව ඇතැමෙක් කරුණු දක්වති. රෝම ප්‍රාන්තයක් වූ ගලාතියෙහි පාවුලු ආරම්භ කළ සභාවන් පිළිබඳව තමාට ඇයි වගකිම නිසා, මෙසේ සහනාධාර බෙදීමට ගිය ගමනේ දී තමාගෙන ආ සත්‍යවූ සුබාරංචියට විරුද්ධවාදින්ගෙන් පැමිණි ප්‍රතික්ෂේප කිරිම් වළක්වනු පිණිස, මෙම ගලාති ලිපිය ලියා ඇති බව පිළිගත හැකිය.

මෙම හසුනෙහි මූලික පරමාර්ථය වන්නේ ගලාතියේ කිතුනුවන් ව්‍යාජ සුබාරංචියක් වෙත යෑම වළක්වාලීමයි. එකල කිතුනු ඇදහිල්ල පිළිගත් විජාතික පුරුෂයන් මෝසස්ගේ ව්‍යවස්ථාව අනුව චර්මච්ඡේදනය ලැබිය යුතු බවත්, ජුදෙව්වරුන් නොවැළඳූ සමහර ආහාර කිතු දහම පිළිගත්, විජාතිකයන් විසින් ද ආහාරයට නොගතයුතු බවත් කියන, ජුදෙව් ආගමික නීති හා වත්පිළිවෙත් අකුරටම පිළිපැදිය යුතු බැව් කියන ඉගැන්වීම තරයේ හෙළා දකිමින් ඊට ප්‍රති විරෝධිව, දෙවියන් වහන්සේ විසින් දෙනු ලබන නිදහස් දිමනාව, එසේ මනුෂ්‍ය විර්යයෙන් ලැබිය හැකි දෙයකට පරිවර්තනය නොකළ යුතුය යන අදහස ස්ථිර කිරිමට පාවුළු තුමා උත්සාහ කළේ ය.

- ක්‍රිස්තුස් වහන්සේ තුළ ඇදහිල්ල කරණකොටගෙන දෙන දීමනාව ගැලවීම යි.
- ගැලවීම පිළිගන්නා තැනැත්තා දේව දරුකමේ උරුමය ලබයි.
  ගැලවීම දෙවියන් වහන්සේගන් ලබන ත්‍යාගයක් මිස මනුෂ්‍ය උත්සාහයෙන් දිනා ගත හැකි දෙයක් නොවේ.
- ගැලවීම යනු කිතුනු නිදහසෙහි පදනම හා උල්පත වේ.
- ගැලවීම ව්‍යවස්ථාව පිළිපැදිමෙන් අත්කර ගත නොහැක.

මෙම හසුනෙහි අඩංගුවී ඇති අන්තර්ගතය මෙසේ දැක්විය හැක.

| | | | |
|---|---|---|---|
| I | පෙරවදන | - | 1/1-10 |
| ii | ප්‍රේරිතයෙකු ලෙස පාවුළුගේ අධිකාරි බලය | - | 1/11-2/21 |

iii දේව වරප්‍රසාදයේ සුබ අස්න - 3/1 - 4/31
iv කිතුනු නිදහස සහ වගකීම - 5/1 - 6/10
v අවසානය - 6/11-18

## 1.2.2.4.1. ප්‍රධාන තේමා

### i ඇදහිල්ල

**ගලාති 3/1- 14**

- ශුද්ධවූ පාවුලු තුමා, ගලාති වරුන්ගෙන්, ඔවුන් දේව සබඳතාවයට පැමිණුනේ ආත්මයාණන් නිසා ද? නැතහොත් ව්‍යවස්ථාව නිසා ද? යන්න ප්‍රශ්න කරමින් තම තර්කය ගොඩ නඟන්නේ ය.

- ආබ්‍රහම් ආදර්ශයක් ලෙස ඉදිරිපත් කරමින් (උත්පත්ති 12/1-6) ආබ්‍රහම් දේව සබඳතාවයට පත්වුයේ, ව්‍යවස්ථාව හේතුකොටගෙන නොව, දෙවියන් වහන්සේ වෙත ඇති ඇදහිල්ල කරණකොටගෙන බව, පෙන්වා දෙයි.

- ආබ්‍රහම් මෙන්ම ඔහුගේ පුත්‍රයන් ද, දේව ආශිර්වාදය ලැබ දේව සබඳතාවයට පැමිණුන හ.එසේම ආබ්‍රහම් අනුගමනය කළ, දෙවියන් වහන්සේ කෙරෙහි ඇදහිල්ල ඇති කරගත් අන්‍ය ජාතිහුද, ඇදහිල්ලෙහි පිහිටි ආබ්‍රහම් සමගම ආශිර්වාද ලබන බවයි කල් මත්තෙන් ප්‍රකාශ කළ ''ඔබ තුළ සියලුම ජාතිහු ආශිර්වාද ලබන්නේ ය'' යන වගන්තියෙන් පැහැදිලි කෙරුනේ.

- එහෙත් ව්‍යවස්ථාව කෙරෙහි පමණක් විශ්වාසය තබන්නා, එය සම්පූර්ණයෙන්ම පිළිපැදිය නොහැකි නිසා, ව්‍යවස්ථාවේ කොන්දේසි කඩ කරන සැම අවස්ථාවකදීම වරදකරුබවට පත්වන බව පාවුළු තුමා පෙන්වා දෙයි.

- ගැලවීම සම්බන්ධවූ පොරොන්දුව, ව්‍යවස්ථාව ඒමට ප්‍රථමයෙන් දී ඇති නිසා ව්‍යවස්ථාව ගැලවීම සම්බන්ධයෙන් අවශ්‍ය නැත. මක්නිසාදයත් පොරොන්දුව ආබ්‍රහම් සමග ක්‍රියාත්මක වූයේත්, මතුවට ක්‍රියාත්මක වන්නේත් ඇදහිල්ල හේතුකොටගෙන ය.

**ගලාති 3/ 26 - 29**

- බෞතිස්ම ස්නාපනය තුළින් අප සියල්ලෝම එකම පැවැත්මක් ලබන බව ගලාතිවරුන්ට පාවුළු තුමා ඉතා තදින්ම පවසන්නේ ය. ජුදා හෝ විජාතික හෝ චර්මඡේදිත හෝ අචර්මඡේදිත හෝ කියා කිසිවෙක් වෙන් නොකෙරෙන බවත්, එකම ඇදහිල්ල තුළ එසේ වන්නේ, ක්‍රිස්තුස් වහන්සේ තුළ ඔවුන් සියල්ලන් දෙවියන් වහන්සේගේ පුත්‍රයන් වන නිසා බවත්, පැහැදිලි කරමින් ය.

- එම නිසා ඔවුන් සියල්ලන් අතර, ග්‍රීක ජුදෙව් භේදයක්, දාස නිර්දාස භේදයක් මිනිස් මට්ටමෙන් තිබුණත්, ඔවුන්ට එක හා සමාන ගරුත්වයක් හා දේව පොරොන්දුවට උරුමයක් ඇති බව පෙන්වා දෙන පාවුළු තුමා එය දේව දරුවන් වීම නිසා ලැබී ඇති ප්‍රතිලාභයක් ලෙස දක්වාලයි.

### ii ආත්මයාණන්ගේ මගපෙන්වීම

- ක්‍රියා පොතේ මෙන්ම පාවුළු තුමාගේ ලිපි වල ද බෙහෙවින් දක්නට ලැබෙන මෙම තේමාව, එනම් ආත්මයාණන්ගේ මගපෙන්වීම ලැබීම, කිතුනු දූත සේවාවන් සඳහා අත්‍යවශ්‍ය ත්‍යාගයක් ලබා දෙන මාර්ගයක් ලෙස පෙන්වා දෙයි. එසේම පරම්පරාවෙන් පරම්පරාවට කිතුනුවන් පණගන්වන්නට ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ බලයත්. ජීවමාන වැඩ සිටීමත් අත්දකින්නට අවස්ථාව ලබා දෙන්නේ සැනසිලි දායකයාණන් වූ ආත්මයාණෝ ය.

- පාවුළු තුමා තම චින්තනය තුළ ඉහත දැක්වූ අදහසට නවදැක්මක් ඉදිරිපත් කරමින් ''මාංශය'' හා ''ආත්මයාණන්'' අතර ඇති ප්‍රභේදය උලුප්පා දක්වයි. මේ අනුවය ගලාති 5/16-26 කොටස විස්තර කෙරෙන්නේ.

**ගලාති 5/ 16 - 25**

- ආත්මයාණන්ගේ මගපෙන්වීම ඇතිව හැසිරෙන්නා මාංශික තෘෂ්ණාවලින් වසඟ නොවේ.
- ආත්මයාණන් වහන්සේගේ මගපෙන්වීම ලබන තැනැත්තා ව්‍යවස්ථාවට යටත් නොවූ නිදහස් පුද්ගලයෙකු වෙයි.
- ආත්මයාණන්ගේ මගපෙන්වීම ලැබීම කරණකොටගෙන, ප්‍රේමය, ප්‍රීතිය, සාමය, ඉවසීම, කරුණාව, යහපත්කම විශ්වාසකම මෘදුකම හා ආත්ම දමනය යන ප්‍රතිඵල හෙවත් ඵල දොළසක් ලැබේ.
- ආත්මයාණන්ගේ මග පෙන්වීම ලබන්නා ආත්මයාණන් කරණකොටගෙන ජීවත් වෙයි. හෙතෙම නිෂ්ඵල පාරට්ටු නොකිරීමට ද, එකිනෙකා කෝප නොකිරීමට ද එකිනෙකාට ඊර්ෂ්‍යයා නොකිරීමට ද පෙළඹෙයි.
- ආත්මයාණන්ගේ මගපෙන්වීම ලබන්නෝ, එනම් ක්‍රිස්තුස් වහන්සේට අයිති අය, තම තමන් තුළ ඇති, රාග ක්ලේෂ වැනි මාංශික තෘෂ්ණා, කුරුසියෙහි ඇණ ගසන්නෝ ය.

## iii ව්‍යවස්ථාව

පුරාණ ගිවිසුමේ දී ව්‍යවස්ථාව, දැමිටු බව ලැබීමේ මාර්ගයක් හෝ ගැලවීමේ මාර්ගයක් ලෙස, ගිවිසුම් සංකල්පය තුළ අර්ථකථනය කළ හ. පාවුළු තුමාගේ ඉගැන්වීම් අනුව ව්‍යවස්ථාව, ගැලවීමේ මාර්ගයක් ලෙස කිසිවිටෙකත් නොසළකන ලදි. පාවුළුතුමා පෙන්වා දෙන පරිදි ව්‍යවස්ථාවේ කාර්යය වූයේ, ක්‍රිස්තුස් වහන්සේගේ පැමිණීම තෙක්, තාවකාලික සේවාවක් ඉටුකිරීම පමණකි. ව්‍යවස්ථාව මැදහත් කරුවකු අතින් දෙනු ලැබූවකි. පොරොන්දුව දෙවියන් වහන්සේ විසින්ම දෙනු ලැබූවකී. මෙම පදනම යටතේ ය, පාවුළුතුමා ව්‍යවස්ථාව යන තේමාව ගලාති ලිපිය තුළ විස්තර කරන්නේ ය.

**ගලාති 3:15-19**

- මෙම පාඨයන් පාවුළු තුමා දේව අනුග්‍රහය හා ව්‍යවස්ථාව අතර සම්බන්ධතාවය පෙන්වා දෙන්නට ඉදිරිපත් කරන්නේ ආබ්‍රහම්ට වූ පොරොන්දු හා මෝසස්ට දුන් ව්‍යවස්ථාව අනුව ය.
- දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට වූ පොරොන්දුව වූයේ දේශය (පොරොන්දු දේශය ස්වර්ගීය ජෙරුසලම) හා වංශය ය. (දේව ජනතාව/ ඒදන් උයනේ දී ප්‍රකාශ කළ ඇගේ වංශය උත්පත්ති 3:15 / ක්‍රිස්තුන් වහන්සේ ය. රෝම 4/10).
- මෝසස්ට ව්‍යවස්ථාව දුන්නේ ආබ්‍රහම්ට පොරොන්දුව වී අවුරුදු 430 කට පමණ පසු ය. ඒ ගිවිසුම මගින් ඊට කලින් දෙවියන් වහන්සේ දුන් පොරොන්දු කිසිවිටකත් නිෂ්ප්‍රභා නො වීය.
- මෝසස්ට දුන් ව්‍යවස්ථාවේ පරමාර්ථය වුයේ, පොරොන්දුව පරිදි ජේසුස් වහන්සේ පැමිණෙන තෙක් දේව ජනතාවට මාර්ගෝපදේශකයකු කිරීමට ය. දේව සබඳතාවය ගොඩ නැගීම සඳහා අත්වැලක් වීමට ය.
- ක්‍රිස්තුන් වහන්සේගේ පැමිණීමෙන් පසු දේව සබඳතාවය ගොඩ නැගීම සඳහා ව්‍යවස්ථාවක් අවශ්‍ය නො විය.
- එසේ අවැසි වූ දේව සබඳතාවය, කුරුසියේ මරණය මගින්, ව්‍යවස්ථාවේ ශාපයෙන් අප මුදා ක්‍රිස්තුන් වහන්සේ විසින් අපට දිනා දුන් සේක.

**ගලාති 4/21 - 30**

- ව්‍යවස්ථාව ගැන ගලාතිවරුන් තුළ ඇති පටු ආකල්පය නැති කරන්නට පාවුළු තුමා ඉදිරිපත් කරන්නේ සාරා සහ ඊසාක් ද. හාගර් හා ඉශ්මායිල් ද යන රූපක දෙකකි. හාගර් හා ඉශ්මායිල් ව්‍යවස්ථාවට වහල්වීම දක්වන අතර, සාරා හා ඊසාක් නිදහස පෙන්නුම් කරයි.

- මේ බව වැඩි දුරට විස්තර කරන පාවුළු තුමා සීනයි කන්දේ දී දෙනු ලැබූ ව්‍යවස්ථාවෙන් මනුෂ්‍යයා වහල් කමට පත්වන බවත්, හාගර්ගෙන් පැවත එන දරුවන් වහල්කම හිමිකර ගන්නා ලෙසම, ව්‍යවස්ථාව පිළිපැදිම හේතුකොටගෙන දේව පිළිගැනීම ලැබේ යයි අපේක්ෂා කරන ජුදෙව් පිළිවෙත් වලින් ද, සිදුවන්නේ, දේව දරුකමේ ලැබීම නොව ව්‍යවස්ථාව වහල්වීම බව පැහැදිලි කරයි.

- නිවහල් ස්ත්‍රියගේ හෙවත් සාරාගේ පුතා, උපත ලැබුවේ දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට වූ පොරොන්දුව මත මිස, මාංශික ලෙස නොවන බව පෙන්වා දෙන පාවුළු තුමා, සාරාගේ පුතා ව්‍යවස්ථාවෙන් බැහැරවූ නිදහස් පුත්‍රයෙකු වන බවත්, සීනයි ගිවිසුමෙන් හෙවත් හාගර්ගෙන් උපන් දරුවන් දාස කමෙහි ද, ස්වර්ගීය ජෙරුසලෙමෙන් හෙවත් සාරාගෙන් උපන් දරුවන් දේව පුත්‍රකමේ ද උරුමය ලබන බවත් පැහැදිලි කරයි.

- එකල මෙන්, මෙ කළද, ස්වභාවිකව හෙවත් මාංශික උපත ගත් දරුවන් ආත්මයාණන්ගෙන් උපත ලත් දරුවන්ට කරන පීඩා හේතුකොට ගෙන, වහල් ස්ත්‍රියත් ඇගේ පුත්‍රයාත් පන්නා දමා නිවහල් ස්ත්‍රියට හා පුත්‍රයාට සැබෑ උරුමය ලබාදෙන බව පවසන පාවුළු තුමා ගලාතියේ කිතුනුවන් ඊසාක් මෙන් නිවහල් ස්ත්‍රියගේ පොරොන්දුවේ දරුවන් නිසා උරුමය ලබන බව පැහැදිලි කරදෙයි. එසේම එම නිදහස් දරුවන් වීම ගැන ගලාතිවරුන් ප්‍රීති සන්තෝෂ විය යුතු බව ද අවධාරණය කරයි.

### iv ගැළවීමේ විශ්ව ව්‍යාප්ත බව

- ගැළවීම වනාහි ඇහිල්ල කරණකොටගෙන, ලැබිය හැකිවූ දෙවියන් වහන්සේගේ නිදහස් දීමනාවකි.

- පුරාණ ගිවිසුමේ දි මෝසස් පිත්තල සර්පයා ඔසවා ඊශ්‍රායෙල් ජනතාවට මරණයේ සෙවණැල්ලෙන් ගැලවිම ලබා දෙන්නටම මැදහත් කාරයකු වූවාසේ, කුරුසියෙහි ඇණ ගසන ලද ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මැදහත්කාරයෙකු නොව තමන් වහන්සේගේම ජීවිත යාගය තුළ සකල මිනිස් සංහතියට ගැළවිම උදාකළ බව පෙන්වා දෙන පාවුළු තුමා අඥාන අය මෙන් තව දුරටත් ව්‍යවස්ථාව තුළින් ගැළවිම ලබන්නට නොසිතා, ආත්මයාණන්ගේ මෙහෙයවිම අනුව සුබ අස්නේ පණිවුඩය අසා එය අදහාගෙන ගැළවීම ලබන්නට කියා අවවාද කරයි.

## 1.2.2.4.2. කිතුනු වටිනාකම්

### i **කිතුනු නිදහස** ගලාති 5/1 - 5/26

ගලාතිවරුන් ව්‍යාජ සුබාරංචියෙන් වළකාවාලනු සඳහා මෙම කෘතිය ඉදිරිපත් කරන පාවුළු තුමා කිතුනුවාගේ සැබෑ නිදහස යනු කුමක්දැයි පැහැදිලි කරන්නේ ය. ගලාතිවරුන් සුබාරංචිය අදහාගනු වෙනුවට, ව්‍යවස්ථාව කර පින්නාගෙන එහි වහලුන් බවට පත්වි සිටිම, ගැන, ගලාතිවරුන්ට චෝදනා කරන පාවුළු තුමා කිතුනුවකු ලෙස නිදහස ලැබීමට නම්:

i පාපයේ වහල්කමින් මිදී ලැබිය යුතු නිදහසත්
ii ක්‍රිස්තුස් වහන්සේ තුළ අත් කරගත්, විශ්වීය නිදහසත්
iii ක්‍රිස්තුස් වහන්සේ තුළ නොමිලයේ ප්‍රදානය කරන දෙවියන් වහන්සේ පොරොන්දුවූ නිදහසත් අවබෝධ කරගැනීම අත්කර ගතයුතු බව අවධාරණය කරයි.

- ක්‍රිස්තුස් වහන්සේ කිතුනුවා මුදාගත්තේ නිදහස් කම ඇතුව සිටීමට ය. එම නිසා දාසකම නැමැති වියගහට නැවත වරක් යටත් නොවී ස්ථිරව සිටිය යුතුය.
- කිතුනුවා නිදහස් කමට කැඳවනු ලැබූ නිසා, එම නිදහස මාංශික තෘෂ්ණා සඳහා වැය නොකොට, ප්‍රේමයෙන් සේවය කළ යුතුය.

ii **අන්‍යෝන්‍ය ආධාර** ගලාති 6/1 - 10

- පාවුළු තුමා මෙම තේමාව මගින් අවධාරණය කරන්නේ, ලෞකික ආධාරයන් වන කෑම බීම ඉඳුම් හිටුම් හෝ මුදල් හදල් නොව, ආධ්‍යාත්මික වර්ධනයක් සඳහා කෙනෙකු විසින් වෙනත් පුද්ගලයෙකු හෝ සංඝයකට හෝ දිය යුතු උපකාරයයි, පිටිවහලයි. මූලිකව එය කිතුනුවකු සතු වගකීමකි. මෙම අදහස පෙරදැරි කරගෙනය පාවුළු තුමා ගලාතිවරුන්ට ආමන්ත්‍රණය කරන්නේ.
- වෙනත් අවස්ථාවකදි අඥාන ගලාතිවරුන් යයි ඇමැතුවත්, පාවුළු තුමා පරිණත කිතුණු පිරිසක් අමතන අකාරයට මෙහිදි ගලාති වරුන්ව අමතන ලබයි. එමනිසා ඔවුන් ලබා ඇති ශුද්ධාත්ම දායාදය එනම් ආත්මයාණන්ගේ මෙහෙය වීමට නතුවීම හේතුකොටගෙන, යම් කෙනෙකු වරදක් කරනු දුටුවොත්, ඔහුව මෘදු කමින් හරවා ගැනීමේ වගකීම මතක් කර දෙයි. මෙය (මතෙව් 18/15-18, ජාකොබ් 5/19-20) හා සම්බන්ධය.

- මේ සඳහා කිතුනුවා විසින් කළ යුත්තේ, පළමුව පරීක්ෂාවට නොවැටෙන ලෙස ප්‍රවේසම් වීමයි. දෙවනුව, මෝසස්ගේ ව්‍යවස්ථාවෙන් නිදහස්ව ක්‍රිස්තුස් වහන්සේගේ ආඥාවට යටත් වීමයි. ක්‍රිස්තුස් වහන්සේගේ වහලෙකු වීමයි. (1 කොරින්ති 7/22) ක්‍රිස්තුස් වහන්සේ තුළවූ ජීවනදායක ආත්මයාණන්ගේ ආධ්‍යාත්මික ප්‍රතිපත්ති අනුව ක්‍රියා කිරීමයි. (රෝම 5/2) යනුවෙන් පාවුළු තුමා අවවාද කරයි.

- එවන් පරිණත කිතුනුවනට, කෙනෙකු සඳහා කළයුතු අන්‍යෝන්‍ය ආධාරය, අවධාරණය කරමින් එක් එක් පුද්ගලයා අන්‍යයන් වෙනුවෙන් ඉසිලිය හැකි හා ඉසිලිය යුතු බර පිළිබඳව පැහැදිලි කරයි. ''ධර්ම වාක්‍ය ඉගෙන ගන්නා උගන්වන්නාට, තමා සතු සියලු දෙයින් සංග්‍රහ කෙරේවා'' යනුවෙන්, දහම දෙසන සැමදෙනාම ප්‍රේමය මල්ඵල ගන්වන්නට හැකි සෑම ප්‍රායෝගික ක්‍රියාකාරකමකට සහභාගිවියයුතු බව අවධාරණය කරමින් කිතුනුවා ඉඩ ප්‍රස්ථා ඇති හැටියට සියල්ලන්ටම, ප්‍රධානකොට ඇදහිලිවන්තයන්ගේ පවුලට අයිතිවූ සැමට යහපත කළ යුතු බව කියයි.

## 1.2.2.5. එපිසි වරුනට ලියන ලද ලිපිය

දේව ධාර්මික ගැඹුර ලෙහෙසියෙන් අවබෝධ කරගත නොහැකිවුත්, එහි අන්තර්ගතයෙන් අනාවරණය කරන සිතැඟියාවන් රසවිඳ අවසන් කළ නොහැකිවුත්, සැබවින්ම අද්විතීය ලිපියකි. එපිස හසුන. මෙම හසුන ගැන වඩාත් හොඳ පැහැදිලි කිරීමක් කරන්නේ නම්, එය ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ අභිරහස ද, මුළු මැවිල්ලම ක්‍රිස්තුස් වහන්සේ තුළ ඒකරාශි කිරීම ද, පැහැදිලි කරන, වඩාත් සවිස්තර ලෙස මෙනෙහි කළ හැකි හසුනක් ලෙසට පැහැදිලි නිගමනය කළ හැක.

මෙම හසුන මගින්, ක්‍රිස්තුස් වහන්සේ සමග එක්සත්වීම, කරණකොටගෙන, මනුෂ්‍ය වර්ගයාගේ ඒකත්වය අත්දකිනු පිණිස එකිනෙකා තම, තමන්ගේ ජීවිත හැඩ ගස්වා ගන්නා ලෙස පාඨකයන් වෙත කරන ආරාධනායක් ඉදිරිපත් කරයි.

වෙනත් හසුන්වල මෙන්, පාවුළු තුමා සභාව තුළ පැන නැගුණු විශේෂ ගැටළු හෝ අර්බුදකාරී අවස්ථාවන් ගැන මෙහි සඳහන් නොකරයි.

එහෙත් ක්‍රිස්තුස් වහන්සේ සමග සබඳතාවය නිසා දේව ජනතාවගේ එකමුතුවීම පෙන්වනු පිණිස පාවුළු තුමා මෙම හසුනෙහි රූපක කිහිපයක් උපයෝගි කරගෙන ඇත. සභාව මිනිස් දේහයකි. එහි හිස හෙවත් ශිර්ෂය ක්‍රිස්තුස් වහන්සේ ය. සභාව ගොඩ නැගිල්ලකි. එහි මුල්ගල ක්‍රිස්තුස් වහන්සේ ය. සභාව බිරිඳකි.

ඇගේ සැමියා ක්‍රිස්තුස් වහන්සේ ය. ක්‍රිස්තුස් වහන්සේ මගින් දේව ජනතාව හිමිකරගත් දේව වරප්‍රසාදය පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීමේ වචන මාලාව අතිශයින් සාර්ථක ය

ක්‍රියා පොතේ 18/ 19-21 හිදි සඳහන් වන අන්දමට, පාවුළු තුමා තම දෙවන ධර්මදූත චාරිකාවේ දි එපිසීයට පළමුවරට සුබාරංචිය ගෙන ආවේ ය යන අදහස, වෙත පාඨකයාව යොමු කරන්නේ ය. එපිස හසුනෙහි කතුවරයා පාවුළු ලෙස මුල් අවධියෙහි සිට පිළිගෙන තිබුණි. එනමුත් නූතන විශාරදයන් මෙම හසුනෙහි කර්තෘත්වය කෙරෙහි විවිධ මත පළ කරති. කොලොස්සි හසුනෙහි අඩංගු වචන වලින් තුනෙන් එකක් පමණ එපීස ලිපියෙහි සඳහන්වී තිබීම ද, එම කොලොස්සි හා එපීස ලිපිය පාවුළු තුමාගේ අනෙකුත් හසුන් වලට වඩා බෙහෙවින් වෙනස් වීම ද, සලකා බලා, මෙම එපීස ලිපිය පාවුළු තුමාගේ ගෝලයෙකු විසින් ලියන්නට ඇතැයි නිගමනය කර ඇත.

## එපිසි ලිපියෙහි අන්තර්ගතය මෙසේ සැකිල්ලක් වශයෙන් දැක්විය හැක.

**i** **හැඳින්වීම** **: ආරම්භක ආචාරය** **(1/1-2)**
**ii** **1 වන කොටස** **: ධාර්මික කරුණු** **(1/3 - 3/21)**

ජුදෙව්වරුන් හා විජාතීන් මනුෂ්‍යත්වයේ නව සහෝදරත්වයකට, හිසවූ ක්‍රිස්තුස් වහන්සේ විසින් වැළඳගන්නා දෙවියන් වහන්සේගේ අභිරහස්‍යම සැලැස්ම

(අ) ආරම්භක ගීතිකාව
ක්‍රිස්තුස් වහන්සේගේ ආධ්‍යාත්මික ආශිර්වාදය (1/3-14)

(ආ) ජුදෙව්වරුන් හා අන්‍යජාතිකයන් පසුතැවිලිවි
ක්‍රිස්තුස් වහන්සේ තුළ ඒකාබද්ධ කරනු ලැබූ,
සභාවට ප්‍රකාශ කරන ලද අභිරහස (1/15 - 2/22)

(ඇ) අභිරහස ලොවට ප්‍රකාශ කළ, පාවුළුගේ භූමිකාව (3/1 -13)

(ඈ) පාවුළු තුමාගේ යැදුම (3/14 -22)

### iii 2 වන කොටස : කිතුනු ජිවිත පැවැත්ම (4/1 - 6/17)

(අ) සාමාන්‍ය ප්‍රතිපත්ති (4/1-5/20)

i ක්‍රිස්තු දේහයේ ඒකත්වය සහ වර්ධනය (4/1-16)
ii නව මිනිසකු වන්නට අවැසි ආධ්‍යාත්මික නවෝදය (4/12 - 5/20)

(ආ) ක්‍රිස්තියානි නිවෙස් සඳහා අයැදුම (5/21 - 6/9)
(ඇ) ක්‍රිස්තියානි යුද්ධායුධ (6/10 -17)

**iv** අවසානය (6/18 - 24)

## 1.2.2.5.1. ප්‍රධාන තේමා

## i ක්‍රිස්තුන් වහන්සේ තුළ ඒකත්වය හා සාමුහිකත්වය
**එපිස 1/3-10**

ජේසුස් වහන්සේ තුළ, උසස් කරනු ලබන්නට, දේව ජනතාවක් වශයෙන් අප හැම තෝරා පත් කර ඇත්තේ, ලෝකය මැවීමටත් පෙර, දෙවියන් තුළ තිබූ දේව සැලැස්ම අනුව ය.එම දේව සැලැස්ම අනුව අප හැම තෝරා ගනු ලැබුයේ ප්‍රේමයෙන් උන්වහන්සේ ඉදිරියෙහි, අපසැම ශුද්ධව හා නොකැළැල්ව සිටින පිණිස ය.එවන් වරප්‍රසාද සම්පතක් අපට ලැබෙන්නේ, සියලුම පාපයන්ගෙන් මිදීමත්, පව් කමාවත් ලබා දීම සඳහා ක්‍රිස්තුන් වහන්සේ විසින් කුරුසිය මත සිය දිවි පිදීම කරණකොටගෙන ය.මෙම දේව ක්‍රියාවලියේ අරමුණ වන්නේ නියමිත කාලයේ දී ක්‍රිස්තුන් වහන්සේ තුළ, ස්වර්ගයෙහිත් පොළොවෙහිත් මුළු විශ්වයෙත් සියල්ලන් එක්සත් කරනු ලැබීම ය.

**එපීස 2/11-22**

ක්‍රිස්තුන් වහන්සේ, තම මරණය තුළින් එකම ජනතාවක් ලෙස විජාතීන් ද, ජුදෙව්වරුන් ද, එක් රැස් කළ සේක. එම නිසා දෙවියන් වහන්සේ දුන් ගැලවීමේ පොරොන්දුව ඔවුන්ටද අයිති වේ.
මේ සඳහා ක්‍රිස්තුන් වහන්සේ ජුදෙව්වරුන් ද, විජාතිකයන් ද වෙන් කළ, වෛරය ඇති කළ මැද බිත්තිය කඩා දමා ඔවුන් සමගි කළ සේක. තමන් වහන්සේ තුළ මනුෂ්‍යත්වයක් මවා, සමගිය ඇති කරන පිණිස, සැම විටම ඔවුන්ව වහල් කළ ව්‍යවස්ථාව අවලංගු කළ සේක. ක්‍රිස්තුන් වහන්සේගේ මෙම ක්‍රියාව නිසා ජුදෙව්වන් සහ අන්‍ය ජාතිකයින්, එක සේ දේව දරුකමට උරුමය ලැබ, උන්වහන්සේ තුළ එක්වන්නෝය. ජුදෙව්වරුන් හා විජාතිකයන් එක් කරන්නට ක්‍රිස්තුස් වහන්සේ අනාවරණය කළ අභිරහසක් ලූක් සුභාරංචියේ දයාවන්ත පියාගේ උපමාවත් අතර සිත් ඇදගන්නා සුළු ආකර්ශනීය සමානතාවයක් දැකිය හැක. පාවුළු තුමා එපිස 2 පරිච්ඡේදය තුළින් දක්වන දේව ධාර්මික කරුණුම ලූක් 15 සඳහන් දයාවන්ත පියාගේ උපමාවේ ද දක්වා තිබේ.

| එපිස 2/1-22 | | ලූක් 15/11-32 | |
|---|---|---|---|
| 2/4 | දයාවෙන් සමෘද්ධවු දෙවියන් වහන්සේ අධික ප්‍රේමයකින් අපට ප්‍රේම කළ බැවින් | 15/20 | ඔහුගේ පියා දුරතියාම ඔහු දැක අන්කම්පාවෙන් ඇළලි දුවගොස් දැතින් ඔහුගේ ගෙල වැළඳ සිප ගත්තේ ය. |
| 2/1 | වැරදි ක්‍රියා හා පාප හේතුකොට ගෙන ඔබ මැරී සිටි කාලයක් විය. | 15/24-32 | මේ මාගේ පුත්‍රයා මැරී සිට යළි ජීවත්ව සිටියි. නැතිවී සිට සම්භ විය. |
| 2/13 | වරක් දුර සිටියාවු ඔබ දූන් ළංකරනු ලැබුවාහු ය. | 15/13-15 | බාල පුත්‍රයා දුර රටකට ගොස් ඒ එරටේ පුරවැසියෙකුට අතවැසි විය. |
| 2/19 | තවත් විදේශිකයෝවත්, ආගන්තුකයෝවත් නොව, සහකාර පුරවැසියෝ ද දෙවියන් වහන්සේගේ පවුලේ දූ දරුවෝ ද වෙති. | 15/22 | පියා පුතා භාරගෙන, ඔහුට හොඳම සළුවක්ද, ඇඟිල්ලෙහි මුදුවක් ද, පාදවල වහන් සඟලක් ද, දමා පුත්‍ර තනතුරෙහි පිහිටු වීම. |
| 2/14-16 | ක්‍රිස්තුන් වහන්සේ වෛරය ඇති කළ මැද බිත්තිය කඩා සමගිය ඇති කරමින් නව මනුෂ්‍යත්වයක් මැවූ සේක. | 15/28-32 | පියා පිටතට අවුත් වැඩි මහල් පුතාට ඇතුලට එනමෙන් ඉල්ලා, පුතේ නිතර ඔබ මා සමගය. මා සතු සියල්ල ඔබ සතුය, ඔබේ මල්ලි මැරී සිටි නමුත් නැවත ජීවත්ව සිටියි. ඒ නිසා අපි ප්‍රිති සන්තෝෂ විය යුතුමය කියා නව සහෝදරත්වයක් ඇති කළ සේක. |

**එපීස 4/1-16**

සභාව තුළ සැම දෙනාම තමන් ලබන කැඳවීමට ඔබින ආකාරයට ක්‍රියා කරනු සඳහා සැම විටම නිහතමානීවද, වීනීතවද, ඉවසිලිවන්තවද, ප්‍රේමයෙන්ද, එකිනෙකා සමග පැහි සිටිය යුතුය.

සභාව තුළ එකිනෙකා කැඳවා ඇත්තේ එකම බලාපොරොත්තුවකටය. ඒනිසා සැම දෙනාම එකම ශරීරයකටත්, එකම ආත්මයාණන් තුළත්, එකම සමිඳාණන් සමගත්, එකම ඇදහිල්ලකටත්, එකම බෞතිස්ම ස්නාපනයකටත් කැඳවා ඇත.

එසේ වුවත් සභාව තුළ දූත කාර්යයන් සඳහා විවිධ පුද්ගලයන් කැඳවා ඇත. ප්‍රේරිතයන්ද, දිවැසිවරුන්ද, ධර්මදේශකයන්ද, සභා පාලකයන්ද, ගුරුවරුන්ද පත් කළ සේක. එසේ කළේ සභාවේ අභිවෘද්ධිය සඳහා ය.

## ii පවුල් ජීවිතය

**එපීස 5/22-30**

විවාහක ස්ත්‍රිය හා පුරුෂයා අතරේ ඇති සම්බන්ධතාවය හා ප්‍රේමය අවධාරණය කරන්නට පරමාදර්ශය ලෙස දක්වන්නේ, ක්‍රිස්තුන් වහන්සේ හා සභාව අතර ඇති සම්බන්ධතාවය ඇසුරෙනි.

ක්‍රිස්තුන් වහන්සේ සභාව උදෙසා තම ජීවිතය පූජා කරමින්, සභාව පවින් පවිත්‍ර කර එයට අප්‍රමාණව ප්‍රේම කරන සේක. එසේම පුරුෂයා ද තම භාර්යාවට ප්‍රේම කරමින් ඈ වෙනුවෙන් ඇප කැප විය යුතුය.

හිස වූ ක්‍රිස්තුන් වහන්සේ ට සභාව නැමති ශරීරය අවනත වන්නේය. එසේම භාර්යාවද, පුරුෂයාට ප්‍රේම කරමින් ඔහුට අවනත විය යුතුය

**එපීස 6/1-4**

පවුල් සංස්ථාව තුළ දෙමාපියන්ට කීකරුවීම, දරුවන්ගේ යුතුකම ය.
පවුලේ වැඩිහිටියන් හා මූලිකයන් වශයෙන් තම දරුවන් තේරුම් ගෙන අවවාද අනුශාසනා දෙමින් ඔවුන් ඇති දැඩි කිරීම, දෙමාපියන් සතු යුතුකමකි.

## iii සැදැහැවතුන්ගේ යුද්ධායුධ

**එපීස 6/10 - 17**

දුෂ්ටාත්මික බලවේගයන් ලොවෙහි රජකම් කරයි. ක්‍රිස්තුන් වහන්සේ සමග රජකම් කිරීමට කිතුනුවන් උන්වහන්සේ සමග උත්ථානවී ඇති නමුත්, ඔවුනට මෙම බලවේගයන් තර්ජනයක්ව පවතින බව අවධාරණය කරන පාවුළු තුමා එම නපුරු බලවේගවලට විරුද්ධව, පළමුව ස්වාමින් වහන්සේ තුළ ශක්තිමත් වන්නට කියයි. දෙවනුව උන්වහන්සේගේ ප්‍රබල ශක්තිය තුළ බලවත් වන්නට කියයි. තෙවනුව දෙවියන් වහන්සේගේ ආධ්‍යාත්මිකවූ සන්නාහය පැළඳ මෙම නපුරු බලවේගයන්ට මුහුණ දෙමින් සටන් වදින ලෙස අයැදියි.

**මේ සඳහා යුද බිමෙන් ගත් රූපක නිතර යොදා ගනියි.**

- පාවුළු තුමා මෙහිදි සඳහන් කරන ශ්‍රද්ධාව නැමැති පළිහ හැරුණ කොට අනකුත් යුද්ධායුධ පිළිබඳව, පැරණි ගිවිසුමේ පූර්ව සඳහන් කිරීම තුළින් උපුටාගෙන මෙසේ විස්තර කරයි.

❖ **ඉගටිය සත්‍ය නැමැති පටියෙන් බැඳගන්න - දමිටුකම නැමැති ළයවැස්ම පැළඳ ගන්න**

යෙසායා 11/5 සඳහන් කරන ආකාරයට සාම රාජ්‍යයක් උදා කරන්නට පැමිණෙන මෙසියස් වහන්සේ ද තම භූමිකාව සඳයා ඉගටිය බැඳ ගන්නේත්, ළය වැස්ම ලෙස පළඳින්නේත්

යුක්තිය නැමැති ගුණාංගයන් ය. ධාර්මික සටන සඳහා කිතුනුවාද ඉඟටි පටියත්, ළය වැස්මත් පැළඳ ගත යුතුය.

❖ **සාම සුබ අස්න නැමැති වහන් පයලා සූදානම් වන්න**

යෙසායා 52/7 සඳහන් අන්දමට, අඳමිටු බලවේග පරාජය කරන්නට සුබාරංචිය ගෙන ඒමත්, සාමය ප්‍රකාශ කිරීමත් යහපත ගැන සුබ අස්නත් ප්‍රකාශ කළ යුතුය.

❖ **ශ්‍රද්ධාව නැමැති පළිය ගන්න**

නපුරු සිතුවිලි, වචන හා ක්‍රියා නැමැති ඊතලවලට ඔරොත්තු දිය හැකි පළිහ වන්නේ ශ්‍රද්ධාව නොහොත් අචල විශ්වාසයයි, ඇදහිල්ලයි.

❖ **ගැලවීම නැමැති හිස්වැස්ම**

ගැලවීමේ හිස්ගැස්ම යෙසායා 59/17 අනුව විස්තර කෙරෙන්නේ ජයග්‍රහණයක් ලෙසිනි. එම ජයග්‍රහණය යුද්ධ තොප්පියක් ලෙස කිතුනුවා ආරක්ෂා කරන්නේ ය.

❖ **ශුද්ධාත්මයාණන්ගෙන් වන දේව වචනය නැමැති කඩුව**

මිනිස් සමාජයේ සිදුවන අයහපත. නපුර, අයුක්තිය අසාධාරණයට විරුද්ධව හඬක් නංවන්නට, ආත්මයාණන්ගේ මෙහෙයවීම තුළ දේව වචනය යොදා ගැනිම මෙමගින් පැහැදිලි කරයි

යෙසායා 11/4 - මෙසියස් වහන්සේගේ වචනයකින් දුෂ්ටයෝ මිය යන්නෝ ය.
හොසියා 6/5 - විනිශ්චය ද විනාශයේ පණිවුඩය ද දුදන්ට විරුද්ධව ගෙන එන බව.
හෙබ්‍රෙව් 4/12 - දෙවියන් වහන්සේගේ වචනය ජීවමානය. ක්‍රියාශිලිය, දෙමුවහත් කඩුවකට වඩා තියුණු ය.

මේ සැම යුද්ධායුද ක්‍රියාත්මක වීමට නම් පාවුළු තුමා අවධාරණය කරන්නේ, මුල් කිතුනු සභාව සම්ප්‍රදායයක් වන යාච්ඤාවය. එනම් යුගාන්තිය දැක්මක් හා බලාපොරොත්තුවක් ඇතිව,ඉතා ඕනෑකමින් හා නොකඩවා යාච්ඤා කළයුතු බවයි.

## iv ක්‍රිස්තුන් වහන්සේ තුළ නව ජීවනය

දෙවියන් වහන්සේ නොදත් මිසදිටුවන් මෙන් ඇදහිල්ලෙන් තොරවූ ජීවිත ගත නොකොට, සැබෑ කිතුනුවන් සේ ජීවත්වීමට පාවුළු තුමා එපිසි සංඝයට ඇරයුම් කරමින් තම තමන් තුළ නව ජීවනය හෙවත් අළුත් ස්වභාවය, ඇති කරගන්නට යයි අවධාරණය කරයි.

අවිද්‍යාව හා මුරණ්ඩු කම නිසා, අඳුරුවූ සිත් ඇති එපීසිවරු දෙවිඳුන්ගෙන් ඈත්ව, විළිබිය නැති සල්ලාල කමේත්, ඉවක් බවක් නැති අනාචාර කමේත්, ඇළි සිටීම ගැන ඔවුන්ට තදින් දොස් පවරමින් පාවුළු තුමා ස්වාමින් වහන්සේගේ නාමයෙන් ඔවුන්ට පවසන්නේ පරණ පුරුදු අතහැර දමා ක්‍රිස්තුස් වහන්සේගෙන් ඉගෙන ගත් දේ තුළ ආධ්‍යාත්මික නවතාවයක් ඇති කරන්නා ලෙසටයි.

- දෙවියන් වහන්සේගේ ස්වරූපය අනුව මවන ලද ඔවුන්ට දමිටුකමින් ද, ශුද්ධවන්ත කමින් ද එම අළුත් ස්වභාවය පැළඳගන්නට යයි කියමින් ඒ සඳහා අසල්වාසි එකිනෙකා සමග සත්‍යවාදි වන්නටත්

- කෝපය ඇතිවූවත්, ඉර බහිනතුරු එය හිතේ නොතබාගන්නා ලෙසත්,
- සොරකම් නොකර, ඒ වෙනුවට දුගීන්ට උපකාර කළ හැකිසේ, වෙහෙස මහන්සි දරා අවංකව වැඩක් කරන්නටත්,
- කිසිදු දූෂිත වචනයක් කටින් පිට නොකර, අසන්නන්ට සුබ සිද්ධවන, අවස්ථාවට සුදුසු වචන පාවිච්චි කරන්නටත්,

- සියලු වෛර ක්‍රෝධ, ද්වේෂ පහකර දමා එකිනෙකා කෙරෙහි දයාවෙන් හා කරුණාවෙන් ජීවත් වන්නත්,
- ක්‍රිස්තුන් වහන්සේ තුළින් ලැබූ කමාව. එකිනෙකාට කමා කිරිමට යොදවා ගන්නා ලෙසත් ඉල්ලා සිටියි.

## 1.2.2.5.2 කිතුනු වටිනාකම්

### i ආලෝකයේ ජීවත්වීම

එපිස 5/1-20

- දෙවියන් වහන්සේගේ පීතෘක සෙනෙහස ඉදිරිපත් කිරීමේ විලාශයක් දක්වන පාවුළු තුමා, එතුමාණන් මෙන් ජීවත් වන්නට එපිස වරුනට ආයාචනා කරයි. මෙය එක්තරා අන්දමකින් ''ඔබේ ස්වර්ගීය පියාණන් වහන්සේ සර්ව සම්පූර්ණව සිටින්නාක් මෙන් ඔබ ද සර්ව සම්පූර්ණ වන්න''. (මතෙව් 5/48) ආභාෂය ඇතිව, ආලෝකයේ දරුවන් ලෙස ජීවත්වන්නට කෙරෙන ඇරයුමක් යැයි සිතිය හැක.

- මෙම කොටස තුළ එවැන්නක් කෙරෙහි එපිස වරුන්ගේ අවධානය යොමුකරන්නට පාවුළු තුමා, විරුද්ධ අර්ථ ඇති පද සහිත රූපක කිහිපයක් යොදා ගනියි. එනම්

  - ප්‍රේමණිය දරුවන් - අකීකරු දරුවන්
  - ආලෝකයේ හැසිරීම - අන්ධකාරයේ සිටීම
  - මරණින් නැගිටීම - නිදා සිටිම
  - ඥානවන්තයන් මෙන් ජීවත්වීම - අඥානයන් මෙන් හැසිරීම
  - ආත්මයාණන්ගෙන් පූර්ණවීම - නිශ්ඵල ක්‍රියාවල නිරතවීම
  - ස්තුති දීමේ වචන පැවසීම - අශික්ෂිත මෝඩ කථා පැවසීම යනුවෙන් යොදා ගනියි.

- මෙම විරුද්ධ අර්ථ ඇති පද යොදා ගනිමින් ජීවිතයේ ධනාත්මක පැතිකඩක් පිළිබිඹු කරන පාවුළු තුමාගේ මූලික අරමුණ වන්නේ, සංඝය තුළ කිතුනු වටිනාකම් ජීවත් කිරීමෙන්, ආලෝකයේ දරුවන් ලෙස, ශුද්ධාත්මයාණන්ගෙන් මුද්‍රා කරනු ලැබූ, (එපිස 1/13) දෙවියන් වහන්සේගෙත් ක්‍රිස්තුස් වහන්සේගේත් රාජ්‍යයේ උරුමක්කාරකම කිතුනුවා ලබන බව (එපිස 5/5) පැහැදිලි කිරීම ය.
- ක්‍රිස්තුස් වහන්සේගේ උරුමක්කාර බවට සහභාගි වන කිතුනුවාද, ආලෝකයේ ජීවත් වෙන්නන් වශයෙන් දෙවියන් වහන්සේගේ පීතෘක ආදරයේ පරමාදර්ශයවූ ක්‍රිස්තුස් වහන්සේගේ අනුරුවක් විය යුතුය. එසේ නම් උන්වහන්සේගේ ආඥාව අනුව ''මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න''(ජුවාම් 15/12) අනුව ක්‍රියාකාරිව් මිහිරි සුගන්ධ පූජාවක් ද, යාගයක් ද කොට අන්‍යයන් වෙනුවෙන් දෙවියන් වහන්සේ ට ජීවිතය පරිත්‍යාගි කළ යුතු බව අවධාරණය කරන පාවුළු තුමා, එසේ කිරීම සැබෑ ප්‍රේමය බව පෙන්වා දෙයි.

### ii සමාජ සබඳතා දෘඩිකර ගැනීම

එපිසි හසුනෙහි, එක්සත් කමේ තේමාව ගොඩ නගන ශුද්ධවූ පාවුළු තුමා, එපීසවරුන්ගේ ජීවිතයෙහි, ක්‍රිස්තුස් වහන්සේ තුළ ඇති ඒකත්වය ප්‍රකාශවන පරිදි සමාජ සබඳතා දෘඩිකර ගනිමින් ජීවත්විය යුතු බව පැහැදිලි කර දෙන සේක. මේ එක්සිත් බව පිළිබිඹු කරන්නේ විවිධාකාර රූපක කිහිපයක් මගිනි.

**එපීස 1/23**

- සභාව ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය ලෙසත් හඳුන්වා දෙන ශුද්ධවූ පාවුළු තුමා, හිසට අවනතව, එක් එක් අවයවය අන්‍යෝන්‍ය සහයෝගිතාවය ඇතිව ක්‍රියා කරන්නාක්මෙන් ශරීරයේ පූර්ණත්වය සඳහා කිතුනුවා, කිතුනු සංඝයේ අභිවෘධිය සඳහා කැප විය යුතු බව අවධාරණය කරන්නේ ය.

**එපීස 4/1-6**

ඇත්තේ එකම ස්වාමිවූ දෙවි පියාණන් වහන්සේ යන සහතිකය මත තමාගේ ආයාචනය පදනම් කරගනිමින් එකමුතු වන ලෙස සියල්ලන්ගේන්ම අයැද සිටියි. ශිලධාර්මික එක්සත්භාවයක් සඳහා, ක්‍රිස්තුස් වහන්සේ විසින් එළිදරව් කරන සත්භාවයකින් යුත් එකත්වයක් මත පිහිටු විය යුතු එකමුතුකම ගොඩ නගන ලෙස අවධානය යොමු කරයි. කිතුනුවා ලබා ඇති කැඳවීමෙහි ඇති අද්විතීය බව ද හුවා දක්වයි. එම සත්භාවයන් නම්ඃ

- එකම ශරිරයක්
- එකම ආත්මයාණන් වහන්සේත්
- එකම සමිඳාණන් වහන්සේත්
- එකම ඇදහිල්ලත්
- එකම බෞතීස්ම ස්නාපනයත්
- එකම දෙවිපියාණන් වහන්සේත් ය.

ඉහත කී ඒකත්වයේ පදනම තුළ කිතුනු ප්‍රේමය වර්ධනය වියයුතු බවත්, ඒ සඳහා නිහතමානිව, විනීතව, ඉවසිලිවන්තව ප්‍රේමයෙන් එකිනෙකා සමග පැහි සිටිය යුතු බවත් මතක් කර දෙයි.

**එපීස 5/21 - 33, 6/1-9**

සමාජ සබඳතා දැඩිකර ගැනීම සඳහා, විවාහක ස්ත්‍රිය හා පුරුෂයා අතර තිබිය යුතු අන්‍යොන්‍ය ප්‍රේමය ක්‍රිස්තුස් වහන්සේත් සභාවත් අතර තිබිය සම්බන්ධතාවය තරම් ගැඹුරු විය යුතු බව පහදා දෙන පාවුළු තුමා එය දිවැසිවරුන් විසින් ගිවිසුම් සංකල්පය තහවුරු කරන්නට, ස්ත්‍රි පුරුෂ සබඳතාවයේ අදහස ඉදිරියට ගෙන යාමක් ද, පූර්ණත්වයට පත්වීමක් ද ලෙස පෙන්වා දෙයි.
එසේම දෙමව්පිය දරුවන් අතර සබඳතාවත්, ස්වාමිවරුන් හා දාසයන් අතර තිබිය යුතු සබඳතාවයත් සෞඛ්‍යමත්, සාමකාමි ආකාරයට. ගොඩ නගා ගත යුතු බව අවධාරණය කරන්නේ ය.

# 1.2.3 එළිදරව් පොත

## 2.3. එළිදරව්ව පොත පිළිබඳව පොදු හැඳින්වීම

### ජොහන් තුමාට එළිදරව් වූ දර්ශනය හැඳින්වීමඃ

නව ගිවිසුමේ එළිදරව්ව පොත හා පැරණි ගිවිසුමේ යෙසායා, ජොවෙල්, සෙකරියා, දානියෙල් පොත්වල ඇතැම් කොටස් ද එළිදරව්ව සාහිත්‍ය පොත් ගණයට ඇතුළත් වේ. ඒවා එක්තරා සාහිත්‍යමය රාමුවක් තුළ ලියැවී ඇත. එබැවින් එම පොත් කියවා තේරුම් ගැනීම එතරම් පහසු නැත.

පීඩාකාරී වාතාවරණයක සිටි බැතිමතුනට තම කම්කටොළු ඉවසා දරාගැනීම සඳහා දිරිගැන්වීමක් ලබා දීම මෙම පොත් කාණ්ඩයෙහි පොදු ලක්ෂණයක්ව පවතී. එළිදරව්ව පොතේ දෙවන හා තෙවන පරිච්ඡේදයන්වල සභා සතට ලියන ලද ලිපි මෙයට නිදසුනකි. බැතිමතුන් දිරිගැන්වීම අරමුණු කොටගෙන සතුරු බලයන්ගේ විනාශය හා පරාජය දක්වන දර්ශන මෙම පොත්වල දක්නට ඇත (දානියෙල් 7 පරිච්ඡේදය, එළිදරව් 20:7-10).

පරණ ගිවිසුමෙහි දිවැසිවර සේවය ක්‍රමයෙන් හින වි යන අවධියක එළිදරව්වාදය එම පුරප්පාඩුව පිරිමැසු හෙයින් දිවැසිවරයා හා එළිදරව්වාදයෙහි අතර විවිධ සමානකම් හා සම්බන්ධකම් ඇත.
එළිදරව්වාදයෙහි දක්නට ඇති විශේෂ ලක්ෂණයන් අතර ද්විත්වවාදය හා යුගාන්තවාදය කැපී පෙනේ. ද්විත්ව වාදයෙන් පරම යහපත හා පරම හිංසාව අතර වූ ගැටුම ඉදිරිපත් කරයි (දානියෙල් 7:25, එළිදරව්ව 17:12-14). එළිදරව්ව සාහිත්‍යය බිහිවූ සමය පර්සියානු ලබ්ධික ධර්ම ප්‍රචාරය ප්‍රචලිත වූ කාලයක් විය. "අහුරමඩ්සා" සහ "අංග්‍රමන්ෂු" ලෙස එහි හැඳින්වූ පරම යහපත සහ පරම අයහපත යන බලවේගයන් ලෝකයෙහි ප්‍රගතියට හෝ පසුබෑමට මුල්වන බව එම ලබ්ධියෙහි මූලික ඉගැන්වීමක් විය.

දේව අභිමතය අනුව අනාගත දිනයක සිදුවන යථෝක්ත යහපත හා අයහපත අතර ගැටුමෙන් අනතුරුව, නපුරු බලවේගයන් විනාශ වී බැතිමතුන් උදෙසා සෞභාග්‍යමත් යුගයක් උදාවේය යන සිද්ධාන්තය යුගාන්ත ධර්මයෙන් අදහස් කෙරේ. එබැවින් බැතිමතුන්ට, අසුබ වර්තමානයෙහි ඇති කරදර හා දුක් පීඩා ඉවසා දරාගැනීම දේව කැමැත්ත බවත්, පීඩාකාරී බලය නියත ලෙස පරාජය වන බවත් යුගාන්ත ධර්මය පෙන්නුම් කරයි. (දානියෙල් 7:9-12, සෙකරියා 14, එළිදරව්ව 19:17-21).

## 1.2.3.1 පොත බිහිවූ පරිසරය

එක්තරා සාහිත්‍යමය රාමුවක් තුළ මෙය ලියැවී තිබෙන නිසා එය කියවා එකවර තේරුම් ගැනීමට එතරම් පහසු නැත. එළිදරව්වාදය බිහිවූ කාලය හා පරිසරය ගැන සෙවීමේ දී එය පීඩන යුගයකදී බිහිවී ඇති බවත්, අවධානයෙන් කියවන්නෙකුට හැඟී යයි. විශේෂයෙන්ම ක්‍රි.පූ. 4 -2 සියවසට ආසන්න සමයකදී එනම් දිවැසිවරය ඉශ්‍රායෙලීය ජන සමාජයෙන් ක්‍රමයෙන් නැතිවීගෙන යන කාලයේ දී, මෙම සාහිත්‍යය බිහිවූවා යයි කිව හැක. පීඩන සමයේ සිටි කිතුනුවන්, ධෛර්යමත් කිරීමට හා ඔවුන්ගේ විශ්වාසය ශක්තිමත් කිරීමට, දිවැසිවරය වෙනුවට, මෙම එළිදරව් සාහිත්‍යය ඉමහත් සේවාවක් ඉටු කළායැ'යි කිවහැක. විශේෂයෙන්ම විශ්වාසය සම්බන්ධව ජාතික අර්බුද වලදී, අහෝසි වෙමින් පැවති දිවැසිවරයේ තැන ගත්තේ මෙම එළිදරව්වාදී සාහිත්‍යයි.

දොමිටියන් අධිරාජ්‍යයාගේ කාලයේ දී, විශේෂයෙන් ක්‍රි.ව. 8- - 96 දී පමණ ඇතිවූ පීඩනයන් මැදින් එය බිහිවුණ බව බොහෝ විශේෂඥයන්ගේ මතයයි. එවකට රෝම අධිරාජ්‍යයේ පැතිර තිබුණ අධිරාජ්‍යා දේවත්වයෙන් පිදීම හා ඇඳුම් පුජා කිරිම ආදී දේ කිතුනුවන් විසින් ප්‍රතික්ෂේප කළ නිසා මෙවැනි පීඩන ඇතිවූවායයි පිළිගැනේ. එම නිසා විශ්වාසයෙන් දිරිමත් කරන්නට සතුරන් ලබන පරාජය සංකේතවත් කරන දර්ශන හා සිදුවීම් මෙම ග්‍රන්ථය තුළ සඳහන් කරමින්, පසුබිම්වූ පරිසරය පිළිබඳව මනා අවබෝධයක් ලබා දෙයි.

## 1.2.3.2 එළිදරව් ග්‍රන්ථයේ කර්තෘත්වය

සභාවේ මූලාරම්භයේ පටන්ම මෙම ග්‍රන්ථයේ කර්තෘත්වය විවිධ මතයන් පැන නැඟී ඇත. මෙම මතයන් ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැක.

(අ) පළමු මතය ලෙස දක්වා ඇත්තේ ජුවාම් අපෝස්තුළු තුමන් එළිදරව් ග්‍රන්ථය ලියා ඇති බවය. මෙම මතය ඔස්සේ ක්‍රි.ව. 130 දී පමණ ශුද්ධවූ ජස්ටින් තුමන් ද, ක්‍රි.ව. 202 දි පමණ ශුදධවූ අයිරේනියස් තුමන් ද ක්‍රි.ව. 212 දී පමණ ඇලෙක්සැන්ඩ්‍රියාවේ ක්ලේමන්ට් තුමන් ද, ටර්ටුලියන් තුමන් ද වැනි සභාපියවරුන්, තවත් විශේෂඥ පියවරුද කරුණු දැක්වීමට ඉදිරිපත් වූහ.

(ආ) ජුවාම් අපෝස්තුළු තුමන් විසින් මේ ග්‍රන්ථය ලියා නොමැති බවට කරුණු දක්වමින් ඉහත දැක්වූ අදහස් වලට හාත්පසින්ම වෙනස් වූ මතයක් ක්‍රි.ව. 267 දි පමණ ඇලෙක්සැන්ඩ්‍රියාවේ ඩයනියස් ද එතුමන්ගේ කාලයේ පටන් අද දක්වා විශේෂඥයන් බොහෝ දෙනෙක් ද මෙම පරස්පර විරෝධී මතයම දැරූහ.

- අපෝස්තුළුවර ජොහාන් තුමන් විසින් ලියන ලද සුබාරංචියේත්, එළිදරව් ග්‍රන්ථයේත් ද්විත්ව අර්ථ යොදා ගැනීම අතර සමානරූපී බවක් දක්නට ඇත.
- දේව ධර්ම සංකල්පයන්ට වඩා, බෙහෙවින් වෙනස් සංකල්පයක් මෙහි දක්නට ලැබේ.
- මෙම ග්‍රන්ථය බිහිවූ කාලය හා ග්‍රන්ථයේ ස්වභාවය අනුව, ඇරුඪ නාමයක් යටතේ ඉදිරිපත් කිරීම, එළිදරව් සාහිත්‍යයේ විශේෂාංගයක් නිසා එළිදරව් ග්‍රන්ථය අපෝස්තුළුවර ජොහාන් තුමාගේ නාමයට ආරූඪ කර ලියා ඇතැයි ද සිතිය හැක.

## 1.2.3.3. ග්‍රන්ථයේ සැලැස්ම

- මෙම එළිදරව් ග්‍රන්ථය සංදේශයක ආකාරයෙන් ඉදිරිපත් කර ඇති අතර එය පාවුළු තුමගේ සංදේශවල මෙන් ආරම්භ වන්නේත් (එළිදරව්ව 1/4-5) අවසන් වන්නේත් (එළිදරව්ව 22/21) පැතුමකිනි.
- මෙම ග්‍රන්ථය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකි

## (i) හැඳින්වීම (එළිදරව්ව 1/1 - 3/33)

- දර්ශනය විවෘතවීම (1/1 - 20)
- ආසියාවේ සභා සතට ලියන ලද සංදේශ සත (2/1 - 3/22)

සංදේශයන් අඩංගු මෙම කොටස ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ඒ ඒ සභාවන්ට ආමන්ත්‍රණය කරන අයුරින් ඉදිරිපත් කර ඇත. එහි ඔවුන්වහන්සේ තමන්වහන්සේගේ ආධිපත්‍යයට ඉඟියක් කරමින්, සභාවල යහපත් තත්ත්වය ගැන ඒවාට ප්‍රශංසා කර, අඩු පාඩුකම් පිළිබඳඩ අනතුරු හඟවමින් අවශ්‍ය අවවාද අනුශාසනා දී ඒවා දිරිමත් කරන බවක් දක්නට ලැබේ.

## (ii) සභා සතට ඉදිරිපත් කරන එළිදරව්වාදි දර්ශන (4/1-22/5)

| | | |
|---|---|---|
| - ස්වර්ගිය සභාව | : | (4/1 - 5/14) |
| - මුද්‍රා සත | : | (6/1 - 8/1) |
| - හොරණෑ සත | : | (8/2 - 11/19) |
| - ස්ත්‍රීය, දරුවා හා මෘගයා | : | (12/1 - 15/4) |
| - දේව උදහස නැමැති පාත්‍ර සත | : | (15/5 - 16/21) |
| - බැබිලෝනියාවේ විනාශය | : | (17/1 - 19/10) |
| - බලන්න, මම සියල්ල අළුත් කරමි | : | (19/11 - 22/5) |

මෙම එළිදරව්වාදි කොටසේ ප්‍රධාන වශයෙන් නොයෙකුත් සංකීර්ණ සංකේතයන්ගෙන් පිරී දර්ශනයන් ද, බොහෝ විට ඒවා පහදා දෙන අයවලුන් ද ඇති බව පැහැදිලි වේ.

(එළිදරව්ව 1/1-3) පදවලින් කෙරෙන කෙටි හැඳින්වීමකින් පස් ආචාරයකින් ආරම්භ වන මෙම ග්‍රන්ථයෙහි පයසුවෙන් වටහාගත නොහැකි ක්‍රිස්තුස් ජේසු ස්වාමින් පිළිබඳව ඉදිරිපත් කෙරෙන චමත්කාර දර්ශනයක් ඇත. (එළිදරව්ව 1/ 9-20) මෙම දර්ශනය හා සබැඳිවූ ඉඟියක් සභා සතට යවනු ලැබූ සංදේශ වලද දක්නට ලැබේ.

මෙම ග්‍රන්ථයේ වටිනාකම යම් ආකාරයකින් තක්සේරු කරන්නට උත්සාහ කරන සංස්කාරකවරයා සුළු වශයෙන් වත්, මෙම ග්‍රන්ථයේ පණිවුඩය පමණක් නොව, එක වචනයකින් පවා වෙනස් කිරීමට තැත්කරන්නන්හට ශාපයක් එල්ල කරමින් ග්‍රන්ථය අවසන් කරයි.

## 1.2.3.4 ග්‍රන්ථයේ වටිනාකම

- ❖ එළිදරව්ව පොත පිරී ඇත්තේ ධාර්මික කරුණු වලින් ය. විශේෂයෙන් ජනවන්දනාව, ක්‍රිස්තු අභිධර්මය (ක්‍රිස්තු විද්‍යාව) Christology සාසන විද්‍යාව (Ecclesiology) යුගාන්ත ධර්මය යන අංශයන්ගෙන් පෝෂිතය.
- ❖ එදා පැවැති සාමාජීය පසුබිම තුළ එනම් ආගමික පීඩනයන්ට මුහුණ දීමට සිදුවූ කිතුනුවනට ද රහසිගතව, තම ආගමික වතාවත් සිදුකිරිම සඳහාත් ජනවන්දනාවේ දී භාවිතා කිරීම සඳහාත් එළිදරව් ග්‍රන්ථය උපයෝගි කරගත හැකිය.
  මෙහි දක්නට ලැබෙන ගීත (එළිදරව්ව 4/11, 5/9, 11/17, 19) හා ''ආමෙන්'', ආලේලුයියා'' වැනි සාධුකාරයන් ද, දේව වන්දනාවේ දී භාවිතා කරන දේව ප්‍රකාශනයට, සැදැහැවතුන්ගෙන් ලැබෙන ප්‍රතිචාරයක් ලෙස දක්වා ඇත.
- ❖ සාමාන්‍ය ජනතාවට, දේව වන්දනාව තුළ තේරුම් කරදෙන සංකේතයන් ග්‍රන්ථයේ අඩංගුය.

- ❖ මෙම ග්‍රන්ථය තුළ, ක්‍රිස්තුස් වහන්සේ දාවිත්ගේ පෙළපතින්, පැවත එන ජුදා ගෝත්‍රයෙ තැනැත්තාණෝ, මරණය නැමැති මිලයෙන් සියලුම මිනිසුන් දෙවියන් වහන්සේ උදෙසා ගන්නාවූ ''විශ්ව ගැලවුම් කාරයා'' ලෙස ඉදිරිපත් කරයි. ((එළිදරව්ව 5/9, 7/9-10)
- ❖ පැරණි ගිවිසුම තුළ දෙවියන් වහන්සේව ආමන්ත්‍රණය කරන ආකාරයටම ''මම ආරම්භය හා අවසානය වෙමි'' යනුවෙන්, ක්‍රිස්තුන් වහන්සේව ද හඳුන්වා දී ඇත.
- ❖ (එළිදරව්ව 21/6) අනුව, කිතුනු සභාව පැරණි ගිවිසුමේ දේව ජනතාව වශයෙන් පෙන්වා දී ඇත.(එළිදරව්ව 1/6 ) එසේම ඉශ්රායෙල් ගෝත්‍ර දොළස ද, සභාවට සමාන කරයි.
- ❖ පාවුළු තුමා එපේසි ලිපියේ (එපේසි 5/25-27) මගින් ප්‍රකාශ කරන ක්‍රිස්තුස් වහන්සේ මනාලයා ලෙස ද, ඉදිරිපත් කිරීම, මෙන්ම, (එළිදරව්ව 21/9-10) මගින් ද සභාව, ක්‍රිස්තුස් වහන්සේ ගේ මනාලිය ලෙස ඉදිරිපත් කෙරේ.
- ❖ සභා සතට ලියන ලද සංදේශ සතෙන් ද පැහැදිලි කෙරෙන්නේ ද සභාවේ නායකයාණන් ක්‍රිස්තුස් වහන්සේ වන බවය.
- ❖ එළිදරව් ග්‍රන්ථය මගින් පැහැදිලි කෙරෙන යුගාන්තීය ධර්මය තුළ දක්වෙන ප්‍රධාන කරුණක් වන්නේ ක්‍රිස්තුස් වහන්සේ පරම ජයග්‍රාහකයාණන් බවයි.
- ❖ ජයග්‍රාහික ක්‍රිස්තුස් වහන්සේ උදාර අශ්වාරෝහකයෙකුගේ වේශයෙන් දක්වා ඇති එළිදරව් ග්‍රන්ථය, ඔවුන් වහන්සේගේ පැමිණීම ඉතා ආසන්න බවත්, එමනිසා, විශ්වාසය සම්බන්ධය මහත් ඉවසීමකින් යුතුව, පැමිණෙන සෑම දුකක් වේදනාවක්ම ඉවසා දරාගත යුතු බව කියමින්, ප්‍රාණපරිත්‍යාගිවරය සඳහා දිරිගන්වමින් යුගාන්තිය, දූක්මකට ජනතාව යොමු කරනු ලබයි.(එළිදරව්ව 7/9-17)

## 1.2.3.5. එළිදරව්වවාදයේ ඇති විශේෂ ලක්ෂණ

මෙම විශේෂ ලක්ෂණ ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැක.

(අ) අනිවාර්යයෙන්ම තිබිය යුතු ලක්ෂණ

(ආ) බෙහෝවිට එහි දක්නට ලැබෙන ලක්ෂණ

(අ) අනිවාර්යයෙන්ම තිබිය යුතු ලක්ෂණ
- → ද්විත්ව වාදය **DUALISM**
- → යුගාන්තවාදය **ESCHATOLOGY**

(ආ) බෙහෝවිට දක්නට ලැබෙන ලක්ෂණ
- → සංකේත භාවිතය, දර්ශනය
- → ආරූඪ නාමයක්

## අ. i ද්විත්වවාදය

මෙමගින් පරම යහපත හා පරම අයහපත අතර ඇති සට්ටනය පෙන්නුම් කරයි. බොහෝවිට එයට බලපෑ හේතුව වූයේ පර්සියානු බහු දේව වාදයයි. එකල පර්සියන් වරු පරම යහපත වන ''අහුරමඩ්සා'' හා පරම අයහපතවූ 'අග්‍රපන්හු' යන බලවේගයන් දෙපලයේ සට්ටනය මත, ලෝකය ඉදිරියට යාම හා පසුබෑම කෙරෙන බව පෙන්වා දෙයි. මෙය සොරෝ ඇස්ටර් වාදි ආභාෂයක් තුළ ඇතිවූවායයි කිව හැක.

## අ ii යුගාන්තවාදය

අනාගතයේ එකි වකවානුවක දී, දෙවියන් වහන්සේ තීරණය කරන දවසකදී, පරම යහපත හා පරව අයහපත අතර ඇතිවන සටනකි, සට්ටනයකි, යුගාන්තවාදය යනුවෙන් හඳුන්වනු ලබන්නේ ය.
පරම යහපත විසින් එකල නපුරු බලවේග බිඳ දමා සැදැහැවතුන්ට සෞභාග්‍යමත් කාලයක් උදාකර ලීමට, ඉතිහාසය තුළ මැදහත් වීමක් කරනු ලබන බව එපගින් හඟවනු ලබයි.

එමනිසා එසේ වනතුරු දේව කැමැත්ත අනුව තීරණය වී ඇති වර්තමානයේ අසුභවූ දේ තුළ ඇතිවන පීඩා කරදර ඉවසීමෙන් හා විශ්වාසයෙන් දරාගනිමින් බලාපොරොත්තු සහගත ලෙස දිවි ගෙවිය යුතුබව, එළිදරව් සාහිත්‍ය මගින් අවධාරණය කරනු ලබයි. මෙවැනි අවස්ථාවන්හි දී පීඩාකාරි බලවේගයන්ගේ පරාජය ඒකාන්තයෙන්ම සිදුවන බව ද අවධාරණය කරනු ලබයි.

## ආ iii සංකේත භාවිතය

එළිදරව් සාහිත්‍ය තුළ මෙසේ සංකේත භාවිතා කෙරෙනුයේ
- ❖ ගුප්තභාවයක් ඇතිවන බව පෙන්වීමට
- ❖ අභිරහස්‍යම බලයක් දැක්වීමට
- ❖ එළිදරව් පොත සතුරන් අතට පත්වුවහොත්, එහි අඩංගු දේ තේරුම් ගැනීමට සතුරාට නොහැකි වන පිනිස
- ❖ කතුවරයාගේ ආරක්ෂාවට

## භාවිතා කළ සංකේත

### 1. වර්ණ සංකේත

- ❖ සුදු - ජයග්‍රහණයේ සතුට, පවිත්‍රත්වය (3/5,7/9, 19/8, 19/11-14)
- ❖ රත්රන් - රාජකීය අසිරිය හෝ උත්තෘෂ්ටභාවය (1/13, 4/4, 17/4)
- ❖ තද රතු - කාමාතුර සම්භෝගය (17/4)
- ❖ රතු - යුද්ධය විනාශය හෝ ලේ වැගිරීම් (6/4, 12/3)
- ❖ කොළ - රෝගිභාවය, පීඩා (6:8)
- ❖ කළු - මරණය (6 : 5)

**සංඛ්‍යා සංකේත**

3 - ත්‍රිත්වයික පූර්ණත්වය සංකේත කරන ලදි (4/8)
4 - විශ්වය හා මැවිල්ල සංකේත කරන ලදි (7/1)
7 - සම්පූර්ණත්වය, පරිපූර්ණත්වය සංකේත කරන ලදි (1/11. 5/1, 8/2)
10 - පරිපූර්ණත්වය (13/1)
12 - ගෝත්‍ර දොළස, අපෝස්තුළුවරු දොළස - දේව ජනතාව(12/1, 21/12-14)
1000 - 10X10 X10 - ශුද්ධය, පරිශුද්ධය, සුපරිශුද්ධය, මෙය පරිශුද්ධයාණන්වූ දෙවියන් වහන්සේව සංකේත කිරීමට යොදා ගන්නා ලදි. (5/11, 7/4, 20/ 1-7)
1260 (දින) - මාස 42, අවුරුදු 3 1/2 -

# දෙවන පාඩම

## 2. දෙවන වතිකාන මන්ත්‍රණ සභා ප්‍රකාශන

### 2.1 දෙවන වතිකාන මන්ත්‍රණ ගිහි ධර්ම දූත සේවාව පිළිබඳ ප්‍රකාශනය

### 2.1.1. ගිහියාගේ කැඳවීම:

පියාණන්ගේ මහිමය සඳහා, ක්‍රිස්තු රාජ්‍යය ලොව පුරා පතළ කිරීමෙන් සියළු මනුෂ්‍යයන්ගේ ගැළවීමේ කාර්යයට පංගුකාර කර ගැනීමත්,

ඔවුන් මගින් මුළු ලොව ම ක්‍රිස්තුන් වහන්සේට සම්බන්ධ කර ගැනීමත්,

යන ශු. සභාවේ පරමාර්ථ ඉටු කර ගැනීමේ දූත සේවාව සඳහා ක්‍රිස්තියානි කැඳවීම ගිහියන්ගේ කැඳවීම වේ. සභාව තුළ විවිධාකාරයෙන් සියළු සාමාජිකයෝ මේ සේවාව ක්‍රියාත්මක කරති. ඒ ආකාරයෙන් දක්වන පංගුකාරකම නිසා සභාව වර්ධනය වේ.
සභාව තුළ ඇත්තේ එකම දූත මෙහෙයකි.

මෙම සේවාවට එකම අරමුණක් ඇත. ගිහියෝ ක්‍රිස්තුන් වහන්සේගේ පූජක, අනුශාසනා හා රාජකීය කාර්යයනට කොටස්කරුවෝ වෙති. එහෙයින් සභාව තුළ ද, ලෝකයෙහි ද ගිහි දූත සේවාවට අයත් කාර්යයන් ඉටු කළ යුතු ය.

**එම දූත සේවාව තුළින්**

- සුබාරංචිය පතළ කිරීම ද
- මනුෂ්‍යයන් ශුද්ධවන්තකම කරා ළඟා කර වීම ද
- ලෞකික ජීවිතයට අයත් දේ තුළට සුවිශේෂ ගුණාංග ඇතුළු කරවීම ද

මගින් ක්‍රිස්තුන් වහන්සේගේ දූත සේවාවට එසේ සාක්ෂි දරති. මිනිස් ගැළවීම සඳහා සේවය කරති. ලෝකය තුළ ජීවත් වෙමින්, ලෞකික කටයුතුවල යෙදෙමින්, අධ්‍යාත්මික ක්‍රිස්තියානි ගුණයෙන් ජ්වලිතව, ලෝකය "මුහුන් කිරීම" සඳහා සේවය කරති.
සිය දූත සේවාව සඳහා යුක්තිය ද අයිතිය ද ගිහියන් පිට පැවරේ. ගිහියෝ බෞතිස්ම ස්නාපනයෙන් ශුද්ධාත්මික ක්‍රිස්තු දේහයට සම්බන්ධව වී, අභිවෘද්ධි ආලේපය මගින් ශුද්ධාත්ම බලයෙන් ශක්තිමත් වෙති. එනයින් සිය දූත සේවාව ස්වාමීන් වහන්සේගෙන් ම ලබති. ලොව සෑම තැන සාක්ෂි දෙනු පිණිස රාජකීය පූජක පිරිසක් ද ශුද්ධ වූ වංශයක් ද වශයෙන් කැපවී සිටිති. (1 පේදුරු 2:4-10). දේව ප්‍රසාද නිධාන මගින් විශේෂයෙන් දිව්‍ය සත්ප්‍රසාදය මගින් මුළු දූත සේවාව ජීවනයෙන් පෝෂණය කරගනු ලබති.

විශ්වාසය, බලාපොරොත්තුව, දේව ප්‍රේමය මගින් සිය දූත සේවාව ක්‍රියාත්මක වෙයි. ප්‍රධාන පණත වූ ප්‍රේමයේ නීතිය, දේව රාජ්‍යය තුළ පතුරුවා හැරීමෙන් දේව මහිමය නගාලීමටත්, එක ම දෙවියන් හා ක්‍රිස්තු තුමන් දැනගැනීමෙන් අනන්ත ජීවිතය (ජොහන් 17:3) ලබා දීමටත් පොළඹවනු ලබති. ඒ නිසා මෙම ගැළවීමේ පණිවිඩය දැක එය පිළිගැන්වීමට ක්‍රියා කිරීමේ උතුම් වගකීම ගිහියා පවරා ගෙන ඇත.

මේ දූත සේවාව සඳහා දේව ප්‍රසාද නිධාන මඟින් ශුද්ධාත්මයාණෝ ජනතාව ශුද්ධවත් කරනු පිණිස ශුද්ධාත්ම දීමනා විශ්වාසියකයනට දානය කරති. (1 කොරින්ති 12:7) එකිනෙකාට සේවය කරමින්. දේව වරප්‍රසාදයේ ගබඩාකරුවන් මෙන් (ඒපීස 4:10) ප්‍රේමයෙන් එකිනෙකාගේ යහපත හා සභාවේ වර්ධනය සඳහා (එපීස 4:16) මේ විවිධ දීමනා එකිනෙකාට දෙන සේක. (1 කොරින්ති 11.12). දීමනා ලැබ, ක්‍රියාකාරී වීමට සියළු විශ්වාසිකයනට ණයක් හා අයිතියක් ඇත. ඒ අතර ම සිය සහෝදරයන් සමඟ ද, ආත්මික පාලකයන් සමඟ ද සහභාගිත්වයෙන් ක්‍රියා කළ යුතු ය.

ක්‍රිස්තුන් වහන්සේ සහා දූත සේවාවේ උල්පත හා වර්ධනයයි. ගිහි දූත සේවාව ඵල දරන්නේ උන්වහන්සේ හා සමඟ ඒකාබද්ධ වීමෙන් ය."යමෙකු මා තුළ පවතී නම් හෙතෙම බොහෝ ඵල දරයි. මගෙන් වෙන්ව කිසිවක් කරන්නට ඔබට නොපිළිවනැv යි ස්වාමීන් වහන්සේ වදාළේ ඒ නිසා ය. ගිහියෝ ලෝකය තුළ තම ජීවිත තත්ත්වයට අයිති ලෞකික යුතුකම් මනා ලෙස ඉටුකළ යුතු අතර, ක්‍රිස්තුන් වහන්සේ හා සමීප සබඳතාව නැතිවී යන්නට ඉඩ නොදිය යුතු ය.

දේව කැමැත්ත අනුව ක්‍රියා කිරීමෙන් එම සබඳතාව වර්ධනය කර ගත හැක. මෙලෙස ගිහියෝ උනන්දුවෙන්, ප්‍රීතියෙන්, ශුද්ධවන්තකමෙහි වර්ධනය වෙමින්, සිහි නුවණින්, ඉවසීමෙන් සියළු අමාරුකම් පලවා හැරීමට උත්සාහ කළ යුතු ය. එලෙස ම ගෙදර කටයුතු හෝ ලෞකික කටයුතු හෝ ආත්මික ජීවිතයේ ක්‍රියා පිළිවෙලින් ඈත් නොකළ යුතු ය. "තවද ඔබ වචනයෙන් හෝ ක්‍රියාවෙන් හෝ කුමක් කරතත්, ඒ සියල්ල ජේසුස් ස්වාමීන් වහන්සේගේ නාමයෙන් කරමින් උන්වහන්සේ තුළින් දෙවියන් වහන්සේට ස්තුති කරන්න" (කොලොස්සි 3:17) මේ සඳහා විශ්වාසයේ, බලාපොරොත්තුවේ, ප්‍රේමයේ ක්‍රියාකාරී පැවැත්මක් අවශ්‍ය වේ.

අපට දෙවියන් වහන්සේ සැමතැනම දැක ගත හැකිවන්නේත්, දේව කැමැත්ත දැනගත හැකි වන්නේත්, සියළු මනුෂ්‍යයන් තුළ ක්‍රිස්තුන් වහන්සේ දැක ගත හැකිවන්නේත් දේව වාක්‍යයෙනි. දේව වාක්‍ය භාවනාව මගින් විශ්වාසයේ ආලෝකය, ලෞකික දේවල්වල අර්ථය හා වටිනාකම් ද, ඒවා මිනිසාට සම්බන්ධ වන ආකාරය ද තීරණය කිරීමට හැකියාව ලැබේ.

### විශ්වාසයේ ජීවිතයක් ගත කරන ගිහියාගේ ලක්ෂණ:

- කුරුසය හා උත්ථානය සිහිපත් කරමින් දේව දරුවනට ප්‍රකාශ වන්නට යන දේවල් ගැන බලාපොරොත්තු වේ.
- ලෞකික සම්පත්වල බැඳීමෙන් මිදී, සදාතනික ධන සම්පත් කෙරෙහි සිත යොමු කරයි.
- ජීවිත විපත් මැද මතු ජීවිතය ගැන බලාපොරොත්තුවෙන් ශක්තිමත් වෙති. (රෝම 8:18).
- දේව ප්‍රේමයෙන් උනන්දු කරනු ලබන ඔවුහු සියළු ආකාර ක්‍රෝධ, රුවටිලි, වංකකම, ඊර්ෂ්‍යාව, අපවාදය පහකර දමා (1 පේදුරු 1:2) සියළු මනුෂ්‍යයන්ට යහපත කරති. විශේෂයෙන් විශ්වාසයේ පවුලට අයිති වූවන්ට යහපත කරමින් (ගලාති 6:10) මනුෂ්‍යයන් ක්‍රිස්තුන් වහන්සේ වෙතට ඇද ගනිති.
- ශුද්ධාත්මයාණන් වගුරුවන ලද ප්‍රේමය හේතුවෙන් (රෝම 5:5) ගිහියා තම ජීවිත ක්‍රමය මගින් සුවිශේෂක භාග්‍යවල අධ්‍යාත්මික ගුණය ප්‍රකාශ කිරීමට හැකියාව සලසයි.
- දිළිඳු ජීවිතයක් ගත කළ ජේසු සමිඳුන් අනුගමනය කරමින් මෙලෝ දේ වල හිඟකමින් අධෛර්යයට පත් නොවෙති.
- ක්‍රිස්තුන් වහන්සේ ආදර්ශයන් ගනිමින් පැහැපත් වෙයි. (ගලාති 5:21).
- මනුෂ්‍යයන් සතුටු කිරීමට වඩා දෙවියන් වහන්සේ සතුටු කිරීමට උත්සාහ කරයි.
- ක්‍රිස්තුන් වහන්සේ නිසා සියල්ල අත්හැරීමට සූදානම් ව සිටියි (ලූක් 14:26).
- ධර්මිෂ්ඨකම නිසා පීඩා විඳියි. (මතෙව් 16:24)
- එකිනෙකා අතරේ ක්‍රිස්තියානි දයාව වර්ධනය කරගනිමින් හැකි සැම අවස්ථාවලදී ම අන්‍යොන්‍ය ලෙස උදව් වෙයි.
- මෙම අධ්‍යාත්මික හා දූත සේවා ජීවිතයේ ආදර්ශය වනුයේ "මරිය තුමියයි".

## 2.1.2 ගිහි දූත සේවාවේ අරමුණු

- ක්‍රිස්තුන් වහන්සේගේ ගැලවීමේ කාර්යයට, ලෞකික පිළිවෙලට නව මුහුණුවරක් දීම.
- සුවිශේෂක අධ්‍යාත්මික ගුණයන් ලෞකික පිළිවෙළ තුළට කා වද්දා, එම ලෞකික පිළිවෙලේ අඩුපාඩු සම්පූර්ණ කිරීම.
- ගිහි දූත සේවාවේ මෙම කාර්යය, ශු. සභාව තුළ හා ලෝකයෙහි ද ආත්මික අංශයෙහි මෙන්ම ලෞකික අංශයෙහි ද ක්‍රියාත්මක කිරීම.
- දේව සැලැස්මට අනුව මුළු ලොවම ක්‍රිස්තුන් වහන්සේ තුළ "නව මැවිල්ලක්" කිරීම.

- ආත්මික හා ලෞකික අංශ තුළ ගිහියා එකවිට විශ්වාසදායකයෙකු හා පුරවැසියෙකු වන බැවින් අවස්ථා දෙකෙහිදී ම ක්‍රිස්තියානි හෘදය සාක්ෂියට අනුව මඟ පෙන්වීමක් ලැබීම.
- ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් හා වරප්‍රසාදයෙන් යුක්තව මනුෂ්‍යයන්ගේ ගැළවීම සඳහා ක්‍රියා කිරීම.
- වචනයෙන්, ක්‍රියාවෙන් ක්‍රිස්තු පණිවිඩය ලොවට ප්‍රකාශ කිරීම හා උන්වහන්සේගේ වරප්‍රසාද මනුෂ්‍යයන්ට ලැබෙන්නට සැලැස්වීම.
- මේ සඳහා පූජක සේවාවත්, ගිහි දූත සේවාවත් එක්වී කටයුතු කිරීම.

## සුබාරංචිය පතළ කිරීමේ හා මනුෂ්‍යයන් ශුද්ධවන්ත කිරීමේ කාර්යය සඳහා ගිහියාට ඇති අවස්ථා:

1. ක්‍රිස්තියානි ජීවිත සාක්ෂියෙන් හා ලෝකෝත්තර අදහසින් යහපත් ක්‍රියාවලින්, මිනිසුන් ඔබේ යහපත් ක්‍රියා දැක, ස්වර්ගයේ වැඩ වසන ඔබේ පියාණන් වහන්සේට ප්‍රකාශ කරන පිණිස ඔබේ ආලෝකය ඔවුන් ඉදිරියේ බබළවන්න¨ (මතෙව් 5:16)

2. අවිශ්වාසකයන් විශ්වාසයට ගෙන එමින් ස්ථිර කරනු සඳහා උගන්වමින් ද, ප්‍රබෝධවත් ජ්වලිත ජීවිතයකට ඉඩ කඩ සෙවීමෙන්,

3. ආගමත්, සදාචාරයත්, මුළු මිනිස් සමාජයක් බිඳ දමන තරම් හායානය ඉගැන්වීම් ප්‍රචාර ඇති වත්මන් යුගයේ තම තමන්ගේ දැන උගත්කම් හා දීමනා අනුව, සහා අදහසට එකඟවන සහා ප්‍රතිපත්ති විස්තර කර දීමෙන්,

4. ලෞකික පටිපාටිය ප්‍රතිසංස්කරණය කර ක්‍රිස්තුන් වහන්සේ මගින් දෙවියන් වහන්සේවෙත යොමු කරන්නට හැකිවනු සඳහා උනන්දුවෙන් ක්‍රියා කිරීම.

**ලෞකික පටිපාටියට අදාළ අංශ:**

- ධනය, පවුලක වත්කම, කර්මාන්ත ව්‍යාපාර
- දේශපාලන සමිති සංගම්
- සංස්කෘතිය, රැකී රක්ෂා, ජාත්‍යන්තර සම්බන්ධතා ඉන් කිහිපයකි.

මේවායේ වර්ධනය හා ප්‍රගතිය මිනිසාගේ උතුම් පරමාර්ථයන් ඉටුකර ගැනීමට ආධාර වේ. ඒවායේ වටිනාකමක් ද ඇත. මේ වටිනාකම් දෙවියන් වහන්සේ විසින් ම පිහිටුවන ලද්දකි. "දෙවියන් වහන්සේ තමන් වදාළ සියළු දේ නරඹා ඉතා මනහර බව දුටු සේක". (උත්පත්ති 13:1)

මනුෂ්‍යාට සම්බන්ධ, ප්‍රයෝජනය සඳහා මවන ලද දේව මැවිල්ලට විශේෂ ගරුත්වයක් ඇත. ස්වාභාවික වුත්, ස්වභාවයට ඉවහල් වුද මේ සියල්ල ම ක්‍රිස්තුන් වහන්සේ තුළ එක්තැන් කර, උන්වහන්සේ ප්‍රධානව සිටින්නට දෙවියන් වහන්සේ සැලසූ සේක. මෙම සැලැස්ම නිසා,
- ලෞකික පටිපාටියේ නිදහසට හෝ අරමුණට හෝ
- හසුරුවන නිති රීතිවලට හෝ
- එහි ඇති වැදගත්කමට හෝ

හානියක් සිදු නොවේ. දේව සැලැස්ම හේතුකොට ගෙන ලෞකික පටිපාටිය ප්‍රාණවත් කරයි. ගුණයෙන් උසස් කරවයි. සියළු ම මනුෂ්‍යයන්ට අත්‍යවශ්‍ය වෙයි.

**ලෞකික දේ අතිසි ලෙස යොදා ගැනීම නිසා: (ජන්ම දෝෂයේ බලපෑම නිසා)**
- මිනිසා සැබෑ දෙවියන් ගැන ද
- සදාචාර නීතිවල මූලධර්ම ගැන ද

බොහෝ වැරදි ඉගැන්වීම්වලින් මුළා වී ගොස්, මිනිස් කල් ක්‍රියාව හා ඔවුන්ගේ සිරිත් විරිත් දූෂිත කරගත්හ. මනුෂ්‍යයා පහත් කොට සළකන ලදී. වර්තමානයේ බොහෝ දෙනා ¨ස්වභාවික විද්‍යා හා තාක්ෂණ දියුණුව

කෙරෙහි¨ අධික විශ්වාසය තබා, ලෞකික දේට ඇලූම්ව එම දේවල්වල ස්වාමිවරුන් මෙන් නොව වහලූන්ව සිටිති.

**සභාවේ වගකීම:**

- ලෞකික පටිපාටිය ප්‍රතිසංස්කරණය කර ක්‍රිස්තුන් වහන්සේ මගින් දෙවියන් වහන්සේ වෙත යොමු කරනු සඳහා,
- මැවීමේ පරමාර්ථ ගැන විභාග කර දැක්වීම.
- ලෞකික දේවල් භාවිතා කිරීම පිළිබඳ මූලධර්ම පහදා දීම.
- ලෞකික පටිපාටිය ක්‍රිස්තුන් වහන්සේ තුළ ප්‍රතිස්ස්කරණය කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම.

**ගිහියන්ගේ වගකීම:**

- ලෞකික පටිපාටිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සුවිශේෂයේ ආලෝකයෙන් ද
- සභා මග පෙන්වීමෙන් ද
- ක්‍රිස්තියානි දයාවෙන් ද
- දක්ෂතා ප්‍රයෝජනයට ගනිමින් සහයෝගයෙන් ද
- දේව රාජ්‍යයේ උරුමයන් වන සාධාරණ කමින් ද

හසුරුවන නීති රීතිවලට හානියක් නොකර, ක්‍රිස්තියානි මූලධර්මවලට එකඟවන පරිදි කාලය, ස්ථානය, අය සම්බන්ධයෙන් වෙනස්වියහැකි තත්ත්වයනට ගැලපෙන පරිදි මේ කාර්යය ඉටු කළ යුතු ය. මේ ධර්මදූත කාර්යයෙහි ලා ක්‍රිස්තියානි සමාජ සේවය හා සංස්කෘතිය යොදා ගත හැකි ය.

**සභාව සෑම දූත සේවාවක් ම ආරම්භ කරන්නේ**

1. දයාව පදනම් කරගෙන ය. දූත සේවයට මෙමගින් ශක්තිය ලැබේ. දයාවේ සේවාව ගැලවීමේ කාර්යයයේ විශේෂ ලක්ෂණය වීම ක්‍රිස්තුන් වහන්සේගේ අභිමතය වූහ. (මතෙව් 11:4-5)
2. ක්‍රිස්තුන් වහන්සේ "අසල්වැසි ප්‍රේමය" තමාගේ පණතක් කරගෙන එය නව උපදේශකයින් හරවත් කළ සේක. තමන් වහන්සේට සමානව තම සහෝදරයන් ද මේ ප්‍රේමයට කොටස්කරුවන් කරගත්හ. "සැබැවින් ම මම ඔබට කියමි. මේ මාගේ සහෝදරයන් අතරෙන් ඉතා කුඩා වරයෙකුට පවා කළ දේ මට ම කළාහු ය" (මතෙව් 25:40)
3. උන්වහන්සේ මිනිස් බව ගෙන, මුළු මිනිස් සංහතිය ම එක් පවුලක් වශයෙන් ලෝකෝත්තර බැම්මකින් තමන්ට සම්බන්ධ කරගත් සේක.
4. තම ගෝලයන් හැඳින ගන්නට විශේෂ සලකුණ සහෝදර දයාව බව ප්‍රකාශ කළ සේක. ¨ඔබ එකිනෙකාට ප්‍රේම කළොත් ඔබ මාගේ ගෝලයන් වන බව සියළු මනුෂ්‍යයෝ දැන ගනිති¨ (ජොහන් 13:35)
5. ශු. සභාව ආරම්භයේ දී සත්ප්‍රසාද රාත්‍රී භෝජනයට, මිත්‍ර භෝජනය එකතු කිරීමෙන් ප්‍රේම බැම්මෙන් බැඳී ක්‍රිස්තුන් වහන්සේ අවට එක්රුස්වී සිටි. එහෙයින් සභාව ප්‍රේමයේ සලකුණකි.
6. සභාව දයාවේ කෘත්‍යයන්, අන්සතු කළ නොහැකි යුතුකමන් ද, ආධිපත්‍යයක් ද වන බව නිතර කියා සිටි. එහෙයින්, දිළිඳුන්ට, රෝගීන්ට අනුකම්පාව ද, සියලූ ආකාරයේ අවශ්‍යතාවල දි මනුෂ්‍යයන්ට සහනය ගෙන දෙන කටයුතු හා එකිනෙකාට ආධාර දීමේ ආයතන ද සභාව ගෞරවයෙන් සලකයි.
7. මුළු ලොව වැසියෝ එක ම පවුලක අය ලෙස සිටිති. පරහට දයාවේ සේවා අද වැනි යුගයක ඉතා අවශ්‍යව ඇත. ආහාරපාන, ඇඳුම් පැළඳුම්, ඉඳුම් හිටුම්, බෙහෙත්, රැකී රක්ෂා හා අධ්‍යාපනික පහසුකම් හිඟ තැන්වලට මේ සේවා ලැබිය යුතු ය. එසේ ම පීඩාවලින් දුර්වලව ශරීර සෞඛ්‍යයෙන් හිරිහැර විඳින මනුෂ්‍යයන්ට මේ දයා සේවා පැතිර යා යුතු ය. මේ සඳහා ධනවතුන්ට හා සමෘද්ධිමත් රටවල් වලට යුතුකමක් ඇත.

**දයාවේ සේවාවලදී අඩුපාඩු ඇති නොවනු පිණිස:**

- අසල්වැසියා දේව සමානකමට මවන ලද බව පිළිගත යුතු ය.
- දිළිඳුන්ට දෙනු ලබන දේ ක්‍රිස්තුන් වහන්සේට දෙනු ලබන බව මතක තබා ගත යුතු ය.
- උදව්වක් ලබන තැනැත්තාගේ පෞද්ගලිකත්වයට හිමි ගරුත්වය ගැන ද සැළකිලිමත් විය යුතු ය.

- දෙන තැනැත්තා පෞද්ගලික වාසිය නොතකා පිරිසුදු සිතින් දිය යුතු ය.
- යමෙකුට සාධාරණකමින් ලැබිය යුතු දේ ගැන විශේෂයෙන් සළකා බැලිය යුතුව ඇත.
- සාධාරණව දෙන දේ, දයාවෙන් දෙන ත්‍යාගයක් ලෙස නොපෙන්වීමට වග බලා ගත යුතු ය.
- උදව් ලබන අය වැටී සිටින විපත්වල ප්‍රතිඵල ගැන පමණක් නොව විපත්වලට හේතු ද, ඉවත් කිරීමට ද උත්සාහ කිරීම වැදගත් ය.
- උදව් ලබන අයට ද අනුන් මත රැඳී නොසිට අනුන් සහාය නොමැතිව ජීවත් වීමට හැකිවන පරිදි උදව් කළ යුතු ය.
- පෞද්ගලික, රාජ්‍ය, ජාත්‍යන්තර සංවිධාන මගින් කරන සමාජ සේවයට, දයා දේවාවලට හැකි පමණ උදව් වීම ගිහියන්ගේ යුතුකම් ය.

## 2.1.3 ගිහි ධර්ම දූත සේවාවට ඇති ඉඩ ප්‍රස්ථා:

**අ) ගිහි ධර්ම දූතයෝ සභාව තුළ හා ලෝකයා තුළ විවිධ කාර්යයන් හි යෙදී සිටිති. මේ අංශ දෙකටම ඇති අවස්ථා නම්,**

- සභාවේ සමිති සමාජ, පවුල තරුණ ජනයා - ජාතික හා අන්තර් ජාතික කටයුතු
- සමාජ මණ්ඩල

**ආ) ක්‍රිස්තුන් වහන්සේගේ පූජක, අනුශාසක, රාජකීය කාර්යයන් සඳහා පංගුකාරකම් ද ගිහියන්ට ඇත. එනයින් සභාවේ ජීවිතය හා ක්‍රියාකාරිත්වය තුළ කළ යුතු යුතුකම් වන්නේ,**

- සභා පාලකයන්ගේ සේවය ඵලදායි කිරීමට ක්‍රියාකාරී සහයෝගය (1 කොරින්ති 16:17-18) තම සමාජයේ දේව වන්දනා ජීවිතයට ක්‍රියාකාරී ලෙස සහභාගි වෙමින් සමාජයේ ධර්මදූතික කටයුතු වලට ද පංගුකාර වීම.
- සභාවෙන් ඈත්ව සිටින්නන්, සභාව තුළට ගෙන ඒම සඳහා ධර්මෝපදේශය හා දේව වාක්‍ය මගින් උනන්දුවෙන් සහයෝගය දැක්වීම.
- තම දක්ෂතා යොදා ගනිමින් ආත්මයන් රැකබලා ගැනීම.
- සභාවේ ලෞකික දේ හැසිරවීම හා වඩා සඵලමත් කිරීම.

**ඇ) ගුරු වසම තුළ:**

- පූජා ප්‍රසාදි තුමෙකුගේ පාලනයට අයත්, එකට එකතු වූ සමූහයකගේ දූත සේවාවට ආදර්ශවත් තැනකි මේ.
- විවිධාකාරව ජීවත්වන මනුෂ්‍යයන් සභාව නම් පොදු සංස්ථාවට එක්කරනු ලබයි.
- ගිහි ධර්මදූතයෝ පූජාප්‍රසාදි වරුන් හා උනන්දුවෙන් වැඩ කිරීමට පුහුණු වෙති.
- විසඳීමට ඇති තම ප්‍රශ්න, ලෝක ගැටළු, මිනිස් ගැලවීම පිළිබඳ දුෂ්කර කරුණු වැනි දේ සභාවේ සහයෝගයෙන් විසඳා ගැනීම කළ යුතු වේ.
- තමන් වසන ප්‍රදේශවල සභාවෙන් ආරම්භ කළ දූත සේවාවන්ට මහත් උනන්දුවෙන් සහයෝගය දීම බලාපොරොත්තු වේ.

**ඈ) රදගුරු වසම තුළ:**

- මීසම රදගුරු වසමට අයත් ය. ඒ නිසා ගුරු වසම් එකකට පමණක් නොව ගුරු වසම් කිහිපයකට වුව ද රදගුරු පදවි කිහිපයකට වුවද සහයෝගය දැක්වීමට සූදානම් විය යුතු ය.
- එසේ ම, ජාතික, අන්තර් ජාතික අවශ්‍යතා සළකා සේවාවන්ට ඉදිරිපත් විය යුතු ය.
- බාහිරව ආධාර දීමෙන්, පෞද්ගලික සේවයට කැපවීමෙන්, දූත සේවාව තමාගේ කාර්යය කර ගැනීමට උත්සාහ දැරිය යුතු ය.
- දෙවියන් වහන්සේගෙන් ලබා ගත් යහපත් දේවලින් කොටසක් වත් උන්වහන්සේට ආපසු දීම යුතුකමක් ද ගෞරවයක් ද වන බව සැලකිය යුතු ය.

**ඉ) පවුල් ජීවිතය තුළ:**

- පවුල, මිනිස් සමාජයේ පැවැත්ම හා වර්ධනය සඳහා පිහිටුවන ලද්දකි.
- දේව වරප්‍රසාදයෙන් ක්‍රිස්තුන් වහන්සේ හා සභාව අතරේ ඒකාබද්ධකම අඟවන උතුම් අභිරහසක් ද වේ. (එපීස 5:32)
- ඒ නිසා පවුලේ දූත සේවාව සභාවට, රටවැසි සමාජයට ඉතා වැදගත් වේ.
- ක්‍රිස්තියානි අඹුසැමි දෙදෙන තමන්ට, දරුවන්ට, ගෙවැසියන්ට සහයෝගය දක්වමින් විශ්වාසයට සාක්ෂි දරති.

**දරුවන් සඳහා:**

- තම දරුවන්ට විශ්වාසය ප්‍රකාශ කරමින් ඔවුන් පුහුණු කරති.
- වචනයෙන් හා ආදර්ශයෙන් ක්‍රිස්තියානි ජීවිතයට, දූත සේවාවට ඔවුන් හැඩ ගස්වති.
- කැඳවීමක් තෝරා ගැනීමේ දී ඥානවන්ත ලෙස ඔවුන්ට උදව් වෙති.
- කැඳවීමක් ඇති බව පෙනී ගියහොත් එය පෝෂණය කරති.

**අඹුසැමි දෙදෙනාගේ යුතුකම් අතර:**

- විවාහ බන්ධනය නොකැඩිය හැකි ශුද්ධ වූ දෙයක් බව තම ජීවිතයෙන් ප්‍රකාශ කිරීම, ඔප්පු කිරීම.
- තම දරුවන්ට ක්‍රිස්තියානි අධ්‍යාපනයක් දීමට මව්පිය භාරකරු හැම දෙනාට ම අයිතියක් හා යුතුකමක් ඇති බව කියා සිටීම.
- පවුලේ උතුම්කම හා නියම ස්වාධීනත්වය ආරක්ෂා කිරීම. එබැවින් රජය නීති පැනවීමේ දී මෙම අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම සඳහා මව්පියන් හා අනෙකුත් විශ්වාසිකයන් අවශ්‍ය වූ අය සමඟ සහයෝගයෙන් ක්‍රියා කිරීම.
- සමාජ තත්ත්වය නඟාලීම සඳහා රජයේ ක්‍රියා මාර්ගයන්හි දී නිවාස සැපයීම, බාලයන්ගේ අධ්‍යාපනය කම්කරු තත්ත්වය, සමාජ සංරක්ෂණය හා අයබදු ක්‍රම සම්බන්ධයෙන් පවුල්වල අවශ්‍යතා ගැන සළකා බැලීම.
- පදිංචිය හැර වෙනත් රටකට හෝ පළාතකට යාමේ දී පවුලක් වශයෙන් එක්ව ජීවත් වීමේ පහසුකම් ඇතිකර ගැනීම.

**පවුලට පැවරී ඇති සමාජමය වගකීම් අතර:**

- වගකීම දෙවියන් වහන්සේ විසින් පවරා දී ඇත. එකිනෙකා අතරේ අන්‍යෝන්‍ය ශ්‍රද්ධාවෙන් හා පොදු යාච්ඤා මගින් මේ වගකීම් ඉටුකළ යුතු වේ.
- පවුල ශු. සභාවේ ගෘහස්ථ ශුද්ධ භූමියයි. සභාවේ නිල වන්දනාවට සහභාගී වේ.
- උද්යෝගීමත්ව ආගන්තුක සත්කාර කෙරේ.
- අගහිඟකම් ඇති සහෝදරයන්ට සේවාවේ සම්බන්ධයෙන් යුක්ති සහගතව ද, පුණ්‍ය ක්‍රියා මගින් ද සහා උන්නතිය සඳහා ක්‍රියාකාරී වේ.
- පවුල් දූත සේවා අතර,

- අතහැර දමන ලද ළමුන් බලා ගැනීම.
- ආගන්තුකයන් කරුණාවෙන් පිළි ගැනීම.
- පාඨශාලා පහසුකම් ඇති කිරීම.
- යෞවනයන්ට ලෞකික වශයෙන් හා උපදෙස් වලින් සහය වීම.
- විවාහ අපේක්ෂකයන් විවාහයට සූදානම් කිරීම.
- ධර්මෝපදේශය ඉගැන්වීම.
- ලෞකිකව හෝ සදාචාරාත්මකව පිරිහී ඇති අඹුසැමියන්ට හා පවුල්වලට ආධාර කිරීම.
- වයස්ගත වූවන්ට අවශ්‍ය දේ සපයා දීම.

එසේ ම සභාව අලුතින් ආරම්භ කර ඇති තැන්වල ද සභාව අන්තරාය සහිත අවස්ථාවලට මුහුණ පෑ ස්ථානවල ද ක්‍රිස්තියානි පවුල මුළු ජීවිත කාලය තුළ දී, සුබාරංචියට විශ්වාසවන්තව සිටිමින් සැබෑ

ක්‍රිස්තියානි විවාහයේ ආදර්ශයක් වී ලොවට සාක්ෂි දරති. එම ප්‍රදේශවල පවුල් කණ්ඩායම් වශයෙන් සංවිධානය වූවොත් දූත සේවාවේ අරමුණු වඩාත් පහසුවෙන් ඉටුකර ගැනීමට ආධාරයක් වේ.

### ඊ) තරුණ පක්ෂය තුළ:

- වර්තමාන සමාජය කෙරේ තරුණ පක්ෂයේ බලපෑම ඉමහත් ය.
- ඔවුන්ගේ ජීවිත පැවැත්ම.
- මානසික ආකල්ප. පවුල් සමඟ ඇති සම්බන්ධතාව.
- නව සමාජය හා ආර්ථික දර්ශනයන් කෙරේ ඇදී යාම.
- දිනෙන් දින වර්ධනය වන ඔවුන්ගේ සමාජමය වූද, දේශපාලනමය වූද වැදගත් කම.
- යුතුකම් ඉටු කිරීමෙහි ඇති අපොහොසත් බව.

**බලාපොරොත්තු:**

- හැකියාවන් හා ශක්තීන් වර්ධනය වන ප්‍රමාණයට දූත සේවාවක්.
- ඵලදායි සහ දක්ෂතා සමග තම පෞරුෂ වර්ධනය ගැන හැඟීමක් වර්ධනය වෙත්ම, පහළ වන අධික ජ්වලිතකම තුළින් ධර්මදූත සේවීන්ට වගකීම් පවරා දීම.
- සමාජමය හා සංස්කෘතික අංශවලින් යුතුකම් ඉටු කිරීමට දක්වන කැමැත්ත සපුරාලීමට අවස්ථාව සැලසීම.
- ජ්වලිත ක්‍රිස්තු ආධ්‍යාත්මිකත්වයෙන් යුතුව, සහා පාලකයන් වෙත කීකරුව ප්‍රේමයෙන් වගකීම් ඉටු කිරීම.
- තමා ජීවත් වන පරිසරයට ගැලපෙන ලෙස තම තමන් අතර දූත සේවාවේ යෙදීමට සූදානම් වීම.
- වැඩිහිටි තරුණ පක්ෂ මිත්‍ර ලීලාවෙන්, සාකච්ඡා මගින් එකී පක්ෂවලට විශේෂිත වූ යහපත් දේ බෙදා ගැනීම.

### උ) ළමයින් විසින්:

තම මිතුරන් අතර තම තත්ත්වය අනුව ක්‍රිස්තුන්වහන්සේට සැබෑ වූ ජීවමාන සාක්ෂියක් වීම.

### ඌ) වැඩිහිටියන් තුළ:

- දූත සේවාව මගින් සමාජ පටිපාටියෙහි සිතුවිලිවලට, සිරිත්වලට, නීති රීතිවලට, සංස්ථා තුළට, ක්‍රිස්තියානි ආකල්ප හා ස්වභාවයන් කා වැද්දීමට උත්සාහ කිරීම.
- ඒ සඳහා ජීවිතයෙන්, වචනයෙන් දෙන සාක්ෂියෙන් සම්පූර්ණ කළ යුතු ය.

**ඒ සඳහා විශේෂ අවස්ථා,**

- ඉගෙනුම ලබන තැන්වලදී.
- තම සේවා ස්ථානයේදී.
- විනෝදය හා ක්‍රීඩා සඳහා රුස්වන තැන්හිදී.
- පදිංචි ස්ථානයේදී.
- මිතුරන් අතරෙහි.

**සභාව තුළ දූත සේවය ඉටු කිරීමේ දී.**

- අන් සියලු දේට වඩා ජීවිතයට විශ්වාසයට අනුකූල වෙමින් ලෝකයට ආලෝකයක් විය යුතු ය. සේවය සැමවිට ම අවංකව කිරීම බලාපොරොත්තු විය යුතු ය.
- සහෝදර දයාව ඉස්මතු විය යුතු ය. තම සහෝදරයාගේ ජීවන තත්ත්වයට, ඔවුන්ගේ වැඩවලට, දුක් කරදරවලට, බලාපොරොත්තුවලට කොටස්කරුවන් වී සහෝදර දයාව ප්‍රකාශ කළ යුතු ය.

- සහෝදර දයාවේ ක්‍රියා නිසා අවට සිටින අයගේ සිත් ක්‍රමයෙන් නොදැනුවත්ව ම වරප්‍රසාදීය, ගැලවීමදායක තත්ත්වය කරා ඇද ගැනීමට සමත් වේ.
- පවුල් අතර, සමාජය තුළ, සේවා ස්ථානවල සිය යුතුකම් තේරුම් ඇතිව උදාර ක්‍රිස්තියානි ලීලාවෙන් ඉටු කළොත් එම ක්‍රියා පිළිවෙල විනිවිද යයි.
- සැබෑ ධර්මදානය සඳහා අසල්වැසියාට වචනයෙන් ද ක්‍රිස්තුන් වහන්සේ ප්‍රකාශ කිරීමට අවස්ථා සෙවිය යුතු ය. මන්ද සුබාරංචියෙන් ක්‍රිස්තුන් වහන්සේ දැන ගනියි.
- ජාතික, අන්තර්ජාතික දූත සේවාවේ යෙදීමෙන්, තම මව්බිම වෙත ප්‍රේමයෙන්, රාජ්‍ය යුතුකම් විශ්වාසවන්තව ඉටු කිරීමට කතෝලිකයෝ බැඳී සිටිති.පනවනු ලබන නීති සදාචාර ප්‍රතිපත්තවලට, පොදු යහපතට අනුකූලව ක්‍රියාත්මක කිරීමට, තම මතයන් හි වැදගත්කම පෙන්වා දෙමින් අවශ්‍ය
- අවස්ථාවලදී කටයුතු කිරීම.
- පොදු ජන සුබ සිද්ධියට අදාළ කටයුතු භාර ගැනීමට, සේවයට දක්ෂ, විශ්වාසිකයින් හා ක්‍රිස්තියානි ධර්මය කෙරේ පැහැදීමක් ඇති කතෝලිකයෝ අකමැති නොවිය යුතු ය. (පිළිප්පි 4:8)
- කල්පනාකාරීව, ගුණවත්කමින්, සාකච්ඡා මගින්, සුවිශේෂක අධ්‍යාත්මික ගුණය අනුව දියුණු කළ හැකි සමාජයීය හා මහජන සංස්ථාවන් දෙස සුපරක්ෂාකාරීව බැලිය යුතු ය.
- සාමූහිකත්වයේ හැඟීම් දියුණු කරන්නට උනන්දු වීම ද එය අවංක, සත්‍ය, සහෝදරත්වයේ තත්ත්වයකට හැරවීම ද ගිහි ධර්ම දූත සේවාවේ කාර්යයක් වේ.
- ගිහියා අන්තර් ජාතික පටිපාටියෙහි ඇතිවන තාර්කික හා ප්‍රායෝගික කරුණු, ඒවා විසඳන අයුරු, දියුණුව කරා ගමන් කරන රටවල් ගැන දැන සිටිය යුතු ය. විවිධ ජාතීන් අතර සම්බන්ධතා හා සහෝදරත්වය හුවමාරු කරගත යුතු ය.
- ජාතික අන්තර් ජාතික පෞද්ගලික කටයුතු සඳහා යෙදෙන චාරිකාවලදී ක්‍රිස්තු සංචාරක දූතයන් සේ ක්‍රියා කළ යුතු ය.

## 2.1.4 ගිහි ධර්මදූත සේවාවේ විවිධ ක්‍රම

### අ) පෞද්ගලික ධර්මදූත සේවාව

සැබෑ ක්‍රිස්තියානි ජීවන උල්පතකින් ත්‍යාගවන්ත ලෙස ගලා එන (ජොහන් 4:14) පෞද්ගලික ගිහි ධර්ම දූත සේවාව මුළු ගිහි ධර්මදූත සේවාවේ ද, සංවිධානය කරන ලද දූත සේවාවන්හි ද, උපත හා සැකැස්ම ද වෙයි. මීට සමාන කළ හැකි අන් සේවාවක් නැත.

තම තත්ත්වය කුමක් වුවත්, සංවිධානය කරන ලද දූත සේවාවන්හි වැඩ කිරීමට අවස්ථාවක් නොමැති සියලූ ගිහියෝ දූත සේවාවට කැඳවා, සේවයේ යෙදීමට බැඳී සිටිති. සභාවේ දියුණුවට, ලොව ශුද්ධවන්ත කිරීමට, ක්‍රිස්තුන් වහන්සේ තුළ එයට ජීවනය දීමට ආධාරවන දූත සේවා බොහොමයක් ගිහියන්ට ඇත.

### ආ) පෞද්ගලික දූත සේවාවේ විශේෂ කාර්යය.

- ප්‍රේමයෙන්, විශ්වාසයෙන්, බලාපොරොත්තුවෙන් නික්මෙන ගිහි ජීවිත සාක්ෂිය, ක්‍රිස්තුන් වහන්සේ විශ්වාස කරන්නන් තුළ උන්වහන්සේ ජීවත් වන බවට සාක්ෂි දරති.
- වචනයේ සේවාවෙන් ක්‍රිස්තුන් වහන්සේව ප්‍රකාශ කරති.
- හැකි පමණින් ධර්මය පහදා දෙමින් ධර්මය පතුරුවා හරිති.
- විශ්වාසවන්තව ධර්මය ප්‍රසිද්ධියේ කියාපාති.
- තව ද, ලෞකික ජීවිත ක්‍රියාවලිය දියුණු කිරීමට සහයෝගය දැක්වීම.
- තම පවුල් හා වෘත්තීය හා සමාජමය ජීවිත තුළ උසස් පරමාර්ථ ඇතිව ජීවත් වෙමින් අවශ්‍ය අවස්ථාවලදී අන්‍යයන්ට මග පෙන්වති.
- මෙලෙස ඔවුහු මැවුම්කාර, ගැළවුම්කාර සහ ශුද්ධවන්ත කරන්නාවූ දෙවියන් වහන්සේ හා සහයෝගීව උන්වහන්සේට ප්‍රශංසා කරති.
- තම ජීවිතය දේව ප්‍රේමයෙන් ප්‍රාණවත් කරමින්, හැකි පමණින් එම ප්‍රේමය තමන්ගේ ක්‍රියා තුළින් ප්‍රකාශ කරති.
- නිල වන්දනාව පෞද්ගලික යාච්ඤා, ස්වදමනය, ජීවිතයේ වෙහෙස මහන්සිය, කම්කටොළු සිය කැමැත්තෙන් දරා ගැනීමෙන් සියළු මනුෂ්‍යයන් වෙත ළඟා වෙමින්, ගැලවීම සඳහා ඔවුන්ට ආධාර

කරමින්, සෑම කිතුනුවෙක් ම දුක් විඳින ක්‍රිස්තුන් වහන්සේට සමාන වෙයි. (2 කොරින්ති 4:10, කොලොස්සි 1.24)

**පෞද්ගලික දූත සේවාවේ වැදගත්කම:**

1. සභා නිදහස බොහෝ දුරට සීමා වී ඇති ප්‍රදේශවලට ඉතා අවශ්‍ය වේ.

- මෙම දුෂ්කර ප්‍රදේශවලදී ඔවුහු පූජාප්‍රසාදිවරුන්ගේ සේවය පවරා ගනිති. තම නිදහසට, තම ජීවිතයට එල්ල වන අනතුරුවලට මුහුණ දෙමින් අවට අයට ධර්මය උගන්වති.
- කතෝලික ජීවිතයකට මෙන්ම කතෝලික චිත්ත ස්වභාවයකට ද පුහුණු කරති.
- දේව ප්‍රසාද නිධාන ලබා ගැනීමට ඔවුන් පොළඹවති.
- විශේෂයෙන් දිව්‍ය සත්ප්‍රසාදය කෙරේ භක්තිය ඇති කර ගැනීමට සලස්වති.

2. කතෝලිකයන් හිඟ, එලෙස ම විශාල ලෙස විසිරී සිටින ප්‍රදේශවලට මේ දූත සේවාව අවශ්‍ය වේ. මෙහිදී විධිමත් සමිති සමාගම් හා අනෙකුත් සංවිධාන නොමැතිව කුඩා කණ්ඩායම් වශයෙන් එකතු වී ක්‍රියා කිරීමට හැකි වෙයි. මෙලෙස ක්‍රියා කරද්දී සමාජයක් වන සභාව ප්‍රේමයට සැබෑ සාක්ෂියක් වෙයි. තවද මිත්‍රත්වයෙන් තම අත්දැකීම් වලින් ඔවුනොවුන්ට ආධාර දෙමින් තම හුදෙකලා ජීවිතයේ හා ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵල ජයගෙන දූත සේවාව සඵල කර ගැනීමට පොහොසත් වෙති.

3. විශ්වාසිකයෝ විවිධ පරිසරයන්හි පෞද්ගලික දූත සේවාව කළත්, ඔවුන් ක්‍රිස්තුන් වහන්සේ හා සභාව තුළ සහභාගිත්වය හා ඒකාබද්ධතාව දරති. "දෙතුන් දෙනෙක් මාගේ නාමයෙන් යම් තැනක රැස්ව සිටින්නේ ද මම ඔවුන් මැද සිටිමි." (මතෙව් 18:20)

## ඇ) සාමූහික දූත සේවාව:

**වැදගත් කොට සැලකීමට හේතු**

- සභාවේ සමාජවල, අනෙක් විවිධ මණ්ඩලවල දූත සේවාව බොහෝ විට හවුල්ව ක්‍රියා කරනු ලැබීමට අවශ්‍ය වීම.
- සාමූහික සමිති සමාගම් මගින් සාමාජිකයෝ ශක්තිමත් කරනු ලබති.
- ඔවුන් දූත සේවාවට පුහුණු කරනු ලබති.
- දූත සේවා වැඩ සංවිධානය කර හසුරුවනු ලබති. එම නිසා පෞද්ගලික ක්‍රියාකාරිත්වයට වඩා ඵලදායකය.

**සාමූහික සේවාව තවත් පණ ගැන්වීම අවශ්‍ය වන්නේ:**

- වර්තමාන ධර්මදූත සේවා ඉලක්කයන් සම්පූර්ණයෙන් ඉටුකර ගැනීමට
- එම සේවාවේ අයිතිවාසිකම් ස්ථිර ලෙස රැක ගැනීමට
- සියළු දෙනාගේ උත්සාහයන් එකට එකතු කිරීමට
- ධර්ම දූත සේවාවට සම්බන්ධ වන අයගේ පොදු හැඟීම්වලට ද ඔවුන්ගේ සමාජයීය පසුතලයට ද අදාල ලෙස සංවිධානය වීමට, එසේ නොවුවහොත් දූත සේවකයන් මහජන මතයෙහි හා සමාජ නියමයන් හි බලපෑම්වලට මුහුණ දෙන්නට තරම් ශක්තිමත් නොවන නිසා ය.

**සාමූහික දූත සේවාවේ සමිති සමාගම්වල පරමාර්ථ:**

සභාව පොදු ධර්මදූත මෙහෙය වන අතර, අනෙක්වා විශේෂාකාරයෙන් සුබාරංචිය පැතිරවීමෙහි ද මනුෂ්‍යයන් ශුද්ධවන්ත කිරීමෙහි ද යෙදෙයි. සමහරක් ලෞකික ක්‍රියාකාරී තත්ත්වයනට, ක්‍රිස්තියානි අධ්‍යාත්මික ගුණය කාවැද්දීමට බලාපොරොත්තු වන අතර තවත් සමහරක් දයාවේ, ප්‍රේමයේ කාර්යයන් මගින් ක්‍රිස්තුන් වහන්සේට විශේෂාකාරයකින් සාක්ෂි දෙයි.

මෙම සමිති සමාගම් වලින් සාමාජිකයන්ගේ දෛනික ජීවිතය හා ඔවුන්ගේ විශ්වාසය අතර එකඟතාව පෝෂ්‍ය කරන ඒවා වැදගත් වේ. මක්නිසාද ලෝකයට සභාව කළ යුතු සේවාවට ඒවා ආධාර කරන නිසා ය. තවද එම සමිති සමාගම්වල ධර්මදූත ශක්තිය සහා පරමාර්ථවලට ගැලපෙන අයුරින් ද, එක එක සාමාජිකයාගේ හා මුළු සංවිධානයේ ම ක්‍රිස්තියානි සාක්ෂිය සුබාරංචි වටිනාකම් මත රඳා පවතින නිසා ද වෙයි.

සමාජ සංස්ථාවල දැනට දක්නට ලැබෙන දියුණුව නිසා ද, වර්තමාන සමාජය ඉක්මනින් වෙනස්වන නිසා ද සභාවේ දූත සේවා වඩ වඩා ජාත්‍යන්තර සංවිධානයක් බවට හැරවීම, ලෝකයම වැළඳ ගන්නා කතෝලික සභාවේ පොදු මෙහෙයට ගැලපෙයි. ජාත්‍යන්තර සංවිධානයන්ට අයත් සාමාජිකයන් ජාත්‍යන්තර සංවිධාන හා සමීප සබඳතා පැවැත්වුවොත් වඩා ඵලදායි පරමාර්ථ ඉටුකර ගත හැකි වෙයි.

සභා පාලකයන් සමග සබඳතා ඇති කරගෙන මෙවැනි සමිති සමාගම් පිහිටුවා පවත්වාගෙන යාමට ද, බැඳී කටයුතු කිරීමට ද ගිහියාට අයිතියක් ඇත. රදගුරුවරුන් හා සබඳතා පවත්වා ගනිමින් දේව රාජ්‍යය සඳහා වැය වූ සමිති සමාගම් ද විය. ඒවායින් උසස් ප්‍රතිඵල ගෙනදුන් අතර, ශුද්ධෝත්තම පියවරු හා රදගුරුවරු මෙම සේවා "කතෝලික ප්‍රයත්නය" නමින් හැඳින්වූහ.

## මෙම දූත සේවාවල එකට සංයුක්ත වී ඇති විශේෂ ලක්ෂණ:

- මෙම සංවිධානවල ආසන්න පරමාර්ථ, දූත සේවා පරමාර්ථවලට සමාන ය. **උදා:** සුබාරංචිය පතුරුවා හැරීම, මනුෂ්‍යයන් ශුද්ධවන්තයින් කිරීම, හෘදය සාක්ෂින් හැඩගැස්වීම.
- රදගුරු මණ්ඩලය සමග සහයෝගයෙන් සිටිමින් මෙම සංවිධාන පවත්වාගෙන යාමත්, සභා පාලන ක්‍රියාකාරිත්වයට අවශ්‍ය පසුතලය පිළියෙල කිරීමත්, තම අත්දැකීම් උපයෝගී කර ගැනීමත් බලාපොරොත්තු වේ.
- ගිහියන් ප්‍රාණවත් ශරීරයක් මෙන් කටයුතු කරන බැවින් සමාජ තත්ත්වය වඩාත් නිරූපණය කරනු ලැබ දූත සේවාව වඩාත් ප්‍රබල වේ.
- සිය කැමැත්තෙන් හෝ ආරාධනය ලැබූ හෝ ගිහියෝ රාජගුරු මණ්ඩලයේ මග පෙන්වීම යටතේ ක්‍රියා කරති.
- මෙම සංවිධාන නොයෙක් නම්වලින් හඳුන්වනු ලැබුවද ඒවා කතෝලික ප්‍රයත්න වශයෙන් සැලකේ.

ඉහත සඳහන් ලක්ෂණ තවත් වැඩි දියුණු කරගන්නටත්, සභාවේ දූත සේවා අනෙක් ක්‍රියා මාර්ගයන්ට නිතර සහයෝගය දෙන්නටත්, ඒ ඒ සමාජ තුළ සේවයේ යෙදී සිටින පූජා ප්‍රසාදීවරුන්ට ද ගිහියන්ට ද ආරාධනය කරයි.

වත්මන් කතෝලික ජාත්‍යන්තර සමිති සමාගම්, මෙම සමිති සමාගම් අතර විශේෂ තැන්හි ලා සැලකිය යුතු ය. රාජගුරු ප්‍රසාදීවරුන් පසසන ලද හෝ විශේෂයෙන් අවශ්‍යවන, පිහිටුවන්නට නියම කරන ලද හෝ මෙම සමිති සමාගම් පූජා ප්‍රසාදින්, පැවිද්දන්, ගිහියන් ගෞරවයෙන් සැලකිය යුතු ය.

## IV. ගිහි ධර්ම දූත සේවාවේ නිසි පිළිවෙල රැකීම

ගිහි ධර්මදූත සේවාව පෞද්ගලිකව හෝ සංවිධානාත්මකව හෝ කෙරුණ ද ඊට මනා පිළිවෙළක් ඇතුළත් විය යුතු ය. ඒ සඳහා

- අවශ්‍යයෙන් ම සභා පාලකයන් හා සම්බන්ධතා පැවැත්විය යුතු ය.
- දූත සේවාවේ විවිධ ව්‍යාපාරයන් අතරේ සහයෝගය ද ඉතා අවශ්‍ය වේ.
- මුළු දූත සේවාව තුළ සහෝදරත්වය කැපී පෙනෙන ලෙසට;
  - සමගිය වර්ධනය වීම (පූජක, පැවිදි ගිහි)
  - පොදු අරමුණු මුදුන් පමුණුවා ගැනීම
  - අනර්ථකාරී තරඟවලින් වැළකීම
  - විවිධ අංග අතර අන්‍යොන්‍ය ගෞරවයක් තිබීම අවශ්‍ය ය.

### පිළිවෙළ රැකීමේ දී රදගුරු යුතුකම්

- දූත සේවාව දියුණු කිරීම
- ආත්මික ප්‍රතිපත්ති අනුව එයට ආධාර දීම

- දූත සේවාවේ ක්‍රියාකාරිත්වය සභාවේ පොදු යහපතට යොමු කිරීම
- ධර්මය හා පිළිවෙළ ආරක්ෂා වන ආකාරයට රැකබලා ගැනීම
- සාර්ථක දූත මෙහෙයයන් අගය කිරීම,
- පොදු යහපත සඳහා, විශේෂයෙන් ආත්මික පරමාර්ථ ඇති දූත සේවා හා ව්‍යාපාරවලින් සමහරක් තෝරා ගෙන, තම විශේෂ වගකීම් යටතේ වඩා උසස් තත්ත්වයකට පත් කිරීම.
- දූත සේවාවේ යෙදෙන ගිහියන් විශේෂයෙන් රැකබලා ගැනීම.

## රදගුරුවරුන් විසින් ගිහියන්ට පවරනු ලබන ඇතැම් කාර්යයන්:

### අ) ක්‍රිස්තියානි ධර්මය ඉගැන්වීම

- ජනවන්දනාවේ ඇතැම් ක්‍රියාකාරිත්වයන් ඉටු කිරීම
- ආත්මයන් රැකබලා ගැනීම

**ආ) ලෞකික පටිපාටියේ ක්‍රියාකාරිත්වයන් හා සංස්ථාවන් සම්බන්ධයෙන් රදගුරු කාර්යභාරය වනුයේ,**

- ලෞකික දේවලදී අනුගමනය කළ යුතු සදාචාර ප්‍රතිපත්ති ඉගැන්වීම හා ඒවා සත්‍යාකාරයෙන් පහදා දීම.
- සියළු කරුණු සියුම් ලෙස පරීක්ෂා කර බැලීම.
- විශේෂඥ උපදෙස් ලබාගෙන, ඒවායේ ක්‍රියාකාරිත්වයන් හා සංස්ථාවන් සදාචාර ප්‍රතිපත්තිවලට ගැලපේදැයි විනිශ්චය කිරීම.
- ලෝකෝත්තර පටිපාටියේ යහපත රැක ගැනීමට හා නගාලීමට අවශ්‍ය දේ තීරණය කිරීම
- ගිහි දූත සේවා දියුණු කිරීමේ කාර්යයට සුදුසු, ඒ පිළිබඳ ප්‍රඥාවක් ඇති පූජකවරුන් පත් කිරීම.

**එම පූජකවරු**

- රදගුරුවරුන් වෙනුවෙන් පෙනී සිටිය යුතු ය.
- සභාවේ අධ්‍යාත්මික ගුණයට ද, ඉගැන්වීමට ද, ඇලුම්ව සිටිමින් ගිහියන් හා රදගුරුවරුන් අතරේ සුහද සබඳතා ගොඩ නැගීම.
- තමන් භාරගත් සමිති සමාගම්වල අධ්‍යාත්මික ජීවිතය පෝෂණය කිරීම.
- ධර්ම දූතික හැඟීමක් ඇති කිරීම.
- ඥානාන්විතව එම සමිති සමාගම් පණ ගැන්වෙන පරිදි අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම් දීම,
- ගිහියන් සමඟ නිතර සාකච්ඡා පවත්වමින් දූත සේවා කටයුතු වඩාත් ඵලදායී කර ගැනීමේ මාර්ග සෙවීම.
- සමිතිය තුළ, සමිතිය හා අන්‍යයන් අතර සමගිය ආරක්ෂා කරගැනීමට උත්සාහ කිරීම.

පැවිදි සොයුරු සොයුරියෝ ද ගිහි දූත කාර්යය අගයමින් තම නිකායික ප්‍රතිපත්තවලට අනුකූලව ගිහි කටයුතුවලට ස්වේඡාවෙන් උදව් වීම. පූජක කාර්යයනට සහයෝගය දීම කළ යුතු ය.

**රදගුරු පදවිවල පිහිටුවා ඇති මන්ත්‍රණ සභා මගින්:**

- සුබාරංචිය පතළ කිරීම
- මිනිසා ශුද්ධවත් කිරීම
- පුණ්‍යායතන හා සමාජ ආයතන සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- ගිහියන්ගේ විවිධ සමිති සමාගම් හා ව්‍යාපාර, අන්‍යොන්‍ය ලෙස සංවිධානාත්මකට පිළියෙළ කිරීම.
- එකිනෙක සංවිධානයේ විශේෂ ස්වභාවය හා ස්වාධීනත්වය ආරක්ෂා කිරීම.

**ශුද්ධාසනයට සම්බන්ධ වූ විශේෂ ලේකම් කාර්යාලයෙන්:**

- ගිහි දූත සේවාවන්ට උපකාර කිරීම
- අනුබල දීම
- ගිහියන්ගේ විවිධාකාර දූත සේවා ව්‍යාපාරයන් පිළිබඳ තොරතුරු සැපයීම
- දූත සේවා සම්බන්ධයෙන් වත්මන් ප්‍රශ්න ගැන පර්යේෂණ පැවැත්වීම

- රදගුරුවරුන්ට හා ගිහියන්ට ඔවුන්ගේ දූත සේවා ගැන උපදෙස් දීම.
- මුළු ලොව ගිහි ධර්ම දූත සේවා හා ව්‍යාපාරයන්ගේ නියෝජිතයන් මේ කාර්යාලයට සම්බන්ධ විය යුතු ය.

ගිහි දූත සේවාවේ පිළිවෙළ අතරට අනෙකුත් ක්‍රිස්තියානි පුද්ගලයන්, සමාජ, සමිති ජාතික හෝ ජාත්‍යන්තර ලෙස සහයෝගයෙන් ක්‍රියා කළ යුතු ය. දූත සේවාවේ අරමුණු සඳහා අරමුණුවල වටිනාකම් පිළිගන්නවුන් අතරේ සහයෝගය අවශ්‍ය විය හැකි ය. ලෞකික ක්‍රියාකාරිත්වයන්හිදී වැදගත් වන මේ දූරදර්ශී සහයෝගය ගිහියෝ ලෝකයේ ගැළවුම්කාරුවාණන් වන ක්‍රිස්තුන් වහන්සේ ට ද මිනිස් පවුලේ ඒකතාවට ද සාක්ෂි දරති.

## V. ගිහි ධර්මදූත සේවාව සඳහා පුහුණුව

### දූත සේවා පුහුණුව යනු

එකිනෙක ගිහියාගේ ස්වාභාවික හැකියාවන්ට ද, ඔවුන් ජීවත් වන තත්ත්වයන්ට ද ගැලපෙන පරිදි ඔහු/ඇය මනුෂ්‍යයෙකු ලෙස සලකා, අංග සම්පූර්ණ පුහුණුවක් දීමයි. ගිහියා ද වර්තමාන ලෝකය ගැන මනා දැනුමක් ඇතිව, තමා ජීවත්වන සමාජයේ සාමාජිකයෙකු වශයෙන් සංස්කෘතියට ගැලපෙන සේ තමා සකස් කර ගත යුතු ය.

### ගිහි දූත සේවා පුහුණු සඳහා අවශ්‍ය පදනම හා නියමයන්

### අ) අධ්‍යාත්මික නියමයන්

- ගිහියා මැවීමේ හා ගැළවීමේ අභිරහස කෙරෙහි විශ්වාසය, තම ජීවිතයේ පදනම කරගැනීම.
- දේව ජනතාවට ජීවනය දෙන දෙවිපියාණන්ට ප්‍රේම කිරීමට පොළඹවන ශුද්ධාත්මයාණන්ට අනුකූල වීම.
- ඒ ආකාරයෙන් ක්‍රිස්තුන් වහන්සේ ගේ හා සභාවේ මෙහෙයයන් ඉටු කිරීමට ඉගෙනීම.

### ආ) ඒ හැරː

- එකිනෙකායේ වයස, තත්ත්වය, තරාතිරම, දක්ෂතා අනුව දේව ධර්මය ශාස්ත්‍රය පිළිබඳ අවබෝධයක්,
- ආචාර විද්‍යාව, දර්ශන ශාස්ත්‍රය පිළිබඳ ධාර්මික අධ්‍යාපනයක්,
- ප්‍රායෝගික කාර්මික පුහුණුවක්,
- සාමාන්‍ය සංස්කෘතික නිපුණත්වයක්

### ඇ) තවදː

- මිනිසුන් අතර යහපත් සබඳතා ප්‍රගුණ කර ගැනීමට උදව්වන මිනිස් වටිනාම් ජීවිතයට ඇතුළු කර ගැනීම.
- අන්‍යයන් සමග සහෝදරත්වයෙන් සහයෝගයෙන් ජීවත් වීමට අවශ්‍ය සුදුසුකම්

### ඇ) දූත සේවා පුහුණුව

- හුදෙක් දැනුමට පමණක් සීමා නොකළ යුතු ය.
- සියළු දෙය විශ්වාසයෙන් බැලීමට ද, විනිශ්චය කිරීමට ද
- නියමිත කාර්යයන් ඉටු කිරීමට ද
- තමන් හා අන්‍යයන් ක්‍රියාකාරකම්වලින් වැඩි දියුණු කිරීමට ද
- පුහුණුව ලබන කාලයේ පටන්ම පුරුදු පුහුණු වීමෙන් උද්යෝගිමත් සේවකයෝ වෙති. ලබන පුහුණුව කාලානුරූප විය යුතු ය. (ප්‍රශ්න හා කාලය අනුව වෙනස් වන හෙයින්) පුහුණුව අවසාන වෙද්දී මානුෂික පෞද්ගලිකත්වය, ඔහුගේ / ඇයගේ පූර්ණත්ව ගැන සැළකිය යුතු ය.

- මෙලෙස පුහුණුවේ කොටස් එකිනෙකාට ගැලපෙන අතරම සමබරතාව ද රැකිය යුතු ය.

**දූත සේවා පුහුණුව ලබන අවධීන්:**

- ළමා ප්‍රාථමික අධ්‍යාපන කාලය තුළ
- යෞවන යෞවනියෝ
- මුළු ජීවිත කාලය පුරාම

**පවුල තුළ දරුවන්ට:**

- දෙමව්පියෝ, සියළු මනුෂයන් වෙත දක්වන ප්‍රේමය දැනගන්නට බාල කාලයේ පටන් දරුවන් පුහුණු කළ යුත්තෝ ය.
- එලෙසම අසල්වැසියාගේ ආත්මික, භෞතික අවශ්‍යතා ගැන සළකා බැලීමට මා පිය ආදර්ශයෙන් පුහුණුවක් දීම.
- සභාවේ හා ලෝක සමාජවල කටයුතු පිළිබඳව ඇල්මක් දැක්වීම.
- මිසම් සමාජය තුළ දේව ජනතාවගේ ජීවමානවූත්, ක්‍රියාකාරීවූත් සමාජිකයන් බවට හැඟීමක් ජනිත කිරීම.
- පූජා ප්‍රසාදිවරු දහම උගන්වන විට, දේශනා කරන විට, මග පෙන්වන විට, අනෙක් සේවා ඉටු කරන විට, ධර්ම දූතිකයන් පුහුණු කිරීම.
- අධ්‍යාපනික ආයතනවලින් දූත සේවාවට අනුබල දීම හා කතෝලික හැඟීම් ඇති කිරීම.

**ඇතැම් දූත සේවාවලට අති විශේෂ පුහුණුවක් අවශ්‍ය වීමට හේතුවන කරුණු:**

- මනුෂ්‍යන් අතර සුබාරංචිය පැතිරවීම, ශුද්ධවන්ත කිරීම සඳහා විවිධ දෘෂ්ටීන් පැතිර ඇති වත්මන් ලෝකය තුළ කතෝලිකයෝ ධර්මයත්, විශ්වාසික අවිශ්වාසික අය අතර සංවාදයත් වාද විවාද වලට භාජනය වන ප්‍රධාන කරුණුත් ගැන අවබෝධයකින් සිටීම.
- සුවිශේෂක ජීවිතයට සාක්ෂිකරුවන් වීම.
- ලෞකික ජීවිත පැවැත්ම ක්‍රිස්තියානි ධර්මය අනුව හැඩ ගස්වා ගැනීම.
- ලෞකික දේවල අගයයන් මිනිසාගේ පෞද්ගලිකත්වය සම්පූර්ණ කර ගැනීමට කොතෙක් බලපානවා ද යන කරුණ වටහා දීම.
- ධනය නිසි ලෙස භාවිතා කිරීම.
- ව්‍යාපාර යෝග්‍ය ලෙස සංවිධානය කිරීමට ඔවුනට ඉගැන්වීම.
- සභාවේ සදාචාර හා සමාජ ප්‍රතිපත්තිවලට ගැලපෙන ලෙස නිතර ම පොදු යහපත ගැන සැලකීම.
- සමාජ ධර්මය දියුණු කිරීම සම්බන්ධයෙන් තම කොටස ඉටු කිරීම සඳහා ඒවායේ මූලික ප්‍රතිපත්ති හා නිගමනයන් එකිනෙක අවස්ථාවේදී ක්‍රියා කරන සැටි කෙසේදැයි ඉගෙන ගැනීම.
- ප්‍රේමයේ හා දයාවේ පුණ්‍ය ක්‍රියා ක්‍රිස්තියානි ජීවිතයට අනගි සාක්ෂි වන හෙයින් දූත සේවාව සඳහා පුහුණුව ලැබ ක්‍රියා කිරීමට මඟ සැලසීම.

**ගිහි ධර්මදූත සේවය සඳහා ලැබෙන සහාය.**

- අධ්‍යයන සම්මේලන
- ධර්ම අභ්‍යාස
- සංගම්
- පොත් පත් හා සඟරා
- ධර්ම විවේක
- විටින් විට පැවැත්වෙන රැස්වීම්.

**මේ සැම දෙයක්ම:**

- ශුද්ධ ලියවිල්ල පිළිබඳ උසස් දැනුමක් ලබා ගැනීමට
- ආත්මික ජීවිතය පෝෂණය කර ගැනීමට
- ලෞකික තත්ත්වය වටහා ගැනීමට උදව් වෙයි.

# 2.2. කිතුනු ජන වන්දනාව පිළිබඳ ව්‍යවස්ථාව

### ආරම්භය

සැබෑ ක්‍රිස්තියානින් වීමට නම්, අපි ජනවන්දනාව හෙවත් බැති පිළිවෙත් කෙරෙහි විශේෂ ආශාවක් හා ඇල්මක් ඇතිකර ගත යුත්තෝ වෙමු. ජනවන්දනාව නියම ක්‍රිස්තියානි ජීවිතයේ උල්පත වන අතර ම, විශ්වාසය අනුව ජීවත් වී ක්‍රිස්තුන් වහන්සේට සාක්ෂි දැරීමට එය අප ශක්තිමත් කරවයි. මේ නිසා වතිකාන ජගත් කතිකාවේ මුල් ප්‍රයත්නය වූයේ සමකාලීන අවශ්‍යතාවයන් අනුව ජනවන්දනාව සකස් කිරීමයි. ජන වන්දනාව පිළිබඳ ප්‍රකාශයේ මූලාරම්භය මෙයයි.

### 1. පොදු මූලධර්ම

### අ) ජන වන්දනාවේ ස්වභාවය හා වැදගත්කම

දෙවියන් වහන්සේ තම පුත්‍රයාණන් මනුෂ්‍යයකු ලෙස මෙලොවට එවූ සේක. එසේ එවනු ලැබූයේ, ඒ දිව්‍ය මනුෂ්‍යයා, දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයන් අතර මැදිහත්කරුවාණන් වී, සකල ජනයාට ගැලවීම ළඟා කර දීම සඳහා ය. එතුමාණෝ තම ජීවිතයෙන් ද, මරණයෙන් ද, උත්ථානයෙන් හා ස්වර්ගාරෝහණයෙන් ද අප දෙවියන් හා මිත්‍ර කොට, දෙවියන් වහන්සේට දියහැකි උසස්තම, උතුම්ම වන්දනාව අප වෙනුවෙන් ඔප්පු කළ හ.

දෙවියන් වහන්සේට වන්දනාව දැක්වීම හා සකල ජනයා ශුද්ධවන්ත කිරීම ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ මෙහෙවරයි. එම මෙහෙවරට අපද සහභාගි කරවා අප මගින් එය සැමවිට කරගෙන යනු සඳහා එතුමෝ ශුද්ධවූ සභාව ස්ථාපිත කළ සේක. ගැලවීමේ සුබාරංචිය සැමට දේශනා කරනු සඳහා එතුමාණෝ අපෝස්තුළුවරුන් යැවූ හ. තව ද අප පාපයෙන් හා මරණයෙන් මුදා, ජේසුස් වහන්සේ තුළ ජීවිතය අපට ලබා දෙන පාස්කු අභිරහස හෙවත් ගැලවීමේ අභිරහස උන්වහන්සේ විසින් ස්ථාපිත ප්‍රසාද නිධාන මගින් යථාර්ථයෙන් ද, සැම කාලයකට හා ස්ථානයකට ඔබින අයුරින් ද ඉදිරිපත් කෙරේ. ජන වන්දනාව නම්, සුවිශේෂය ප්‍රකාශ කිරීමටත් ගැලවීම හා වන්දනාව පිළිබඳ ක්‍රිස්තුන් වහන්සේගේ කාර්යයනට සහභාගි වීමටත් දේව ජනතාව එක්තැන් වීමයි.

ගැලවීම හා වන්දනාව පිළිබඳ උන්වහන්සේගේ කාර්යයනට අපට සහභාගි විය හැක්කේ ශුද්ධ වූ සභාව තුළ ද, විශේෂයෙන් ශු. සභාවේ ජනවන්දනා මෙහෙයන්හිදී උන්වහන්සේ වැඩ සිටින නිසා ය. දිව්‍ය පූජා යාගය ඔප්පු කරන පූජා ප්‍රසාදිවරුන් තුළ ද, විශේෂයෙන් ඔප්පු කරනු ලබන පූපයෙහි හා මුද්‍රික රසයෙහි එතුමෝ වැඩ සිටිති. ශුද්ධ වූ සභාව අභිකුත් දේව ප්‍රසාද නිධාන දානය කරන විට ද විශ්වාසකයන් තුළ ක්‍රියා කරන්නේ ක්‍රිස්තුන් වහන්සේම ය.

ක්‍රිස්තුන් වහන්සේ ම ස්ථාපනය කරන සේක. පව් කමාව දෙන සේක. තවද ශුද්ධ වූ බයිබලය කියවද්දී අප එකිනෙකාට කථා කරන්නේ ද එතුමාණෝ ය. ඒ අතර ම දේව ජනයා යැදීමටත්, ගී ගැයීමටත් එක් වූ විට එතැන ද ක්‍රිස්තුන් වහන්සේ වැඩ සිටිති. මක් නිසා ද යත්, “දෙදෙනෙක් හෝ තිදෙනෙක් මාගේ නාමයෙන් යම් තැනක රැස්වී සිටිත් නම්, මම එතැන ඔවුන් මැද සිටිමි” යි උන්වහන්සේ ම වදාළ සේක. (මතෙව් 18:20)

සැම ජන වන්දනා මෙහෙයයක්ම ක්‍රිස්තුන් වහන්සේගේත්, ශුද්ධ වූ සභාවේත් පූර්ණ ක්‍රියාවක් වන බැවින් ඊට සරිලන අනෙක් කටයුත්තක් ශුද්ධ වූ සභාව තුළ නොමැත්තේ ය. ශු. සභාවේ අනෙක් කර්තව්‍යයන් අනවශ්‍ය බවක් මෙයින් අදහස් නොකෙරේ. ඇත්තෙන් ම ජනයා ජනවන්දනාවට සහභාගි වන්නට ප්‍රථමයෙන් ඔවුහු විශ්වාසය හා සිත් හැරීම කරා කැඳවනු ලැබිය යුත්තෝ වෙති. කෙසේ වෙතත් ප්‍රසාද ස්නාපනය මගින් ද විශ්වාසය මගින් ද, සියලූ මනුෂ්‍යයන් දේව දරුවන් කර, සභාව තුළ ඔවුන් එක්තැන කොට, ඔවුන්ට දිව්‍ය යාගයට සහභාගි වී, ස්වාමීන් වහන්සේගේ භෝජනය අනුභව කිරීමට මඟ සැලැස්වීම සභාවේ සැම ධර්මදූත ප්‍රයත්නයක ම පරමාර්ථය වෙයි.

සැකෙවින් කියතොත් ජනවන්දනාව වෙත සියලූ මනුෂ්‍යයන් කැඳවා ගැන්ම සැම ධර්මදූත ප්‍රයත්නයක ම පරමාර්ථයයි. එහෙයින් ජනවන්දනාව සභාවේ සියලූ කාර්යයන්හි ඒකායන පරමාර්ථය යයි කිව හැක. එලෙස ම ජනවන්දනාව හෙවත් බැති පිළිවෙත්, කිතුනුවන්ගේ විශ්වාසය හා ප්‍රේමය වර්ධනය කර ගැනීමටත්, එම විශ්වාසය හා ප්‍රේමය අනුව ජීවත් වීමටත් ඔවුන් ශක්තිමත් කෙරේ. මේ අනුව ශු. සභාවේ සියලූ කාර්යයන්හි අරමුණත්, සියලූ කාර්යයන් වෙත ශක්තිය ගලා එන උල්පතත් ජනවන්දනාව ම වනු ඇත.

අධ්‍යාත්මික ජීවිතය, ජනවන්දනාත්මක එනම්, බැති පිළිවෙත් පිළිබඳ යාච්ඤාවන්ට ම සීමා නොවේ. කිතුනුවා ඇත්තෙන්ම තම සහෝදර ජනතාව සමග සාමූහිකව යාච්ඤා කිරීමට කැඳවනු ලැබ සිටි. එහෙත් ඔහු ඇතුළු ගෙට වැද, රහසිගතව දෙව් පියාණන් යැදිය යුතු අතර, ඔහුගේ මුළු ජීවිතයට උන්වහන්සේට කරන වන්දනාවක් විය යුතු ය. අනුමත කර ඇති ජනප්‍රිය භක්ති අභ්‍යාසයන්හි යම් වටිනාකමක් ඇති වනුයේ, ඒවා ජනවන්දනාව වෙතින් ජීවය ලබා, ජනවන්දනාව කෙරෙහි ම අප අවධානය යොමු කෙරේ නම් පමණි.

## ආ) ජනවන්දනාවට අනුබල දීම

සැබෑ ක්‍රිස්තියානි භාවයේ මූලික හා අනිවාර්ය උල්පත දෙවියන් හා මනුෂ්‍යයන් මුණ ගැසෙන ජනවන්දනාව තුළ රඳා පවතී. එහෙයින් ප්‍රසාද ස්නාපනය ලැබූ සෑම කිතුනුවකුගේ ම අයිතිය හා යුතුකම සාමූහික ක්‍රියාවන් වූ ජනවන්දනා මෙහෙයයන්ට සම්පූර්ණයෙන් ද, දැනුම් තේරුම් ඇතිව ද, ක්‍රියාකාරී ලෙස ද සහභාගි වීම ය.
සියළු ම ජනවන්දනා ප්‍රතිසංස්කරණයන්ගේත්, ශුද්ධාරක්ෂක හෙවත් ඝානගෝපාලීය සේවාවන්ගේත් පරමාර්ථය මෙය සාර්ථක කරගැන්ම ය. එමනිසා ජනවන්දනාව පිළිබඳව දේව ජනතාවට අනුශාසනා කිරීම ඝානගෝපාලයන්ගේ පරම යුතුකමකි. දේව ජනතාවට ඒ පිළිබඳ මනා දැනුමක් ලබා දීමට නම්, ඔවුන් ම ඒ ගැන මනා පැහැදීමකින් යුතුව, එය කෙරෙහි දැඩි ඇල්මක් ද දැක්විය යුතු බව කිවයුතු කරුණක් නොවේ.

## ඇ) ජනවන්දනා ප්‍රතිසංසකරණය

සැමට ම, බුද්ධිමත්ව හා උද්යෝගිමත්ව ජනවන්දනාවට සහභාගි වීමට හැකිවනු සඳහා වෙනස්වීම් කීපයක් කිරීම අවශ්‍ය ය. සමහර දේ දෙවියන් වහන්සේගෙන් එක එල්ලේ ම පැවැතෙන නිසා, වෙනස් නොවිය යුතු බැව් මෙහිදී අමතක නොකළ යුත්තකි. එහෙත් ඊට අමතරව වෙනස්විය හැකි දෑ කොතෙකුත් ඇත. ජනවන්දනාවේ ඇතුළාන්ත ස්වභාවයනට එතරම් නොගැලපෙන අංගයන්, කාලයාගේ අවෑමෙන් ඊට එකතු වී ඇත්නම්, නැතහොත් මෙතෙක් පැවැති ඇතැම් දෑ දැනට එතරම් ඵලදායි නොවන බව හැඟේ නම් ඒවා වෙනස් කළ හැකිවා පමණක් නොව, වෙනස් කළ යුතු ද වන්නේ ය.
එහෙයින් මෙම සංශෝධනයන් හෙවත් වෙනස්වීම් පිළිබඳව අප විමතියටවත්, බියට හෝ සැකයටවත් පත් නොවිය යුතු ය. මේවා කිසිසේත් ජනවන්දනාවේ විනාශයට හේතු නොවනු පමණක් නොව, ජනවන්දනාව එයින් වඩාත් තේරුම් පැහැදුම් ඇතිව පැහැදිළිවීම ද කෙරේ. මෙවැනි වෙනස්කම් ඇති කිරීමට බලය ඇත්තේ සභා පාලකයන් වන ශුද්ධෝත්තම පියාණන්ට හා රාජගුරු ප්‍රසාදිවරුන්ට පමණි.
ජනවන්දනාව පැවත එන්නේ ශු. ලියැවිල්ල පදනම් කරගෙන ය. ජනවන්දනාවේ දී කියැවෙන පාඨ ද, ගැයෙන ස්තෝත්‍ර ගීත ද, යාච්ඤා ද, අනෙකුත් වන්දනා ගීතිකා ද උපුටාගනු ලබන්නේ ශු. ලියවිල්ලෙනි. ජනවන්දනාවේදී භාවිතා කෙරෙන යාච්ඤා හා සලකුණු අර්ථවත් වන්නේ ශු. ලියැවිල්ල ආශ්‍රයෙනි. එහෙයින් ශු. ලියැවිල්ල කෙරෙහි උණුසුම් භක්ත්‍යාදරයක් හා ගෞරවාන්විත හැඟීමක් ඇතිකර ගැනීම බෙහෙවින් ම වැදගත් ය.

## ජනවන්දනාව සාමූහික ඇදහිල්ලකි.

සෑම ජනවන්දනා මෙහෙයයක් ම, එනම් දේව ජනතාව තම පිය රදගුරුතුමා හෝ එතුමාගේ නියෝජිතයන් හෝ වටා එක්වී පවත්වන සෑම වන්දනාවක්ම සාමූහික මෙහෙයයකි. එය නියතයෙන් ම සාමූහික ක්‍රියාවක් වීමට නම්, සෑම කෙනෙක් ම ඊට සහභාගි විය යුත්තේ පෞද්ගලික හැඟීමක් ද ඇතිව ය. කිසියම් විශේෂ කාර්යයක් සඳහා නියමිත, එනම් දේව මෙහෙයයෙහි මූලික වන තැනැත්තා, මෙහෙයයට උදව්වන තැනැත්තා, ශු. ලියැවිල්ල කියවන්නා, අර්ථ කථකයා සහ ගායකයා යන අය ජන වන්දනාවෙහි නියමිත සේවාවක් ඉටු කරන්නෝ ය. මෙම උත්කෘෂ්ට සේවාවට ගැලපෙන පරිදි, ඔවුන් තමනට නියමිත කාර්යයන් අවංක භක්තියෙන් හා ගෞරව සම්ප්‍රයුක්ත හැඟීමෙන් ඉටුකළ යුතු ය. මෙම කාර්යය සඳහා ඔවුන් විධිමත් ලෙස පුහුණු කළ යුතු ය.
ජනවන්දනාවේ මේ සාමූහික ස්වභාවය නිසා පෞද්ගලිකව සහභාගි වන මෙහෙයයනට වඩා සාමූහිකව සහභාගි වන මෙහෙයයක් වඩාත් උචිත ය. සාමූහිකව ගී ගැයීමෙන් ද, පොදු යාච්ඤා එක්ව උච්චාරණය කිරීමෙන්ද ඒවාට උත්තර දීමෙන් ද ශාරීරික ඉරියව් මගින් ද, නියමිත වේලාවන් හි ගෞරවනියව නිශ්ශබ්දතාව රැකීමෙන් ද සියලු ම විශ්වාසකයෝ උද්යෝගිමත්ව ජනවන්දනාවට සහභාගි විය යුත්තෝ ය. ජනවන්දනාත්මක මෙහෙයයන්හිදී එක් එක් පුද්ගලයන් විශේෂ ගරු බුහුමන් අපේක්ෂා කිරීම නොහොබී.

**ජනවන්දනාව අනුශාසනා කිරීමේ මාර්ගයකි.**

අපට ගුරු උපදේශ සඳහා ප්‍රකාශ කිරීම පිණිස ජනවන්දනාවෙහි දේව වචනය අන්තර්ගතව ඇත. ක්‍රිස්තුන් වහන්සේ තුළ අප ගැලවීම ප්‍රකාශ කෙරෙන කියවීම්වලට ගෞරවයෙන් සවන් යොමු කළ යුතු අතර, අප දෛනික ජීවිතය මගින් ඊට නිසි ප්‍රතිඋත්තර ද දිය යුතු ය.
ජන වන්දනාවේ එක් අංගයක් වන ධර්මානුශාසනයෙන් නිසි ඵල නෙළීමට නම්, මෙහෙයයන්හි පිළිවෙත් සංක්ෂිප්ත වීම ද, සරල වීම ද, සැමට ම තේරුම් ගත හැකි වන සේ ලිහිල් වීම ද එක ම දෙය පුන පුනා නොපැම ද අවශ්‍ය ය. පිළිවෙත් සහ වචනයන් අතර ඇති සමීප එකඟත්වය හෙළි කිරීම සඳහා ශු. ලියවිල්ල කියවීම තව තවත් පුළුල් විය යුතු අතර, උධෘත පාඨයන් විවිධත්වයෙන් යුතුව ද, අවස්ථානුකූලව ද තෝරා ගැනීම මැනවි.
ධර්මානුශාසනය හෙවත් දේශනය ජන වන්දනාවේ අනිවාර්ය අංගයකි. එය දිව්‍ය පූජාවට පමණක් සීමා නොවිය යුතු ය. අන් මෙහෙයයන්හි දී පවා ඒ ඒ පිළිවෙත්වලට අනුකූල නම් ධර්මානුශාසනයක් පැවැත්වීම යෙහෙකි. අනුශාසනා කළ යුත්තේ ශු. ලියවිල්ල තුළ ද ජනවන්දනාවේ ද අඩංගු දේ පිළිබඳව ය. එයින් ප්‍රකාශ කළ යුත්තේ ගැලවීම් ඉතිහාසය තුළ දෙවියන් වහන්සේගේ මහඟු ක්‍රියා ද, මෙහෙය පැවැත්වීම සඳහා එක්වූ සභාව ඒ අවස්ථාවේ දී ක්‍රිස්තුන් වහන්සේ ජීවමානව වැඩ සිටීම ද පිළිබඳව ය.
බයිබල් මෙහෙයයන් පැවැත්වීමට වඩ වඩා දිරිගැන්විය යුතු ය. මෙවැනි දෑ සඳහා විශේෂයෙන් උනන්දු කළ යුත්තේ පූජාප්‍රසාදිවරුන් නොමැති ප්‍රදේශයන් තුළ ය. තේවාචාරී කෙනෙකුට හෝ රදගුරු තුමන්ගේ අවසරය ලබා ගත් ඕනෑ ම කෙනෙකුට හෝ එම මෙහෙයයන් පැවැත්විය හැකි ය.
දිව්‍ය පූජාවේදි පමණක් නොව දේව ප්‍රසාද නිධාන දානය කිරීමේ දී ද මව් බස හැකි පමණ භාවිතා කිරීමට සභා පාලකයන් කටයුතු සැළසිය යුතු ය.

**ජාතික සම්ප්‍රදායයනට හා ජනයාගේ ප්‍රකෘති ස්වභාවයට සුදුසු සේ සකස් කිරීම**

පිළිවෙත් විදියෙහි බුරුලක් නැති සමානත්වයක් අවශ්‍ය නැත. විවිධ කණ්ඩායම්, ප්‍රදේශ හා ජනතාවනට සරිලන සේ ජනවන්දනා ක්‍රමය සකස්විය යුතු ය. හැකි සැම විටෙක ම ස්ථානික සංස්කෘතියෙන් ද පොදු උරුමයෙන් ලබා ඇති දීමනාවලින් ද ප්‍රයෝජන ගත යුතු වන්නේ ය. මේ සඳහා ඉතා ගැඹුරු වෙනස්වීම් පවා සිදුවනු ඇත. මෙවැනි වෙනස්වීම් ශුද්ධාසනයේ අවසර ඇතිව රදගුරුතුමා විසින් පමණක් සිදු කළ හැක.

**රදගුරු වසම හා මීසම තුළ ජනවන්දනා ජීවිතය දියුණු කිරීම**

රදගුරු වසමක රදගුරුතුමා තම විශ්වාසිකයන්ගේ උත්තම පූජකයාණන් ය. රාජගුරුප්‍රසාදි තුමා වෙත කේන්ද්‍රගත වන පදවියේ පොදු දේව වන්දනා ජීවිතය ඉතා වැදගත් කොට සැළකිය යුතු ය. එතුමාණන්ගේ ආසන දෙව්මැදුරෙහි විශේෂයෙන් එසේ විය යුතුය. පූජාප්‍රසාදිවරුන් සහ තවත් සේවකයන් සමඟ රාජගුරුප්‍රසාදිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ඉරුදින ශු. මෙහෙයයට, විශේෂයෙන් සත්ප්‍රසාදිය යාගයට දේව ජනතාවගෙන් මහත් කොටසක් සම්පූර්ණ ලෙස ද, ක්‍රියාකාරී ලෙස ද යාච්ඤාවෙන් හා වන්දනාවෙන් සහභාගි වනවිට ශු. සභාව විශේෂාකාරයකින් ප්‍රත්‍යක්ෂ වන බව විශ්වාසකයන් අවබෝධ කරගත යුතු ය.

එහෙත් නිතර ම මෙවැනි අවස්ථාවලට සහභාගි වීමට රාජගුරු ප්‍රසාදිතුමාට නොහැකි හෙයින් විශ්වාසකයන් වඩාත් අඩු සමුදායයන් වශයෙන් බෙදීම අවශ්‍ය ය. රාගුරුප්‍රසාදි තුමා වෙනුවෙන් ක්‍රියා කරන ධාර්මික මාර්ගදේශකයකු වන පූජාප්‍රසාදිවරයෙකු යටතේ පිහිටුවනු ලබන ගුරු වසම් (මීසම්) මේ සමුදායන් අතරේ විශේෂයෙන් මැදහත් කොට සැළකිය යුත්තේ, මුළු ලෝකයෙහි පිහිටුවා තිබෙන දෘශ්‍යමාන සභාව මේ මීසම් මගින් නිරූපණය වන හෙයිනි.
රදගුරු වසම තුළත්, මීසම තුළත් ජනවන්දනාව දියුණු කිරීම සඳහා ගිහියා පෙරමුණට ආ යුතුව ඇත. මන්දයත් එය ශු. සභාව ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකාරිත්වයෙන් නිසි මග මෙහෙයවීමක් ලෙස සැළකිය හැකි හෙයිනි.

## 2. පොදු මූල ධර්මයන් ක්‍රියාත්මක කිරීම

### දිව්‍ය සත්ප්‍රසාදයේ අභිරහස

අප ස්වාමී වූ ක්‍රිස්තුන් වහන්සේ අන්තිම රාත්‍රී භෝජනයේ දී දිව්‍ය සත්ප්‍රසාදය ස්ථාපිත කළ සේක. එසේ ස්ථාපිතකරනු ලැබුවේ උන්වහන්සේ නැවත වඩිනතුරු, තමන් වහන්සේගේ මරණයේත්, උත්ථානයේත් අභිරහස නිරතුරු පැවතීමට සලසනු සඳහාත්, අප ජීවිත කාලයේ දී අපව ද උන්වහන්සේගේ එම ගැලවීමේ සහ යාගයේ කාර්යයට පංගුකාරයන් කරනු සඳහාත් ය. දිව්‍ය සත්ප්‍රසාදය ක්‍රිස්තුන් වහන්සේගේ මරණයේත් උත්ථානයේත් සිහිවටනයයි. ප්‍රේමයේ ප්‍රසාද නිධානයයි. එකමුතු බවේ සළකුණයි. දයා ප්‍රේමයේ බැම්මයි. තව ද එය වනාහි අනාගත මෝක්ෂ මහිමයේ පූර්ව ආස්වාදයක් ලබා දෙන පාස්කු භෝජනයයි.
සත්ප්‍රසාදිය යාගය හෙවත් දිව්‍ය පූජාව අප ක්‍රිස්තියානි ජීවිතයේ කේන්ද්‍රස්ථානයයි. එමනිසා අප දිව්‍ය පූජාවට සහභාගි විය යුත්තේ සිහි බුද්ධියෙන් ය. එහිදී කරන දෑ පිළිබඳ දැනුම් තේරුම් ඇතිව හා සම්පූර්ණ අවබෝධයකින් සිටිය යුතුය. විශ්වාසයේ මේ අභිරහස සිදුකරන වේලාවේ දී, විශ්වාසකයන් පිටස්තර අය මෙන් හෝ බලන්නට ආ අය මෙන් හෝ නොසිට අප මධ්‍යස්ථකයාණන් වන ක්‍රිස්තුන් වහන්සේ තුළ අපවත් පඩුරක් මෙන් පූජා කෙරෙමින් උන්වහන්සේගේ යාගයට හවුල් වී දෙවියන් වහන්සේට තුති පිදිය යුතු ය. එවිට අප හා දෙවියන් අතරත්, අප එකිනෙකා අතරත් ඇතිවිය යුතු සබඳතාව ක්‍රිස්තුන් වහන්සේ මගින් දිනෙන් දින තහවුරු වී, දෙවියන් වහන්සේ “සියල්ලෙහි සියල්ල” වන සේක.

බැති පිළිවෙත් සම්බන්ධයෙන් පසුගිය කාලයේ ඇතිවූ සහ අනාගතයේ දි ඇතිවන වෙනස්වීම් වල පරමාර්ථය වන්නේ, සියලුදෙනාට වඩා හොඳින් අවබෝධ වන ලෙස ද, ප්‍රයෝජනවත් වන ලෙස ද එය හැඩගැස්වීම ය. වචනයේ බැති පිළිවෙතට හෙවත් දිව්‍ය පූජාවේ මුල සිට විශ්වාසකයන්ගේ යාච්ඤාව දක්වා කොටසට සවන් දී එය අප ජීවිතාදර්ශය කරගත යුතු ය. සභාව, රට, රජය, සමාජය හා සකල විශ්වාසකයන්ගේ යාච්ඤාවෙන් “වචනයේ බැති පිළිවෙත” අවසන් වේ.

දිව්‍ය පූජා යාගයේ දෙවැනි කොටස වන යාගික පිළිවෙතට මුළුමනින් ම සහභාගි වීමේ නියත සළකුණ දිව්‍ය සත්ප්‍රසාදය ලැබීම ය. එමනිසා දිව්‍ය පූජා මෙහෙයට සහභාගි වන සැමදෙනාම දිව්‍ය සත්ප්‍රසාදය ලැබීමට උත්සුක විය යුතු ය. ඊට සම්පූර්ණ ලෙස සහභාගි වීමේ වැදගත්කම පෙන්වනු වස් විශේෂ අවස්ථාවල ඇතැම් අයට, උදාහරණයක් වශයෙන් විවාහයේ දි මනාලයාට සහ මනාලියට, පූප සහ මිදිරස යන දෙප්‍රකාරයෙන් ම දිව්‍ය සත්ප්‍රසාදය ලැබීමට ශුද්ධාසනය අවසර දී ඇත. නත්තල් දින හා පාස්කු ඉරුදින මැදියම් රැයේත්, උදයේත් දිව්‍ය පූජාවන්හි ද, මහ බ්‍රහස්පති දින උදයේත් සවසත් දිව්‍ය සත්ප්‍රසාදය ලැබීමට දී ඇති අවසරයෙන් තහවුරු වන්නේ, සම්පූර්ණ ලෙස සහභාගිවීම සඳහා දිව්‍ය සත්ප්‍රසාදය ලැබීමේ වැදගත් කම ය.

ඉපැරණි චාරිත්‍රයක් වූ හවුල් දිව්‍ය පූජාවට දැන් අවසර දී ඇත්තේ එහි ඇති ගාම්භීරත්වය නිසා ම නොව, එක ම නායක පූජකයාණන් වන ක්‍රිස්තුන් වහන්සේ තුළ සියලූ මනුෂ්‍යයන් පංගුකාරයන් වන එක ම පූජකවරයක් ඇති බව ඒත්තු ගැන්වීමට ය.

### අනෙක් දේව ප්‍රසාද නිධාන සහ සංස්කාරක

දේව ප්‍රසාද නිධානයන් හි පරමාර්ථය අප ශුද්ධවන්ත කිරීමත්, ශු. සභාව ගොඩනැගීමත්, දෙවියන් වහන්සේට වන්දනා ප්‍රණාමය පුද කිරීමත් ය. තවද ප්‍රසාද නිධානයන් වනාහි ක්‍රිස්තුන් වහන්සේගේ ගැලවීමේ කාර්යයේත් ඊට අපගේ වන්දනාත්ම ජීවිතයෙන් හා ප්‍රේමයෙන් ප්‍රකාශ කෙරෙන විශ්වාසයේ ප්‍රති උත්තරයේත් සළකුණු ය. ක්‍රිස්තුන් වහන්සේ අපට දානය කරන වරප්‍රසාදයන්ගේ සංකේතයන් වන ප්‍රසාද නිධානවල බාහිර සළකුණු ඒ ඒ ජන කොටස්වලට වඩාත් අර්ථවත් වන ලෙස සහ සුදුසු වන අන්දමට ඒවායේ පිළිවෙත් සංශෝධනය විය යුතු ය.

උත්තරීතර දේව ප්‍රසාද නිධානය වන දිව්‍ය සත්ප්‍රසාදය සහ අනෙකුත් ප්‍රසාද නිධානයන් අතර සැබැඳියාව හුවා දක්වෙන ලෙස එම ප්‍රතිශෝධනය විය යුතු ය.

ප්‍රසාද ස්නාපනය, අභිවෘද්ධි ආලේපය, පාපොච්චාරණය සහ පූජකවරය යන දේව ප්‍රසාද නිධානයන් පිළිවෙත් වෙනස්වීමකට භාජනය කෙරෙනු ඇත. තව ද, අන්තිම ආලේපය නැමැති ප්‍රසාද නිධානය සැළකිය

යුත්තේ මරණයට පෙර කෙරෙන අවසාන පිළිවෙතක් ලෙසින් නොව, රෝගාතුරයන් ආලේප කිරීමක් ලෙස ය. රෝගී වීමෙන් හෝ වයස්ගත වීමෙන් හෝ කෙනෙකුගේ ජීවිතය අන්තරාදායක වීමට පටන් ගත් විගස ම රෝගීන්ගේ ආලේපය ලබා දීම සුදුසු ය.

ආශිර්වාදකාර බන්ධනයේ වරප්‍රසාද හොඳින් පිළිබිඹු කෙරෙන අයුරින් ද, විවාහ ජීවිතයට ඇතුළුවන යුවතිපතීන්ගේ වගකීම් ගැන මනා අවබෝධයක් ලබා දෙන අයුරින් ද එම ප්‍රසාද නිධානයේ පිළිවෙත් වෙනස්විය යුතු ය. එම නව පිළිවෙත්වලට ඒ ඒ දේශයන් හි අනුගමනය කරන විරාගත සිරිත් විරිත් හා සම්ප්‍රදායයන් ඇතුළත් කිරීම යෝග්‍ය ය. අවශ්‍ය ය. පුණ්‍ය සංස්කාරයන් මගින් ද ශු. සභාව මධ්‍යස්ථ වී, ක්‍රිස්තුන් වහන්සේගේ ගැලවීම අප වෙත ගෙන එන්නී ය. මේ හේතුවෙන් අප ශුද්ධවන්ත කෙරේ. දේව ප්‍රසාද නිධාන ලැබීමට සුදුස්සන් කෙරේ. එදිනෙදා ජීවිතයේ විවිධ අවස්ථාවන් ශුද්ධවන්ත කෙරේ. ආසිරි පැන් භාවිතය, පුද්ගලයන්, ගෙවල් දොරවල්, යාන වාහන, කෙත්වතු යනාදිය ආශිර්වාද කිරීම, අළු බදාදා අළු ද, ගොබ් ඉරිදා ගොබ්ද ආශිර්වාද කිරීම, පැවිදි පොරොන්දු භාරදීම, මළවුන් වැළලීමේ පිළිවෙත් ආදිය මීට නිදසුන් වේ. ක්‍රිස්තියානිවරයෙකුගේ මරණය මගින් පාස්කුවේ ජයග්‍රාහී ස්වභාවය වැඩි වැඩියෙන් ප්‍රකාශ වන ලෙස මළවුන් වැළලීමේ පිළිවෙත් සකස්විය යුතුව තිබේ. ඒ ඒ ප්‍රදේශයට ආවේණික වූ වැදගත් අවමඟුල් සිරිත් විරිත් ද ඇතුළත් කිරීම උචිත ය.

### දේව රාජකාරිය

පූජකවරුන්ට සහ ඇතැම් පැවිද්දන්ට අනිවාර්යයෙන්ම කියවනු ලැබීමට නියමවූ යාච්ඤා දේව රාජකාර්යය යනුවෙන් හැඳින්වේ. මුල් අවධියේ පටන් ම ක්‍රිස්තියානීහු දිවා-රාත්‍රී දේව ස්තෝත්‍රය පැවැත්වීමෙන් මුළු දවසම ශුද්ධවත් කළ හ. දැන් පූජකවරු විසින් දේව ස්තෝත්‍රය නිසි ලෙස කියනු ලබන විට එය, සමස්ත සභාවම සමඟ එක්ව ක්‍රිස්තුන් වහන්සේ පියාණන්ට කෙරෙන යාච්ඤාවක් වේ.
පූජකවරු සහ පැවිද්දෝ මෙම ස්තෝත්‍ර පැවැත්වීමේ දේව රාජකාරිය ඉටු කිරීමට ද, විශ්ව සභාවේ සකල සාමාජිකයන්ගේ අවශ්‍යතාවන් උදෙසා මැදහත්වීමට ද නිල වශයෙන් නියම වී සිටිති. එහෙත් එයට සහභාගි වනු වස් අඩු තරමින් එහි ඇතැම් කොටස් පෞද්ගලිකව හෝ කීමට ගිහියනට ද ඇරයුම් කෙරේ. ඒ ඔහුගේ අධ්‍යාත්මික ජීවිතයට පිටුවහලක් වනු ඇත. එමගින් ඔහුගේ පුද්ගලික යාච්ඤා ද පණ ගැන්වේ. ඉරුදිනවල සහ ප්‍රධාන මංගල දිනවල මීසමේ දෙව්මැදුරේ පැවැත්වෙන සන්ධ්‍යා මෙහෙයය සභාවේ පොදු යාච්ඤාව සඳහා ගිහියාට අවස්ථාව සලසා දෙයි.

### ජනවන්දනා වර්ෂය

ක්‍රිස්තුන් වහන්සේ ඉටු කළ ගැලවීමේ කර්තව්‍යය ශු. සභාව සෑම යුගයකදී ම දෙයාකාරයෙන් නැවත නැවත ලෝකයට ඉදිරිපත් කරන්නී ය. එනම් ඉරුදින මෙහෙයයන්ගෙන් හා ශු. සභා වර්ෂයේ ප්‍රධාන මංගල මෙහෙයයන්ගෙනි. ස්වාමීන් වහන්සේ මළවුන්ගෙන් උත්ථානවීම නැවතත් සිහිපත් කිරීම සඳහා සෑම ඉරුදිනම දෙව් මැදුරුවලට විශ්වාසිකයෝ එක්වෙති. එම මුළු දවස ම ඔවුන් ගත කළ යුත්තේ ඒ මලෝද්ගතය නිසා ජනිත වන ප්‍රීතියෙන්, සතුටින් සහ නිදහසින් ද යුතුව ය.
වතාරිකයේ කාලයට සම්බන්ධ පරමාර්ථ දෙකක් ඇත. පළමුව, පාස්කු මෙහෙයයේ දී අළුත් කරනු ලබන අප ප්‍රසාද ස්නාපනීය පොරොන්දුව මගින් පාපයට නැසී, ක්‍රිස්තුන් වහන්සේගේ මරණයේ පංගු කාරයන් වීමට කැඳවනු ලබමු. දෙවනුව, එය ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයෙන් පණගැන්වී, ඒ අනුව අප ජීවිතයන් ද අභිනව එසවීමකට පත්වන ලෙස සොම්නසින් යුතුව සම්පූර්ණ වූ ද නව ක්‍රිස්තියානි ජීවිතයකට සූදානම් වීමේ කාලයයි.

මෙයාකාරයෙන් ශු. සභාව දේව වන්දනාවේ වර්ෂයේ විවිධ කාල පරිච්ඡේදයන් මගින් ක්‍රිස්තුන් වහන්සේගේ ගැලවීමේ ඉතිහාසය පිළිවෙලින් විග්‍රහ කර, උන්වහන්සේ සමග එම ගැලවීමේ සෑම ක්‍රියාවක්ම අප එදිනෙදා ජීවිතයේ අංගයක් කරගෙන ජීවත්වීමට අවස්ථාව ලබා දේ. එහෙයින් ශුද්ධවරයන්ගේ මංගල්‍යයනට වඩා අවුරුද්දේ ඒ ඒ වකවානුවලට නියමිත ක්‍රිස්තුන් වහන්සේ සම්බන්ධ මංගල්‍යයන් වැදගත් ය. ශු. සභාව සාන්තුවරයනට ගෞරව දක්වන්නේ ඔවුන් ජේසුස් වහන්සේගේ මෙම ගැලවීමේ ජීවිතය තම ජීවිතාර්ශය කරගෙන ජීවත් වූ නිසා ය. ශු. සභාවේ මාතාව වන මරියතුමියට විශේෂාකාර භක්ත්‍යාදරයක් හා ප්‍රේමයක් දක්වන්නේ එතුමිය ජේසු සමිඳුන්ගේ ගැලවීමේ කාර්යයේ විශේෂ පංගුකාරියක් වූ නිසා ය.

**ආගමික සංගීතය**

ඈත අතීතයේ පටන් ම සංගීතය ජනවන්දනාවේ වැදගත් අංගයක් වී ඇත. එයින් යාච්ඤාව ප්‍රබෝධමත් කරයි. සභාව තුළ සාමූහික හැඟීමක් උපදවයි. වත් පිළිවෙත්හි ගරු ගාම්භීරත්වය වර්ධනය කරයි. එහෙයින් සැමදෙනා ම ජනවන්දනා ගී ගායනයට සහභාගිවීම ඉතා වැදගත් ය.
ගායනයට සහභාගි වන ක්‍රිස්තියානීන්ගේ විශ්වාසය සහ හැඟීම් මැනවින් ප්‍රකාශ වනු පිණිස, ආගමික සංගීතය දේශීය වුත්, නවතමවුත් සංගීතයෙන් පෝෂණය විය යුතු ය. මුළු සභාවට ම පහසුවෙන් ඊට සහභාගිවීම සඳහා ආගමික සංගීතය ලිහිල් විය යුතු ය. එහෙත් සභාවේ සමූහ ගායනා මෙහෙයවන්නේ ගායක කණ්ඩායම නිසා, එම කණ්ඩායම ඉතාමත් සැලකිල්ලෙන් පුහුණු කළ යුතු ය.

**ආගමික කලා ශිල්ප සහ ශු. භාණ්ඩ**

ශු. සභාව දෙවියන් වහන්සේට ප්‍රශංසා කරන මාර්ග අතර කලා ශිල්ප ද එකකි. එහෙයින් ආගමික වූ කලාවන් හා සංකේතයන් මගින් දේව සත්‍යතාවන් මනාසේ ප්‍රකාශ කළ යුතු ය. එමගින් දේව වන්දනාවේ අලංකාරයත්, මහිමතාවයත් ජනතාවට ඒත්තු ගන්වා දේව වන්දනාව සඳහා ඔවුන් උනන්දු කළ යුතු ය. ආගමික වූ සැම කලා කෘතියක ම සරල බවක් ද උදාර බවක් ද අලංකාරයක් ද ඇතිවිය යුතු ය. එය උසස් සම්ප්‍රදායික අංගයන් රැකගන්නා අතර ම එයට දේශීය වූද, නවතම වූද, ආභාෂයක් දිය යුතු ය.

රදගුරුවරු දෙව්මැඳුර තුළ ඇති ප්‍රතිමාවන් හා සැරසිලි අඩු කිරීමට ද, පූජා පිළිවෙත කෙරෙහි අවධානය යොමු නොකරවන සැම දෙයක් ම ඉවත් කිරීමට කටයුතු කළ යුතු ය. එහෙත් දිව්‍ය පූජාව කෙරේ අවධානය යොමු කිරීමේ පරම චේතනාව නිසාම, පූජා ඇඳුම් ආයිත්තම්වල උදාර බවත්. චාම් බවත් තිබිය යුතු ය. ඇඳුම් දේශගුණයටත්, ශාරීරික සෞඛ්‍යයටත් ගැලපෙන ඒවා විය යුතු ය.

විශ්වාසකයන්ගේ සම්පූර්ණ සහභාගිවීමට රුකුල් දෙන අයුරින් දෙව්මැඳුරු තැනිය යුතුවෙයි. දේව ජනතාව රොක්වන ස්වමීන් වහන්සේගේ භෝජන මේසය වූ පූජාසනයේ උතුම්කම එහි සැලැස්මෙන් හා ස්ථානයෙන් හුවා දැක්විය යුතු ය.

දිව්‍ය සත්ප්‍රසාදය ප්‍රධාන පූජාසනය මත තැන්පත් කර නොමැති නම්, එයට විශ්වාසකයන්ගේ ගෞරව ප්‍රණාමය පිදිය හැකිවන ලෙස සුදුසු වූ අනෙක් ස්ථානයක තැන්පත් කළ යුතු ය. දේව වාක්‍යය කියවීමට භාවිත කරන ආසනය කාටත් පෙනෙන ස්ථානයක තැනීමට වග බලාගත යුතු ය. ප්‍රසාද ස්නාපනීය ජලයේ යෝග්‍යතාව හා ගෞරවය ගැන සැලකිය යුතුවෙයි.

**අවසානය**

ජන වන්දනාව පිළිබඳ මෙම වෙනස් කිරීම් දුරදිග නොබලා කරන ලද ඒවා නොවේ. මෙම වෙනස් කිරීම් වල එක ම අරමුණ වන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ අභිප්‍රාය පරිදි උන්වහන්සේගේ ගැලවීම් සහ වන්දනාවේ කාර්යයන්හි සියල්ලන්ට ම සහභාවීමට හැකිවනු සඳහා දේව ජනතාව ගැඹුරු බුද්ධිමත් විශ්වාසයෙහිත් අවංක කාර්යක්ෂම ප්‍රේමයෙහිත් එක්තැන් කිරීම ය.

## 2.3. දෙවන වතිකානු මන්ත්‍රණ සභාවේ දේව ප්‍රකාශන පිළිබඳ ව්‍යවස්ථාව

වර්ෂ 1965 ක් වූ නොවැම්බර් මස 18 දින රෝමයේ සාන්ත පේදුරු බැසිලිකාවේ දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ පියවරුන් විසින් දේව ප්‍රකාශන පිළිබඳ ව්‍යවස්ථාව දානය කරන ලදී.

## 2.3.1. දේව ප්‍රකාශන හැඳින්වීම

මුළු මිනිස් ඉතිහාසය තුළ ගැලවීමේ සැලැස්ම මින් ප්‍රකාශ වේ. එය සම්පූර්ණයෙන් ම ප්‍රකාශ වන්නේ ක්‍රිස්තුන් වහන්සේ තුළිනි. දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ අනන්ත යහපත්කමින් හා ස්ථිර ප්‍රාඥාවෙන්

උන්වහන්සේව ම අනාවරණය කරන සේක. දෙවියන් වහන්සේ ප්‍රත්‍යක්ෂ දේ තුළින් එනම්, උන්වහන්සේගේ මැවිල්ල තුළින් අපට ප්‍රකාශ වන සේක.

සම්පූර්ණවූත්, අති උත්කෘෂ්ඨ වූත් දේව ප්‍රකාශනය වනුයේ ක්‍රිස්තුන් වහන්සේ ය. තමන් වහන්සේගේ වැඩ සිටීම, වචන හා ක්‍රියා, මරණය හා උත්ථානය තුළිනුත්, ශුද්ධාත්මාගමනය තුළිනුත්, උන්වහන්සේ දෙවියන් වහන්සේව අනාවරණය කළ සේක.

**එයට අපගේ ප්‍රතිචාරය**

දෙවියන් වහන්සේ මනුෂ්‍යයාට අනාවරණය වනුයේ උන්වහන්සේ දැනගෙන, උන්වහන්සේ කෙරෙහි විශ්වාසකර ප්‍රේමයෙන් උන්වහන්සේට කීකරු වීමටය. උන්වහන්සේගේ අනාවරණයේ සත්‍යතාවය විශ්වාසයෙන් පිළිගෙන සම්පූර්ණයෙන් ම උන්වහන්සේට අවනත වීමට ය.

## 2.3.2. දේව ප්‍රකාශන පැතිරවීම

සම්ප්‍රදාය තුළින්, දේව වචනය තුළින්, සහා ඉගැන්වීමේ ගුරු බලය තුළින් දේව අනාවරණය සිදු වේ. ක්‍රිස්තුන් වහන්සේ, තමන් විසින් උගන්වන ලද හා සම්පූර්ණත්වයට පමුණුවන ලද සුබාරංචිය පතුරුවන ලෙස තම ගෝලයින්ට අණ කළ සේක.

සභාවේ ප්‍රමුඛ හා උතුම්ම කාර්යය වනුයේ සුබාරංචිය දේව ජනතාවට ප්‍රකාශ කිරීමයි. රාජගුරුප්‍රසාදිවරු අපෝස්තුළුවරුන් ගෙන් තමාට ලැබුණ තිල බලය භාවිතකර සුබාරංචිය පැතිරවීමේ හා ආරක්ෂා කිරීමේ කාර්යය ඉටු කරති. දේවානුභාවයෙන් ලියැවුණු මුඛ පරම්පරාගත සම්ප්‍රදායයන්, ශුද්ධ ලියැවිල්ල යන දෙක ම එකිනෙකට සමීප ලෙස බැඳී පවතී. ලේඛනගත කරන ලද දේව වචනය ශුද්ධ ලියවිල්ල ය. පරම්පරාවෙන් පරම්පරාවට පැවත එන වචනය සම්ප්‍රදායයි.

## 2.3.3. ශුද්ධ ලියැවිල්ලේ ආනුභාවය හා අර්ථ නිරූපණය

බයිබලය ශුද්ධාත්මානුභාවයෙන් ලියැවුණු ග්‍රන්ථයක් ලෙසත්, දේව වචනය හෙවත් දේව පණිවිඩය අඩංගු පුස්තකයක් ලෙසත් සභාව අවිවාදයෙන් පිළිගනී. (ජොහාන් 20:31, 2 තිමොති 3:16, 2 පේදුරු 1:19, 21:3, 15-16). ඒ නිසා පුරාණ ගිවිසුමේ අඩංගු සියලූ ම පොත් සහා මාතාව විසින් අනුමත කරන ලද ඒවා ය.

ශුද්ධ ලියවිල්ල මගින් දෙවියන් වහන්සේ මනුෂ්‍යාට කථා කරන සේක. ශුද්ධ ලියවිල්ල කියවිය යුත්තේත්, එහි අර්ථය විසඳිය යුත්තේත්, ශුද්ධාත්මාලෝකය තුළිනි. සදාකාලික දෙවි පියාණන්ගේ වචනය මනුෂ්‍යයා වූ ලෙස, මනුෂ්‍ය වචනවලින් ප්‍රකාශිත දේව වචනය මනුෂ්‍යයාට තේරුම් ගත හැකි ලෙස ශුද්ධ ලියැවිල්ල මගින් ප්‍රකාශ වේ.

## 2.3.4. පුරාණ ගිවිසුම

පුරාණ ගිවිසුමේ පරමාර්ථය වනුයේ දිවසිවරුන් හා රජවරුන් මගින් ගැලවුම්කාර වූ ක්‍රිස්තුන් වහන්සේගේ පැමිණීම සඳහා ලෝකය සූදානම් කිරීම ය. ක්‍රිස්තන් වහන්සේ පැමිණීමට පෙර මනුෂ්‍යයාගේ තත්ත්වයත්, දෙවියන් වහන්සේ හා මනුෂ්‍යා අතර වූ සම්බන්ධතාවයත් පුරාණ ගිවිසුම අපට පෙන්වා දෙයි. දේව සැලැස්මට අනුව ක්‍රිස්තුන් වහන්සේගේ නව ගිවිසුම පුරාණ ගිවිසුම සම්පූර්ණ කිරීමකි.

## 2.3.5.නව ගිවිසුම

සුවිශේෂ සතර නව ගිවිසුමේ ප්‍රධාන තැනක් ගනී. ඒවායින් ප්‍රකාශ වනුයේ ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය හා ඉගැන්වීම් ගැන ය. ඒවා අපගේ ඇදහිල්ලේ පදනමයි. ක්‍රිස්තුන් වහන්සේ විසින් කියන ලද හා කරන ලද සියල්ල සුවිශේෂවල අඩංගු වන බව සභාව අදහා ගනී. ක්‍රිස්තුන් වහන්සේ ප්‍රකාශ කළ ශුභාරංචිය තේරුම්

ගත් අපෝස්තුළුවරු උන්වහන්සේගේ උත්ථානයෙන් පසු ශුද්ධාත්ම අනුහසින් ක්‍රිස්තු පණිවිඩය අන් අයට ප්‍රකාශ කළහ.

ශුද්ධාත්මානුභාවය ඇතිව ලියන ලද ශු. පාවුළු තුමාගේ සංදේශ හා අනිකුත් අපෝස්තලික ලේඛනයන් නව ගිවිසුමේ අඩංගු වේ. මෙම ලේඛන ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීම් හා බලය පිළිබඳවත්, ආදි ක්‍රිස්තියානි සංඝයේ වර්ධනය පිළිබඳවත් අපගේ දැනුම ශක්තිමත් කරයි.

## 2.3.6. සභා ජීවිතය තුළ ශුද්ධ ලියවිල්ල

සභා මාතාව දිව්‍ය සත්ප්‍රසාදයට ගෞරවය දක්වන්නාක් මෙන් ම, ශුද්ධ ලියවිල්ලට ද ගෞරව දක්වයි. සියළු විශ්වාසිකයින්ගේ භාවිතය සඳහා සභා මාතාව ඉතා සැලකිල්ලෙන් යුතුව මුල් භාෂාවලින් ලියැවුණු ශුද්ධ ලියැවිල්ල අන්‍ය භාෂාවලට පරිවර්තනය කරන්නී ය. ශු ලියවිල්ල ජනතාවට පහදා දීමේ වගකීම සතු වන්නේ සභා මාතාවට ය.

දේව ධර්ම ශාස්ත්‍රයේ පදනම වන්නේ ශුද්ධ ලියැවිල්ල හා මුඛ පරම්පරාගත සම්ප්‍රදායයි. විශ්වාසයේ ආලෝකයෙන් ක්‍රිස්තු අභිරහස මෙනෙහි කිරීමෙන් මේවායේ ඇති වටිනාකම වටහා ගත හැකි ය. තමන් භාරයේ සිටින දේව ජනතාව හා සමඟ දේව වචනය බෙදාගැනීම සියළුම පූජක පක්ෂයේ ද, තේවාචාර්ය හා ධර්මෝපදේශකයින්ගේ ද යුතුකම ය.

දෙවන වතිකානු මන්ත්‍රණ සභාව සියළු ක්‍රිස්තියානීන්ට නිතර නිතර දේව වචනය කියවීමට උනන්දු කරයි. "දේව වචනය නොදන්නා ක්‍රිස්තන් වහන්සේ නොදනී" (ශු. ජෙරෝම් තුමා) තම විශ්වාසිකයිනට ශුද්ධ ලියවිල්ල භාවිත කළ යුතු අන්දම ගැන උපදෙස් දීම අපෝස්තලික ඉගැන්වීම දරන රාජගුරු ප්‍රසාදීන් සතු කාර්ය යි.

දෙවන වතිකානු මන්ත්‍රණ සභාවේ බලාපොරොත්තුව වන්නේ දෙවියන් වහන්සේගේ වචනය සීඝ්‍ර ලෙස පැතිරී ගොස් ගෞරවයට පැමිණීම ය. (2 තෙසලෝනික 3:1) සඳහටම පවතින දේව වචනය කෙරෙහි ගෞරවාදරය වැඩිවී ආධ්‍යාත්මික ජීවිතයේ නව පිබිදීමක් ඇති කිරීම ය.

## 2.4. ක්‍රිස්තියානි නොවූ ආගම් කෙරෙහි ශු. සභාවේ සබඳකම් පිළිබඳ ප්‍රකාශය

1. මෙකල මනුෂ්‍යයන් දිනෙන් දින තම තමන් අතරේ කිට්ටු සබඳතා ගොඩනගා ගන්නා අවදියකි. එලෙස ම ජාතීන් අතරේ ද සම්බන්ධතා ඇතිකර ගන්නා කාලයකි. සභාව ද තම අවධානය ක්‍රිස්තියානි නොවූ ආගම් කෙරෙහි යොමු කරමින්, කෙලෙස තම සාමාන්‍ය ලීලාව මෙවැනි ආගම් කෙරෙහි බලපෑ යුතුදැයි සිතන්නට වූවා ය. එබැවින්, මනුෂ්‍යයන් අතර, ජාතීන් අතර, සාමය හා ප්‍රේමය නගාලීම තම මූලික කාර්යය ලෙස සැලකූ ඇය සියලූ මනුෂ්‍යයනට පොදු, මනුෂ්‍යයන් අතර ඇසුරට සහාය වන කරුණු ගැන සැලකිලිමත් වෙමින් මෙම ප්‍රකාශය ඉදිරිපත් කළා ය.

එකම පැවැත්මක් (ප්‍රභවයක්) ඇති, එකම පවුලකට අයිති මිනිස් සංහතියම මැවූ දෙවියන් වහන්සේ මුළු පෘථිවිය මත ජීවත්වීමට ඔවුනට සැලසූ සේක. (ක්‍රියා 17:26) ඔවුනගේ අවසානය ද එකම ය. එනම් දෙවියන් වහන්සේ ය. මනුෂ්‍ය ජාතීන් දෙවියන් වහන්සේගේ ආලෝකයෙහි හැසිරෙන, උන්වහන්සේගේ තෝරා ගත්තවුන්, තේජසින් දීප්තිමත් වූ ශුද්ධ නගරයෙහි එක්වන දිනය පැමිණෙන තෙක් (එළිදරව්ව 21:23) උන්වහන්සේගේ ආරක්ෂාව ද යහපත්කම ද, ගැළවීමේ ක්‍රියා මාර්ගය ද සියළු මනුෂ්‍යයන් කෙරෙහි පැතිර යන්නේ ය. (ක්‍රියා 14:17)

පෙර මෙන් දැනුදු මිනිසා මිනිස් හදවත් කළඹන, ගැටළුවලට- ප්‍රශ්නවලට පිළිතුරු ආගම් වලින් සොයයි. මිනිසා කවරෙක් ද? ජීවිත අරුත හා අදහස කිමෙක් ද? යහපත හා පාපය යනු කිම? දුකට හේතුව සහ එහි අදහස කුමක් ද? මරණය, විනිශ්චය හා මෙලොවින් පසු ඒවායේ විපාක ගැන සත්‍යය කිමෙක් ද? මිනිසා හසුරුවන පැවැත්ම, ඔහු ඇදී යන කෙළවර වූ පරම අභිරහස කිමෙක් ද? මේ මිනිසාට උරුම වූ ප්‍රශ්නයන් ය.

2. මෙලොව දේවල කාල ක්‍රමය සහ මිනිස් ජීවිත සිද්ධීන් පාලනය කරන ගුපත බලයක් ගැන හැඟීමක් අතීතයේ සිට අද දක්වා ම මිනිස් සංහතිය අතරේ පවතී. මෙම හැඟීම සැමවිට ම අති උතුම් දෙවි කෙනෙකු ගැන ය. පියෙකු ගැන ය. මෙම හැඟීම නිසා බලවත් ආගමික අවබෝධයක් ඒ මනුෂ්‍ය සංහතිය තුළ ම විනිවිද යයි. සංස්කෘතික වශයෙන් දියුණුවට පත් ආගම්, වඩාත් සියුම් වූ කල්පනාකාරී විලාශයකින් හා ලාලිත භාෂිතයකින් යුතුව ඉහත ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නට උත්සාහ කරයි. හින්දු භක්තිකයෝ දිව්‍ය අභිරහස මෙනෙහි කරමින් විපුල ඵලදායක තත්ත්වයකින් යුත් දේව කථා වලින්ද සියුම් දාර්ශනිය විභාගයන් මගින් ද එය ප්‍රකාශ කරති. මෙලොව දුක් වේදනා වලින් මිදීම සන්‍යාසි අභ්‍යාසවල යෙදීමෙන් හෝ ගැඹුරු භාවනා වල යෙදීමෙන් හෝ ප්‍රේමයෙන් විශ්වාසයෙන් දෙවියන් වෙතට යාමෙන් හෝ ලබා ගැනීමට සොයති. විවිධ දේශ වල විවිධ අයුරින් පවත්නා බුදු දහමේ වෙනස් වන මේ ලෝකයේ මූලික නොවෙනස්කම් පිළිගනු ලැබෙයි. ධර්මිෂ්ඨ ස්ථිර සිතකින් පූර්ණ නිදහස් තත්ත්වයක් ලබා ගැනීමට හෝ තමාගේ උත්සාහයෙන් සමහරවිට වඩා උසස් ආධාරයෙන් උතුම් ප්‍රබුද්ධතාව ලබාගැනීමට හෝ මාර්ග උගන්වනු ලබයි. එලෙස ලොවේ ඇති වෙනත් ආගම් ද තම ඉගැන්වීමෙන් න්‍යායන් හා වත්පිළිවෙත් මගින් මිනිස් හදවත්හි ඇති නොසන්සුන්තාවයට පිළියම් ලබා ගැනීමට උත්සාහ කරයි.

කතෝලික සභාව, මේ ආගම්වල දක්නට ලැබෙන සත්‍ය වූද, ශුද්ධවූ කිසිවක් ප්‍රතික්ෂේප නොකරයි. කතෝලික ඉගැන්වීම් අනුව සමහරක් විස්තර හා විභාග අතින්, බොහෝ කරුණුවලදී වෙනස්ව පැවතිය ද ඒවා සකල මනුෂ්‍යයන්ට ආලෝකය දෙන පරම සත්‍යය පිළිඹිබු කරන හෙයින් අනෙක් ආගම්වල ක්‍රියාකාරිත්වය ජීවිත ක්‍රමයන් ශික්ෂා හා ඉගැන්වීම් සියල්ල අවංක ගෞරවයෙන් සලකයි. එහෙත් ක්‍රිස්තුන් වහන්සේ මාර්ගය ද, සත්‍යය ද, ජීවනය ද (ජොහන් 14:16) වන බවත් උන්වහන්සේ තුළ මනුෂ්‍යනට සම්පූර්ණ ආගමික ජීවිතය සම්බන්ධ වන බවත් උන්වහන්සේ තුළ දෙවියන් වහන්සේ සියලූ දේ තමනට සමගි කර ගන්නා බවත් (2 කොරින්ති 5:18-19) කතෝලික සභාව නිතර ප්‍රකාශ කරයි. ප්‍රකාශ කළ යුතු යි.

එහෙයින් ඥානවන්ත ලෙසත්, ප්‍රේමයෙන් යුතුවත් අන්‍යාගමිකයන් සමග සංවාදයෙන් සහයෝගිතාවයෙන් ක්‍රියා කළ යුතු ය. ක්‍රිස්තියානි විශ්වාසිය ජීවිතයේ සාක්ෂිකරුවන් වශයෙන් ක්‍රියා කළ යුතු ය. ඔවුන් අතරේ දක්නට ඇති අධ්‍යාත්මික සදාචාරාත්මක යහපත් දේ සමග සමාජමය වූ හා සංස්කෘතිකවූත්, වටිනා දේ පිළිගෙන ආරක්ෂා කළ යුතු ය. එපමණක් නොව ඒවාට අනුබල දෙන ලෙසටත් සභා මාතාව උපදෙස් දෙන්නී ය.

3. සභා මාතාව මුස්ලිම්වරුන් ද ගෞරවයෙන් සලකයි. ඔවුහු ජීවමානවූ ද නිතර වැඩ සිටින දයාන්විත සර්ව බලධාරී, අහස හා පොළොව මැවූ, මිනිසුනට කථා කළ එක ම දෙවියන් වහන්සේට වන්දනා කරති. ඉස්ලාම් ලබ්ධියට නැකම් කියන ආබ්‍රහම් මෙන්, ඔවුහුද උන්වහන්සේගේ ගුප්ත නියමයනට මුළු හදවතින් අනුකූලතාවය දැක්වීමට උත්සාහ කරති. ඔවුහු ජේසුස් ස්වාමින් වහන්සේ සැබෑ දෙවියන් බව පිළි නොගත්ත ද, දිවස්වරයාණන් කෙනෙකු ලෙස පිළිගෙන ගරු කරති. උන්වහන්සේගේ මාතාවන් වූ කන්‍යාමරිය තුමියට ගෞරවාදර දක්වති. ඇතැම්විට එතුමියට යාච්ඤා කරති. එකිනෙක මනුෂ්‍යයා උත්ථාන කර නඩු විනිශ්වයට නැවත පැමිණීමේ දිනය එනතුරු බලාපොරොත්තුවෙන් සිටිති. සදාචාර ජීවිතය අගයති. යාච්ඤාවෙන්, දන් දීමෙන්, උපවාසයෙන් දෙවියන් වහන්සේට වන්දනාමාන කරති. ශතවර්ෂ ගණනාවක් තුළ ක්‍රිස්තු භක්තිකයන් හා මුස්ලිම්වරුන් අතර ආරවුල්, සතුරුකම් ඇති වුවද, අතීතය අමතක කර, එකිනෙකා අතර අන්‍යෝන්‍ය අවබෝධය ඇතිව ජීවත් වීමට උත්සාහ කරන ලෙසට මෙම මන්ත්‍රණ සභාව සියලූ දෙනාගෙන් ඉල්ලා සිටියි. සියළු මනුෂ්‍යයන් සම්බන්ධයෙන්, සමාජ සාධාරණකමද, වටිනා සදාචාර ප්‍රතිපත්ති ද, සමාදානය හා නිදහස ද ආරක්ෂා වන පරිදි ක්‍රියා කිරීමට ඔවුහු සහයෝගයෙන් එක්සත් වෙත්වා!

4. ඉතා සියුම් ලෙස සභා අභිරහස ගැන තම අවධානය යොමු කළ කතිකාවතට අවබෝධ වූයේ, නව ගිවිසුමේ ජනතාව ආත්මික වශයෙන් ආබ්‍රහම්ගේ මුල්ම පරම්පරාවට සම්බන්ධ කොටසක් වූ බව ය. දේව සැළැස්ම අනුව විශ්වාසයේ තෝරා ගැනීමේ පැවැත්ම එකල වූ, ආදී පීතෘවරු - මෝසස් හා දිවස්ප්‍රසාදිවරුන් අතරෙන් වූ බව සභා මාතාව පිළිගනී. එහෙයින් විශ්වාසය මගින් (ගලාති 3:7) ආබ්‍රහම්ගේ සැබෑ පුත්‍රයෝ ඇදහිල්ල ඇති අය වෙති. දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාස

කරන සියළු දෙන ආබ්‍රහම්ගේ කැඳවීමට ඇතුළත් වෙති. එලෙස ම තෝරාගත් ජනතාව වහල් බවින් මිදී නික්මයාම සභාවේ ගැලවීමේ අභිරහසක් ලෙසින් ද පිළිගනී.

කරුණාභරිත දෙවියන් වහන්සේ විසින් පිහිටුවන ලද පැරණි ගිවිසුමේ ප්‍රකාශනය, එම ජනතාවගෙන් ලබාගත් බව සභාව අමතක නොකරයි. වල් ඔලිව වැනි අන්‍ය ජාතිකයන් විසින් බද්ධ කරන ලද යහපත් ඔලිව කඳෙන්, තමන් සාරය ලබන බව සභාවට අමතක කළ නොහැකි ය (රෝම 11:17-24). අප සමාදානය වන ක්‍රිස්තුන් වහන්සේ, කුරුසය මගින්, ජුදයන් - අන්‍ය ජාතිකයන් සමාදාන කර, දෙපක්ෂය ම උන්වහන්සේ තුළ එක්කළ බව ශුද්ධ වූ සභාව විශ්වාස කරයි (එපීස 2:14-16).

දේවපුත්‍රකමට පිළිගනු ලැබීම, මහිමතාවය, ගිවිසුම හා ව්‍යාවස්ථාව, දේව සේවය හා පොරොන්දු ඔවුන් සතු බව සභාව පිළිගනියි. ඇදහීම, පොරොන්දුව, පියවරු ද ඔවුන්ගේ ය. මාංශාකාරයෙන් කන්‍යාමව්ගෙන් ක්‍රිස්තුන් වහන්සේ උපන්නෙත් ඔවුන්ගෙන් යැයි (රෝම 9:4-5) ශුද්ධ වූ පාවුළුතුමාගේ කියමන් සභාව නිතර සිහිපත් කරයි. එලෙස ම සභාව, තම අත්තිවාරමේ ගල් කණු වැනි අපෝස්තුළුවරුන්, ක්‍රිස්තුන් වහන්සේව ලොවට ප්‍රකාශ කළ ගෝලයන් කිහිප දෙනෙකු, ජුදා ජාතියෙන් උපන් බව සිහිපත් කරයි.

ශුද්ධ ලියවිල්ලෙහි සඳහන් පරිදි, දෙවියන් වහන්සේ කරුණාවෙන් යුතුව, ජෙරුසලෙම බැලීමට ආ දවස දැනනොගත් (ලූක් 19:44) ජුදයින් අතරෙන් බොහෝ දෙනෙක් සුවිශේෂය පිළිනොගත් අතර. ප්‍රචාර කිරීමට ද බාධා පැමිණවූ හ (රෝම 11:28). එහෙත් පාවුළු තුමා සඳහන් කරන පරිදි ඔවුහු පියවරුන් නිසා, තවම දෙවියන් වහන්සේගේ ප්‍රේම වන්තයෝ ව සිටිති. දෙවියන් වහන්සේ තම දීමනා හා කැඳවීම් ගැන පසුතැවිලි නොවීම මෙයට හේතුවයි. (රෝම 11:29) එක්සිත්ව, උන්වහන්සේට සේවය කරන්වායි (ශෙපනියා 3:9) එක් හඬින් සියළු ජාතීන් ස්වාමින් වහන්සේට පවසති. එලෙස ම උන්වහන්සේ පමණක් දන්නා දවස පැමිණෙන තෙක් දිවස්වරුන් හා අපෝසතුලූළුවරු සමග සභාව ද බලාපොරොත්තුවෙන් සිටියි.

ක්‍රිස්තු භක්තිකයන් හා ජුදයන් අතර පොදු ආත්මික උරුමය එතරම් විශාල ය. එකිනෙකා අතර අවබෝධය, ගෞරවය, දේව ශාසනය පිළිබඳ අධ්‍යයනයෙන්. සහෝදරත්වයෙන් කෙරෙන සංවාදයන් තහාලීමට මෙම සභාව ආශා වන්නී ය.

ජුදා බලධරයන්, ඔවුන් අනුව ගියවුන් ක්‍රිස්තුන් වහන්සේගේ මරණය ඉල්ලා සිටි බව ඇත්තකි (ජොහාන් 19:6). එහෙත් උන්වහන්සේගේ දුක් ප්‍රාප්තියේදී සිදුවූ දෙවල් ගැන හෝ එකල ජුදයිනට හෝ වත්මන් ජුදයිනට හෝ දොස් පැවරීම නොවටී. සභාව නව දේව ජනතාව වන නමුත්, ජුදයන් දුෂ්ඨයන් මෙන්, දේව ශාප ලද්දන් මෙන් ශුද්ධ ලියවිල්ලෙන් ඔප්පු වෙතියි සිතා එසේ සැළකිය නොයුතු ය. දහම් පාඩම් වල දී, දේව වචනය දෙසීමේ දී සුබාරංචියට අදාළ නොවන කිසිවක් නොඉගැන්වීමට ප්‍රවේශම් විය යුතු ය.

කෙනෙකුට පීඩා කිරීම සහා ප්‍රතිපත්තිය නොවන බව සභාව පවසයි. තව ද ජුදයන් හා සභාව අතර පොදු උරුමය සිහි කරමින්, දේශපාලන හේතුවලින් නොව, සුබාරංචියෙන් ප්‍රකාශිත ඇතුළාන්ත ප්‍රේමයෙන් පෙළඹී කටයුතු කළ යුතු ය. එබැවින් ඔවුනට විරුද්ධව කෙදිනක හෝ කවරකුගෙන් හෝ පැන නගින විරෝධ පීඩා වෛර ආදි සෑම උවදුරක් ම සභාව හෙළා දකියි. එපමණකුදු නොව, සභාව නිතර ඉගැන්වූ, දැනුදු උගන්වන පරිදි ක්‍රිස්තුන් වහන්සේ මිනිස් පව් උදෙසා, සිය කැමැත්තෙන්, ප්‍රේමයෙන් දුක්විඳ මරණයට පත් වූ සේක. එහෙයින් ක්‍රිස්තුන් වහන්සේගේ කුරුසය සීමාරහිත, දේව ප්‍රේමයේ ලකුණ හා සියළු වරප්‍රසාදයේ උල්පත වන බව ප්‍රකාශ කිරීම සහා ඉගැන්වීමට අයිති කටයුත්තකි.

5. දේව සමානකමටම මවන ලද මිනිසුන් අතරෙන් සමහරෙකුව සහෝදරයන් ලෙස පිළි නොගනිමු නම්, සැමගේ පියාණන් වන දෙවියන් වහන්සේට සත්‍යයෙන් ම ඇමතීමට අපට නුපුළුවන. දෙවියන් හා මනුෂ්‍යයා අතරත් සම්බන්ධකම ඉතා කට්ටු ලෙස පවතියි. එය “ප්‍රේම නොකරන්නා දෙවියන් නාඳුනයි” යනුවෙන් පෙන්නුම් කරයි. (1 ජොහන් 4:8)

එහෙයින් මිනිසුන් හා ජාතීන් අතර මිනිස් ගරුත්වය, අයිතිවාසිකම් පිළිබඳ වෙනස්කම් දැක්වීමට මග සලසන වාදයකට හෝ ක්‍රියාවකට හේතු නොමැත.

මෙලෙස සභාව - ජාති, වර්ණ, තරාතිරම් හෝ ආගමික හිරිහැර ක්‍රිස්තු අදහසට නොගැලපෙන දේ ලෙස හෙළා දකියි. ප්‍රතික්ෂේප කරයි.

එහෙයින් මෙම කතිකාවත, පේදුරු පාවුළු, අපෝසතුළුවරුන් අනුව යමින්, සියළු ජාතීන් තමන්ගේ හැසිරීම ඔබින ලෙස පවත්වාගන්නා මෙන් ක්‍රිස්තු භක්තික විශ්වාසිකයන්ගෙන් ඉල්ලා සිටියි. (පේදුරු 2:12) එලෙස ම ස්වර්ගික පියාණන්ගේ දරුවන් වන පිණිස තමනට හැකි පරිද්දෙන් සියළු මනුෂ්‍යයන් සමග සමාදානයෙන් සිටින මෙන් ද මතක් කරයි (රෝම 12:18).

# තුන්වන පාඩම

## රෝගීන්ගේ ආලේපය, පූජාත්වරය හා ආශිර්වාදකාර බන්ධනය යන දේව ප්‍රසාද නිධාන පිළිබඳ අවබෝධය

### 3.1 රෝගීන්ගේ ආලේපය

### 3.1.1 ගැලවීමේ ඉතිහාසය තුළ සක්‍රමේන්තුව සඳහා වන පදනම

16 වන සියවසේ දී ප්‍රචලිත අදහස වූයේ මිනිසා විසින්ම ආලේප කරන ලද පිළිවෙතක් බව ය. ජාකොබ් තුමාගේ සංදේශය තුළින් වැඩිමහල්ලන් කිතුනු සංසය තුළ වැඩිහිටියන් ලෙස අර්ථකථනය කළහ. ඒ අනුව වැඩිමහල්ලන්ට සැලකිම සංසයේ වැඩිහිටියන්ගේ කාර්යයක් බව ඉස්මතු කළහ.

එනමුත් ''ට්‍රෙන්ට්'' මන්ත්‍රණ සභාව වැඩිමහල්ලන් ගැන පුළුල්ව කතා කරමින් වැඩිමහලු කෙනෙකුගේ වයෝවෘධිභාවය තුළ ඔහු හෝ ඇයව ආලේප කිරීම සුව සහනය ලබාදීම ශුද්ධවූ පිළිවෙතක් බව ප්‍රකාශ කළේ ය. රෝගීන් ආලේප කිරීමෙන් හා ඔහු සඳහා යාච්ඤා කිරීමෙන් ඔහුට පව් කමාව ලැබෙන බව ප්‍රකාශ කළේය. දේව ධර්මවාදින් බොහෝදෙනෙකුගේ මතය වූයේ මෙය අපෝස්තුළුවරුන් විසින් ස්ථාපිත කර ඇති බව ය. මෙය දේව ප්‍රසාද නිධානයක් ලෙස ස්ථාපිත කිරීම ගැන ශුද්ධවූ බයිබලය දැකිය හැකි ප්‍රබල සාක්ෂිය ජාකොබ් තුමාගේ ලිපිය වේ.
''ඔබ අතරෙන් යමෙක් රෝගිව සිටින්නේ නම් ඔහු සභා මූලිකයන් කැඳවා ගනීවා. ඒ මූලිකයෝ ස්වාමින් වහන්සේගේ නාමයෙන් ඔහු තෙලින් ආලේප කොට, ඔහු උදෙසා යාච්ඤා කරත් වා. එවිට ඇදහිල්ලෙන් පුදන යාච්ඤාවෙන් රෝගියාට සුවය ලැබේ. ස්වාමින් වහන්සේ ඔහු නැඟිටුවනු ඇත. ඔහු පව්කර තිබේ නම්, ඒ පව් ඔහුට කමා කරනු ලැබේ. එබැවින් ඔබ එකිකොට පාපොච්චාරණය කර, සුවය ලබන පිණිස එකිනෙකා උදෙසා යාච්ඤා කරන්න. දැහැමි මිනිසෙකු යදින යැදුම බලවත් ය. පලදායක ය. (5:14-16)

තවද ට්‍රෙන්ට් මන්ත්‍රණ සභාවේ ඉගැන්වීම් වූයේ ද මෙය ක්‍රිස්තුන් වහන්සේ විසින්ම ස්ථාපිත කළ බවයි. එබැවින් රෝගී තැනැත්තා ක්‍රිස්තුන් වහන්සේ ගේ දුක් වේදනා වලට පංගුකාර වේ. මරණාසන්නව සිටින රෝගියාගේ පංචේන්ද්‍රිය ශුද්ධවූ තෛලයෙන් ආලේප කිරීමෙන් මේ ප්‍රසාද නිධානය දානය කෙරේ. ශුද්ධවූ සුවිශේෂ කතුවර මාක් තුමා ද, මෙම සක්‍රමේන්තුව ගැන පැහැදිලිව සඳහන් කර ඇත.
'' තවද ඔව්හු බොහෝ යක්ෂයන් දුරු කොට, බොහෝ රෝගීන් ද තෙලින් ආලේප කොට සුවපත් කළහ.'' (මාක් 6/13)

#### මනුෂ්‍ය ජීවිතය හා රෝගී තත්තවයට පත්වීම.

මිනිස් දිවිය මිනිසා මුහුණ දෙන ඉතා බැරෑරුම් ප්‍රශ්නයකි. රෝගාතුර වීම හා දුක් විඳීම, යමෙක් තමාගේ බෙලහීන බව අසරණ බවව සීමිත බව හොඳටම අත්දකින්නේ රෝගාතුරු වූ විට ය.

සමහර අවස්ථාවල දී රෝගාතුරුවූ අය බලාපොරොත්තු නැති කරගෙන දෙවියන් වහන්සේට විරුද්ධව කැරළි ගැසීමට පෙළඹේ. එහෙත් තවත් කොටසක් තමාගේ රෝගී වීම දෙවියන් වහන්සේ කරා ළඟා වීමට අවස්ථාවක් කර ගනී. පරිණත භාවයට පත්වීමට එය හේතුවක් කරගනී. දෙවියන් සොයා යාමටත්, දෙවියන් වහන්සේ කරා ළඟා වීමටත් කදිම අවස්ථාවක් මේ මාර්ගයෙන් ඔවුනට උදා වේ.

පුරාණ ගිවිසුමේ රෝගාතුරු වූ මිනිසා දේව සම්මුඛයෙහි ජීවත් විය. ඔහු තමාගේ රෝගය සඳහා වැළපෙන්නේ ඒ දෙවියන් වහන්සේ ඉදිරිපිට ය. ඔහු සුවය පතා සිටින්නේ, ජීවිතයෙත්, මරණයෙත්, ස්වාමීන් වන දෙවියන් වහන්සේගෙනි. (ගීතාවලිය 6:3, යෙසායා 38)

රෝගාතුර වීම සිත් මාරුවකට හේතු වේ. දෙවියන් වහන්සේගෙන් ලැබෙන සමාව ශාරීරික සුවයට මාර්ගයක් වේ. (ගීතාවලිය 32:5, 3, 8:5, 39:9,12) මෙලොව ඇති පාපය, අයහපත, නිසා රෝගාතුර වීම ඇති

වේ යන්න ඊශ්‍රායෙල් ජනතාවගේ අත්දැකීම විය. දෙවියන් වහන්සේට විශ්වාසවන්ත වීම සුවය ලැබීමට හේතු වේ. ''මම නුඹලාට සුවය දානය කරන දෙවියන් වහන්සේ ය මම වෙමි.'' (නික්මයාම 15:26)

යෙසයා දිවැසිවරයා පවසන්නේ අන් අයගේ පාපවලට වන්දි ගෙවීමක් රෝගී භාවය මගින් කළ හැකි බව යි. (යෙසායා 33:24) දෙවියන් වහන්සේ සියලු දෙනාගේම රෝග සුවකර ඔවුන්ගේ පාපවලට සමාව දී සියොන් නගරයට යහපත් කාලයක් උදාවීමට සැලසන බව දිවැසිවරයා පවසයි.

## 3.1.2 මානව පිවිතය තුළ රෝගි බව

සිරාක් 38:14 - සහනය දීමේ අනුග්‍රහය තමන්ට දෙන ලෙසත්, ප්‍රාණයක් ගළවන පිණිස සුවය දෙන ලෙසත් ඔවුන් ද සමිඳාණන්ට යාච්ඤා කරනු ඇත.

ද්විතිය නීති සංග්‍රහය 32:39 - බලන්න මම පමණක් දෙවියන් වහන්සේ වෙමි. මා හැර අන් දෙවි කෙනෙකු නැත දිවි දෙන්නෙත් දිවි නසන්නෙත් මම ය.

ගීතාවලිය 103 - එතුමාණෝ මාගේ සියළු පව් කමා කරන සේක. මාගේ සියලු රෝග සුව කරන සේක.

ජාකොබ් 5:15 - විට ඇදහිල්ලෙන් පුදන යාච්ඤාවෙන් රෝගියාට සුවය ලැබේ.

### ශාරීරික සුවය මගින් ලැබෙන අභ්‍යන්තර වරප්‍රසාද

ලූක් 5:20 - උන්වහන්සේ ඔවුන්ගේ ශ්‍රාද්ධාව දැක, මිත්‍රය, ඔබේ පව් ඔබට කමා කර ලද''යි වදාළ සේක.

ලූක් 18:42 - පෙනීම ලබන්න, ඔබේ ශ්‍රාද්ධාව ඔබ සුව කළේ ය.'' යි වදාළ සේක.

ලූක් 8:48 - දියණියනි ඔබේ ශ්‍රාද්ධාව සුව කළේ ය. සාන්ත සිතින් යන්නැ'යි උන්වහන්සේ ඇයට වදාළ සේක.

### සුවය මෙසියානු ආගමනයට ලකුණකි.

මතෙව් 4:23 - ජේසුස් වහන්සේ ඔවුන්ගේ ධර්ම ශාලාවල අනුශාසනා කරමින් ද, රාජ්‍ය පිළිබඳ සුබ අස්න දේශනා කරමින් ද, සෙනඟ අතර සියලු ආකාර ලෙඩ රෝග සුව කරමින් ද ගලීලය පුරා සැරී සැරු සේක.

මතෙව් 9:35 - ජේසුස් වහන්සේ ඔවුන්ගේ ධර්මශාලා වල උගන්වමින් ද රාජ්‍ය පිළිබඳ සුබ අස්න දේශනා කරමින් ද හැම අන්දමේ රෝග ලෙඩ රෝග සුව කරමින් ද සියලු නුවරවල හා ගම්වල සැරිසැරු සේක.

මතෙව් 11:4-5 ඔබ ගොස් අසන දකින දේ ජොහාන්ට දන්වන්න. අන්ධයෝ පෙනීම ලබති. කොරු ඇවිදිති. ලාදුරු රෝගිහු පවිත්‍ර වෙති. බිහිරන්ට ඇසෙයි. මළවුන් නැගිටුවනු ලබති. දිළිඳුන්ට සුබ අස්න ප්‍රකාශ කරනු ලැබේ.

ලූක් 6:18 - දුෂ්ඨාත්මයෙන්ගෙන් පීඩිත වූවෝ සුව කරනු ලැබූ හ.

### ක්‍රිස්තුන් වහන්සේ විසින් කරන ලද සුවය ශුද්ධවූ ලකුණු විය.

මාර්ක් 1:14 - උන්වහන්සේ මහානුකම්පාවෙන් අත දිගු කොට ඔහු පිට තබා, ''මම කැමැත්තෙමි, පවිත්‍ර වන්නැ''යි වදාළ සේක.

මාර්ක් 7:33 - උන්වහන්සේ ඔහු සමූහයා කෙරෙන් වෙන් කොට ඉවතට ගෙන ගොස් ඔහුගේ කන්වල උන්වහන්සේගේ ඇඟිලි බහා තමන් කෙළවලින ඔහුගේ දිව ස්පර්ශ කළ සේක.

මාර්ක් 8:23 - උන්වහන්සේ අන්ධයා අතින් අල්ලාගෙන ගමෙන් පිටතට ගෙන ගොස් ඔහුගේ ඇස්වල කෙළ තවරා ඔහු පිට අත් තබා...

ලූක් 13:13 - ඈ පිට අත් තැබූ සේක.

ජොහාන් 9-11 - උන්වහන්සේ මාගේ ඇස්වල මඩ ගැල්වූ සේක. මම සෝදා ගතිමි.

**සුව කිරීමේ බලය අපෝස්තුළුවරුන්ට දානය කරන ලදී.**

ලූක් 6:19 - උන්වහන්සේගෙන් බලයක් නිකුත් වී සියලු දෙනාටම සුවය ලැබිණ (මාර්ක් 1:14, 3:10, 6:56)
මාර්ක් 6:12-13 - දොළොස් දෙනා යක්ෂයින් දුරු කර බොහෝ දෙනෙකු අලේප කර ඔවුන්ට සුවය දානය කළහ.
ලූක් 9:1 - රෝග සුවපත් කරන ලදි.
මාර්ක් 16:18 - රෝගීන් පිට අත්තැබූ විට ඔවුහු සුවය ලබති.

**ගැලවීමේ ක්‍රියාවලියෙන් පසු රෝගී බව ගැන අලුත් අරුතක්**

2 කොරින්ති 12:9 - ''රෝගාතුර වූ විට මගේ වරප්‍රසාදය....''
ජාකොබ් 5:14-16 - ''නුඹලා අතරෙන් කිසිවකු රෝගාතුරුව සිටි නම්... ඔහු පව් කර තිබේ නම් ඒ පව් ඔහුට කමා කරනු ලැබේ. ක්‍රියා 3:2-8 රන් වත් රිදී වත් මට නැත........''

මනුෂ්‍යයාගේ දුක් වේදනා ගැන අවදිව ක්‍රිස්තුන් වහන්සේ ඔවුන් ස්පර්ශ කර සුව කළා පමණක් නොව, ඒ දුක් වේදනා තමන්වහන්සේගේම කර ගත් සේක. (යෙසායා 38, ගිතාවලිය 6:3) 'උන්වහන්සේ අපේ වේදනා දුරු සේක. අපගේ රෝග වෙනුවෙන් දුක් වින්ද සේක.'' උන්වහන්සේගේ සුව කිරිමේ දේව රාජ්‍යය පැමිණීමේ සලකුණු විය. උන්වහන්සේ දුක් ප්‍රාප්තියෙන් හා මරණයෙන් අපගේ දුක් වේදනා වලට නව අරුතක් ලබා දුන් සේක. ඒ නිසා අපි උන්වහන්සේ හා සමාන වනවා පමණක් නොව, උන්වහන්සේගේ ගැලවීමේ කාර්යයේ පංගුකාරයින් බවට ද පත්වෙමු. (මතෙව් 8:17, යෙසායා 53:4)

උත්ථානු වූ ක්‍රිස්තුන් වහන්සේ මෙම දූත කාර්යය නවතාවයකට පත් කරන සේක. 'ඔවුන් මාගේ නාමයෙන් රෝගින් මත අත් තබා යාච්ඤා කළ විට ඔවුන්ට සුවය ලැබේ.' (මතෙව් 10:38) සභා මාතාව ක්‍රිස්තුන් වහන්සේ විසින් කියන ලද වචනය ස්ථිර කරනු සඳහා රෝගීන් මත අත තබා යාච්ඤා කර ඔවුන්ට මානසික හා ශාරිරික සුවය දානය කරයි. (මාක් 16:17-18) අපට සුවය සහ ගැලවීම දානය කරන ක්‍රිස්තුන් වහන්සේ සැබෑ වූ දෙවියන් වහන්සේ බව ඔප්පු කිරීමට කදිම සාක්ෂි වේ. (මතෙව් 1:21, ක්‍රියා 4:12)

**ශුද්ධවූ තෛලයෙන් ආලේප කිරීම.**

ජෙරමියා 8:22, 46:11 මාගේ සෙනඟ සුවය ලබා නැත්තේ මන්දැයි ස්වාමින් වහන්සේ අසන සේක.
යෙසායා 1:6 - ඔබේ තුවාල වලට බෙහෙත් තෙල් දමා නැත.
මාක් 6:13 - ඔවුහු බොහෝ යක්ෂයන් දුරුකොට.... තෙලින් ආලේප කොට සුවපත් කළ හ.
ලූක් 10:34 - ඔහු වෙතට ගොස් තෙල් හා මිදියුෂ ගල්වා තුවාල බැඳ....
ජාකොබ් 5:14 - ඔබ අතරෙන් යමෙක් රෝගීව සිටින්නේ නම්.. ස්වාමීන් වහනසේගේ නාමයෙන් ඔහු තෙලින් ආල්ප කොට....

## 3.1.3. දිව්‍ය වෛද්‍යවරයා වූ ක්‍රිස්තුන් වහන්සේ

ක්‍රිස්තුන් වහන්සේ රෝගී වුවන් කෙරෙහි දක්වූ අනුකම්පාවත්. නොයෙකුත් ලෙස රෝග වලින් හා දුර්වලකම්වලින් පෙළන වුවන් සුව කිරීමත් සඳහා දෙවියන් තම සෙනඟ බැලීමට පැමිණි සේක. දිව්‍ය රාජ්‍යය අත ළඟ ය. යන්න කදිම නිදසුනකි. ක්‍රිස්තුන් වහන්සේට රෝග සුවකිරීමට පමණක් නොව, පව් කමා කිරීමට බලය ඇත. උන්වහන්සේ පැමිණියේ සම්පූර්ණ මිනිසා සුව කිරීමට ය. උන්වහන්සේ දිව්‍ය වෛද්‍යවරයාණන් වන සේක.

ලූක් 7:16 හි නායිම් නුවර තරුණයා උත්ථාන කිරීමෙන් පසු ''එකල සියල්ලෝම බියපත්ව, ශ්‍රේෂ්ඨ දිවැසිවරයෙක් අප අතර පහළ වී සිටි'' දෙවියන් වහන්සේ සිය සෙනඟ ගැලවීමට වැඩිය සේක. (මතෙව් 4:24) උන්වහන්සේගේ කීර්තිරාවය සිරියාව පුරා පැතිරිණි. නානාවිධ රෝග පීඩාවලින් පෙළුණු රෝගීහු ද, අංශභාග රෝගීහු ද උන්වහන්සේ වෙත ගෙනන ලද්දෝ ය. උන්වහන්සේ ඔවුන් සුවපත් කළ සේක.
මේ පාඨයෙන් ඔවුන් ඉල්ලීම් දෙකක් කරන ලදී. ඒ සුවය සහ පව් සමාවයි.
නව ගිවිසුමේ ප්‍රසාද නිධානයක් ලෙස ක්‍රිස්තුන් වහන්සේ විසින් මෙය ස්ථාපනය කරන ලදී. ශුද්ධවූ මාර්ක් තුමා මේ ගැන සඳහන් කරයි.

## 3.1.4 රෝගීන්ට සුවය ජාකොබ් තුමාගේ අනුශාසනය

ජාකොබ් අපෝස්තුළුවරයා විසින් විශ්වාසකයන්ගේ භාවිතය පිණිස මෙම ප්‍රසාද නිධානය ඉදිරිපත් කර ස්ථිර කරන ලදී. (ජාකොබ් 5:14-15) ''ඔබ අතරෙන් යමෙක් රෝගීව සිටින්නේ නම් ඔහු සභා මූලිකයන් කැඳවා ගනීවා. ඒ මූලිකයෝ ස්වාමීන් වහන්සේගේ නාමයෙන් ඔහු තෙලින් ආලේප කොට ඔහු උදෙසා යාච්ඤා කරත්වා''

මෙම දේව ප්‍රසාද නිධානය මගින් රෝගී තත්ත්වය නිසා දුක් විඳින තැනැත්තා ක්‍රිස්තුන් වහන්සේගේ දුක් වේදනාවලට පංගුකාර වෙයි. මරණාසන්නව සිටින රෝගියාගේ පංචේන්ද්‍රිය ශුද්ධවූ තෙලයෙන් ආලේප කිරීමෙන් මේ ප්‍රසාද නිධානය දානය කරනු ලැබේ.

රෝගී තත්ත්වය හා පාපය අතර ඇති සම්බන්ධතාවය පහත දැක්වෙන ශුද්ධවූ පාඨ පෙන්නුම් කරයි.

| | | |
|---|---|---|
| උත්පත්ති 3:15-19 | - | පළමු පාපයට ලැබුණු දඬුවම |
| 2 රාජාවලිය 15:5 | - | කුෂ්ට රෝගය ඔහුට වැළඳුණේ ය. |
| යෙසායා 53:5 | - | අපගේ පව් නිසා ප්‍රතික්ෂේප කරනු ලැබීම. |
| 1 සාමුවෙල් 16:14 | - | යාවේ දෙවියන් වහන්සේගේ ස්ප්‍රිතුව ඔහුට කරදර කළේ ය. |
| උපදේශකයා 6:2 | - | තද කෝපයට ඔබ ඉඩ නො දෙන්න. කෝපාවිෂ්ඨ ගොනෙකු මෙන් ඔබ ඉරා දමන්නට එයට හැකි ය. |
| ජොහාන් 9:2 | - | පාපය නිසා අන්ධව ඉපදුනි. |
| ජාකොබ් 5:15 | - | ඔහුට සමාව දෙනු ලැබේ. |

## 3.1.5 ප්‍රසාද නිධානමීය ඵල

- (ශාරීරික දීමනාව) රෝගයෙන් සුවය ලැබීම, එම පුද්ගලයාගේ ගැලවීමට යම් කිසි උපකාරයක් හා උදව්වක් පිණිස (පශ්චාත්තාපික දීමනාව) පව්වලට සමාව ලැබීම සහ ආත්මීක සුවය ලැබීම. මෙම පුද්ගලයාගේ අසනීප තත්ත්වය නිසා පාපොච්චාරණය නැමැති දේව ප්‍රසාද නිධානයට සහභාගී විය හැකි ය.
- තමාගේ සහ මුළු සභාවේ ප්‍රයෝජනය හා යහපත සඳහා රෝගියා තම දුක් වේදනා ක්‍රිස්තුන් වහන්සේගේ දුක්ප්‍රාප්තිය සමඟ එකතු කිරීම.
- තම රෝගී තත්තවය නිසා හෝ මහළු විය නිසා හෝ තමාට විඳින්නට සිදුවන දුක් වේදනා සියල්ල ක්‍රිස්තියානි ලීලාවෙන්, සාමයෙන් හා ධෛර්යයෙන් විඳ දරා ගැනීමට ශක්තිය ලැබීම.
- පාපොච්චාරණය කළ නො හැකි නම් තමා කළ පව්වලට මෙමගින් සමාව ලැබීම.
- රෝගියාගේ ආත්ම ගැළවීමටට ආදාළ වේ නම් ඔහුට ශාරීරික සුවය ලැබීම.
- සදාකාලික ජීවිතයට ඇතුළුවීම සඳහා හොඳින් සූදානම් වීමට අවශ්‍ය ශක්තිය ලැබීම.

## 3.1.6 ප්‍රසාද නිධානය කවුරුන් ලබන්නේ ද? කවුරුන් දෙන්නේ ද?

මෙම දේව ප්‍රසාද නිධානය දානය කළ හැක්කේ රාජගුරු ප්‍රසාදිවරයෙකුට හෝ පූජා ප්‍රසාදිවරයෙකුට ය. රෝගීන් ආලේපය දානය කිරීමේ පිළිවෙතහි, සභාවේ පූජකවරු රෝගීන් මත තම හස්ත තබා යාච්ඤා කරති. විශ්වාසයෙන් යුක්තව ඔවුහු ඔවුන් වෙනුවෙන් යාච්ඤා කරති. (ජාකොබ් 5:14-15)
රාජගුරු ප්‍රසාදීවරුන් විසින් ආශිර්වාද කරන ලද තෛලයෙන් ඔවුන් ආලේප කරනු ලබති. මෙය ක්‍රිස්තියානින් ලබන අන්තිම දේව ප්‍රසාද නිධානයයි.

## ක්‍රිස්තියානින්ගේ අන්තිම දේව ප්‍රසාද නිධානය

අන්තිම ගමනට සූදානම් වන ක්‍රිස්තියානින්ට තම ජීවිතයේ අන්තිම මොහොතේ දී අවශ්‍ය දේව ශක්තිය ලබා ගැනීම සඳහා ක්‍රිස්තුන් වහන්සේගේම ශ්‍රී ශරීරිය හා රුධිරය මාර්ගෝපදේශකත්වයක් වශයෙන් ඔවුනට දානය කරයි. මෙය අනන්ත ජීවිතය ලබා ගැනීමට ආධාරයක් වන අතර, උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේගේ ශක්තිය මෙමගින් ඔවුනට ලැබේ. ජොහාන් තුමන්ගේ සුවිශේෂයේ 6:54 වගන්තිය මෙය තහවුරු කරයි. ''යමෙක් මාගේ මාංශය අනුභව කරන්නේ ද, මාගේ රුධිරය පානය කරන්නේ ද, ඔහුට සාදාතන ජීවනය ඇත. තව ද මම ඔහු අන්තිම දවසේ දී උත්ථාන කරන්නෙමි''.

මිනිස් දිවිය ආරම්භයේ දී ප්‍රසාද ස්නාපනය, අභිවෘද්ධි ආලේපය හා දිව්‍ය සත්ප්‍රසාදය ආරම්භක ප්‍රසාද නිධාන වශයෙන් ද දේව දරුවන්ට දානය කරන්නාක් මෙන් මිනිස් දිවියේ අන්තිම මොහොතේ දී පාපොච්චාරණය (සමගි සන්ධායේ දේව ප්‍රසාද නිධානය) දිව්‍ය සත්ප්‍රසාදය හා රෝගීන්ගේ ආල්පය ස්වර්ග රාජ්‍යයට යාමට ආධාරයක් වශයෙන් දේව දරුවන්ට දානය කෙරේ. මෙමගින් ක්‍රිස්තියානින් ඔවුන්ගේ මෙලොව වන්දනා ගමන අවසන් කෙරේ. දේශය වන ස්වර්ග රාජ්‍යය කරා යාමට සූදානම් කෙරේ.

# රෝගීන්ගේ ආලේපය සම්බන්ධ මන්ත්‍රණ සභාවන් ඉදිරිපත් කරන කරුණු

## ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව (1550)

රෝගීන්ගේ අලේපය දානය කිරීමේ අවශ්‍යතාවය, ලැබීමට අවශ්‍ය සුදුසුකම්, දානය කරන තැනැත්තා ගැන පැහැදිලි ඉගැන්වීම් ඉදිරිපත් කළේ ය.

## දෙවන වතිකාන මන්ත්‍රණ සභාව

මෙම ඉගැන්වීම් කාලානුරූප කරයි. ''මෙම ප්‍රසාද නිධානය මරණ මොහොතේ සිටින අය විසින් පමණක් ලැබිය යුත්තක් නොවේ...'' (ජනවන්දනාව පිළිබඳ ප්‍රකාශනයේ අංක 73-75 කියවන්න.) රෝගීන් සඳහා විවිධ, සේවා ඇත. බැහැදකින්නට යාම, දිව්‍ය සත්ප්‍රසාද ලබා දිම, රෝගීන් ආශිර්වාද කිරීම, ආත්මය භාර කිරීම.

## 3.1.7 ප්‍රසාද නිධානය කෙසේ සමරන්නේ ද?

**සූදානම**

කාමරය හා රෝගියා පවිත්‍ර කිරීම, පිරිසිදු වස්ත්‍රයක් ඇන්දවීම, දිව්‍ය සත්ප්‍රසාදය හා ශුද්ධවු තෛලය සඳහා ඇතිරිල්ලක් සහිත මේසයක්, දල්වු පහනක්, ආසිරි පැන් කුප්පියක්, වතුර වීදුරුවක් පූජාප්‍රසාදී තුමාට අත සේදීම සඳහා වතුර භාජනයක්, රෝගියාව පශ්චාත්තාපයේ ප්‍රසාද නිධානයට සූදානම් කිරීම, ආශාවක් ඇති කිරීම, ආත්ම සෝදිසියක් හා පසුතැවිල්ලට උදව් කිරීම, පසුව ස්ත්‍රෝත්‍ර යාච්ඤාවට ළංවීම, පූජාප්‍රසාදිතුමා පැමිණි විට අන් අයව ද කැඳවා මෙහෙයට සහභාගි වීම, යාච්ඤා ගීතිකා කියවීම, මෙය සභාවේ පොදු මෙහෙයක් බව වටහා ගත යුතු ය. පූජාප්‍රසාදි තුමාට හැකියාව ඇත්නම් රෝගියා සඳහා දිව්‍ය පූජාව සිදු කළ හැකි ය.

**රෝගින් ආලේප කරන සාමාන්‍ය පිළිවෙත**

- පියතුමා රෝගිය සිටින තැනට පැමිණ අවස්ථාවට අනුව ආසිරි පැන් රෝගියට ආමන්ත්‍රණය කරයි.
- රෝගියාගේ හැකියාව අනුව පාපොච්චාරණය අසයි. එසේත් නැතිනම් පශ්චාත්තාපික පිළිවෙත අරඹයි.
- ඉන්පසු දේව වාක්‍යයෙන් කෙටි පාඨයක් කියවයි.
- විශ්වාසකයින්ගේ යාච්ඤා උච්චාරණය කිරීම
- ඉන් අනතුරුව පියතුමා රෝගියාගේ හිසමත නිශ්ශබ්දව අත් තබයි.
- ශුද්ධවූ තෛලය සඳහා තුති පිදීමේ යාච්ඤාව කියනු ලැබේ.
- මේ සියළු පියවරයන් අවසන් වූ පසු පියතුමා ශුද්ධවූ තෛලය රැගෙන රෝගියාගේ නළල,දෑත් ආලේප කරමින් පහත සඳහන් යාච්ඤාව එක් වරක් පවසති.

**''මේ පරිශුද්ධ ආලේපයෙන් ද තමන්වහන්සේ ද ශුද්ධාත්මයාණන් වහන්සේගේ වරම් දෙමින් ඔබට ආධාර කරන සේක්වා!''**

පිළිතුර : ආමේන්.

පියතුමා: ඔබේ පව් වලින් ඔබ මුදා ගැලවීම දානය කර කරුණාබරව ඔබ සනසන සේක්වා

පිළිතුර : ආමේන්.

ඉන්පසු තවත් යච්ඤාවක් කියා ස්වාමිවාක් ආරාධනාව අරඹයි. ඉන්පසු දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ රෝගියා ට දානය කරයි. එ සමගින්ම අවසාන යාච්ඤාව උච්චාරණය කර ආශිර්වාදය දානය කරනු ඇත.

## 3.1.8 මාර්ගෝපකරණයේ දිව්‍ය සත්ප්‍රසාදය (Viaticum)

රෝගියා සිහි බුද්ධියෙන් සිටින අවස්ථාවේ දී දිව්‍ය සත්ප්‍රසාදය ලබා ගැනීමට මග සැලසීම මින් අදහස් කෙරේ. මාර්ගෝපකාරි දිව්‍ය සත්ප්‍රසදය දිව්‍ය පූජාවේ දී හෝ අන් විටෙකදි ලබා දිය හැකි අතර, එයට කලින් රෝගියාට පාපොච්චාරණය කර ගැනිමට ඉඩ සලසා දිය යුතුය. හැකිනම් මාංශය හා රුධිරාකාරයෙන් දිව්‍ය සත්ප්‍රසාදය ලබාදීම වඩාත් යෝග්‍ය ය. මාර්ගෝපකාරි දිව්‍ය සත්ප්‍රසාදය තේවාචාර්ය වරයකුට හෝ ගිහියකුට දානය කළ හැක.

# 3.2 පූජකවරයේ ප්‍රසාද නිධානය

## 3.2.1. ගැලවීමේ ඉතිහාසය තුළ පූජකවරය

දෙවියන් වහන්සේ විසින් තෝරාගෙන උන්වහන්සේටම අයිති වනු සඳහා කැප කරනු ලබන මේ අය තම මුළු දිවිය දේව සේවය සඳහා කැප කරයි. ක්‍රිස්තුන් වහන්සේ විසින් තම සභාවට දානය කරන සියළුම බලතල හා දීමනාවන්ට හිමිකමක් පූජාත්වරය මගින් ඔවුනට ලැබේ. ඒ සියල්ලක් ම ලැබෙනුයේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ අනුග්‍රහයෙනි. රාජගුරුප්‍රසාදි, පූජාප්‍රසාදී සහ තේවාචාරී යන තත්ත්වයන් ලැබීමට සුදුසුකමක් මෙම දේව ප්‍රසාද නිධානය මගින් ඔවුන්ට ලැබේ. එහි ප්‍රධාන පිටස්තර ලකුණ වන්නේ, රාජගුරු ප්‍රසාදි තුමා එය ලබන්නාගේ හිස මත අත් තබා යාච්ඤා කිරීම ය.

පුරාණ ගිවිසුමේ දෙවියන් වහන්සේ පූජක තත්ත්වය සඳහා සෙනග අතරින් වෙන මම කොටසක් තෝරා ගෙන දේව රාජ්‍යය සඳහා සේවය කිරීමට ඔවුන් තෝරා පත්කර ගත් සේක. (නික්මයාම 19:6) ''නුඹලා මට පූජක රාජ්‍යයක් ද, කැපවූ ජාතියක් ද වන්නහු ය.'' තව ද සාලෙම් හි රජ වූ පරමේශ්වර දෙවියන් වහන්සේගේ පූජකවූ මෙල්කිසදෙත්, පූප සහ මිදි යුෂ ගෙනැවිත් ඔහුට ආශිර්වාද කරමින්...... (උත්පත්ති 14/18, නික්මයාම 19/22, 29/1, ලෙවී 1/7, ද්විතීය 18/1, 19/17, 21/5, 29/43, 30/30, 40/15, ජෝෂුවා 33/1, 1රාජාවලිය 8/6, ජෙරමියා 1/1, 26/16, 27/16, ගීතාවලිය 132/9, එසකියෙල් 44/15).

අලුත් ගිවිසුමේ ප්‍රසාද ස්නාපනය මගින් දේව ජනතාව බවට පත් වූ සියලුම විශ්වාසිකයෝ ක්‍රිස්තුන් වහන්සේගේ පූජක කාර්යයට සහභාගි වෙති. 'දෙවියන් වහන්සේට ප්‍රසන්න ආධ්‍යාත්මික පුද පූජා කරන පිණිස ශුද්ධවූ පූජක පිරිසක් වන්න. (1 පේදුරු 2/5, එළිදරව්ව 1/6, 5/10, 1 තිමති 3/2, තීතස් 1/5)

සැ. යු. පුරාණ ගිවිසුමේ පූජකවරු බොහෝ සිටියෝ ය. එහෙත් නව ගිවිසුමේ ඇත්තේ එකම පූජකයෙකි. එතුමා නම් ක්‍රිස්තුන් වහන්සේ ය. පූරාණ ගිවිසුමේ මෝසස්, ජෝෂුවාගේ හිත මත අත තබා යාච්ඤා කර, ඔහුව පූජක තත්ත්වයට එසවූහ.

**ක්‍රියා 6 : 6** ''ඔවුහු මේ අය ප්‍රේරිතයන් වෙත ඉදිරිපත් කළ හ. ප්‍රේරිතයෝ යාච්ඤා කොට ඔවුන් මත අත් තැබූ හ.

**ක්‍රියා 13 : 1-3** ''බාර්ණබස් හා පාවුළු යන අය පූජකයන් බවට පත් කිරීම.

## 3.2.1.1 පූරාණ ගිවිසුම තුළ පූජකවරය

ඊශ්‍රායෙල් පූජකවරය සඳහා ''කොහේන් '' නැමැති හේබ්‍රව් වචනය පුරාණ ගිවිසුම තුළ යොදා ඇත. එයි අරුත ගැන විවිධ මත ඇත. එයට හේතුව ඊශ්‍රායෙලයට යාබද අනෙක් රාජ්‍යවලද පුජකවරුන් සඳහා ද කොහෙන් නැමැති වචනයම යොදා ඇති බැවිනි. උදා: උත්පත්ති 14/ 18, 1 සාමුවෙල් 5/5.

''කොහෙන්'' නැමති වචනයේ අරුත ඉදිරියට නැවීම හෝ ගරුසර දක්වීම බව පොත පත පෙන්වා දේ. මෙවැනි අරුත් දක්වීම් ගැන විවිධ මත තිබුනත් ඊශ්‍රායෙල් පූජකවරයා ජනතාව වෙනුවෙන් සමිඳාණන් වහන්සේගේ සම්මුඛයට පිවිසෙන්නා ලෙස පිළිගැනේ.

ආදිපිතෘවරුන් විසින් යම් ආකාර පූජක කාර්යයන් සිදුකල ඇති බවට උත්පත්ති පොත පෙන්වා දෙයි. (උත්. 12/7-8, 13/ 18) උත්පත්ති 15/9-11, උත්පත්ති 28/ 16-18. මොසෙස් ද පූජක කාර්යයන් ඉටුකළ බවට නික්මයාම පොත පෙන්වයි. නික්මයාම 24/ 4-18.

**ඊශ්‍රායෙලයේ නිළ පූජකවරයේ ස්වභාවය**

නික්මයාම 29 හා ලෙවී ව්‍යවස්ථාව 8 පරිච්ඡේදය පූජකවරුන් නිල වශයෙන් පත් කරනු ලැබීම පිලිබඳව කරුණු කාරනා මතුකර පෙන්වයි. තවද පැරැන්නන් අතර විශේෂ පූජක කාර්යයන් ඉටු කිරීම සඳහා එයටම ගැලපෙන විශේෂ පුද්ගලයින් සිටි බව සිහිපත් කරයි. නිදසුනක් ලෙස රජවරුන්ගේ දවසේ දී නිළවශයෙන් පූජකවරුන් සිටි බවට සාධක ඇත. 1 සාමුවෙල් 22: 11-20, 1 රාජාවලිය 19 25-26

තවද මෙම පූජකවරුන්ට පත් කිරීම පිළිබඳව සටහන් වන කරුණු කාරණා ඉතාමත් සංකීර්නය. (ලෙවී ව්‍යවස්ථාව 8 වන පරිච්ඡේදය, නික්මයාම 29) එම සංකීර්ණභාවය විස්තර කර දෙනු ඇත. සමස්ථයක් ලෙස මෙම විස්තර දෙස බලන කළ මූලික කරුණු දෙකක් පැහැදිලි ය.

1. ඉශ්‍රායෙල් පූජකවරය ගිවිසුම හා සම්බන්ධවේ.
2. දෙවියන් වහන්සේ හා ඊශ්‍රායෙල් ජනතාව අතර මැදහත් කාර්යයන් ඉටුකරන්නෙකි.

නික්මයාමේ 19:6 සීනයි ගිවිසුම පරමාර්ථය ඉදිරිපත් කර ඇත්තේ නික්මයාම 19:6 දීය.....නුඹලා මට පූජක රාජ්‍යයක් ද කැපවුන ජාතියක් ද. වන්නාහු ය. ...’’එම කැපවීම තුළ ශුද්ධවන්ත කම හා පූජකවරය එම ගිවිසුමට ඇතුලත් වන්නක් බව පැහැදිලි ය.

පුරාණ ගිවිසුමේ පූජකවරය මූලිකවම ගිවිසුම හා සම්බන්ධ වෙන බැවින් ගිවිසුම ජනතාව විසින් පවත්වාගෙන යන අයුරු හා ගිවිසුමේ නියමයන් පිළිපදිනු ඇත්දැයි සොයා බැගිමට නිළපූජක වරයේ වගකීමක් වේ.

ඒ හෙයින්ම ගිවිසුමේ අනපණත් ගැන ජනතාව දැනුවත් කිරීම පූජකයා සතු කාර්යභාර්ය වේ.

පුරාණ ගිවිසුමේ පූජකවරයා ජනතාවගේ කන්නලව්ව හා බලාපොරොත්තු දෙවියන් වහන්සේ වෙත ගෙන යන්නා විය.

## 3.2.1.2 නව ගිවිසුමේ පූජකවරයාවූ ක්‍රිස්තුස් වහන්සේ

නව ගිවිසුමේ උත්තම පූජකයාණන් ලෙස අවිවාදයෙන් ම හඳුන්වා දෙන තැනැන්වහන්සේ වනුයේ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ය. මෙම හැදූරිමේ දී අවිවාදයෙන්ම ශු. බයිබලයේ හෙබ්‍රෙව් වරුන්ට ලිව් ලිපිය අධ්‍යයනය කළ යුතුවේ. හෙබ්‍රෙව් වරුන්ට ලිව් ලිපියේ කතුවරයා පුරාණ ගිවිසුමේ පූජක වරයා හා නවගිවිසුමේ පූජකවරය සංසන්දනය කරමින් ගැඹුරු විවරනයක් ඉදිරිපත් කරයි. හෙබ්‍රෙව් ලිපිය දිග හැරී අයුරු මෙලෙසින් අපට දැකිය හැක.

| | | |
|---|---|---|
| පරිච්ඡේද 1:1-3 | - | ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේගේ පූර්ණ ප්‍රකාශනය වේ. |
| 1:4 - 2:18 | - | ක්‍රිස්තුන් වහන්සේ දේම දූතයන්ටත් වඩා ශ්‍රේෂ්ඨ ය. |
| 3:1 - 4: 13 | - | ක්‍රිස්තුන් වහන්සේ මෝසෙස්ට සහ ජොෂුවාටත් වඬා ශ්‍රේෂ්ඨ වේ. |
| 4:14 - 7:28 | - | ක්‍රිස්තුන් වහන්සේගේ පූජකවරයේ ශ්‍රේෂ්ඨත්වය. |
| 10:1-39 | - | ක්‍රිස්තුන් වහන්සේගේ යාගයේ ශ්‍රේෂ්ඨත්වය. |
| 11:1-12: 9 | - | විශ්වාසයේ ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය. |

## ක්‍රිස්තුන් වහන්සේගේ උත්තම පූජකවරයේ ඇති ශ්‍රේෂ්ඨත්වය හා එයට ඇති සුදුසුකම්

හෙබ්‍රෙව් 5:1-4 ඉතා පැහැදිලිව උත්තම පූජකවරය සඳහා මූලික සුදුසුකම් 2 ක් ඉදිරිපත් කරයි.

i උත්තම පූජකයකු ලෙස දෙවියන් වහන්සේ ඉදිරියේ තමන් නියෝජනය කරන ජනයා සානුකම්පිතව සැලකීමට හැකියාව

පාප පූජා ඔප්පු කරනුයේ ජනතාවගේ පව් සඳහා පමණක් නොව තමාගේ ද පව් සඳහා ය. එහිදි කැපී පෙණෙන සාධකයන් වනුයේ පූජකයා මනුෂ්‍යයකු ලෙස සෙසු ජනතාව සමග මනුෂ්‍ය දුර්වලතාවයක් බෙදා ගන්නා බව ය. ''ඔහුත් දුර්වලකම්වලට භාජනයවී සිටින බැවින් අනුවණයන් ද. මුලාවෙන්නන් දගැන ඉවසිල්ලෙන් ක්‍රියා කිරීමට ඔහුට පිළිවෙනි''(5:2) නායක පූජකයා දුර්වලතාවයන් දන්නා බැවින් දුර්වල අය ගැන සානුකම්පිතව අවබෝධ කරගැනීමේ හැකියාව ඉස්මතු කරයි (ලෙවී 16:6)

ii උත්තම පූජකයා එම තිළයට දෙවියන් වහන්සේ විසින් ම තෝරා පත්කර ගත යුතුවීමයි.

## ක්‍රිස්තුන් වහන්සේගේ සුදුසුකම

1. ක්‍රිස්තුන් වහන්සේව දෙවියන් වහන්සේ විසින්ම තෝරා පත් කර ඇත. නායක පූජක තනතුරට, ක්‍රිස්තුන් වහන්සේව ඔසවනු ලැබුවේ පියාණන් වහන්සේ විසින්ම බව හෙබ්‍රෙව් ලිපිය පෙන්වා දයි. එය තහවුරු කිරීමට ගිතාවලියේ 2:7 පෙන්වයි. ''ඔබ මාගේ පුත්‍රයා ය. අද මම ඔබ ජනිත කළෙමි....''

    ක්‍රිස්තුන් වහන්සේ පූජකයකු වනුයේ මෙල්කිසදෙක්ගේ පූජක පිළිවෙතට අනුව අනෙකුත් සෙසු වංශ අභිබවා ඉහළම තළයට ක්‍රිස්තුන් වහන්සේ පැමිණෙන පූජක වංශය ඉස්මතු කරයි. ඔබ මෙල්කිසදෙක්ගේ පූජක පරපුරට අනුව සදහට ම පූජකයෙක් වන්නේ ය.

## මිනිස් දුක හඳුනන උත්තම පූජකයා ක්‍රිස්තුන් වහන්සේ

මිනිස් දුක හොඳාකාරවම හඳුනන ක්‍රිස්තුන් වහන්සේ තමන්ගේ පාපවලට නොව ජනතාවගේ පව් උදෙසා ජීවිතය ද පිදූබව ඉතා පැහැදිලිව පෙන්නුම් කරයි.

අපට ඇත්තේ අපේ දුබලකම් ගැන අනුකම්පාවක් නැති උත්තම පූජකයෙක් නොව හැම අයුරින්ම අප වාගේ පරීක්ෂාවලට මුහුණ පෑ පාප රහිත උත්තම පූජකයෙකි. (හෙබ්‍රෙව් 4/157

ක්‍රිස්තුන් වහන්සේගේ දුක්විඳීම උන්වහන්සේගේ කීකරුකමේ අනිවාර්ය ලක්‍ෂණයක් වූ බව කැපීපෙනෙන සාධකයකි.

## 3.2.1.3 පූජකවරයේ ප්‍රසාද නිධානයේ තේවාවර

- මනුෂ්‍යයන් වෙනුවෙන් ක්‍රියා කිරීමට පත් කරයි. පාපයට වන්දි ගෙවීම සඳහා යාග ඔප්පු කරයි. (නික්මයාම 29:1-30, ලෙවී 8, හෙබ්‍රෙව් 5:1)
- දේව වචනය ප්‍රකාශ කරයි. දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා අතර සබඳතාවය ඇති කරනු සඳහා යාග ඔප්පු කරයි. යාච්ඤා පුද කරයි. (මලාකි 27:9)
- මිනිසාගේ ගැලවීම සඳහා මේ යාග පූජා ප්‍රමාණවත් නොවී ය. ඒ සඳහා ක්‍රිස්තුන් වහන්සේට ම තම ජීවිතය පූජා කිරීමට සිදු විය. (හෙබ්‍රෙව් 5:3, 7:27, 10:1-4)

ගණන් කථාවේ 11: 24-25 දක්වා ඡේදයේ දැක්වෙන පරිදි මෝසස් තුමා ආරොන් පූජකයෙකු ලෙස පත්කර ප්‍රජා මූලිකයන් හැත්තෑ දෙනෙකු ඔහුගේ සහායකයින් ලෙස පත් කිරීම නව ගිවිසුමේ පූජාත්වරය මගින් පූජකයන් පත් කිරීමට පෙර ලකුණක් ලෙස සැලකිය හැකි ය. පූරාණ ගිවිසුමේ පූජක තත්ත්වය නව ගිවිසුමේ උත්තම පූජකයා වන ක්‍රිස්තුන් වහන්සේ තුළ සම්පූර්ණ විය.

ක්‍රිස්තුන් වහන්සේ පමණක් සැබෑ පූජකයා වන සේක. අනිකුත් සියලුම පූජකයෝ උන්වහන්සේ නියෝජනය කරන්නෝ වෙති. ක්‍රිස්තුන් වහන්සේ පූජක තත්ත්වයේ උල්පත වන සේක. පූරාණ ව්‍යවස්ථාවේ පූජකයා ක්‍රිස්තුන් වහන්සේට පෙර ලකුණක් වේ. නව ව්‍යවස්ථාවේ පූජකයා අපට ක්‍රිස්තුන් වහන්සේ තුළින් හමු වේ.

පූජක තත්ත්වය සේවක තත්ත්වයකි. පූජකයා දේව ජනතාවට සේවය කිරීම සඳහා දිවිය කැප කරයි. මෙම පූජක තත්ත්වය උත්තම පූජකයා වූ ක්‍රිස්තුන් වහන්සේගේ පූජකත්වය මත රදා පවති. ක්‍රිස්තුන් වහන්සේ මෙම තත්ත්වය ස්ථාපනය කරනු ලැබුවේ දේව ජනතාවගේ යහපත සඳහාත්, සභාවේ වර්ධනය සඳහාත් ය. මේ දේව ප්‍රසාද නිධානයෙන් ලැබන සියලුම බලය සහ දීමනා ලැබෙන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ ම බලයෙනි.

සේවකයින්ගෙන් සේවකයා වූ ක්‍රිස්තුන් වහන්සේ අනුගමනය කරමින් උන්වහන්සේව ආදර්ශයට ගනිමින් පූජක තත්ත්වය වැළඳ ගන්නා සෑම කෙනෙක් ම තමන්ට පැවරෙන බලතල භාවිතා කළ යුතු ය. උන්වහන්සේගේ බැටළු රැළ ගැන සැළකිල්ල දැක්වීම උන්වහන්සේට දක්වන ආදරයේ ලකුණක් බව ක්‍රිස්තුන් වහන්සේ පැහැදිලිවම ප්‍රකාශ කළ සේක.

# පූජකවරයේ ධුරාවලි තුන

මේවා නම්, තේවාචාරී, පූජාප්‍රසාදී සහ රාජගුරු ප්‍රසාදී ආදියයි. මෙම ධුරාවලි අනුපිළිවෙලින් දෙවන ශත වර්ෂයේ මැද භාගයේ වර්ධනය විය. මෙම ධුරාවලි තුනේ සිටින අයගේ කාර්යය වනුයේ, එදා ක්‍රිස්තුන් වහන්සේ තෝරා ගත් අපෝස්තුළුවරුන්ගේ කාර්යය නූතන සභෘව තුළ මෙය පියවර තුනක විහිදෙයි.

## 1. රාජගුරුප්‍රසාදි තත්ත්වයඃ

පූජාත්වරය නමැති දේව ප්‍රසාද නිධානය පූර්ණභාවයට පත් වනුයේ රජගුරු ප්‍රසාදී තත්ත්වයෙනි. ක්‍රිස්තුන් වහන්සේ තම අපෝස්තුළුවරුන් මත විශේෂාකාරයකින් ශුද්ධාත්මයාණන් වහන්සේ පැමිණිමට සලස්වා ඔවුන් මේ තත්ත්වයට උසස් කළ සේක. එලෙස නූතන ශුද්ධවූ සභාවේ රාජගුරුප්‍රසාදී තත්ත්වයට පත්වන අයගේ හිස මත අත් තබා යාච්ඤා කිරීමෙන් ශුද්ධාත්මයාණන්ගේ විශේෂ වරප්‍රසාද ඔවුන් මත වස්වන ලෙස රාජගුරු ප්‍රසාදී තුමා යාච්ඤා කරයි. මෙම තත්ත්වයට කැප කරන ලද අය ක්‍රිස්තුන් වහන්සේගේ ම ස්ථානය දරයි. ඔවුනට සභාවේ හිමිවන දිවැසිවර, පූජක හා එඬේරික යන ත්‍රිවිධ කාර්යයන්ට විශේෂ හිමිකම් හා වගකීම් අත් වේ. (ක්‍රියා 1:8. 2:4, ජොහාන් 20922-23, 1 තිමති 4:14, 2 තිමති 1:6-7)

## 2. පූජාත්වරය මගින් පූජක තත්ත්වයට ඔසවනු ලැබේ.

රාජගුරු ප්‍රසාදිවරුන් සමඟ සහයෝගයෙන් සේවය කරති. ක්‍රිස්තුන් වහන්සේ විසින් තම අපෝස්තුළුවරුන්ට භාරදුන් විශ්ව දූත කාර්යයට මොවුහු සහභාගි වෙති. ක්‍රිස්තුන් වහන්සේ විසින් තම සභාව ගොඩ නැගීම හා වර්ධනය කිරීම සඳහා අපෝස්තුළුවරුන්ට පැවරූ සියලු බලතලවලට හිමිකම් ලබති. දේව වාක්‍ය දේශනා කිරීමත්, තම බැටළුවන් මෙහෙයවා පාලනය කිරිමත්, නව ගිවිසුමේ පූජකයෙකු ලෙස දේව වන්දනා මෙහෙයයන් පැවැත්වීමත් ඔවුන්ගේ විශේෂ කාර්යයන් වේ.

පූජාත්වරය මගින් ඔවුනට ලැබෙන විශේෂිත වූ හා මහගු වූ ආධ්‍යාත්මික වරප්‍රසාද හා දීමනා මගින් ක්‍රිස්තුන් වහන්සේ මෙලෙව ආරම්භ කළ ගැළවීමේ කාර්යය අදත්, හෙටත් අන්තිමය දක්වාත් කරගෙන යාමට බලය, ශක්තිය ලැබේ. ඔවුන් දිනපතා දෙවියන් වහන්සේට පුද කරන උතුම් වූ දිව්‍ය පූජා යාගය තුළින් ඔවුන්ගේ දිවියට අවශ්‍ය වරප්‍රසාද නො අඩුව ලැබේ.

## 3. තේවාචාරී තත්ත්වය

මෙමගින් සේවය සඳහා කැප වේ. තේවාචාරී තත්ත්වයට එසවිමේ දී එය ලැබෙන්නන්ගේ හිස මත රාජගුරුප්‍රසාදී තුමා පමණක් අත් තබා යාච්ඤා කරයි. තේවාචාරීවරු ක්‍රිස්තුන් වහන්සේගේ දූත කාර්යයට හා විශේෂ වරප්‍රසාද වලට විශේෂ අන්දමකින් සහභාගිත්වය ලබයි. සේවකයින්ගේ සේවකයා වූ ක්‍රිස්තුන් වහන්සේගේ සේවක තත්ත්වයට මේ අය විශේෂ අයුරකින් සම්බන්ධ වේ. මොවුන්ගේ කාර්යය වනුයේ, ජනවන්දනාව මෙහෙයන් හි දී රාජගුරු ප්‍රසාදිවරුන්ට හා පූජාප්‍රසාදීවරුන්ට සහාය වීම දිව්‍ය සත්ප්‍රසාදය බෙදා දීමට සහාය වීම, විවාහ මංගල්‍ය අවස්ථාවල දි උදව් වීම සුබ අස්න දේශනා කිරීම, අවමංගල්‍ය

අවස්ථාවල දී යාච්ඤා මෙහෙයන් පැවැත්වීම ආදිය සහ නොයෙකුත් දයාවේ ක්‍රියාවල නිරත වීම යනාදිය යි.

## පූජකයෙකු තුළ තිබූ ගුණ ධර්ම

ජොහාන් 13 සිට සේවයට නිතරම සූදානම් ව සිටීම හා ආදරයෙන් හා බැහැපත්කමින් එම සේවය කිරීම. හේබ්‍රෙව් 5:1-4 සෑම නායක පූජකයෙක් ම දෙවියන් වහන්සේ ඉදිරියෙහි පඬුරුත්, පාප පූජාත් ඔහු ඔප්පු කරනු පිණිස ද මිනිසුනට සේවය කරනු පිණිස ද, මිනිසුන් අතරින් තෝරා පත් කරනු ලබයි. ඔවුන් දුර්වලකම්වලට භාජනය වී සිටින බැවින් අනුවනයින් ද, මුලාවෙන්නන් ද ගැන ඉවසිල්ලෙන් ක්‍රියා කිරීමට ඔහුට පුළුවන. ඒ දුර්වලකම්නිසා සෙනග උදෙසා මෙන්ම තමා උදෙසාත් ඔහු විසින් පාප පූජා ඔප්පු කරනු ලැබීම අවශ්‍යව ඇත. තව ද ආරොන් වැනි, දෙවියන් වහන්සේ විසින් කැඳවන ලද අය මිස, අන් කිසිවෙක ඒ නිලය තමාටම පවරා නො ගත්තෝ ය.

## 3.2.1.4 - 3.2.1.5 පූජකවරයේ සක්‍රමේන්තුව දානය කිරීමේ පිළිවෙත

මෙම දේව ප්‍රසාද නිධානය මගින් ක්‍රිස්තුන් වහන්සේ එය ලබන තැනැත්තාට ඊට අදාළ වූ වරප්‍රසාද දානය කරන සේක. පූජක තත්ත්වයට හිමි බලතල ලැබෙන අතර, මරණය තෙක් පූජකයෙකු ලෙස ජීවත් වීමට හා සේවය කිරීමට අවශ්‍ය වරප්‍රසාද සියල්ල දානය කරන සේක. (හෙබ්‍රෙව් 6:20-7:3)

මෙම දේව ප්‍රසාද නිධානය දානය කිරිමේ පිළිවෙත් තුනේ දී ම රාජගුරුප්‍රසාදී තුමා එය ලබන අයගේ හිස මත අත්තබා ශුද්ධාත්මයාණන්ගේ වරප්‍රසාද හා දීමනාවන් ලබා දෙන පිණිස යාච්ඤා කරයි. පූජත්වරය සඳහා කරන යාච්ඤාවේ දී එම පූජක තත්ත්වයට අවශ්‍ය සියලුම වරප්‍රසාද ඉල්ලා නැවතත් ශුද්ධාත්මයාණන් යදියි. ක්‍රිස්තුන් වහන්සේ තම දූත කාර්යය රාජගුරුප්‍රසාදීන් මගින් අඛණ්ඩම කරගෙන යන සේක. එතුමා සභාවේ සේවය සඳහා තේවාචාරීන් ද පූජකයන් ද අභිෂේක කරයි. (එපීස 4:11)

### ශුද්ධවූ තෛලයෙන් ආලේප කිරිම සහ කැපවීම.

### පුරාණ ගිවිසුම තුළ

- 28:41 ''ඔබ ඔවුන් ආලේප කර වෙන්කර මාගේ සේවය සඳහා කැප කරන්න.''
- 30:30 ''ඉන්පසු ඔබ ආරොන් හා ඔහුගේ පුතුන් ආලේප කොට, ඔවුන්මට පූජක පදවියේ සේවය කරන පිණිස ඔවුන්ට පූජකවරය දානය කළ යුතු ය.
- 40:15 ''ඔවුන්ගේ පියා ආලේප කළ ලෙස ඔවුන් ද මා හට පූජක නිලයේ සේවා කරනු පිණිස අලේප කළ යුතු ය. මෙසේ කිරිමෙන් ඔවුන් හට සදාතන පූජකවරය දෙනු ලැබේ.
- ලෙවී 8:12 ''පසුව ඔහු අලේප තෛලය ආරොන්ගේ හිස තම වත්කොට ඔහු කැප කරමින් ආලේප කළේ ය.''

### නව ගිවිසුම තුළ

- 1 පේදුරු 2:9 'එහෙයින් අන්ධකාරයෙන් ස්වකීය විශ්මය පත් අලෝකයට ඔබ කැඳවාගෙන තැනැන්වහන්සේගේ මහිමාන්විත ක්‍රියා දක්වනු පිණිස ඔබ වනාහි තේරා ගත් වංශයක් ද. රාජකීය පූජක පෙළපතක් ද ශුද්ධ ජාතියක් ද, දෙවියන් වහන්සේ සතු සෙනඟක් දවන සේක.'

## 3.2.1.6. පූජකවරයේ ප්‍රසාද නිධානයෙන් ලැබෙන දීමනා

කවදාවත් නොමැකෙන ලාංඡනයක් මෙය ලැබෙන්නන් තුළ පදිංචි වේ. මෙය ලබන අයට ක්‍රිස්තුන් වහන්සේ, ශුද්ධාත්මයාණන්ගේ විශේෂ වරප්‍රසාද දානය කරන්නේ, උන්වහන්සේ විසින් ස්ථාපිත සභාවට විශේෂ සේවයක් කරනු පිණිස ය. ඔහු ක්‍රිස්තුන් වහන්සේගේ නියෝජිතයෙක් වේ. පූජක දිවැසි හා එඬේර නැමැති ත්‍රිවිධ කාර්ය නිසා ශුද්ධවූ සභාවේ නායකත්වයක් දරයි.

### රාජගුරු ප්‍රසාදී තත්ත්වයට ලැබෙන දීමනා හා වරප්‍රසාද

රාජගුරුප්‍රසාදි වරයෙකුට තම තත්ත්වය ඇතිව වගකීම් හා යුතුකම් හරියාකාරව ඉටු කිරීමට ශක්තිය මෙම දේව ප්‍රසාද නිධානයෙන් ඔවුන්ට දානය කෙරේ. තමාට අයිති දේව ජනතාව පාලනය කිරීමට ද, මඟ පෙන්වීමට ද, අභියෝගයන්ට මුහුණ දෙමින් ප්‍රඥාවෙන් හා එඩිතර බවින් දේව ජනතාව ආරක්ෂා කිරීමට ද අවශ්‍ය වරප්‍රසාද ඔවුන්ට ලැබේ.

දිළිඳු වූ රෝගී වූ සහ ජීවිතයේ නොයෙකුත් අවශ්‍යතාවලින් මිරිකී සටින අයට ආදර පියෙකු ලෙසින් සහාය වීමට අවශ්‍ය වරම් ඔවුනට ලැබේ. දේව ජනතාවට සුබ වදන දේශනා කිරීම හා ඔවුනට ආදර්ශමත් විමට ද එකවර පූජකයෙකු හා යාගයක් වූ දිව්‍ය සත්ප්‍රසාදයේ වැඩ සිටින ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් හා තම බැටළු රැළ වෙනුවෙන් තම ජීවිතය පවා පුද කිරීමට අවශ්‍ය වූ විශේෂ ශක්තිය ද, ශුද්ධාත්මයාණෝ ඔවුනට දානය කරන සේක.

### පූජාප්‍රසාදි තත්ත්වයට ලැබෙන විශේෂ දීමනා හා වරප්‍රසාද

සුබ වදන දේශනා කිරීමටත්, දේව වචනයට හා සත්‍යයට සේවය කිරීමටත්, දිව්‍ය පූජාව හ අනිකුත් ජනවන්දනා මෙහෙයයන් සිදු කිරීමටත් වරප්‍රසාද ලැබේ.

### තේවාචාරී තත්ත්වයට ලැබෙන විශේෂ දීමනා හා වරප්‍රසාද

දේව ජනතාව සඳහා ඔවුන් කැප කරනු ලැබේ. ඔවුන්ට සේවය කිරිමටත්, රාජගුරු ප්‍රසාදී හා පූජාප්‍රසාදීවරුන්ට සහාය වීමටත්, දේව වචනය දෙසීමටත් අවශ්‍ය ශක්තිය දේව ප්‍රසාද නිධානීය වරප්‍රසාදය මගින් ඔවුන්ට ලැබේ. දයා සේවාවේ කාර්යයන් සඳහා ද ඔවුන් කැප කර වෙන් කෙරේ.

## 3.3 ආශීර්වාදකාර බන්ධනයේ දේව ප්‍රසාද නිධානය

### 3.3.1 විවාහයේ කර්තෘ දෙවියන් වහන්සේ ය. (දේව සැලැස්ම තුළ විවාහය)

සමාජීය දේව ප්‍රසාද නිධානයකි. කුඩාම සමාජ ඒකකය වන පවුල කැප කරන්නේ මෙම ප්‍රසාද නිධානයට ය. දෙවියන් වහන්සේ ලෝකාරම්භයේ සිටම විවාහ තත්ත්වය ස්ථාපිත කළ බව ශුද්ධ ලියවිල්ලේ ඉගැන් වේ.
මිනිසා තනිව සිටීම සුදුසු නැත. ඔහුට සුදුසු සහකාරියක් මවා දෙන්නෙමි (උත්පත්ති 2/18) වදාළ දෙවියන් වහන්සේ පුරුෂයා සහ ස්ත්‍රිය අතර තිබිය යුතු අන්‍යොන්‍යය ප්‍රේමය හා සහයෝගය ඇති කර වදාළ සේක. මේ බන්ධනය තුළින් දෙදෙනා තවදුරටත් දෙදෙනෙකු නොව ඔවුහු එක් කෙනෙක් වන්නෝ ය.

මෙයින් වැටහෙනුයේ විවාහය ස්වභාවික මානුෂික සිද්ධියක් වන බව ය. එහෙත් ක්‍රිස්තුන් වහන්සේ එම ස්වභාවික මානුෂික සිද්ධිය ශුද්ධවන්තවත් කර එය නව ගිවිසුමේ ප්‍රසාද නිධානයක් තත්ත්වයකට එසෙවූ සේක. **විවාහ ජීවිතය තුළින් දෙවියන් වහන්සේගෙන් පැන නගින ප්‍රේමය ක්‍රිස්තුන් වහන්සේ ආශිර්වදා කළ සේක.**

## 3.3.2 ක්‍රිස්තු අභිරහස තුළ විවාහය

අඹුසැමි සම්බන්ධතාවය ක්‍රිස්තුන් වහන්සේ සභාවට දක්වන ප්‍රේමයට සම්බන්ධ කරයි. පාවුලු එපීසි ලිපියේ පෙන්වා දෙන පරිදි '' ක්‍රිස්තුන් වහන්සේට ඇති ගෞරවය නිසා එකිනෙකාට යටත් වන්න. භාර්යාවෙනි, ඔබ ස්වාමීන් වහන්සේට මෙන්, තම ස්වාමි පුරුෂයාට යටත්ව සිටින්න. මන්ද, ක්‍රිස්තුන් වහන්සේ සභාවේ හිස වන්නාක් මෙන්, පුරුෂයා භාර්යාවගේ හිස ය. එබැවින් සභාව ක්‍රිස්තුන් වහන්සේට යටත් වන්නාක් මෙන්, භාර්යාවන් ද සියලු දේවල දී පුරුෂයනට යටත් විය යුතු ය.

පුරුෂයෙනි, ක්‍රිස්තුන් වහන්සේ සභාවට ප්‍රේම කළාක් මෙන්, ඔබත් ඔබගේ භාර්යාවනට ප්‍රේම කරන්න. උන්වහන්සේ එසේ කෙළේ, වතුරෙන් ද වචනයෙන් ද, සභාව සෝදා පිරිසිදු කර, කැප කර, එය තේජාන්විත සභාවක් වශයෙන් කැළලක්වත්, රැල්ලක්වත්, එබඳු කිසිවක්වත් නැතිව විශුද්ධව, නිකෙළෙස් ව, තමනට ම ප්‍රදානය කරගැනීමට ය. එසේ ම පුරුෂයන් විසින් ද සිය භාර්යාවනට තම ශරීරයට මෙන් ප්‍රේම කටයුතු ය. සිය භාර්යාවට ප්‍රේම කරන තැනැත්තා තමාට ම ප්‍රේම කරගන්නේ ය. කවරකුවත් කිසිම කලෙක තමාගේ ශරිරයට ද්වේෂ කර ගෙන නැත. එසේ නොව, ඔහු එය පෝෂණය කරගෙන ආරක්ෂා කරයි. ක්‍රිස්තුන් වහන්සේ සභාව ගැන සලකන්නෙත් එසේම ය. මන්ද, එය උන්වහන්සේගේ ශරීරය වන බැවිනි. අපි ඒ ශරීරයේ අවයවයෝ වෙමු. මේ නිසා මිනිසෙක් තමාගේ පියා ද, මව ද අත්හැර සිය භර්යාවට ඇලුම් වන්නේ ය. ඒ දෙදෙනා එක් තැනැත්තෙක් වන්නේ ය. මෙය මහා අභිරසකි. මට හැඟෙන පරිදි එය අදාළ වන්නේ ක්‍රිස්තුන් වහන්සේට සහ සභාවට ය. එහෙත් එය පෞද්ගලික වශයෙන් ඔබටත් අදාළ වන්නේ ය. හැම පුරුෂයෙකු ම තමාට මෙන් තම භාර්යාවට ප්‍රේම කළ යුතු ය. හැම භාර්යාවකම තම ස්වාමි පුරුෂ්‍යාට ගෞරව දැක්විය යුතු ය''. (එපීස 5/21-33)

එමෙන්ම ජේසුස් වහන්සේ ප්‍රසිද්ධ ජීවිතය ආරම්භහේ දීම කිතුනු විවාහය පිළිබඳව උන්වහන්සේ ප්‍රබල සළකුණක් පෙන්වීය. කානානුවර මගුල් ගෙදරදි මරිය තුමියගේ ඉල්ලීම වන කතෝලික පවුල පිලිබඳව පළමු සළකුණ වන ජලය මිදියුෂ බවට පත් කිරීමේ ප්‍රාතිහාර්ය සිදු කරන ලදී.

මෙම ප්‍රාතිහාර්ය කතෝලික පවුල පිළිබඳව සළකුණක් වනුයේ කෙසේ ද? එය අන් දෙයක් නිසා නොව දුකේදීත් සැපේදීත් පවුලක් ලෙෂ එකට බැඳීව සිටිම තුළ දෙවියන් වහන්සේ ජීවමානව ඔවුන් අතර වැඩ සිටීම හා ඔවුන්ගේ ජිවනබර සැහැල්ලු කිරීම යන ප්‍රත්‍යයක්ෂයට සළකුණකි.

ජේසුස් වහන්සේ විවාහය ගැන ඉතා පැහැදිලිව ඉගැන්වූයේ පවුල් ජිවිතයේ නොබිඳෙන සුළු බන්ධනයෙක් ගැන ය. '' දෙවියන් වහන්සේ එක් කළ දෙය මනුෂ්‍යයා වෙන් නොකෙරේවා''
(මතෙව් 19 : 6)

## කිතුනු විවාහය ප්‍රේමයේ ගිවිසුමකි.

දෙවන වතිකාන මන්ත්‍රණ සභාවට පෙර විවාහය හඳුන්වනු ලැබුවේ කොන්ත්‍රාත්තුවක් ලෙසට ය. එනම් දෙපාර්ශ්වයක් යම් යම් කොන්ත්‍රාත්තු මත ඇති කරගත් පොරොන්දුවක් ලෙසට ය. එලෙස එක් පාර්ශවයක් යම් හෙයකින් නියම කරන ලද කොන්දෙසින් උල්ලංඝනය කළොත් කොන්ත්‍රාත්තුව ඉබේ ම අහෝසි වී යයි.

දෙවන වතිකාන මන්ත්‍රණ සභාව මෙවැනි දැඩි නීතිමය සංකල්පයක් හැටියට විවාහය නම් නො කර ගිවිසුමක් යයි හඳුන්වන්නේ විවාහයේ මූලික පදනම ප්‍රේමය නිසා ය.

විවාහයේ දී කිතුනුවා දෙවියන් වහන්සේ සමඟ ද එකිනෙකා සමග ද ගිවිසුමකින් බැඳෙන්නෝ ය. මෙම ගිවිසුම ක්‍රිස්තුන් වහන්සේ හා ස්වකීය සභාව අතරේ ඇති ප්‍රේමය පිළිඹිබු කරන්නේ ය. විවාහ ජීවිතයේ ඉතා සමීප සබඳතාවය ද ප්‍රේමය ද ඒ තුළ නිති ද ඇතිකර තිබෙන්නේ දෙවියන් වහන්සේ ම ය. ඒ නිසා කිතුනු විවාහය යහපත් හා පරිශුද්ධ දෙයක් විය යුතු ය. යමෙක් නියම වෛවාහික ප්‍රේමයකින් තොරව අනාගත සුරක්ෂිතභාවය ඇති කර ගන්නට, ලිංගික ආශාවන් පිනවා ගැනිමට හෝ සමාජය තුළ තැනක් ලබා ගැනීමට පමණක් විවාහයට ඇතුල් වේ නම් එතැන ද කිතුනු විවාහයක් නො මැත. විවාහයේ ශක්තිය හා පසුබිම විය යුත්තේ ප්‍රේමය යි. ආදරය යි.

මෙම ප්‍රේමය ගැඹුරු හා පිරිසිදු වන තරමට පරාර්ථකාමීව එකිනෙකාට පක්ෂපාතිවීම නිසා දිනෙන් දින මෙම ප්‍රේමය තුළ ඔවුන් වර්ධනය වනු ඇත.

පුරුෂයින් විසින් තම භාර්යාවනට තම ශරීරයට මෙන් ප්‍රේම කළ යුතු ය. සිය භාර්යාවට ප්‍රේම කරන තැනැත්තා තමාට ම ප්‍රේම කරගන්නේ ය.

සෑම භාර්යාවක්ම තම ස්වාමියාට ගෞරවය දක්විය යුතු ය. (එපීසි 5:25-32) මෙම ප්‍රේමය කිසිම ලෙසකින්වත්, කායික දෙයක් පමණක් නොවිය යුතු ය. ප්‍රේමය දෙවියන් වහන්සේ ය. ප්‍රේම නොකරන්නා දෙවියන් වහන්සේ නාඳුනයි. මන් ද දෙවියන් වහන්සේ ප්‍රේමය ය. (1 ජුවාම් 7/8) ස්ත්‍රිය හා පුරුෂයා අතර ඇති බැඳීම සමාන කරනුයේ ක්‍රිස්තුස් වහන්සේ හා සභාව අතර ඇති බැඳීමකි.

# 3.3.3 ආශිර්වාදකාර බන්ධනයේ ප්‍රසාද නිධානය දානය කිරීම

## කිතුනු විවාහය සක්‍රමේන්තුවකි

ප්‍රසාද ස්නාපනය ලබාගත් දෙදෙනෙකු අතර කෙරෙන විවාහය සක්‍රමේන්තුවකි. දෙවියන් වහන්සේ උන්වහන්සේගේ සෙනඟ සමග ප්‍රේමයේ හා විශ්වාසයේ ගිවිසුමකින් බැඳී ඔවුන්ගේ ජීවිත තුළට ඇතුළු වූවා සේ විවාහයේ දී කිතුනුවන්ගේ ජීවිත තුළට ආශිර්වාදකාර බන්ධනය නැමැති සක්‍රමේන්තුව මගින් ක්‍රිස්තුන් වහන්සේ වැඩම කරන සේකැ'යි කතෝලික සභාව අපට උගන්වයි. (වර්තමාන ලෝකයේ ශුද්ධවූ සභාව 48)

සක්‍රමේන්තුවක් යනු දේව වරප්‍රසාදයේ දෘශ්‍යමාන හා ක්‍රියාකාරි සංකේතයකි. එලෙස එය දෙවියන් වහන්සේගේ ජනතාවට ගැලවීම ලබාදෙන සැලැස්ම ක්‍රියාත්මක කිරීමක් ද වෙයි.

සභාව සක්‍රමේන්තුවක් ලෙස ජනතාවට ගැලවීම අත්කර දෙන්නා සේම විවාහය තුළින් ද දෙවියන් වහන්සේ ජනතාව ගැලවීම කරා ළඟා කරන සේක. එම නිසා විවාහය ද සක්‍රමේන්තුවකි. කිතුනු විවාහය ගැලවීමේ ගිවිසුමේ අනුස්මරණයක් ඉෂ්ටවීමේ දිවැස්වැකියකි. විවාහයේ සක්‍රමේන්තුව මගින් දෙවියන් වහන්සේගේ රජයේ වටිනාකම් සොයා ගෙන යන්නටත්, එම රාජ්‍යයේ ගුණාංග මෙලොව ජීවත්කරවන්නටත්, අඹුසැමි දෙදෙනා දෙවියන් වහන්සේගෙන් කැඳවීම ලබති. එම නිසා අඹුසැමිප්‍රේමය මිහිපිට දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ සලකුණකි. ඔවුන් දෙවියන් වහන්සේගේ ආදරයට මෙලොව සාක්ෂි දරන්නේ දෙදෙනා එකිනෙකාට ප්‍රේම කිරීමෙන් හා දෙදෙනා එක්ව දරුවන්ට ප්‍රේම කිරීමෙන් ය. කතෝලිකයන් දෙදෙනෙක් අතර විවාහය සාමාන්‍යයෙන් දිව්‍ය පූජාව වේලාවේ දී සිදු වේ. විවාහයේ දී ආශිර්වාදකාර බන්ධනයේ සක්‍රමේන්තුව දානය කරන්නේ එම පිළිවෙත සිදුකරන පූජක තුමා නොව විවාහයට ඇතුල්වන දෙදෙනා ය.

දෙදෙනා අන්‍යෝන්‍ය එකිනෙකාට සක්‍රමේනතුව දානය කිරීමෙන් දෙදෙනා තවදුරටත් දෙදෙනෙකු නොව එක්නෙකු බවට පත් වෙති.

පූජක තුමා මෙහි දී ක්‍රියා කරන්නේ සභා නියෝජිතයා වශයෙනි. ''වාසනාවන්ත කල්හි ද අවසනාවන්ත කල්හි ද ලෙඩ දුකේ දී හා සුව සැපේ දී ත් ඔබට විශ්වාස වන්ත වෙන්තට මම පොරොන්දු වෙමි. මගේ මුළු ජීවිත කාලය තුළදීම මම ඔබට ප්‍රේම කරමි. මම ඔබට ගෞරව කරමි.'' දෙදෙනා එකිනෙකාට ප්‍රකාශ කිරීමත් සමඟ සිද්ධ වෙන්නාවූ විවාහයෙන් දෙදෙනාම දේව සේවයට තමන්ව කැප කරගන්නා අතර විවාහයෙන් ලබා දෙන්නාවූ වරප්‍රසාද තුළින් දේව ප්‍රේමයේ සංකේතයක් ලෙස ලොව තුළ ක්‍රියාත්මක වීමට කැඳවීමක් ලබති. විවාහයේ සක්‍රමේන්තුව තුළ දෙදෙනාගේ වගකීම නම් ඔවුන් ලබාගන්නා දේව වරප්‍රසාදය විවාහක යුවළ පූජාප්‍රසාදී තුමා ඉදිරියේ සිය කැමැත්තෙන්ම ක්‍රිස්තුන් වහන්සේ සමඟ ජනිත කරගත් මේ ප්‍රසාද නිදානය පසුව දික්කසාදයෙන් බිඳ දමන්නට තැත් කිරීම මහා අභාග්‍යයකි. ආශිර්වාදකාර බන්ධනය අහෝසි කිරීම කිසිම මනුෂ්‍යයෙකුට නො හැකි වන බව ක්‍රිස්තුන් වහන්සේ ස්ථිරව ම ඉගැන්වූ සේක.

''මම ඔබට කියමි, වෛශ්‍යාකම හැර අන් කරුණක් නිසා සිය භාර්යාව දික්කසාද කරන කවරෙක් වූවද ඇය කාමමිත්‍යාචාරයට පමුණුවන්නේ ය. එසේ දික්කසාද කරනු ලැබූ ඇය විවාහ කරගන්නා යමෙක් වේ ද ඔහුත් කාමමිත්‍යාචාරය කරන්නේ ය. එබැවින් දෙවියන් වහන්සේ එක්කළ අය මනුෂ්‍යා වෙන් නො කෙරේ වා '' (මතෙව් 5/32, 19/8)

## 3.3.4 වෛවාහික කැමැත්ත

ප්‍රසාද ස්නාපනය ලබාගත් දෙදෙනෙක් තමන්ගේ නිදහස් කැමැත්තෙන් එකඟතාවයට පැමිණීම තුළ කතෝලික විවාහය සිදුවේ.

මෙම එකඟවීම තුළ දෙදෙනා එකිනෙකා වෙනුවෙන් පරිත්‍යාගි වෙන අතර එකිනෙකා පිළිගනිමින් ඔවුන් දෙදෙනෙක් නොව එක්කෙනෙක් වනු ඇත.

## 3.3.5. විවාහයේ ප්‍රසාද නිධානයෙන් ලැබෙන දීමනා (විවාහයේ ඒකත්වය)

විවාහයේ මූලික ලක්ෂණය ඒකත්වයයි. ඒකත්වය යනුවෙන් හඳුන්වනු ලබන්නේ පුරුෂයා එක් ස්ත්‍රියක සරණ පාවා ගැනීම හා ස්ත්‍රීය එක් පුරුෂයකු සරණ පාවා ගැනීම ය.
''මිනිසෙක් පියා ද මව ද අත්හැර සිය භාර්යාවට ඇලුම් වන්නේ ය. ඒ යුවළ ද එක් කෙනෙක් වෙති. මෙසේ ඔවුහු දෙදෙනෙක් නොව එක් කෙනෙක් වන්නේ ය. (මාක් 10/6-8)

පැහැදිලි අන්‍යොන්‍ය ප්‍රේමයකින් හා ස්වත්‍යජයකින් ජීවත් කරවීමට දෙදෙනා අතර ගැඹුරු ප්‍රේමයක් ගොඩනගා ගැනීමටත් විවාහයේ ඒකත්වය අත්‍යවශ්‍ය ය. එලෙස ම දෙමව්පියනට තම දරුවන් සම්බන්ධව යුතුකම් නිසි ආකාරයෙන් ඉටු කිරීමටත් ඔවුන් උදෙසා ඇප කැප වෙමින් ප්‍රේමයෙන් ඔවුන් ඇති දැඩි කිරීමටත් විවාහයේ ඒකත්වය අත්‍යවශ්‍ය ය.

## 3.3.6 මිශ්‍ර විවාහය (විවාහයේ අඛණ්ඩභාවය)

කිතුනු විවාහයේ එක් මූලික ලක්ෂණයකි, විවාහයේ අඛණ්ඩතාවය. එනම් දෙදෙනාගෙන් එක් පාර්ශවයක් මරණයෙන් හැර වෙන මොනම හේතුවක් නිසාවත් විවාහ ගිවිසුම අවලංගු නො කළ හැකි බව ය. එනම් දික්කසාද කළ නො හැකි බව ය.

අද සභාව විවාහයේ අඛණ්ඩතාවය ගැන විවිධ සභා ප්‍රකාශන වලින් පැහැදිලි කරදෙයි.

වර්තමාන ලෝකයේ ශුද්ධවූ සභාව පිළිබඳ වතිකාන ප්‍රකාශනයේ 48 වෙනි පරිච්ඡේදයේ විවාහයේ අඛණ්ඩතාවය ගැන තහවුරු කර ඇත. දෙවෙනි ජුවාම් පාවුලු පාප්තුමා නිකුත් කරන ලද 'කිතුනු පවුල්' නැමති විශ්ව ලේඛනය තුළින් ද විවාහයේ අඛණ්ඩතාවය පැහැදිලි කර ඇත.

## 3.3.7 විවාහ අර්බුද, පවුල් අවුල්

### විවාහයේ මූලික පරමාර්ථ දෙකක් ඇත.

i. විවාහයේ දී ඔවුනොවුන්ගේ සුබ සිද්ධිය සඳහා දෙපාර්ශවයේ යහපත සඳහා ජීවිතය දානය කිරීම. මින් අදහස් කරන්නේ ඔවුනොවුන්ගේ සුබ සිද්ධිය සඳහා ජීවිත දානය කිරීමයි. විවාහක යුවළක් එකිනෙකාට විශ්වාසවන්තව හා එකිනෙකා කෙරෙහි විවෘතව ජීවිත් විය බව ය.
විවාහක දෙදෙනා දැඩි ප්‍රේමයකින් බැඳී සිටිය යුතු වේ. වෛවාහික ප්‍රේමය මිහිපිට ක්‍රියාත්මක වන අන් කිසිදු ප්‍රේමයකට වඩා වෙන්ස් ය. වෛවාහික ප්‍රේමය තුළින් දෙදෙනාගේ ශාරීරික මානසික හා ආධ්‍යාත්මික යහපත උදාවිය යුතු වේ.

## ii දරුවන් බිහිකිරීම හා ඇතිදැඩි කිරීම.

විවාහය, පුරුෂයාගේ හා භාර්යාවගේ යහපත වෙනුවෙන් ද දරුවන්ගේ හා සමාජයේ යහපත වෙනුවෙන් ද පූජනීය විය යුතු ය. ජනනය කිරිමෙනුත් දරුවන් ඇතිදැඩි කිරීමෙනුත් එහි නියම අරමුණ ඉස්මතු වේ. දරුවන්ට සමාජයේ යහපත් පුද්ගලයින් ලෙස ඇතිදැඩි කිරීමත් නිසා අධ්‍යාපනයක් දීමත් ඔවුන්ගේ ශාරීරික අවශ්‍යතාවයන් සොයා බැලීමත් දෙමව්පියන්ගේ යුතුකම් වේ.

## විවාහයට නීත්‍යානුකුල බාධා

ශාසන නීති සංග්‍රහයේ විවාහ වීමට ඇති බාධා කිහිපයක් පෙන්වා දී ඇත.

## i වයස අසම්පූර්ණ වීම

ශාසන නීතිය පෙන්වා දෙන සර්ව ව්‍යාප්ත නීතිය තුළ පිරිමියා වයස අවුරුදු 16 සම්පූර්ණව සිටිය යුතු අතර ගැහැනියගේ වයස අවුරුදු 14 ඉක්මවිය යුතු ය.

එහෙත් දෙපාර්ශ්වයටම බලපාන තවත් පොදු කොන්දේසියක් නම් ඔවුන් වයස අවුරුදු 18 සම්පූර්ණ කර නැතිනම් විවාහය සඳහා දෙමව්පියන්ගේ හෝ භාරකරුවන්ගේ අවසරය නොහොත් කැමැත්ත අවශ්‍ය වීම ය. රදගුරු මණ්ඩල තීරණය අනුව අද ලංකාවේ ක්‍රියාත්මක වන වයස් සීමාවන් නම් පිරිමියා ද ගැහැණිය ද අවුරුදු 18 සම්පූර්ණ වී සිටීම ය.

## ii ලිංගික බෙලහීනතාවය

ලිංගික බෙලහීනතාවය යනු යමෙකුට සාමාන්‍ය ස්වාභාවික අයුරින් ලිංගික සංසර්ගයේ යෙදීමට ඇති අපොහොසත් භාවයයි. මෙය පුරුෂයාට මෙන්ම ස්ත්‍රීයට ද බලපායි. ලිංගික බෙලහීනතාවය කායික හෝ මානසික හේතු මුල් කරගෙන ඇති විය හැක. මෙම බෙලහීනතාවය විවාහයට ප්‍රථම හෝ පසුව ද, සැමදා හෝ යම් කිසි කාල සීමාවකට ද, සැම කෙනෙකු සමග හෝ යම්කිසි පුද්ගලයින් සමග පමණක් ද බල පවත්වනු විය හැක. යමෙකු මෙවැනි බෙලහීනතාවකින් පෙළෙද්දී විවාහ ජීවිතයට ඇතුල් වුවහොත් අවලංගු විවාහයක් වේ. වඳ භාවය විවාහයට බාධාවක් නො වන්නා සේම එය බෙලහීතාවයක් නො වේ.

## iii පූර්ව බන්ධනය

පෙර යමෙකු නිත්‍යානුකුල විවාහ බන්ධනයට ඇතුළත්ව සිටිද්දී නැවතත් විවාහයක් කර ගත හොත් පසුව කළ විවාහය ඉබේ ම අවලංගු වේ.

## iv කිතුනු නොවන කෙනෙකු සමග කිතුනුවකු ඇති කර ගන්නා විවාහය අවලංගු විවාහයකි.

මෙහි දී මිශ්‍ර විවාහ පිළිබඳ ප්‍රශ්නය නැගේ මිශ්‍ර විවාහය යනු යම් කිසි අත්‍යවශ්‍ය හේතුවක් මත සභාව විසින් පුද්ගලිකව දෙනු ලබන විශේෂ අවසර සහතිව විවාහ වීමකි. එම අවසරය නිසි ලෙස ලබාගෙන විවාහ වීමේ හැකියාව ඇත.

මිශ්‍ර විවාහ කොටස් දෙකකි. පළමුවැන්න, කතෝලික හා කතෝලික නොවන එහෙත් සභාව විසින් පිළිගත් කිතුනු සභාවක අයෙකු හා ඇතිවන විවහයයි. මෙහි දී දෙපාර්ශ්වයම කිතුනුවන් නිසා එම විවාහය නීත්‍යානුකුල අන්දමින් සිදු කරනු ලැබුවහොත් එය වලංගු විවාහයක් මෙන්ම සක්‍රමේන්තුවක් ද වන්නේ ය. දෙවැන්න නම් කතෝලිකයකු හා කිතුනු නොවන අයෙකු අතර

ඇතිවෙන විවාහය යි. මෙය පොදු භාවිතයේ දී ''මිශ්‍ර විවාහ'' ලෙස සලකනු ලැබේ. මිශ්‍ර විවාහය සක්‍රමේන්තුවක් නොවේ.

## v ශුද්ධවූ නිලවරයෙක්

රදගුරු, පූජක හා තේවාචාරී තත්ත්වයන්හි සිටින කෙනෙකුට සභාව තුළ වලංගු විවාහයකට ඇතුළත් විය නො හැක.

## vi සදාකාලික වේද භාර

කවරකු හෝ යම්කිසි පැවිදි පංතියක් තුළ සදාකාලික වේදභාර ගෙන ඇත්නම් පැවිදි දිවිය අත හැර දමා ම වේදභාරවලින් නිල මිදීමක් නො ලැබ වලංගු කිතුනු විවාහයක් කරගත නො හැක.

## vii පැහැර ගෙන යාම

යමෙකු විවාහය සඳහා ස්ත්‍රීයක පැහැර ගෙන ගොස් හෝ රදවා තබාගෙන එම ස්ත්‍රීය සමග වලංගු විවාහයක් ඇති කර ගත නො හැක. නමුත් පසුව දෙපාර්ශවයම නිදහස් කැමැත්ත ප්‍රකාශ කළහොත් සමාන්‍ය පරිදි විවාහවීමේ හැකියාව ඇත.

## viii ලේ නෑකම

මෙය ඇති වන්නේ එකම මව්පිය දෙදෙනාගෙන් පැවතෙන දරුවන් අතරෙහි ය. එක කුස ඔත් සහෝදර, සහෝදරියන් අතරෙහි පළමුවන නෑකම ද ඔවුන්ගේ දරුවන් අතරෙහි දෙවන නෑකම ද ඒ දරුවන් අතර තුන්වන නෑකම ද ඇති වෙයි. මේ ත්‍රිවිධ නෑකම ඉක්මවන තැන විවාහය අවලංගු වෙයි.

## ix විවාහ නෑකම

මේ අනුව ස්ත්‍රී පුරුෂ දෙදෙනක් විවාහ වූ පසු ඔවුන්ගෙන් කෙනෙක් නැසී ගියොත් අනික් අයට නැසී ගිය අයගේ නෑ බන්ධන සමග දෙවෙනි නෑකම ඉකුත් වන තෙක් විවාහ වීමට නුපුළුවන

## x දරුකමට හදාගත් අයෙකු සමග විවාහය

නීත්‍යානුකූලව දරුකමට හදාගත් අයෙකු සමග එම සුළු පියාට හෝ මවට විවාහ වීමට නො හැක. එලෙසම තමන්ගේම දරුවෙකු හා හදා ගත් දරුවකු අතරත් වලංගු විවාහයක් ඇති විය නො හැක.

## xi ප්‍රසිද්ධ අවාදර්ශය

මෙම විවාහ තහංචිය පැන නැඟෙන්නේ අවලංගු හෝ අනියම් සබඳතා විවාහවලිනි. මෙවැනි සබඳතා ඇති කරගෙන සිටින කෙනෙකුට අනෙක් පාර්ශ්වයට නීත්‍යානුකූලව හෝ අනියම්ව හෝ ලැබුන දරුවකු සමගවත් එම පාර්ශ්වය සමගවත් විවාහවීම නීතියෙන් තහනම් වේ.

## xii මිනිස් ඝාතනය

යමෙකු සමග විවාහ වීම සඳහා එම තැනැත්තාගේ හෝ තැනැත්තියගේ භාර්යාව හෝ ස්ත්‍රී පුරුෂයා ඝාතනය කරනු ලැබ ඉන්පසු විවාහය සිදුකරනු ලැබුවහොත් එම විවාහය වලංගු නොවේ.

## අද පවතින විවාහ අර්බුද

1. බහුභාර්යා සේවනය
2. බහු පුරුෂ සේවනය
3. නිදහස් ආලය
4. දික්කසාදය
5. අනියම් උපත් පාලනය
6. බාලවයස් විවාහ
7. මිශ්‍ර විවාහය නිසා ඇතිවන අර්බුද

ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය,
"ලංකාරාම"
19, බැල්කම් පෙදෙස,
කොටා පාර, කොළඹ - 8.

දුරකථනය : 011-2685459
ෆැක්ස් : 011-2665021
විද්‍යුත් තැපෑල : natcatbible@gmail.com